# ජනාවාස

# පිළිබඳ

# අභ්‍යාස පාඨමාලාව

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 7.

ප්‍රකාශන මාලා අංක 8.

1974 අගෝස්තු

2009/06
2010/04.
06

ප්‍රකාශන මාලා අංක 8    1974 අගෝස්තු

# ජනාවාස පිළිබඳ අභ්‍යාස පාඨමාලාව

1974 මැයි මස 20 වැනි දින සිට 31 වැනි දින දක්වා

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත,
කොළඹ 7.

22881
22881

## පටුන


පෙරවදන: ජනාවාස පිළිබඳ පුහුණුවීමේ පාඨමාලාව
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ
සී. නාරායනසාමි මහතා ... ... 1

ආරම්භක දේශනය:
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්
මහින්ද සිල්වා මහතා ... ... 3

වචනයක්:
ප්‍රධාන උපදේශක ෆ්‍රෑන්ක් සෝන්ඩර්ස් මහතා ... 4

කෘෂිකාර්මික සංවර්ධනය සැළසුම් කිරීම:
කෘෂිකර්ම සංවර්ධන අධ්‍යක්ෂ
කේ. එච්. ජේ. විජේදාස මහතා ... ... 5

සමුපකාර ගම්මාන වලින් ලද අත්දැකීම්:
කෘෂිකර්ම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ
නන්ද අබේවික්‍රම මහතා ... ... 8

කෘෂිකාර්මික ණය:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී
පියදාස සේනානායක මහතා ... ... 11

මහ ගොවි ජනපද හා තරුණ ව්‍යාපාර වලින් ලද අත්දැකීම්:
සහකාර ඉඩම් කොමසාරිස්
ඩබ්. ජේ. එස්. කරුණාරත්න මහතා ... ... 15

මහවැලි ජනාවාසවල මූලික අංග:
මහවැලි සංවර්ධන මණ්ඩලයේ සහකාර
සාමාන්‍යාධිකාරී (ජනාවාස) ඩී. එම්. ආරියරත්න මහතා ... 20

සමුපකාර ගම්මානවල ඇතැම් ගැටළු:
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ
සහකාර අධ්‍යක්ෂ එන්. ජයනාදන් මහතා ... 24

කෘෂිකාර්මික ජනාවාසකරනයෙහි ඇති ගැටළු:
කැගල්ල දිසාපති,
කපිල පතිරණ විමලධර්ම මහතා ... ... 26

කෘෂි භාණ්ඩ අලෙවිය පිළිබඳ ගැටළු:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී
පියදාස සේනානායක මහතා ... ... 29

ප්‍රති සංවිධානය කළ ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික සංවර්ධනය:
ග්‍රාමීය ආයතන හා එළදා වර්ධන නීති අධ්‍යක්ෂ,
අයි.කේ.වීරවර්ධන මහතා ... ... 35

ආර්ථික සංවර්ධනයෙහි ලා ග්‍රාමීය පරිපාලන ක්ෂේත්‍රයේ කාර්ය භාරය:
රත්නපුර අතිරේක දිසාපති
එස්.සී.මානික්කවාසගර් මහතා ... ... 38

අදහස් හුවමාරුව පිළිබඳ ගැටළුව:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී
ර්.කේ.පෙරේරා මහතා ... ... 41

ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසයන්හි අත්දැකීම්:
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ
ගොඩ්ෆ්‍රි මූතුකුඩ මහතා ... ... 45

ජනාවාස කරණයෙහිදී අදාළ වන සංස්කෘතික කටයුතු:
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ
කරුණාසේන ජයලත් මහතා ... ... 47

ජනාවාසවල සමාජ ගැටළු:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී
ටියුඩර් සිල්වා මහතා ... ... 49

ජනාවාසකරණයක කළමනාකරණය:
විශ්‍රාමලත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
එච්.කනගරත්නම් මහතා ... ... 53

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නීතිමය වෙනස්කම්:
ග්‍රාමීය ආයතන හා එළදා වර්ධන නීති අධ්‍යක්ෂ
අයි.කේ.වීරවර්ධන මහතා ... ... 55

ඉඩම් භාවිතය – අවශ්‍ය ප්‍රතිසංශෝධන:
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්ය
හිරාන් ඩයස් මහතා ... ... 57

වියලිකලාපීය හා තෙත්කලාපීය ඉඩම් පරිහරණය:
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ
ආර්. එම්. එස්. රත්නායක මහතා ... ... 59

ගොවිපල් සැලසුම්කරණය සහ අය වැය සකැසුම:
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අර්ථ ශාස්ත්‍රඥ
ඩී. ර්. එ/ප්. සූරවීර මහතා ... ... 62

කෘෂිකර්ම ශිල්පීය නවීකරණය:
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ටී. එම්. ජී. තෙන්නකෝන් මහතා ... ... 73

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ අත්දැකීම්:
ප්‍රාදේශීය සංවර්ධන අධ්‍යක්ෂ
හැරල්ඩ් ප්‍රනාන්දු මහතා ... ... 76

ක්ෂේත්‍ර අධ්‍යයනය:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී,
ඩී. ද එස්. රත්නවීර මහතා ... ... 80

නිලධාරීන් හා මහජනයා අතර අදහස් හුවමාරු කිරීමේ ගැටලුව:
ග්‍රාමීය ආයතන හා එළදා වර්ධන නීති සහකාර අධ්‍යක්ෂ
අමර හේවාමද්දුම මහතා ... ... 87

ග්‍රාමීය ඉතිරි කිරීම් සංවර්ධනයට උපයෝගී කර ගැනීම:
ලංකා බැංකුවේ සිංහල අංශයේ කළමනාකාර
ඩී. අත්තනායක මහතා ... ... 89

උතුරු මැද පළාතේ සමාජ ව්‍යුහය:
සාගින්නෙන් නිදහස් කිරීමේ ව්‍යාපාරයේ සමාජ විද්‍යාඥ
පී. ගනේවත්ත මහතා ... ... 91

රජය අත දෙන ගොවි ව්‍යාපාර:
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී
ඩී. ද එස්. රත්නවීර මහතා ... ... 93

ව්‍යාප්ති සේවාවන්හි ගැටලු හා හැකියාවන්:
දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී
පී. එස්. ඩබ්. සී. විජේවර්ණසූරිය මහතා ... 97

කෘෂිකාර්මික විවිධාංගකරණය :
කෘෂිකර්ම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ
ආචාර්ය ලෙස්ලි හේරත් ... ... 99

සමූපකාර ගම්මාන සහ සමූපකාර ප්‍රතිපත්ති :
ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ඩී. එම්. ඩී. මාරපන මහතා ... ... 101

තරුණ ගොවි ව්‍යාපාරවල අත්දැකීම් :
සහකාර ඉඩම් කොමසාරිස්
ආර්. එස්. ජයරත්න මහතා ... ... 105

සමූපකාර ගම්මානයක ගණන් තැබීමේ කටයුතු :
සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්
ඩී. ඩබ්. ප්‍රනාන්දු මහතා ... ... 107

---

# ජනාවාස පිළිබඳ පුහුණුවීමේ පාඨමාලාව

ජනාවාස පිළිබඳ සංකල්පය ශ්‍රී ලංකාවට නව අදහසක් නොවේ. ඈත අතීතයේදී ජනපද ව්‍යාපාර මගින්ද, තරුණ ව්‍යාපාර මගින්ද මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නයක් දරන ලදී අතර, සංවර්ධන ක්‍රියා වලියෙහි ලා එම ව්‍යාපාරයන්ගෙන් ඉටු වූ කාර්ය භාරය දැන් විළසිල්ලට යොමුව පවතී. එම ව්‍යාපාරයන්හී පුද්ගලයින් පදිංචි කරවීමේදී අනුගමනය කරන ලද ප්‍රතිපත්ති සහ රජය විසින් විශාල වශයෙන් ප්‍රාග් ධනය ආයෝජනය කරමින් ඇති කළ යටි තල පහසුකම් සැපයීම වැනි ක්‍රියා මාර්ග කොතෙක් දුරට සාර්ථක වූයේද යන්න ගැන දැන් විවිධ මත පවතී.

මේ අතරතුර ජනාවාස කරනය පිළිබඳව නව ආකල්ප ඇති වීනි. සාමූහිකත්වය, සූක්ෂම ක්‍රම විධි මගින් වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම වැනි අළුත් අදහස් ඉස්මතු වූයේ මෑතක සිටය. ශ්‍රී ලංකාව දැනට මුහුණ පා ඇති ආර්ථිකමය හා සමාජමය ගැටළු විසඳීම සඳහා ජනාවාස කරනය පිළිබඳව මෙතෙක් අනුගමනය කළ ප්‍රාග්ධන සූක්ෂම කාර්ය පද්ධතිය වෙනස් කිරීමේ අවශ්‍යතාවය උද්ගත වුනේය. දැන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ජනාවාස ව්‍යාපාරයන් ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යන අතර, රටාව පිළිබඳව ඒවායේ සුළු වෙනස්කම් තිබුනද අවසාන වශයෙන් අපේක්ෂා කරන පරමාර්ථය පොදුවේ සමාන වන්නේය. සේවා වියුක්තව සිටින තරුණ පෙළ ස්වයං ජීවන මාර්ග කෙරෙහි යොමු කරවීම, නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගැනීම සහ භූමිය සහ මිනිසා අතර මෙතෙක් නොවූ විරූ සම්බන්ධතාවයක් ඇති කර ගැනීම වැනි පොදු පරමාර් පෙරදැරි කරගෙන මෙම ව්‍යාපාර ආරම්භ කරන ලද්දේය.

මෙතෙක් පිහිටුවා ක්‍රියා කරගෙන යන ලද ජනාවාස පිළිබඳව සමීක්ෂණයන් කර එම ජනාවාස පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් මෑතදී කරන ලද අතර එහි වාර්තාව දැන් පිළියෙල වී ඇත.

ජනාවාසකරනය පිළිබඳව නව සංකල්ප ක්‍රියාත්මක කිරීමේ කාර්ය භාරයේදී ජනාවාසයන්හී සාමාජිකයින් හට ආරම්භක මාර්ගෝපදේශකත්වයක් ලබා දෙන ව්‍යාපාර කළමනාකරුවන්ගේ වගකීම අතිශයින් සංකීර්න වන්නේය. ව්‍යාපාරයේ මුල් කාලය තුළ සාමාජිකයන් නිවැරදි මග පෙන්වීම බලාපොරොත්තු වන්නේ එවැනි ව්‍යාපාරයක් භාරව කටයුතු කරන්නෙකු ගෙනි. එහෙයින් මෙවැනි ව්‍යාපාරයකට සවිමත් පදනමක් වැටෙන පරිදි ක්‍රියා කිරීමේදී ව්‍යාපාර කළමනාකරු සතු කාර්ය භාරය ඉතාමත් වැදගත් වේ.

මහවැලි සංවර්ධන මණ්ඩලයේ ජනාවාස භාර නිලධාරීන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමූපකාර ගම්මාන භාර ව්‍යාපාර කළමනා කරුවන් උදෙසා දින 10 ක් තුළ පැවැත්වුනු මෙම පාඨමාලාවේදී, කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, භූමි කටයුතු, කළමනාකරණය ආදී වශයෙන් ජනාවාසයක ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන විවිධ අංශ පිළිබඳව මූලික අවබෝධයක් දේශන හා සාකච්ඡා මගින් ඉදිරිපත් කරන ලද අතර ලස්සනගම සමූපකාර ගම්මානය හා මහවැලි සංවර්ධන මණ්ඩලයේ ජනාවාස පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද මෙයට ඇතුලත් වීනි.

පාඨමාලාව සාර්ථක කර ගැනීමෙහි ලා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ප්‍රධාන නිලධාරී මහතුන්ගෙන් ලැබුණු සහාය අගය කොට සලකමි. එසේම, අපගේ ආරාධනයන් පිළිගෙන මෙහි පැමිණ දේශන පැවැත්වූ සියළුම දේශකයන්ට ස්තුති කරනු කැමැත්තෙමි. මෙම පාඨමාලාව මැනවින් කරගෙන යාම සඳහා සහාය දුන් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පිරි නැමේ.

පාඨමාලාව පිළියෙල කිරීම හා එයට අදාල වන විෂයයන් පිළිබඳව තීරණය කර කටයුතු කිරීම වැනි සංවිධානාත්මක කාර්යය භාරගෙන ක්‍රියා කල අප ආයතනයේ පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී ඒ.එස්.රණතුංග සහ ඩී. ද එස්.රත්නවීර මහතුන්ට ද ස්තුතිවන්ත වෙමි.

පාඨමාලාවේදී පවත්වන ලද දේශනයන්හී සම්පිණ්ඩනයක් ඇතුළත් මෙම ප්‍රකාශනය සකස් කිරීමෙහි ලා කටයුතු කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරීන්ටද ස්තුති කරමි.

සී. නාරායනසාමි
අධ්‍යක්ෂ

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 7.

## ආරම්භක දේශනය

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිල්වා මහතා
විසිනි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වනු ලබන 10 වෙනි පුහුණු කිරීමේ පාඨමාලාව වන ජනාවාස පිළිබඳව වූ මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වන්නේය. පුළුල් අයුරින් පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති වුවද ආයතනය විසින් ගොවිජන සේවා ක්ෂේත්‍රය හා අදාළ නොයෙකුත් අභ්‍යාස පාඨමාලා, ආයතනය ආරම්භ කර මෙතෙක් ගතවු ඇති දෙවසර තුළ පවත්වන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද ඇතුළුව දින 10 ක් තුළ පැවැත්වෙන මෙම පාඨමාලාව බෙහෙවින් සාර්ථානුකූල වන්නේය. පාඨමාලාවට සහභාගී වන ක්ෂේත්‍ර නිලධාරීන් තරුණ ජනාවාස භාරව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. මෙහිදී නොයෙකුත් කථිකයින් විසින් පවත්වනු ලබන දේශනවලට සවන් දීමෙන් පමණක් සෑහීමකට පත් නොවී සාකච්ඡාවන් අනුසාරයෙන් දේශනවලට විෂය වන කරුනු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගෙන එම කරුණු තරුණ ජනාවාසයන්හී සාමාජිකයින් හට අවබෝධ කරවීමට ඔබට හැකි වනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

වර්තමානයෙහි කෘෂිකාර්මික සංවර්ධනය වේගවත් පෙරළියකට මුහුණ දී සිටී. දැනට අවුරුදු දහයකට පමණ හෝ පෙර ඇති නුවූ, මෙතෙක් නුවූ විරූ වැදගත් වෙනස්කම් මුළු ගොවිජන සේවා රටාව තුළ සිදු වෙමින් පවතී. පිටරටින් මෙරටට ගෙන්වූ ආහාර භෝග බොහොමයක් සඳහා විදේශ විනිමය හිගය හේතුකොටගෙන 1973 දී සීමාවන් පැනවීම නිසා ආදේශක වශයෙන් ආහාර භෝග ගණනාවක්ම මෙරටෙහි නිපදවීමේ අවශ්‍යතාවය ඇති වීමෙන් කෘෂිකාර්මික රටාව තුළට නව ආකල්පයක් පිවිසිනි. මෙහි ප්‍රතිපලය වූයේ වැඩි ඉඩම් ප්‍රමාණයක ආහාර භෝග වගා කිරීම සඳහා අවශ්‍යතාවයක් ඇති වීමයි. මේ කෘෂිකාර්මික පෙරළියට සරිලන පරිදි ඉඩම් සීමා කිරීමේ පනත, කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටු පනත, කෘෂිකාර්මික ඉඩම් පනත වැනි නව පනත් කිහිපයක් රජය සම්මත කර ඇත. මෙම අගෝස්තු මස 24 වෙනි දිනට පෙර, රජයට පවරා ගැනීමට තිබෙන සියළුම ඉඩම්වල වැඩ කටයුතු නිමාවකට පත්වීමෙන් අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යයන්හී පළමුවැනි කොටස සමාප්ත වේ. මෙම ඉඩම් නැවත බෙදා දීමේදී, ඒවායින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව රජය විශේෂයෙන් සැලකිලිමත් වන අතර ජනාවාස පිහිටුවීම සඳහාද මෙම ඉඩම් සැහෙන ප්‍රමාණයක් වෙන් කරනු ඇත.

අතිශයින් යුහුසුළුව කෘෂිකාර්මික සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ආයතනික රටාව තුළද නොයෙකුත් වෙනස්කම් සිදු කර ඇත. පලදාව වර්ධන කමිටු හා ඒවා යටතේ පිහිටුවනු ලබන කෘෂි සේවා මධ්‍යස්ථාන ආදී සංවිධාන තුළින් අපේක්ෂා කෙරෙනුයේ සංවර්ධනයට රුකුල් දෙන ඒකාබද්ධ ආයතනික ව්‍යුහයක් ඇති කිරීමයි. මෙම සංවිධාන ඒකාබද්ධ වී දැනට ආරම්භ කර ඇති නව කෘෂිකාර්මික පෙරළිය, ප්‍රතිපත්ති සකස් කරන්නවුන් වශයෙන් අපට වුවද පහසුවෙන් විග්‍රහ කළ නොහැකි පරිවර්තනයකි.

## ව ච න ය ක්

මෙම අභ්‍යාස පාඨමාලාවට සහභාගී වෙන නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යයේ වැදගත්කම අවධාරණයෙන් සඳහන් කළ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රධාන උපදේශක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ /ප්‍රැන්ක් සෝන්ඩරිස් මහතා විවිධ සංවිධාන යටතේ කණ්ඩායම් වශයෙන් ගොවිතැන් කිරීමේ ප්‍රශ්නය දැනට ජාත්‍යන්තර වශයෙන් සැලකිල්ලට ලක්ව ඇති බව පැවසීය. ඔහු වැඩිදුරටත් මෙසේ සඳහන් කළේය:–

සමූපකාර හා සාමූහික ගොවිපල ක්‍රමය පිළිබඳව ලෝකයේ රටවල් බොහෝ ගණනක් සෑහෙන අත්දැකීම් ලබා ඇත. මේ සෑම අවස්ථාවකදීම ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්නට සිදු විනි. ඇතැම් ප්‍රශ්නවලට විසඳුම් හමුව ඇතත් අදාළ එක් එක් රටට විශේෂ වූ තත්වයන් අනුව එම විසඳුම් සොයා ගත හැකි විනි. බැහැරින් උකහා ගත් ආකෘතියක් පිළිගැනුමට වඩා ශ්‍රී ලංකාවේ සමාජයට ගැලපෙන සාමූහික ගොවිපල රටාවක් සපයා ගැනීම අවශ්‍යය. සාමූහික ජනාවාසයක් පිළිබඳව සළකන කල්හි ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ සියළුම විෂයයන් අදාළ වේ. පළමුව නිෂ්පාදන ආර්ථිකය පිළිබඳ ගැටළු උද්ගත වන අතර ඉන් පසුව ඉඩම් භුක්ති තත්වය, ආයතනික සහාය, අධ්‍යාපනය හා ව්‍යාප්ති සේවා පිළිබඳ ගැටළු ඇති වේ. කණ්ඩායම් ගොවිපල ක්‍රමයෙහි වඩාත්ම දුෂ්කර වනුයේ සමාජයීය ගැටළුය. ගොවිතැන් වැඩ කටයුතු අධික කාලසීමාවලදී ශ්‍රම හුවමාරුව, එක්ව වැඩ කිරීම ආදී වශයෙන් ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව සම්ප්‍රදායිකව සහයෝගය දක්වා ඇතත් මෙම පාඨමාලාවන්ට සහභාගී වන නිලධාරීන්ට මුහුණ දීමට සිදු වන අභියෝගය වනුයේ ගොවීන්ගේ සාමූහික සංවිධාන සවිමත් කිරීමට මාර්ග සොයා ගැනීමයි.

කාර්මික රටාව තුළ, රාජ්‍ය සංස්ථා, පෞද්ගලික සමාගම් සහ පෞද්ගලික ව්‍යවසායකයින් නිෂ්පාදනයට දායක වනු දක්නට ලැබේ. ඉදිරි අනාගතයේ කෘෂිකාර්මික නිෂ්පාදන රටාවද, රාජ්‍ය ව්‍යාපාර, සාමූහික ගොවිපලවල් සහ පෞද්ගලික ගොවීන්ගෙන් සමන්විත වනු ඇත.

පොදුවේ පාසැල් ගුරුවරයෙකුගේ සාමාන්‍ය සිරිත වනුයේ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු දෙනවා විනා ඔහුට තවත් ඉගෙන ගැනීමට දෙයක් තිබේයයි පිළි ගැනීම නොවේ. එහෙත් මෙරටෙහි සාමූහික ගොවිපල සංවිධානය පිළිබඳව ඔබ සැමටත්, රජයේ දෙපාර්තමේන්තුවලටත්, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයටත් තව ඉගෙන ගැනීමට බොහෝ දේ ඇති අතර අවශ්‍ය ප්‍රශ්න විමසා එක්ව ඒවාට විසඳුම් සොයා ගැනීමට උත්සාහ කළ යුතු වේ. සාමූහික ජනාවාස වැනි ක්ෂේත්‍රයන්හි නිරත අයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීට සඳහා ඇති පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් නව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කැප වන අතර පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරීන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය අතර ද්වි–මාර්ග අදහස් හුවමාරුවක් එහිදී සිදු වනු ඇත. මේ අනුව ආයතනයේ පර්යේෂණ හා අභ්‍යාස රටාව, ක්ෂේත්‍රයේදී හමු වන ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා යොමු කෙරේ.

---

# <u>කෘෂිකාර්මික සංවර්ධනය සැලසුම් කිරීම</u>

කෘෂිකර්ම සංවර්ධන අධ්‍යක්ෂ කේ.එච්.ජේ.විජේදාස මහතා විසිනි.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සමුපකාර ජනාවාස භාරව කටයුතු කරන ව්‍යාපාර කළමනාකරුවන් හා මහවැලි සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන නිලධාරීන් උදෙසා පැවැත්වෙන මෙම අභ්‍යාස පාඨමාලාව අතිශයින් වැදගත් වේ. ඇතැම්විට මේ නිලධාරීන් වෙත පැවරෙන රාජකාරී කටයුතු, ඔවුන් සපුරාලිය යුතු අරමුණු හා ඔවුන්ගෙන් අපේක්ෂිත සේවය සුළු වශයෙන් වෙනස් වුවද මෙම දේශනයට විෂය වන කරුණු සැමටම පොදු විය යුතුය. මා දක්වන කරුණු අනුසාරයෙන් සාකච්ඡාවක් පවත්වා අප අතර අදහස් හුවමාරුවකට මෙපරිද්දෙන් අවස්ථාවක් ලැබීම මම අගය කරමි.

කෘෂිකාර්මික සංවර්ධනය සැලසුම් කිරීම වැනි සංකීර්ණ විෂයයක් ශ්‍රී ලංකාවේ ප්‍රවර්තන තත්වය කෙරෙහි බලපාන අයුරු සලකන කල්හි ආර්ථික හා කෘෂිකාර්මික සංවර්ධනය වශයෙන් දෙකොටසකට වර්ගීකරණය කිරීම යෝග්‍ය නොවේ. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි ලා කෘෂිකර්මය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර එය දේශීය කෘෂිකර්මය හා වැවිලි කර්මාන්තය වශයෙන් සාමාන්‍යයෙන් කොටස් දෙකකට බෙදිය හැක. ජාතික නිෂ්පාදනයෙන් සියයට 45 ක පමණ ප්‍රමාණයක් කෘෂිකර්මයෙන් උපයා ගනු ලැබෙන අතර වැඩ කරන ජනතාවගෙන් සියයට 50-55 අතර ප්‍රමාණයක් කෙලින්ම කෘෂිකාර්මික මෙහෙයන්හි නියැලී සිටින්නෝ වෙත්. මෙනයින් බලන කල ආර්ථික සංවර්ධනය යනුවෙන් සැලකිය යුතුව ඇත්තේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳවය. කාර්මික හා වාණිජ සංවර්ධනයට අවශ්‍ය භෞතික මෙන්ම ශිල්පීය සම්පත් ද බෙහෙවින් සීමිත හෙයින් ඇතැම්විට තව දශක දෙක තුනක් හෝ ඊටත් වැඩි කලක් යන තෙක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි කෘෂිකර්මයට හිමි ප්‍රමුඛත්වය යටපත් කළ හැකි නොවේ.

කෘෂිකාර්මික හෝ වේවා, කාර්මික හෝ වේවා, වාණිජමය හෝ වේවා සංවර්ධන ක්‍රියා පද්ධතියෙහි ආරම්භක කාර්යය වනුයේ ක්‍රමවත් සැලැස්මක් සම්පාදනය කිරීමයි. පස, ජලය ආදී භෞතික සම්පත් මෙන්ම ශිල්ප ඥානය, කුශලතාවය ආදී මානුෂික සම්පත් ද මැනවින් ආයෝජනය කර උපරිම කාර්ය පලය ලබා ගැනීම සඳහා සැලැස්මක් අවශ්‍ය වේ. සැලැස්මක් නොමැති නම් අපේක්ෂිත ඉලක්කයක් හෝ සාක්ෂාත් කර ගත යුතු අරමුණක් පිළිබඳව උපකල්පනය කළ හැකි නොවේ. එක් එක් ආයෝජනය තුළින් ලබන ප්‍රතිපල සැලැස්මක් අනුසාරයෙන් නිර්ණය කළ හැක. එසේම නිෂ්පාදන ව්‍යුහය කෘෂිකර්මාන්ත අංශයන්, කාර්මාන්ත සහ වාණිජමය අංශයන් සම්බන්ධීකරණය කරන පුරුකක් වශයෙන්ද සැලැස්ම වැදගත් ස්ථානයක් ගනී. ආර්ථිකයේ නොයෙකුත් අංශ අතර සමතුලනාත්මක සංවර්ධනයක් ඇති කිරීම අරභයා, ජාතික මට්ටමින් වේවා ප්‍රාදේශීය මට්ටමින් වේවා සැලැස්මක් අවශ්‍ය වන්නේය. ආර්ථිකයෙහි විවිධ අංශ තුළ ගැටළු උද්ගත නොවන පරිදි සංවර්ධනය ලඟා කර ගැනීමේ පරමාර්ථය සඳහා සැලසුම් සකස් කිරීම මෙයින් අදහස් කෙරේ.

සමාජයීය රටාව තුළ විවිධ ජන කොටස් අතර ආර්ථිකමය පරතරයන් ඇති වීමෙන් අවුල් වියවුල් සහිත සාමාජික ගැටළු ඇති වේ. දියුණු කාර්මික පරිසරයක් වටා, ජීවන මට්ටමින් සෑහෙන තත්වයක සිටින ජන කොට්ඨාශ ඒකරාශි වී නාගරික සමාජයක් ඇති වීම හා නො දියුණු ආදායම් මට්ටමකින් යුත් විස්තීරණ ගැමි සමාජයක් සම්ප්‍රදායික ගතානුගතික ව්‍යුහයකට හසුව සිටීම

හේතුකොටගෙන දේශීය අර්ථ ක්‍රමයන්හි සමතුලිත බවක් ඇති නොවිනි. මෙය අප්‍රසන්න සාමාජික ගැටළු ඇති කරලීමට සමත් පදනමක් වූවේය. මෙකී ආදායම් පරතරය පියවීම සඳහා පසුගිය කාලය තුළ නොයෙකුත් ක්‍රියා මාර්ගයන් ගනු ලැබීන. ගැමි සමාජයට අයත් බහුතර කොටසක් නියෝජනය කරන ගොවි ජනතාව විසින් උපදවනු ලබන වී, මිරිස් වැනි භෝග සඳහා වැඩි මිලක් රජයෙන් ගෙවීම, ඇතැම් භාණ්ඩ සඳහා මිල පාලනය ඉවත් කර නිදහස් වෙළඳ පොළේ මිල උච්ඡාවචනයන්ට හසු වීමට ඉඩ හැරීම වැනි ආර්ථික ශිල්ප ක්‍රම යටතේ ගොවි ජනතාව වෙත ආදායම් ගලා ඒමට මාර්ග සලස්වන ලදී. රජය විසින් මෙවැනි පියවර නො ගන්නා ලද නම් ආදායම් පරතරය තව තවත් වැඩි වීමේ නැඹුරුතාවය ඇති වන්නට තිබුනි. මෙම පරතරය පියවා, හුදෙක්ම කවර විදියක හෝ රැකියාවක් අපේක්ෂාවෙන් නගරයට සංක්‍රමණය වීමට ගැමි ජනතාව දක්වන ප්‍රවණතාවය ඉවත් කිරීමට නම් සවිමත් ආර්ථිකමය පදනමක්, සැලසුම්ගත ක්‍රියා මාර්ගයකින් ගැමි සමාජය තුළ ඉදි කළ යුතු වන්නේය.

විශාල මූලධන ආයෝජනයක් නොමැතිව තරුණ ශ්‍රම සම්පත තුලින් පලදායිතාවය වැඩි කර ගැනීමේ පරමාර්ථය සපුරාලීම සඳහා මැතදී පිහිටුවන ලද සමුපකාර ගම්මාන ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වැදගත් අංගයක් බවට පත්ව ඇත. රජය, නිශ්චිත ප්‍රතිපත්තියක් වශයෙන් සමුපකාර ගම්මානයන්හි ආරම්භක කාර්යයන් සඳහා නියමිත මුදල් ප්‍රමාණයක් වෙන් කරයි. මෙසේ ලැබෙන මූල්‍ය සම්පත් මෙන්ම ඉඩම් වැනි භෞතික සම්පත් ආයෝජනය සඳහා සැලසුමක් පිළියෙල කර ගත යුතු වේ. එම සැලසුම මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ඉලක්ක, අවසානයේ ලබන කාර්ය පලය මෙන්ම අවසාන වශයෙන් ලැබෙන ප්‍රතිපලයෙහි ඌණතාවයක් තිබේ නම් එම අඩුපාඩු සපුරා ගැනීම සඳහා අවශ්‍ය උපක්‍රම ආදිය පිළිබඳව සැලකිලිමත් වීම සංවර්ධන ක්‍රියා මාර්ගයන්හි වැදගත් කරුණු වේ. කවර මට්ටමක හෝ සැලසුමක මූලික අංග හතරක් පුළුල් වශයෙන් දැක්විය හැක. රජයේ පස් අවුරුදු සැලැස්ම අනුසාරයෙන් මෙම කරුණු පැහැදිලි කර ගත හැක.

I. රාජ්‍ය ප්‍රතිපත්ති – කිසියම් සංවර්ධන වැඩ පිළිවෙලක් සඳහා මූලික වශයෙන් රජය අනුගමනය කරන ප්‍රතිපත්ති. මෙය සැලැස්මක පදනම වන්නේය.
II. අරමුණු – සැලැස්ම ඉදිරිපත් කරන්නේ කවර පරමාර්ථයක් උදෙසා ද යන්න මෙයින් පැහැදිලි කෙරේ.
III. ප්‍රමුඛත්ව – සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කවර කරුණුවලට මුල් තැනක් දිය යුතුද යන බව ප්‍රමුඛත්ව අනුව නිගමනය කරනු ලැබේ.
IV. ඉලක්ක – සැලැස්මෙන් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිපල.

මේ ආකාරයෙන්ම විවිධ සැලසුම් විවිධ මට්ටමින් පිළියෙල කෙරේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල වැනි කෙටිකාලීන සැලසුමක් වශයෙන් සැලකිය හැක. බොහෝ රටවල දක්නට ලැබෙන මධ්‍යකාලීන සැලසුම්, විශේෂයෙන් පස් අවුරුදු සැලසුම් සහ ඇතැම්විට දශකයක් පමණ කාලසීමාවක් සඳහා අදහස් කැරෙන දීර්ඝ කාලීන සැලසුම් ජාතික මට්ටමින්, සකස් කරනු ලැබේ. මේ හැරුණුවිට ප්‍රාදේශික සහ ගම් මට්ටමේ සැලසුම් ද සකස් කර ගනු ලැබේ.

කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙල යටතේ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සැලසුම් ගම් මට්ටමින් පිළියෙල කිරීමට අපේක්ෂා කරන ලදී. එහෙත් නව කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ ගොවි කාරක සභා ප්‍රතිසංවිධානය කිරීමෙහි ලා තරමක ප්‍රමාදයක් පවතින හෙයින්

ගම් මට්ටමේ සැලැස්ම පිළියෙල කිරීම තරමක් ප්‍රමාද කිරීමට සිදු වී ඇත. කලින් ප්‍රාදේශීය ආදායම් නිලධාරී ප්‍රමුඛ ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටුව විසින් ඉටු කරන ලද සැළසුම් සැකස්ම, අලුතින් පිහිටුවන ලද එලදා වර්ධන කමිටු මාර්ගයෙන් ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලැබේ. මෙවැනි ප්‍රාදේශීය සැලසුමකදී සමූපකාර ගම්මානය අදාළ වන්නේ කෙලෙසද? පලදායීතාවය වැඩි කිරීමේ පරමාර්ථය සපුරාලීම මුඛ්‍ය ප්‍රතිපත්තිය කොට ගත් සමූපකාර ගම්මාන ද පොදුවේ දේශීය කෘෂිකාර්මික අංශයට අයත් වේ. සමූපකාර ගම්මානයක විවිධ බෝග වගා කිරීම, කිරි නිෂ්පාදනය, වැනි කාර්යයක් කරගෙන යනු ලැබේ නම් එවිට එම කාර්යය තත් ප්‍රදේශයේ එලදා වර්ධන කමිටු සැලැස්මට අයත් වන්නේය. පොදුවේ ගත් කල සමූපකාර ගම්මානවල අරමුණු හා ඉලක්ක එලදා වර්ධන කමිටු වලින් අපේක්ෂිත කාර්යයන් හා සැසඳේ.

සමූපකාර ගම්මානයක් පිළිබඳව සලකන කල්හි ද ආරම්භක අවදියෙහි නොයෙකුත් ගැටළු ඇති වීමට ඉඩ ඇත. ගම්මානයට අයත් ඉඩම් එක්වරට උපයෝගී කර ගත නොහැකි බව, ගම්මානයෙන් ඉවත් වී යාමට ඉඩ ඇති සාමාජිකයින් ආදිය පිළිබඳව උපකල්පනය කර එම සංඛ්‍යා ලේඛන ඇසුරින් මූල් පදනම වශයෙන් සැලැස්මක් සාදා ගැනීමට පිළිවන. මේ අනුව කිසියම් නිශ්චිත කාලයකට අවශ්‍ය වන ආයෝජන දැන ගත හැකි වේ. සමූපකාර ගම්මානයක බෝග රටාව පිළිබඳව නිගමනය කිරීමේදී විදේශීය විනිමය හිඟය හා දේශීය අවශ්‍යතාවයන් ආදිය පිළිබඳව සැලකිලිමත් වී ප්‍රමුඛත්ව නිගමනය කිරීම ඉතාමත් වැදගත් වන්නේය.

ශ්‍රී ලංකාවෙහි පොදු ජාතික අරමුණ වී ඇත්තේ හැම බිම් අඟලකින්ම උපරිම නිෂ්පාදන මට්ටමක් ළඟා කර ගැනීමයි. අපට හිමි අක්කර 160 ලක්ෂයක් සඳහා දැනටමත් 130 ලක්ෂයක ජනතාව ව්‍යාප්තව සිටින හෙයින් එක අයෙකුට පොදුවේ අක්කරයකට වැඩි බිම් ප්‍රමාණයක් බෙදී නොයයි. අනෙක් අතට උග්‍ර රැකීරක්ෂා ප්‍රශ්නය දැවෙන තත්වයකට පත්ව ඇත. සමූපකාර ගම්මානයක සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී මෙම කරුණු ද අවධාරනයෙන්ම සිහිපත් කළ යුතුය.

මෙතෙක් කල් උස් පහත් වශයෙන් කල්පිත සමාජ මට්ටම් දෙකක පැවැත්මට උපස්ථම්භක වූ ගම හා නගරය අතර ඇති ආදායම් පරතරය දැන් සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතී. ඌණ සංවර්ධනයට භාජන වෙමින් පැවතුන හුළිස් හා ඕනෑතරම්න් ලබා ගත හැකි ශ්‍රමය සම්බන්ධීකරණයෙන් හොඳ ආදායමක් ලබා නාගරික සමාජයීය තත්වයන් අභිබවා සිටීමට පිළිවන් බව ගොවි ජනතාව වටහාගෙන ඇත. බලාපොරොත්තුවෙන් පිරුණු මෙම පණිවිඩය සමූපකාර ගම්මානයන්හි තරුණයින්ගේ සිත් තුළ නිරතුරුවම ධාරණය කළ යුතු වේ. මෙම ගම්මානයන්හි එක් අරමුණක් වනුයේ ගම් 'පෙදෙස්වල ආදායම් මට්ටම් තර කිරීමෙන් ජනතාව ගමේම රඳවා ගැනීමයි. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා සැලසුම්කරණය අත්‍යවශ්‍ය වන්නේය.

සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේදී නොයෙකුත් ගැටළු බලාපොරොත්තු විය යුතු වේ. ඇතැම්විට නොයෙකුත් හේතූන් නිසා අපේක්ෂිත ඉලක්ක, ආයෝජන යනාදිය වෙනස් කළ යුතු අවස්ථා එළඹීමට පිළිවන. මෙවැනි තත්වයකදී සැළසුම් වෙනස් කිරීමට කිසිසේත් පසුබට විය යුතු නොවේ. වඩාත්ම වැදගත් වනුයේ වරින් වර කාලානුරූපව සැලැස්ම සමාලෝචනය කිරීමයි.

## සමූපකාර ගම්මාන වලින් ලද අත්දැකීම්

කෘෂිකර්ම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ නන්ද අබේවික්‍රම මහතා විසිනි

සමූපකාර ගම්මාන හෝ තරුණ ජනාවාස ව්‍යාපාරයක් භාරව කටයුතු කරන කළමනාකරුවන් අනිකුත් කෘෂිකාර්මික ව්‍යාපාර පිළිබඳව ද අවබෝධයක් ලබා ගත යුතුය. මෙම සෑම ව්‍යාපාරයකින්ම අපේක්ෂා කෙරෙන අවසාන පරමාර්ථය නිෂ්පාදනය වැඩි කිරීම හෙයින් එක් එක් ව්‍යාපාරයන්හී අරමුණු පිළිබඳව ගැටීමක් ඇති විය යුතු නොවේ. මෙම නව ව්‍යාපාර පිළිබඳව තවම සාරානුකූල අධ්‍යයනයක් කර නැත. ගොවිකටයුතු පරීයේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් තරුණ ජනාවාස පිළිබඳව පරීයේෂණ අධ්‍යයනයක් සිදු කර එහි වාර්තාව ඇත් නිකුත් කර ඇත. සාමාන්‍ය වශයෙන් සළකන කල කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමූපකාර ගම්මාන වැඩ පිළිවෙලේ මූලික පරමාර්ථය වන්නේ විශේෂයෙන් තරුණ ගොවි ජනතාව වෙත සංවර්ධන සැලසුම් හා සංවිධාන කාර්යයන් පැවරීමයි.

මෙම වැඩ සටහන ආරම්භ කරන ලද්දේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක කමිටුවක නිර්දේශය අනුවය. මෙවැනි මාදිලියේ ව්‍යාපාර පිළිබඳව සළකන කල්හි කලින් ආරම්භ කරන ලද විශාල ගොවි ජනපද ව්‍යාපාර සඳහා ආයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය අනුව ඒවායින් ලැබුනු නිෂ්පාදනයත්, රැකියා අවස්ථාත් ප්‍රමාණවත් නොවන්නේ යයි සළකනු ලැබිනි. එසේම සිය ගම් ප්‍රදේශයෙන් දුරස්තර ප්‍රදේශවල ජනතාව පදිංචි කරවීම නිසා ගොවි ජනපද ව්‍යාපාරයන් තුළ නොයෙකුත් ප්‍රශ්න උද්ගත විනි. මේ කරුණු සළකා බලා ප්‍රදේශයේ ජනතාව එම ප්‍රදේශයේම සංවර්ධනය සඳහා සහභාගී කරවා ගැනීමේ පරමාර්ථය ඇතිව සමූපකාර ගම්මාන වැඩ පිළිවෙල දියත් කරනලදී. මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතුව ඇත්තේ අවසානයේදී මෙම වැඩ පිළිවෙලට සහභාගී වන අයටම ඒවායේ සම්පූර්ණ වගකීම පවරනු ලැබීමයි.

දැනට සමූපකාර ගම්මාන 60 ක් පමණ ක්‍රියාත්මකව පවතී. මෙතරම් විශාල ප්‍රමාණයක සමූපකාර ගම්මාන ක්‍රියාත්මක වෙතැයි කලින් අදහස් නො කරනු ලැබිනි. එක් එක් ප්‍රදේශ වලින් ලැබුණු ඉල්ලීම් අනුව මෙම ව්‍යාපාර දැන් නොයෙක් ප්‍රදේශවල ආරම්භ කර ඇත.

සමූපකාර ගම්මානයන්හී මූලික ලක්ෂණය ඉඩම් පිළිබඳව ඇති පොදු අයිතිය පමණක් නොවේ. අධික ජනගහණයත්, සේවා වියුක්ති ප්‍රමාණයත් උග්‍රව පවතින තෙත් කලාපයේ ප්‍රදේශවල මෙම ගම්මාන පිහිටුවීමට අදහස් කරන ලද්දේ ඒ සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන ප්‍රාග්ධන ආයෝජනය ද බෙහෙවින් අඩු හෙයිනි. වියළි කලාපයේ නම් මෙවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා විශාල වශයෙන් මූලධන අවශ්‍ය වන්නේය. එසේම සංවර්ධන කාලසීමාව ද බෙහෙවින් දීර්ඝ වන්නේය. තෙත් කලාපයේ පවතින ඉඩම් හිඟය හේතුකොටගෙන බොහෝවිට උපරිම ප්‍රයෝජනය ගෙන නොදෙන, අත්හැර දැමූ ඉඩම් ලබාගෙන මෙම ව්‍යාපාරය ආරම්භ කරන ලදී. මේ සඳහා මූලික වශයෙන් රජයෙන් දරන ලද වියදම් ගොවි ජනපදවල වියදමට වැඩියෙන් අතිශයින් අඩු වන්නේය. රැකියා ප්‍රශ්නය විසඳීමත්, අඩු වියදමකින් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමත් මෙම ව්‍යාපාර වලින් අරමුණු කරන ලදී.

සමුපකාර ගම්මාන සඳහා මුදල් සපයනු ලබන්නේ ද ගොවි ජනපද ව්‍යාපාරවලට මෙන් නොව වෙනස් ක්‍රියා මාර්ගයක් අනුවය. ගොවි ජනපද ව්‍යාපාරවලදී බොහෝවිට කරන ලද වැඩ කොටස අනුව දිසාපති තුමා මගින් කෙලින්ම මුදල් ගෙවන ලදී. එහෙත් මෙම ව්‍යාපාරවලට මුදල් සපයනු ලබන්නේ මහජන බැංකු මාර්ගයෙනි. මුළු ව්‍යාපාරයම සමස්තයක් හැටියට ගෙන අවශ්‍ය මූලධනය බැංකු මගින් ලබා දීමෙන් අභියම් අයුරින් අදහස් කරනු ලැබෙනුයේ ව්‍යාපාරයට සහභාගී වන සාමාජිකයින්ට මුදල් කටයුතු පිළිබඳ කිසියම් ව්‍යාපාරික අවබෝධයක් ලබා දීමයි.

සමුපකාර ගම්මානයන්හි පාලනය අවසාන වශයෙන් එහි සාමාජිකයින් වෙත පැවරීම අපේක්ෂා කෙරේ. පළමු කොටම එක් එක් ව්‍යාපාරයට සහභාගී වන අය සමුපකාර සමිතියක් වශයෙන් සකස් විය යුතුය. මුල් වර්ෂයේදී රජයේ නිලධාරියෙක් මෙම සමුපකාර සමිතියේ සභාපති වන අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලයට යටත් පිරිසෙයින් සාමාජිකයින් තුන් දෙනෙකුවත් ඇතුළත් වන්නේය. දෙවන අවුරුද්ද වනවිට ක්‍රම ක්‍රමයෙන් රජයේ නිලධාරී සංඛ්‍යාව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අඩු කර සාමාජික සහභාගිත්වය වැඩි කරනු ලැබේ. ගොවි ජනපදවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය බොහෝවිට ජනපද නිලධාරීන් මත පැවරුනි. එහෙත් සමුපකාර ගම්මානයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය රඳා පවතින්නේ එය භාරව කටයුතු කරන ව්‍යාපාර කළමනාකරු මත නොව එහි සේවය කරන සාමාජිකයින් මතය. එසේ වනුයේ ව්‍යාපාර කළමනාකරුට සේවය කිරීමට සිදු වන්නේ ව්‍යාපාරයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ගුරුහරුකම් ඇතිව නිසයි.

ව්‍යාපාර කළමනාකරුවෙකු සතු වගකීම් පිළිබඳව සළකන කල්හි සමුපකාර ගම්මානයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අතිශයින් වැදගත් වන්නේය. ජනපද ව්‍යාපාරයකට වඩා වෙනස් ආකල්පයකින් මෙහිදී වැඩ කළ යුතු වේ. ස්වාධීනව නිගමනයන්ට එළඹීමට ව්‍යාපාර කළමනාකරුවන්ට මෙහිදී හැකියාවක් නො ලැබුනත් අධ්‍යක්ෂක මණ්ඩලය නිවැරදි ක්‍රියා මාර්ගයකට යොමු කිරීම ඔහු සතු වැදගත් වගකීමකි. ප්‍රතිපත්ති හා මුදල් පාලනය පිළිබඳව එකඟත්වයකට පැමිණිය නොහැකි නම් උසස් නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගැනීමට ඔහුට පිළිවන. ඇතැම්විට ව්‍යාපාරයේ සාමාජිකයින් හට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට තනිව තීරණයකට එළඹිය නොහැකි වන්නේ නම් පමණක් උපදෙස් විමසීමට ව්‍යාපාර කළමනාකරුට අවස්ථාවක් ඇත.

මෙම ව්‍යාපාර වලින් අනිවාර්යයෙන්ම අදහස් කරනු ලැබෙනුයේ කෘෂිකාර්මික සංවර්ධනයක් හෙයින් කෘෂිකර්මය පිළිබඳව සෑහෙන අවබෝධයක් ව්‍යාපාර කළමනාකරුවන්ට තිබිය යුතුය. සමුපකාර ගම්මානයට හසු වූ ප්‍රදේශයේ හැකියාවන් පිළිබඳව අධ්‍යයනය කර ශක්‍යතා වාර්තාවන් පිළියෙල කිරීමට ව්‍යාපාර කළමනාකරු උත්සුක විය යුතුය. මෙම ව්‍යාපාර සඳහා රජයේ අනිකුත් සහනාධාර යටතේ ආධාර ලබා ගැනීමට පිළිවන. ඉඩමෙහි අයිතිය සමුපකාර සමිතියට පැවරෙන අතර රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාරයේ අනාගතය හැසුරුවීමේ වගකීම සමුපකාර සමිතියට පැවරේ.

මෙතෙක් කල් ලැබුණු අත්දැකීම් අනුව ඇතැම් ව්‍යාපාර සාර්ථක වී පසුව අසාර්ථක වීමට නොයෙකුත් හේතු තිබුනි. සාමාජික ශ්‍රමය නොයොදා කුලී ශ්‍රමිකයන් ලවා වැඩ කරවා ගැනීමට යාම හේතුකොටගෙන ඇතැම් ව්‍යාපාරයක් මුදල් අතින් අසතුටුදායක තත්වයකට පත් විනි. මෙසේ වූයේ සමුපකාර ගම්මාන වැඩ සටහනේ මූලික ප්‍රතිපත්ති නොසලකා හැරීමෙනි. තවත් සමුපකාර

ගම්මානයක වී අස්වැන්න සාමාජිකත්වය විසින් ඉල්ලා සිටින ලදී. එහෙත් රජයේ ප්‍රතිපත්ති අනුව මෙම වී, වී අලෙවි මණ්ඩලයට විකිණිය යුතු යයි ව්‍යාපාර කළමනාකරු බල කළේය. මෙවැනි තත්වයකදී සාමාජිකයින් අධෛර්යයට පත්වීම තේරුම් ගත යුතුය. කෙසේ වෙතත් වී නොව මිරිස් වැනි වෙනත් භෝග රජයටම විකිණීම අවශ්‍ය නොවේ. වැඩි මුදලක් ගත හැකි නම් බාහිර ගැණුම් කරුවන්ට මෙම භෝග විකිණීමට පුළුවන.

සමූපකාර ගම්මාන නව ව්‍යාපාරයක් වන හෙයින් මූලික වශයෙන් පිළියෙල කරනු ලබන සැලසුම අතිශයින් වැදගත් වන්නේය. මෙවැනි ව්‍යාපාරයක් සැකසීමේදී ඒ පිළිබඳව අත්දැකීම් හා අවබෝධයක් ඇති අය සමඟ කරුණු විමසා කටයුතු කිරීම වැදගත් යයි සැළකිය හැකිය. එසේම අවසාන වශයෙන් ලාභ ලැබෙතැයි අපේක්ෂා කරන නොයෙකුත් අත්හදා බැලීමේ කටයුතු මුලින්ම කිරීමටද මෙවැනි ව්‍යාපාර උත්සුක විය යුතු නොවේ. යටත් පිරිසෙයින් පළමුවෙනි අවුරුදු දෙක තුළ සෑහෙන ආදායමක් ලබා ව්‍යාපාරය සාර්ථකත්වයකට පත් වූ පසු එවැනි අත්හදා බැලීම් කිරීමට පුළුවන. ව්‍යාපාරයේ කටයුතු කරගෙන යාමේදී නොයෙක් විට අවශ්‍ය වන පරිදි මූලික සැලසුම වෙනස් කිරීමට කිසිසේත් පසුබට විය යුතු නොවේ. අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සැලසුම වරින් වර සමාලෝචනය කළයුතු වේ. කාර්ය සාධක අයුරින් එය පිළියෙල කර ගැනීමට ව්‍යාපාර කළමනාකරුවන් සාමාජිකයින්ද සමඟ කටයුතු කිරීම අත්‍යවශ්‍යය.

---

# කෘෂිකාර්මික ණය

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී පියදාස සේනානායක මහතා විසිනි.

ණයවලට ඇති අවශ්‍යතාවය:

වැඩියෙන් නිෂ්පාදනය කිරීම සඳහා ගොවීන් වැඩි දියුණු කළ බීජ වර්ග, පෝර, කෘමි නාශක හා ගොවි උපකරණ සඳහා වැඩියෙන් වියදම් කළ යුතුය. මෙම වියදම් සඳහා මුදල් එක්කෝ තමන්ගේ ඉතිරි කිරීම් වලින්, එසේ නැතහොත් තිබෙන වත්කම් විකිණීමෙන්, බදු දීමෙන් හෝ උගසට තැබීමෙන්, එසේත් නැතහොත් කවරෙකුගෙන් හෝ ණයට ගැනීමෙන් සපයා ගත යුතුය. මෙහිදී විවිධ හේතූන් නිසා එනම් දේශීය කෘෂිකර්ම අංශයේ පහත් ඵලදා මට්ටම්, ඒ පහත් ආදායම් මට්ටම සහ පහත් ජීවන තත්වය, ඉඩම් භුක්තිය සම්බන්ධව පවතින ගැටළු, වේගයෙන් ඉහළ යන ජීවන වියදම, විශේෂයෙන් කෘෂිකාර්මික ආධානයන්ගේ එනම් නිෂ්පාදන සාධක (යෙදවුම්වල) මිළ යහළ යාම, මේ සියල්ලටමත් වඩා ඉහලින් තම භෝගවල අස්වනු පිළිබඳව ඇති අවිනිශ්චිතතාව (කාලගුණ හේතූ නිසා) ආදී කරුණු නිසා ගොවීන්ගේ ඉතිරි කිරීම් මට්ටමත්, ඔවුන් සතු වත්කමුත්, ඉතා අඩු නිසා දියුණු ක්‍රම ශිල්ප භාවිතා කිරීමට ඔවුන් උනන්දු කරවීම පිණිස ණය මුදල් සපයන කාර්යක්ෂම ආයතන බිහි වීම ඉතා වැදගත් කාරණයක් ලෙස සඳහන් කළ හැකිය.

මේ ආකාරයට නිෂ්පාදිතය වැඩි කිරීම පිණිස ගොවීන්ට වැඩියෙන් ණය පහසුකම් අවශ්‍ය බව අපට කිව හැකියි.

ගොවීන්ට සපයනු ලබන නිෂ්පාදන ණය කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍යම වූ සාධකයක් නොවූවත් එමගින් කෘෂිකාර්මික සංවර්ධනය වේගවත් කළ හැකි බව කෘෂි-අර්ථ ශාස්ත්‍රඥයන්ගේ නිගමනයයි.

ණය වර්ග:

ගොවීන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් විවිධාකාර ලෙස වර්ග කරනු ලැබේ. විශේෂයෙන් මෙම වර්ග කිරීම් සඳහා යොදා ගනු ලබන ප්‍රධාන කාරණා දෙකක් ඇත. එනම්, ණය අවශ්‍ය වන්නේ කුමන කාරණයක් සඳහා ද යන්න සහ ණය අවශ්‍ය වන්නේ කොපමණ කාලයක් සඳහා ද යන්නත්ය.

(අ) කෘෂි නිෂ්පාදනය හා සම්බන්ධ අරමුණු සඳහා:

I. ස්ථාවර (දීර්ඝ කාලීන) ප්‍රාග්ධනය – ඉඩම් මිළදී ගැනීම, ඒවා එලි පෙහෙලි කිරීම හා වැඩි දියුණු කිරීම දීර්ඝ කාලීන යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම ආදිය, ගොඩනැගිලි ඉදි කිරීම.

II. මධ්‍ය කාලීන ප්‍රාග්ධනය (අර්ධ ස්ථාවර ප්‍රාග්ධනය) –උපකරණ, සතුන්, යන්ත්‍ර සූත්‍ර (ස්ප්‍රේ යන්ත්‍ර වැනි) මිලදී ගැනීම.

III. කාරක (කෙටි කාලීන) ප්‍රාග්ධනය – බීජ, පෝර, කෘමි නාශක, කම්කරු වැටුප්, පවුලේ වියදම් සහ අලෙවිය සඳහා වන වියදම් ආදිය. (වියදම් බණ්ඩවත් – ආදායම් අඛණ්ඩවත් ලැබීම.)

(ආ) කෘෂිකර්මය හා සම්බන්ධතාවක් නැති එහෙත් නිෂ්පාදන කටයුතු සඳහා වන ණය:

ගොවීන්ගේ අතිරේක රැකියාවන් සඳහා (ගෘහ කර්මාන්ත) අවශ්‍ය වන ස්ථාවර, මධ්‍ය කාලීන හා කෙටිකාලීන ණය.

(ඉ) පාරිභෝගික කටයුතු සඳහා වන ණය:

I. අත්‍යවශ්‍ය කටයුතු - ආහාර, ඇඳුම්, නිවාස.

II. අර්ධ අත්‍යවශ්‍ය - දරුවන්ගේ අධ්‍යාපනය, වෛද්‍ය පහසුකම්, දිගුකාලීන පාරිභෝජන භාණ්ඩ මිලට ගැනීම.

III. අත්‍යවශ්‍ය නොවන කටයුතු - උත්සව, වන්දනා ගමන්, ඛවර්ණාභරණ මිලයට ගැනීමාදිය.

මේ හැර තවත් විදියේ වර්ග කිරීමක් නම්, එම ණය වලින් ලැබෙන ප්‍රතිඵල අනුව ඒවා වර්ග කිරීමයි. ඒ අනුව ගතික හා ස්ථිතික වශයෙන් ණය කොටස් දෙකකට බෙදනු ලැබේ. ගතික ණය වශයෙන් සැලකෙන්නේ අර්ථ ක්‍රමයට අමතර ආදායමක් හා අලුත් අය වස්තුවක් එකතු කිරීමට සමත් වන්නාවූ ණයයි. උදාහරණයක් වශයෙන් ගොහොරු ඉඩමක වතුර බැස්සුවොත් යම් යම් වගාවන් කළ හැකි බවට ගොවියෙකුට පෙනී යා හැකිය. ගොවියා ණයක් ලබාගෙන එහි වතුර බස්සවා අලුත් වගාවක් කොට අස්වැන්නක් ද ලබා ගන්නා යයි සිතමු. එයින් ඔහු ලබා ගත් ආදායම අලුතු ආදායමකි. එම ඉඩම අලුත් ආදායමක් ලබා දෙන අය වස්තුවකි. මේ මගින් ලැබූ ආදායමින් ඔහුට ගත් ණය පොලියත් සමඟ ගෙවීමට හැකියාවක් ලැබේ. ගතික ණය යයි හඳුන්වන්නේ මෙවැනි වර්ගයේ ණය වලටයි.

අනෙක් වර්ගය ස්ථිතික ණය වේ. ස්ථිතික ණය යනු තිබෙන තත්වය ආරක්ෂා කර ගැනීම පිණිස ගනු ලබන ණයකි. එයින් අලුත් ආදායමක් නූපදින අතර අර්ථ ක්‍රමයට අලුත් අයවස්තුවක් ද එකතු නොවේ. එහෙයින් ඒ ණය මුදල වැය කළාට පසුව ගෙවා දැමීමට හැකියාවක් ඇති වන්නේද නැත. උදාහරණයක් වශයෙන් ගොවියෙකු අසනීපයක් සෑදී පාරිභෝජනය සඳහා ණයක් ගත්තොත් ඒ ණයෙන් පිටත් වූ පසු ඒ ණය ගෙවා දැමීමට අපහසු තත්වයක් ඇති වේ. ආපදා ගෙවිය නොහැකි වූ විට ඔහු සදාකාලික ණය ගැතියෙක් වේ. ඊළඟ කන්නයේ ගොවිතැන් ගෙන යාමට ඔහුට අළුත් ණයක් උවමනා වේ. මේ ආකාරයට ඔහුට ණයෙන් ගොඩ ඒමට අවස්ථාවක් නො ලැබේ. එමනිසා මේ ආකාරයේ ණය ස්ථිතික ණය ලෙස හඳුන්වනු ලැබේ.

<u>ණය සැපයුම</u>:

ගොවීන්ට අවශ්‍ය මේ විවිධාකාර ණය ලබා ගැනීමට ඇති මාර්ග මූලික වශයෙන් ආයතනික හා ආයතනික නොවන වශයෙන් වර්ග කළ හැකිය. ආයතනික අංශය වශයෙන් රජය, වාණිජ බැංකු, සමූපකාර සමිති හා ග්‍රාමීය බැංකු සැලකිය හැකි අතර ආයතනික නොවන අංශය ලෙස උගස් බඩු ගන්නන්, වෘත්තීය ණය දෙන්නන්, ගමේ කුඩා තඩ කාරයින් (වෙළඳුන්) හා ඥාතීන් සහ හිතවතුන් සැලකිය හැකිය. කෘෂි කාර්මික ණය පිළිබඳව කරන ලද සමීක්ෂණ වලින් පැහැදිලි වී ඇති වැදගත් කාරණයක් නම් ගොවීන්ගෙන් වැඩි දෙනෙක් තවමත් ආයතනික නොවන අංශ වලින් ණය ලබා ගැනීම කෙරෙහි උනන්දුවක් දක්වන බවය. සාමාන්‍යයෙන් ආයතනික අංශයෙන් ලබා ගන්නා ණය මුළු ණය වලින් 10% ක් පමණ වන අතර ආයතනික නොවන අංශයෙන් ඉතිරි ප්‍රමාණය ලබා ගත හැකිය.

ආයතනික ණයට ගෙවිය යුතු පොලිය අඩුය. ආයතනික නොවන අංශයට ගෙවිය යුතු පොලිය වැඩිය. බොහෝවිට ආයතනික නොවන අංශයේ ණයවලට ඇත්තේ සැඟවුනු පොලී ප්‍රමාණයකි. උදාහරණයක් වශයෙන් කඩ කාරයන්ගෙන් ණය ගන්නේ ණයට බඩු ගැනීම මගිනි. මේ ගොවීන් තමන් නිපදවන භාණ්ඩ කඩ කාරයන්ට විකිණිය යුතුය. ඒවා ඔහු ගන්නේ අඩු මිළටය. ඔහු ඒවා විකුණන විට වැඩි මිළකට විකුණයි. එතන සැඟවුනු විශාල පොලියක් ඇත. උගස් කිරීමේ ක්‍රමයත් මෙබඳුය. ගොවියෙකු හදිසියෙන් ණයක් ඕනෑ වූ විට තම ඉඩම කෙනෙකුට උගස් තියයි. උගස් ගත් පුද්ගලයාට පොලිය වෙනුවට ඉඩම භුක්ති විඳිය හැක. ඒ අනුව ගොවියා සතු එකම අය වස්තුව වෙන කෙනෙකුට හිමි වී ගොවියාට ආදායම් මාර්ගයක් නැති වී යයි. ඒ නිසා ගොවියාට එය බේරා ගැනීමට ඇති මාර්ගය ඇහිරේ. එහි අවසාන ප්‍රතිඵලය ණය මුදල දුන් තැනැත්තාටම ඉඩම හිමි වීමයි. මෙවැනි පීඩාකාරී පොලී ප්‍රමාණයක් තිබීම නිසා සුළු ගොවි පංතියෙන් විශාල ආදායමක් තවත් පංතියකට සංක්‍රාම වේ. ඒ නිසා ගැමි ආර්ථික පුළුල් වීමක් සිදු නොවන බව පෙනේ. මේ ආකාරයට ආයතනික අංශයෙන් ණය නොගෙන පුද්ගලික අංශ වලින් ණය ගැනීමට ගොවියා පෙළෙඹෙන්නේ මන්ද යන්න පරීක්ෂා කර බැලීම ඉතාම වැදගත් වේ. අනෙක් කාරණය ආයතනික අංශ වලින් ගන්නා ණයට වඩා පුද්ගලික අංශයෙන් ගන්නා ණය ආපසු ගෙවා දැමීමට ගොවීන් වැඩි උනන්දුවක් දැක්වීමයි. බොහෝ දෙනෙක් කියන හැටියට කල් පසු වූ ණය තිබීම ආයතනික අංශයෙන් ණය ලබා නො ගැනීමට ප්‍රධාන හේතුවයි. එහෙත් සමූපකාර සමිතිවල ලේඛන පරීක්ෂා කර බැලූවොත් කල් පසු වූ ණය තිබෙන අයටත් ණය ලබා දීමට රජය පසුගිය වතාවේ ගත් තීරණය යටතේ වුවත් ණය ලබා නොගත් අයගෙන් කල් පසු වූ ණය තිබෙන අය උන්නේ ඉතා සුළු ප්‍රමාණයක් බව පෙනී යා හැක. අළුත් ක්‍රම භාවිතා කරන්නැයි කියන විට මුදල් නැතැයි කියන ගොවියා ආයතනික අංශයෙන් අඩු පොලියට මුදල් දෙන විට ඒ මුදල් ප්‍රයෝජනයට නො ගන්නේ මන්ද යන ප්‍රශ්නය මේ නිසා වැදගත් වේ.

I. රජයේ හෝ සමූපකාර වැනි විවිධ ආයතන වලින් සපයන ණය පිළිබඳ දැනුමක් හෝ ඒ ණය යොදවන ආකාරය පිළිබඳ දැනුමක් නොතිබීම;

II. සමූපකාර හා වෙනත් ආයතන වලින් ණය සැපයීමේදී අනුගමනය කරන පිළිවෙත් ඉතා දීර්ඝ කාලයක් ගත වෙන කොල රාශියක් පිරවිය යුතු දේවල් වීම;

III. බොහෝ ගොවීන් සමූපකාරවල සාමාජිකත්වය ලබා නො තිබීම;

IV. ඉඩම් කට්ටි කුඩා වීම – අක්කර භායකට අඩු නම් ණය ලබා ගැනීමට පෙළඹීමක් ඇති නොවිය හැක;

V. මිරිස් වැනි වෙනත් භෝග වලින් ලැබෙන ආදායම හා තවත් නොයෙකුත් ආර්ථික හා සමාජීය කරුණු මීට හේතු විය හැකිය. මහවැලි සංවර්ධන මණ්ඩලය මේ පිළිබඳව අත්හදා බැලීමක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කත්තරගම නැමැති ප්‍රදේශයේ කර ඇත. එය සාමාන්‍යයෙන් ආයතනික ණය ලබා නො ගන්නා ගමකි. නමුත් මහවැලි සංවර්ධන මණ්ඩලය සමූපකාරයෙන් ණය ලබාගෙන එය ගොවීන් අතරේ බෙදා දෙන ලදී. ගොවීන්ගේ අස්වැන්න බාහිර හේතූන් නිසා එතරම් සාර්ථක නුවුනත් සියළු දෙනාම පාහේ ලබා ගත් ණය ආපසු ගෙවා ඇත. නමුත් එහැනදී එක ප්‍රශ්නයක් මතු වේ. එනම් ගොවීන් ණය ලබා ගැනීමට පෙළඹුනේ ණයවලට අවශ්‍යතාවයක් තිබුණු නිසාමද? එසේ නැතහොත් මහවැලි සංවර්ධන මණ්ඩලය ණය ආපසු එකතු කර නොගනීවි යයි ඔවුන් බලාපොරොත්තු වූ නිසාද? යන්න ආයතනික අංශ ණය සැපයීමෙහි ලා ජනප්‍රිය නොවීමට හේතු රාශියක්ම තිබිය හැක. ඒ නිසා ණය සැපයුම් අංශය ගැන කථා කරනවිට මේ තත්වය පිළිබඳ නියම කරුණු සොයා ගැනීම ඉතා වැදගත් වන්නේ ආයතනික අංශ වලින් ණය ගැනීමට වඩා පීඩාකාරී මාර්ග වලින් ණය ලබා ගැනීමට



2288

ගොවියා පුරුදු වීමෙන් ග්‍රාමීය ආර්ථිකයට අහිතකර ප්‍රතිඵල ඇති වන හෙයිනි.

තවත් ප්‍රශ්නයක් නම් ආයතනික අංශ වලින් වරක් ණය ලබා ගත් පසු ඒ ණය නැවත ආපසු නො ගෙවීමයි. මේ නිසා ඔවුන් සමුපකාරයෙන් නැවත ණය ලබා ගැනීමට නුසුදුස්සන් බවට පත් වේ. ඒ නිසා දියුණු වගා ක්‍රම සඳහා ණය මුදල් ලබා ගැනීමට නැවතත් පෞද්ගලික අංශය වෙත නැඹුරු වන්නට ඔවුන්ට සිදු වේ. මේ පිළිබඳව කරන ලද සමීක්ෂණවලදී ගොවීන් විසින් දෙන ලද පිළිතුරුවලට අනුව ණය ආපසු නො ගෙවීමට හේතු ලෙස නොයෙක් කරුණු දක්වා ඇත. ඒවා අතර අස්වනු පාඩුවීම, පහත් ආදායම, ආපසු ගෙවීමට අදහසක් නැතිකම, රෝගී වීම හෝ මරණය, සමුපකාර නිලධාරීන්ගේ උනන්දුවක් නැතිකම, සමුපකාරවල වංචා, නඩු හබ, උත්සව සඳහා විශාල වියදම් දරන්නට සිදු වීම, ණය ලියා හරිවී යයි කල්පනා කිරීම, සූදුව, සුරාව වැනි වෙනත් දේවලට ලබා ගත් ණය යෙදවීම, ණය රජයෙන් දෙනු ලබන ප්‍රදානයක් යයි සැලකීම, වාරිමාර්ග පහසුකම් හිඟකම් අධික ණය ගැති භාවය දක්වා තිබේ.

මෙම කරුණු වලින් පැහැදිලිව ඉස්මතු වී පෙනෙන කාරණා කිහිපයක් ඇත. අස්වනු පාඩුවීම හා ආදායම අඩු වීම යන කරුණු දෙකම එකකට එකක් සම්බන්ධ වූ ඒවාය. අනෙක් කාරණය නම් ණය එකතු කර ගැනීම පිණිස සමුපකාර නිලධාරීන්ගේ එතරම් උනන්දුවක් නොමැති වීමයි. තුන්වනුව රජයෙන් දෙන ණය පිළිබඳ ගොවීන්ගේ ආකල්පවල ස්වරූපය ද වැදගත් වේ. මහ බැංකුව විසින් කරන ලද සමීක්ෂණයකින් හෙළි වන පරිදි ණය ආපසු නො ගෙවූ ගොවීන්ගෙන් 49% ක්ම ආපසු නො ගෙවීමට හේතුව ලෙස දක්වා ඇත්තේ අස්වනු පාඩුවීම හා අඩු ආදායමක් ලැබීමයි. නමුත් සමහරවිට අස්වනු පාඩුවක් ඇති නොවූ කන්නවලදී පවා ණය ආපසු නො ගෙවන ලද්දේ ඒ නිසා බව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිතටයුතු තත්වය පිළිබඳව කරන ලද සමීක්ෂණයෙන් හෙළි වී ඇත. අනෙක් අතට බැමිණිවත්ත ප්‍රදේශයේදී කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ ණය ආපසු ගෙවා නැති ගොවීන්ගෙන් වැඩි දෙනෙක් ප්‍රදේශයේ සාමාන්‍ය ගොවීන්ට වඩා ආර්ථික හා සමාජමය අතින් උසස් තත්වයක පසු වන අය බවයි.

ණය දෙන්නේ කුමක් සඳහා ද යන්න පිළිබඳව ගොවීන්ට අවබෝධයක් නැති කම හා ණය වෙනත් විවිධාකාර දේවලට යෙදවීම මෙහිදී විශේෂයෙන් වැදගත් කාරණයකි. දැනට කෙරෙන ක්‍රමයට අනුව හැකි සෑම අවස්ථාවකම ද්‍රව්‍ය වලින් ණය දීමට උත්සාහ කෙරේ. මෙයින් උත්සාහ ගන්නේ ණය වෙනත් කරුණු සඳහා යෙදවීම වැළැක්වීමයි. නමුත් ගොවියාට මුදල් අවශ්‍ය නම් මෙසේ ණයට ලබා ගත් ද්‍රව්‍ය පුද්ගලික වෙළෙඳුන්ට විකුණා මුදල් ලබා ගැනීමට ද අපහසුවක් නැති බව අප අමතක නො කළ යුතු වේ. වැලිමඩ එළවළු අලෙවිය පිළිබඳව අප සමීක්ෂණයක් කළ අවස්ථාවේදී දැකිය හැකි වූ එක් දෙයක් නම් ගොවීන් සමුපකාරයෙන් ණයට ගත් බීජ අර්තාපල් වලින් කොටසක් කෙළින්ම කොළඹ වෙළෙඳුන්ට විකුණා මුදල් ලබා ගන්නා බවයි. තවත් හේතුවක් නම් කලට වේලාවට ණය නොලැබීමයි. මේ කරුණුවලට අනුව ද්‍රව්‍ය වලින් ණය දීම පමණක් ණය වෙනත් කරුණුවලට යෙදවීම වැළැක්වෙන බවට සහතිකයක් ලෙස සැලකිය නොහැක. දැනට ණය දීමේදී කිසියම් ආකාරයක සුපරීක්ෂාකාරී බවක් තිබුණ ද ණය යෙදවීම ගැන හෝ ආපසු ලබා ගැනීම ගැන එතරම් දක්නට නොමැත. මේ නිසා ඉතාම වැදගත් වන්නේ ණය දෙන අවස්ථාවේදීත් එය යොදවන අවස්ථාවේදීත් ආපසු ගෙවන අවස්ථාවේදීත් ඒ පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතු බවය.

---

# මහ ගොවි ජනපද හා තරුණ ව්‍යාපාර වලින් ලද අත්දැකීම්

(සහකාර ඉඩම් කොමසාරිස්, ඩබ්ලිව්. ජේ. ඇස්. කරුණාරත්න මහතා විසිනි. )

මූලික වශයෙන් සළකා බලනවිට, ගොවිජනපද ව්‍යාපාර හා තරුණ ව්‍යාපාර පරමාර්ථ අනුව එකි–නෙකට වෙනස් වූ ව්‍යාපාර වශයෙන් දැක්විය නොහැක. මෙම ව්‍යාපාර දෙකෙහි පරමාර්ථය වූයේ පුද්ගලයින්ට සුදුසු ප්‍රදේශවල රජයේ ඉඩම් ද, වෙනත් රජයේ සහනාධාර ද ලබා දී, කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු දියුණු කිරීම හා කෘෂි කර්මාන්තය ජීවන වෘත්තියක් වශයෙන් ගෙන යා හැකි පිරිසක් බිහි කිරීමය. පසුගිය දසක හතරක කාලයක් මුළුල්ලේ අනුගමනය කරන ලද ජනපද පිහිටුවීමේ ප්‍රතිපත්තියේ එක්තරා අවස්ථාවක් වශයෙන් තරුණ ව්‍යාපාර හැඳින්විය හැක.

මහ ගොවි ජනපද ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්, ප්‍රධාන වශයෙන් කුඹුරු ගොවිතැන සඳහා වාරිමාර්ග පහසුකම් ඇතිව ඇති කරන ලද ගොවි ජනපද හා තේ, රබර්, පොල්, කෝපි හා කුරුඳු වැනි වගාවන් සඳහා පමණක් වූ ගොඩ ගොවි ජනපද වේ. ගොවි ජනපද ව්‍යාපාර දැනට දසක හතරකට පමණ ඉහතදී ආරම්භ කරන ලද අතර ඒ සම්බන්ධව පරිනත වූ අත්දැකීමක් ලබා ඇත. මහ ගොවි ජනපද ආරම්භ කිරීමට අදාළ වූ හේතු කීපයක් විය. ඒවා නම් :–

(අ) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන යුගයේදී සම්මත කර ගන්නා ලද මුඩු බිම් පනත යටතේ රජයට අයත් වූ ඉඩම් ආපසු ගැමියන්ට ලබා දීමේ අවශ්‍යතාවය පෙනී යාම ;

(ආ) මෙරටේ විශේෂයෙන්ම දකුණු හා උඩරට ප්‍රදේශවල එවකට තිබූ ජනගහණ තදබදය පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා ජනපද ඇති කොට ජනගහණය වඩා තුනී වන අයුරු බෙදා හැරීම ;

(ඇ) වර්ෂ 1929 දී නිකුත් කරන ලද ඉඩම් කොමිෂන් වාර්තාවේ පෙන්වා දුන් පරිදි සුළු ඉඩම් හිමි, සෞභාග්‍යමත් – ආත්ම ගරුත්වයක් ඇති ස්වයංපෝෂිත ගොවි ජනතාවක් බිහි කිරීමේ අවශ්‍යතාවය ; විශේෂයෙන්ම ගැමි ජනතාව ණය ගැතිකමේ උවදුරින් බේරා ගැනීම, වෙනස් වාණිජමය පන්තිවලට රජයේ ඉඩම් අයත් වීම වැළැක්වීම හා ඉඩම් කුඩා කොටස්වලට කැබලි කිරීම නවතාලීමේ අවශ්‍යතාවය ;

(ඈ) 1931 හඳුන්වා දෙන ලද ඩොනමෝර් ව්‍යවස්ථාව අනුව අලුත් බලවේගයන් දේශපාලන භූමියේ ඇතිවීම. විශේෂයෙන්ම මෙම ව්‍යවස්ථාව යටතේ ලාංකිකයන් රජයේ වගකිව යුතු තනතුරු ලැබූ අතර මේ නිසා ලාංකික ගොවි ජනතාවගේ තත්වය නංවාලීමට නව ප්‍රබෝධයක් හා උනන්දුවක් ඇති විය.

(ඉ) පළමු ලෝක මහා සංග්‍රාමයෙන් පසුව රටේ ඇති වූ විවිධ ආර්ථික හා සමාජික ප්‍රශ්න නිසාත්, විශේෂයෙන්ම වැඩි වන ජනගහණය, ආහාර සැපයුම හා ඉඩම් හිඟය වැනි ප්‍රශ්න අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය රජයේ වග කිව යුතු නිලධාරීන්ට හා ලාංකික දේශපාලඥයින්ට වැටහී ගිය නිසාත්, රට සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඇති වීම ;

(ඒ) රටේ වියළි පළාත්වල තිබූ මැලේරියා උවදුර මැඩලීමට සමත් වීම නිසා, මේ හේතු කොටගෙන පුද්ගලයින් එම ප්‍රදේශවලට සංක්‍රමනය වීමට කැමැත්තක් දැක්වීම;

(ද) ක්‍රමවත් ලෙස රටේ ඇති රජයේ ඉඩම් සංවර්ධනය කිරීම හා බෙදා දීමේ පරමාර්ථයන් මූලි කරගෙන සකස් වූ ඉඩම් සංවර්ධන ආඥා පනත වර්ෂ 1935 දී බිහි වීම. මේ අනුව පුථමවරට රජයේ ඉඩම් භාරව ක්‍රියා කිරීමට "ඉඩම් කොමසාරිස්" නමැති තනතුර ද බිහි විය.

රජයේ ඉඩම් ප්‍රතිපත්ති සලකා බලනවිට මේ සම්බන්ධ අවස්ථා තුනක් ඇති වූ බැව් පෙනියයි. වර්ෂ 1928 දක්වා අනුගමනය කරන ලද ඉඩම් ප්‍රතිපත්තිය එක් අවස්ථාවකි. ඉඩම්වල අයිතිය රජය සතු බවද, රජයට අභිමත ලෙස ඉඩම් වෙන් කළ හැකි බවද, ඉඩම් ලබා ගැනීමට උනන්දුව ඇති විය යුත්තේ පුද්ගලයින්ගෙන් බවද, රජයේ ඉඩම් ලබා ගන්නා විට ඒ සඳහා මුදලක් ගෙවිය යුතු බවද යන කරුණු මෙම අවස්ථාවේදී පිළිගත් මූලධර්ම විය. දෙවන අවස්ථාව බිහි වූයේ 1929 ඉඩම් කොමිසමේ වාර්තාවට පසුවය. ඉඩම් බෙදා දීමේ උනන්දුව පුද්ගලයන්ගෙන් නොව රජයෙන් ඇති විය යුතු බවද, ගොවි ජනතාව ආරක්ෂා කිරීම රජයේ පරමාර්ථයක් විය යුතු බවද මේ අවස්ථාවේදී පිළි ගන්නා ලදී. එහෙත් කැලෑ ඉඩම් සංවර්ධන කිරීම ප්‍රධාන වශයෙන් කට්ටිකරුවන් සතු වගකීමක් බැව් පිළි ගන්නා ලදී. තුන්වන අවස්ථාව වශයෙන් 1935 දී සම්මත කර ගන්නා ලද ඉඩම් සංවර්ධන ආඥා පනත සැලකිය හැක. ක්‍රමවත් ලෙස ඉඩම් සංවර්ධනය කිරීම පිණිස ආධාර රජයෙන්ම ලැබිය යුතු බැව් මේ අවස්ථාවේදී පිළි ගන්නා ලදී.

පසුගිය කාලය තුළදී මහ ගොවි ජනපද අනූ හතරක් (94) පමණක් ආරම්භ කර ඇත. ඉඩම් කට්ටි ගණන දළ වශයෙන් 75,938 ක් පමණ වන අතර මේ අනුව මඩ ඉඩම් අක්කර 218,422 ක් ද, ගොඩ ඉඩම් අක්කර 120,335 ක් පමණ ද විය. මුල් අවස්ථාවේදී බෙදා දීමේ ඒකකය මඩ ඉඩම් අක්කර 5 ක් හා ගොඩ ඉඩම් අක්කර 3 කින් සමන්විත විය. ගල්ඔය හා මිනිපේ ව්‍යාපාරවල මේ අනුව ඉඩම් බෙදා දී ඇති අතර ක්‍රමයෙන් එය අඩු වී තිබේ. සමහර ජනපදවල මඩ ඉඩම් අක්කර 3 ක් හා ගොඩ ඉඩම් අක්කර 2 බැගින් ද, මෑතකදී සිට මඩ ඉඩම් අක්කර 2 ක් හා ගොඩ ඉඩම් අක්කර 1 බැගින් ද බෙදා දී ඇත. ජනපදවලට මුල්වරට කට්ටිකරුවන් පදිංචි කරන අවස්ථාවේදී සියළුම සහනාධාර ලබා දී ඇත. කැලෑ එළි කිරීම, මුල් ඉදිරීම, වැට බැඳීම, නියර දැමීම, කෘෂිකාර්මික උපකරණ, බිත්තර වී, තාවකාලික නිවස හා ප්‍රවාහනය යන කරුණු සඳහා සහනාධාර ද, පොදු අවශ්‍යතා සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද ලබා දී ඇති අතර දළ වශයෙන් එක් ජන පදිකයෙකු පදිංචි කරවීම සඳහා රජය විසින් රු. 16,000 ක් පමණ වියදම් කර ඇත. එහෙත් සමහර අවස්ථාවලදී, උදාහරණයක් වශයෙන් ගල්ඔය ව්‍යාපාරයේදී, මේ සඳහා රු. 21,500 ක් පමණ වැය කර ඇත.

කට්ටිකරුවන් ජනපදවල පදිංචි කරවීමේ අවස්ථාවන් පිළිබඳව අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය ද පසුගිය කාලවලදී වෙනස් වී ඇත. මුල්ම අවස්ථාවලදී සියළු පහසුකම් සලසා දීමෙන් පසුව කට්ටිකරුවන් ජනපදවල පදිංචි කරවූ අතර 1958 සිට පූර්ව ඉඩම් බෙදා දීමේ ප්‍රතිපත්තිය ආරම්භ කරන ලදී. මේ අනුව වාරිමාර්ග පහසුකම් ලබා දීමට වර්ෂයකට පෙර කට්ටිකරුවන් ජනපදයට පැමිණි අතර පාරවල්-ඇලවේලි කැපීමට හා කුඹුරු ඉඩම් කට්ටි ශුද්ධ කිරීමට කට්ටිකරුවන් සහාය කර ගැනීම හා මේ අනුව ජනපදිකයින් අතර එකමුතු භාවයක් හා සහයෝගිතාවයක්

ඇති කිරීමට මෙයින් බලාපොරොත්තු විය. ඇත්ත වශයෙන් අත්දැකීම් අනුව මෙම ප්‍රතිපත්තිය නිසා ආර්ථික හා සාමාජික වශයෙන් විවිධ කම්කටොලුවලට හා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට ජනපදිකයින්ට සිදු විය. විශේෂයෙන්ම වාරිමාර්ග පහසුකම් කලට වේලාවට ලබා නොදීම නිසා ජීවනෝපාය සඳහා විශාල සටනක් කිරීමට මොවුන්ට සිදු විය. දැනට පිළිගෙන තිබෙන ප්‍රතිපත්තිය නම් පූර්ව ඉඩම් බෙදා දීමේ ප්‍රතිපත්තිය අහෝසි කර සියළු පහසුකම් ලබා දුන්නාට පසුව කට්ටි කරුවන් ජනපදයට ගෙන්වීමය.

ජනපද පිහිටුවීම හේතුකොටගෙන මෙතෙක් කැලෑ ඉඩම් වශයෙන් අත්හැර දමා තිබූ රජයේ ඉඩම් එළි පෙහෙළි වීමත්, අක්කර ලක්ෂ ගණන් කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනය කිරීමත්, මෙම ආර්ථික පදනම මත විශාල ජන සමූහයක් පදිංචි කර ඔවුන්ට ජීවනෝපායන් ඇති කිරීමත් සිදු විය. අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර වැනි දිස්ත්‍රික්කයන්හි අද තිබෙන තත්වයට දියුණු වීමට අඩිතාලම ඇති කළේ මෙම ප්‍රදේශවල පිහිටුවන ලද ජනපද ව්‍යාපාර බැව් කීම අතිශයෝක්තියක් නොවේ. එමෙන්ම අපේ රටේ මුළු වී නිෂ්පාදනය ගැන සලකා බලන විට ද ගොවි ජනපද වලින් ලැබෙන වී ප්‍රමාණය සුළු පටු නොවේ. එහෙත් හුදෙක් ආර්ථික වශයෙන්ම සලකා බලනවිට ගොවි ජනපද සඳහා මෙතෙක් රජය විසින් කර ඇති වියදම ගැන සලකා බලනවිට ඊට සමාන නිෂ්පාදනයක් ඇති වී නොමැත. මෙම කරුණ ජනපද සම්බන්ධයෙන් කරන ලද විවිධ පර්යේෂණ වාර්තා හා කමිටු වාර්තා මගින් මැනවින් පෙන්වා දී ඇත. ගල්ඔය ව්‍යාපාරය අගය කිරීමේ කමිටු වාර්තාව පෙන්වා දී ඇති පරිදි ගල්ඔය ව්‍යාපාරය සඳහා වියදම් කර ඇති මුදල් ගැන සලකා බලනවිට ඒ හා සමාන ආදායමක් රටට එම ව්‍යාපාරයෙන් ලැබී නොමැත. එම කමිටු වාර්තාව පෙන්වා දී ඇති පරිදි 1966 දී එනම් එම ව්‍යාපාරය අරඹා වර්ෂ 15 කට පසුවද කුඹුරු අක්කරයක සාමාන්‍ය අස්වැන්න බුසල් 38 ක් පමණ විය. මෑතක් වන තුරුම අනෙකුත් ගොවි ජනපදවල වී අස්වැන්න ද මේ හා සමාන විය. හුදෙක් ආර්ථික මට්ටමින්ම ගොවි ජනපද අගය කිරීම අසාධාරණ වුවත්, මෙම ව්‍යාපාරවල නිෂ්පාදන ශක්තිය තවදුරටත් ප්‍රගුණ කළ යුතු බව අප විසින් පිළිගත යුතුය. නිෂ්පාදන ශක්තිය හීන වීමට හේතු කිහිපයක් විය. මුල් අවස්ථාවලදී කට්ටිකරුවන් ජනපදවලට තෝරා ගත්තේ ඔවුන් සතු කෘෂිකාර්මික දැනුම පදනම් කරගෙන නොවේ. ඇත්තවශයෙන්ම මෑතක් වනතුරු මූලික සුදුසුකම් ලෙස සැලකුවේ පවුලේ සංඛ්‍යාවය. කෘෂිකර්මය පිළිබඳ දැනුමක් ඇති කෘෂිකර්මය පිළිබඳව නවීන ක්‍රම උපයෝගී කර ගැනීමේ අත්දැකීමක් ලබා තිබුණු පිරිසක් මේ නිසා ජනපදවල පදිංචි කරවීමට නොහැකි විය. සමාජ විද්‍යාත්මක වශයෙන් සලකා බලන විටද ජනපදවල පදිංචි වීමට පැමිණියේ සම්ප්‍රදායික සමාජයේ ජීවන ක්‍රමය හා ආර්ථික රටාවට අනුව හැඩ ගැසුණු පිරිසකි. එමෙන්ම පසුගිය කාලවලදී විවිධ ජනපද ව්‍යාපාරයන් භාරව කටයුතු කළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අවධානය වැඩි වශයෙන්ම යොමු වූයේ නිෂ්පාදන ශක්තිය දියුණු කිරීමට වඩා ඉඩම් පිළිබඳ පරිපාලන කටයුතුවලටය. තවද ශ්‍රමය, ඉඩම හා ජලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතු බව කට්ටි කරුවන්ට ඒත්තු ගැන්වීමට හා පෙළඹවීමට කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ද සම්පූර්ණයෙන්ම සමත් වූයේ නැත. මේ ආදී කරුණු හේතු කොටගෙන සම්ප්‍රදායික සමාජයේ පැවැති ආකාරයෙන්ම කට්ටිකරුවන් ගොවිතැන් ක්‍රමයට පුරුදු වුනු අතර ඉඩම් කට්ටිය සූක්ෂම ලෙස වගා කිරීමටත් භෝග විවිධාංගකරණ කිරීමටත් අසමත් විය.

ජනපද පිහිටුවීමේදී අනුගමනය කරන ලද ව්‍යාපාරයේ භෞතික සැලැස්මේ ද අඩු පාඩුකම් තිබුණි. මෙම සැලැස්ම බොහෝසෙයින්ම සකස් වූයේ ඉඩම් කට්ටිවලට වාරිමාර්ග පහසුකම් ඉතා ලාභ

ලෙස ලබා දීමේ මූලික අවශ්‍යතාවය මතය. ආර්ථික වශයෙන් ඵලදායී, සෞභාග්‍යමත් හා සාමාජික වශයෙන් ශක්තිමත් ජන කොට්ඨාශයක් ඇති කිරීමට උපයෝගී වන අන්දමට ව්‍යාපාරවල භෞතික සැලැස්මවල් සකස් වී තිබුණේ නැත. විද්‍යාත්මක වශයෙන් පස් රටාව ගැන සලකා බැලීමත්, ජනපදවල උස්බිම් කට්ටිවලට වාරිමාර්ග පහසුකම් ලබා දීමත්, ට්‍රැක්ටර් භාවිතය වැනි නූතන කෘෂිකර්මයේ විද්‍යානුකූල අවශ්‍යතාවයන් සලකා බැලීමත් මෙම භෞතික සැලැස්ම වලින් ඉටු වූයේ නැත. සමහර ජනපදවල වාරිමාර්ග ඇලවල් සැතපුම් 25 කටත් අධික දුරක් වැටී තිබුණු අතර මෙවැනි දීර්ඝ පටියක් ලෙස සකස් වුනු ජනපද ව්‍යාපාර නිසා මෙරටේ ගම්වල තිබුණු "ගම්ගොඩ" ක්‍රමය නැති විය. මේ නිසා සාමාජික වශයෙන් එකමුතුකමක් හා සහයෝගිතාවයක් මත පදනම් වුනු නානාවිධ ගැටුම් වලින් හීන වූ ජන කොට්ඨාශයක් ඇති නොවීය. "ගම්ගොඩ" ක්‍රමය පදනම් කොට ගෙන මතුවට ජනපද ව්‍යාපාර සකස් විය යුතු බැව් දැනට පිළිගෙන තිබේ.

අපගේ අත්දැකීම් අනුව විවිධ ගොවි ජනපද පිහිටුවන අවස්ථාවන්හිදී සමාජ විද්‍යාත්මක කරුණු ගැන සෑහෙන අවධානයක් යොමු නොකිරීම නිසා සාමාජික වශයෙන් විවිධ ගැටළු ඇති වී ඇත. එක් අතෙකින් ව්‍යාපාරවල භෞතික සැලැස්ම, සාමූහිකත්වයකින් යුතු සමාජ ක්‍රමයක් ඇති කිරීමට ඉවහල් නොවූ අතර අනෙක් අතින් තෝරා ගන්නා ලද කට්ටි කරුවන්ගේ විවිධ සංස්කෘතික හා සාමාජික පසු බිම්ද එවැනි සාමූහිකත්වයට තුඩු දුන්නේ නැත. ඥාති සම්බන්ධතාවයන්ගෙන් තොරව අළුත් පරිසරයක ජීවිත ගත කිරීමට පැමිනි පුද්ගලයින් බොහෝසෙයින්ම තමාගේ පවුලටම නැඹුරු වූ ජීවිත ගත කිරීම ආරම්භ කළ අතර සාමාජික වශයෙන් සහයෝගය අඩු වීමත්, සාමූහික වගකීම හීන වීමත් සිදු විය. රජයේ සේවකයින්ගේ පරිපාලන කටයුතුත්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හඳුන්වා දුන් ඉඩම් භුක්ති ක්‍රමයත් නිසා තමන්ගේ ඉඩම් කට්ටි රජයේ බදු ඉඩම් වශයෙන් සැලකීමත් රජයේ විවිධ සහනාධාර නිසා රජය පියෙකු ලෙස සැලකීමත් ඇති විය. දැනට ජනපද ව්‍යාපාර පිහිටුවා වර්ෂ 40 ක් පමණ ගත වී ඇතත් මෙම ව්‍යාපාරවල පාලන කටයුතු භාර ගැනීමට කට්ටි කරුවන් තවම අසමත් වීමට මෙම කරුණු හේතු වී ඇත. තවද ජනපදවල කට්ටි කරුවන් පදිංචි කරන අවස්ථාවන්හිදී ඔවුන්ගෙන් යැපෙන දරුවන්ගේ අනාගතය ගැන සැලකිලිමත් නොවීමත්, විවිධ සාමාජික ප්‍රශ්න ඇති වීමට හේතු වී ඇත. ජනපදය ඇතුළත බෙදා දීමට වෙනත් ඉඩම් කට්ටි නොමැති නිසා කට්ටි කරුවන්ගෙන් යැපෙන්නන් බොහෝ අවස්ථාවලදී ජනපදයේ ඇළවල් සඳහා වෙන් කර ඇති රක්ෂිත ඉඩම් අනවසරයෙන් වගා කරන බැව් පෙනෙන්නට තිබේ.

ඉහත සඳහන් කරන ලද ප්‍රශ්න සම්බන්ධව ලද අත්දැකීම නිසා එම ප්‍රශ්නවලට මුහුණ දීම සඳහා පියවර කීපයක් මෑත කාලයේදී ගන්නා ලදී. මෙම පියවරවල්වල මූලික පරමාර්ථය නම් කර තිබෙන ආයෝජනයට අනුව මහ ගොවි ජනපද ව්‍යාපාර ආර්ථික වශයෙන් ඵලදායි කර ගැනීමයි. පළමුවෙන්ම 1965/66 වර්ෂවලදී මහ ගොවි ජනපද සඳහා කට්ටි කරුවන් තෝරා ගැනීම සඳහා නව තේරීම් ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම නව ක්‍රමයට අනුව කට්ටි කරුවන් තෝරා ගැනීමේදී කෘෂිකර්මය පිළිබඳ දැනුමක් ඇති නවීන කෘෂිකර්ම විධි උපයෝගී කර ගැනීම සම්බන්ධව අත් දැකීමක් ඇති පුද්ගලයින්ට විශේෂ අවධානයක් යොමු කරන ලදී. දෙවනුව ඉහත සඳහන් කර ඇති පරිදි මහ ගොවි ජනපදවල ඉඩම් කට්ටි බෙදා දීමේ ඒකකය කලින් කලට වෙනස් වී ඇත. මුලදී කුඹුරු අක්කර 5 ගොඩ අක්කර 3 ක් හෝ 2 ක් බෙදා දුන් අතර පසුව එය අක්කර 2:1 අනුපාතයට අඩු කරන ලදී. වඩාත් දක්ෂ ලෙස හා උපරිම ලෙස ප්‍රයෝජනය ගත හැකි ඉඩම් ඒකක සම්බන්ධව ගවේෂණ තවදුරටත් කරගෙන යනු ලැබේ. ව්‍යාපාරවල භෞතික සැලැස්ම පිළියෙල

කිරීමද දැනට වඩා ක්‍රමවත් ලෙස කරනු ලැබේ. මනුෂ්‍යයින් වශයෙනුත්, අළුත් පදිංචි කරුවන් වශයෙනුත් කට්ටි කරුවන්ට ඇති අවශ්‍යතා සපුරාලන ලෙස භෞතික සැලසුම් පිළියෙළ කළ යුතු බැව් පිළිගෙන ඇත. විශේෂයෙන්ම සාමූහික ජනාවාස රටාවන් ඇති වීමට තුඩු දෙන පරිදි පදිංචි කරුවන්ගේ ඉඩම් කට්ටි ඇති කිරීමට නව භෞතික සැලසුම් සම්පාදනයේ පරමාර්ථය වේ.

මීට අමතරව ව්‍යාපාරවල නිෂ්පාදන ශක්තිය දියුණු කිරීම සඳහා ද පියවර ගෙන තිබේ. දැනට පවතින ජනපද ව්‍යාපාර නැවතත් පුනරුත්ථාපනය කිරීම සඳහා 1966/67 වර්ෂ වලදී ගන්නා ලද තීරණයක් අනුව විශේෂ ව්‍යාපාර ඇති කරන ලදී. උපරිම වශයෙන් කුඹුරු ඉඩම් කට්ටි දියුණු කිරීම, කෘෂිකාර්මික වශයෙන් විවිධාංගකරණය කිරීම, උපරිම වශයෙන් ජලය භාවිතා කිරීම, ව්‍යාප්ත සේවාවේ හා අනෙකුත් ව්‍යාපාර මට්ටමේ ක්‍රියාත්මක වන ආයතනවල කටයුතු ශක්තිමත් කිරීම හා පුළුල් කිරීමත් මෙම ව්‍යාපාරවල පරමාර්ථය වේ. මේ අනුව ජනපද ව්‍යාපාර 15 ක ඇති කුඹුරු අක්කර 78,000 ක් හා ගොඩ ඉඩම් අක්කර 42,000 ක් පමණ විශේෂ ව්‍යාපාර වශයෙන් සලකා ඇති අතර මෙම කටයුතු නිසා එම ව්‍යාපාරවල නිෂ්පාදන ශක්තිය ඉතා සීඝ්‍ර ලෙස වැඩි වී ඇති බැව් කිව හැක. විශේෂයෙන්ම මෙම ව්‍යාපාරවල වී අස්වැන්නත්, අතිරේක භෝග වගාවත් වැඩි වී තිබේ.

තරුණ ගොවි ව්‍යාපාර ද විශේෂ ගොවි ජනපද ව්‍යාපාරයන් ලෙස සැළකිය හැක. උසස් වාරිමාර්ග ක්‍රම හා වෙනත් නවීන කෘෂිකාර්මික ක්‍රමයන් භාවිතා කරමින් උගත්, රැකියා විරහිත තරුණයින්ට කෘෂි කර්මාන්තය ජීවනෝපායක් වශයෙන් ඉදිරිපත් කිරීම මෙම ව්‍යාපාරවල මූලික අදහස විය. එමෙන්ම එම තරුණයින්ට රු. 250/- ක මාසික ආදායමක් ලබා දීමත්, වී ගොවිතැන හැන පමණක් වෙහෙස නොවී විවිධ භෝගාංගකරණය මගින් අතිරේක භෝග වගා නිෂ්පාදනය වැඩි කිරීමත් පරමාර්ථයන් විය. දැනට මෙවැනි ව්‍යාපාර 41 ක් පමණ ක්‍රියාත්මකව පවතින අතර අළුත් ව්‍යාපාර ඇති නොකොට මෙම ව්‍යාපාර තවදුරටත් දියුණු කිරීමට දැනට තීරණය කර ඇත. මෙම ව්‍යාපාරවල කෙරෙන කටයුතු විවිධය. පොල්, කුරුඳු, තේ, එන්සාල්, පළතුරු, එළවළු, මිරිස්, රතු ළූනු වැනි අතිරේක භෝග, වී ගොවිතැන හා කුකුළන් ඇති කිරීම ආදිය තරුණ ව්‍යාපාර වලින් කෙරේ. විශ්වමඩුකුළම්, ඉහළ හේවැස්ස හා කැම්බල්ස් තරුණ ව්‍යාපාර ඉතාමත් සාර්ථක වන අතර ඒවායේ තරුණයෙකුගේ මාසික ආදායම රු. 1000/- ටත් වැඩි වේ. සෑම ව්‍යාපාරයක්ම එක හා සමානව සාර්ථක නොවන අතර ව්‍යාපාරවල භෞතික සැලැස්ම නියම අන්දමින් සැලසුම් නොකිරීම, නුසුදුසු තරුණයින් තෝරා ගැනීම, නුසුදුසු ප්‍රදේශවල පිහිටීම, සුදුසු භෝග රටාවක් තෝරා නොගැනීම හා ක්ෂේත්‍ර මට්ටමේ දුර්වල නායකත්වය යනාදී කරුණු නිසා සමහර ව්‍යාපාර අසාර්ථක වී ඇත. මෙම ව්‍යාපාර පිළිබඳ කටයුතු සමාලෝචනය කර, තවදුරටත් ශක්තිමත් කරවා ගැනීමට කටයුතු කර ඇති අතර මෙසේ තරුණ ව්‍යාපාර වලින් ලද අත්දැකීම්, දැනට පිහිටුවා ගෙන යනු ලබන සමූපකාර ගම්මාන හා අනෙකුත් ගම් මට්ටමේ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ඉමහත් සේ ඉවහල් වේ.

---

## <u>මහවැලි ජනාවාසවල මූලික අංග</u>

මහවැලි සංවර්ධන මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරි
(ජනාවාස) ජී. එච්. ආරියරත්න මහතා විසිනි.

විශාල පරිමාණයේ ඉඩම් සංවර්ධන ක්‍රම උපායක් වශයෙන් ජනපද යෝජනා ක්‍රම පිහිටුවාලීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවට ඇත. කිසිදු සංවර්ධනයකට ලක් නොවූ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබීම සහ ජනාවාස තැනින් තැන විසිරී පැවතීම මෙන්ම ජන සංඛ්‍යා ව්‍යාප්තිය ද අඩු වීම හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ වියලි කලාපය ජනපද ව්‍යාපාර පිහිටුවීම සම්බන්ධයෙන් ඉතාමත් වාසි දායක ප්‍රදේශයක් විය.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මෙම ප්‍රතිපත්තිය මත පිහිටා සකස් කරන ලද අලුත්ම යෝජනා ක්‍රමයයි. මෙම යෝජනා ක්‍රමය මගින් සමස්ත වශයෙන් ශ්‍රී ලංකාවේ පොදු සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි අත්‍යාධික බලපෑමක් ඇති කිරීමට නියමිත හෙයින් එය සැලසුම් කිරීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදීද අතීතයෙන් ගත් ආදර්ශයන් පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් අවශ්‍යය. පැරණි යෝජනා ක්‍රම වලින් සමාජයිය වශයෙන් යම් යම් සීමිත පරමාර්ථයන් කීපයක් ඉටු කර ගැනීමට හැකි වුවත් ඒවායින් අවසාන වශයෙන් ලත් ප්‍රතිඵලය අනුව සළකා බලන කල සතුටුදායක තත්වයක් නොපවතින්නේ යයි දැනට හෙළි වී ඇත. ගල්ඔය අගැයීමේ කමිටු වාර්තාවට අනුව පරීක්ෂණ වලින් ප්‍රත්‍යක්ෂව ඇත්තේ ගොවි ජනපද ව්‍යාපාරවල ආයෝජනය කරන ලද අධික පිරිවැයට ගැලපෙන සේ ප්‍රතිඵලයන් නොලැබී ඇති බවයි. ජනපද ව්‍යාපාර පිහිටුවීමෙන් පසු වුවද පුරාණ ගම්වල පැවති ඒක භෝගීය හා යැපුම් මට්ටමේ කෘෂිකර්ම රටාව ඒ අයුරින්ම ජනපදවලට ද බෝවී ගියේය. එසේම මූලික සැලසුම් සම්පාදනයේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදීද නොයෙකුත් අන්දමේ දුෂ්කරතාවයන් ඇති වීමෙන් යැපීම් දීමනා, සහනාධාර වැනි ආධාර මගින් ජනපදික ප්‍රජාව නඩත්තු කිරීමට රජයට සිදු විය. එසේම තමුන්ගේ ජීවිතයේ සෑම අංශයක් සම්බන්ධයෙන්ම රජය කෙරෙහි පරායත්තව සිටීමට පුරුදු වූ ජනතා කොටසක් ද බිහි විය.

ඉහත සඳහන් තත්වයට හේතු වූ කරුණු රාශියක් ඇත. මෙ කරුණු රාශිය අතර ඇති ප්‍රධානම කරුණ කෙරෙහි ගල්ඔය ඇගැයීමේ කමිටු වාර්තාව විශේෂ අවධානයක් යොමු කරවයි. බොහෝ ජනපද ව්‍යාපාරයන් අසාර්ථක වීමට හේතු වූයේ ඒ මගින් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන විවිධ අංග පිළිබඳව සංඛ්‍යා ලේඛන හා අනිකුත් තොරතුරු අනුසාරයෙන් සකස් කර ගත් සමස්ත සැලසුමක් නො තිබීම නිසා යයි මෙම වාර්තාවෙහි දක්වා ඇත. අනාගතයේදී ඇති කිරීමට බලාපොරොත්තු වන ජනපද යෝජනා ක්‍රම සැලසුම් කළ යුතු වන්නේ විවිධ අංශ පිළිබඳව කළ යුතු ගවේෂණ හා පර්යේෂණ අනුසාරයෙන් සංඛ්‍යා ලේඛන හා තොරතුරු රැස් කොට විධිමත් සැලැස්මක් අනුව බවද එම වාර්තාවෙහි වැඩිදුරටත් දක්වෙයි.

මහවැලි සංවර්ධන මණ්ඩලය මෙම කරුණ කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ඇත. යෝජනා ක්‍රමයේ විවිධ අංශ වන ඉංජිනේරු–වාරිමාර්ග, පාංශු පරිශීලනය හා ඉඩම් වර්ගීකරණය, කෘෂිකර්ම සංවර්ධනය සහ අලෙවි සහ ණය පහසුකම් සංවිධානය යන අංශ පිළිබඳව වෙන වෙනම ගවේෂණයන් හා අධ්‍යයනයන් කොට මේ කරුණු සියල්ලම අලලා පොදු සක්‍යතා වාර්තාවක්

සකස් කෙරෙට ඇත. මෙම වාර්තාව සකස් කිරීමේදී රටේ පොදු සමාජ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරු ක්‍රියාත්මක වැඩ සටහන් ඇතුළත් කිරීමට ද වග බලා ගන්නා ලදී.

වාර්තාව සකස් කිරීමේදී යෝජනා ක්‍රමයේ පොදු පරමාර්ථය විය යුත්තේ කුමක්දැයි යන්න විශේෂ සැළකිල්ලට භාජනය විය. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල්වල ආර්ථිකයේ ද්විත්ව ස්වරූපය සමනය වන පරිදි දේශීය කෘෂිකර්ම අංශය නවීකරනය කිරීම මෙම යෝජනා ක්‍රමයේ පරමාර්ථය වශයෙන් සැළකිය හැක. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්ම අංශය හෙවත් සම්ප්‍රදායික අංශය මන්දක් වනතුරුම ස්ථිතික කාර්යක්ෂමතාවයකින් පැවැති අංශයකි. මෙය ගතික කාර්යක්ෂමතාවයකින් යුත් නවීන අංශයක් කරා පරිවර්තනය කිරීමේදී අනුගමනය කළ යුතු උපාය පැහැදිලිවම මෙම වාර්තාවෙන් පෙන්නුම් කරයි. මෙහිදී නවීකරණය පිළිබඳ සංකල්පය තරමක් දුරට සාකච්ඡා කිරීම ප්‍රයෝජනවත් විය.හැකිය. මහවැලි යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු වන්නේ 'මාර්ස්ඩන්' වැනි සමාජ විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලැබූ ක්ෂණික නවීකරණයක් ( crash-modernisation ) නොවේ. ඒ වෙනුවට එය වඩාත් කිට්ටු වන්නේ 18 වෙනි ශත වර්ෂයේ අග භාගයේදී පමණ ජපානය විසින් සම්ප්‍රදායික අංශය නූතන අංශයක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගයටයි. ජපානය විසින් අනුගමනය කරන ලද්දේ දේශීය කෘෂිකර්ම අංශයෙහි තැනින් තැන විසිරී පැවැති ආර්ථික හා මිනිස් සම්පත්, කුශලතාවයන් සහ ශිල්ප ක්‍රම හා සුළු කර්මාන්ත ඒකරාශී කොට ඒකාබද්ධ සංවිධානයක් මගින් ඒවාට නව මෙහෙයුම් ක්‍රම ලබා දී සංවර්ධනය කිරීමයි. අපේ රටේ වර්තමාන අවශ්‍යතාවයන්ට අනුව මෙවැනි සංවර්ධන ක්‍රම උපායක ඇති වැදගත්කම පහසුවෙන් අවබෝධ කර ගත හැක. මෙවැනි ක්‍රම උපායක් අනුගමනය කිරීමෙන් නිෂ්පාදනය, නිෂ්පාදන ඵලදායිතාවය සහ ජීවන හා ආදායම් මට්ටම් දියුණු කර ගැනීම, ගැමි ජනතා කොටස්වල සංවර්ධන හැකියාවන් හා ශක්තීන් පුබුදුවාලීම මෙන්ම විරල සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා දීම හා ස්වාධීන ගොවි ප්‍රජාවන් බිහි කර ගැනීම වැනි පරමාර්ථ එකවරම ඉටු කර ගත හැකි වෙයි. මේ සඳහා රජයේත්, ජනතාවගේත් ඒකාබද්ධ ප්‍රයත්නයක් අවශ්‍ය වන බවද මෙවැනි ක්‍රම උපායකින් පිළි ගැනේ.

මෙවැනි සංවර්ධක ක්‍රම උපායකට ඇතුළත් වන ක්‍රියාත්මක වැඩ සටහන් කිහිපයක් ගැනද මෙහිදී සඳහන් කළ යුතුය. අප රටේ දේශීය කෘෂිකාර්මික අංශයෙහි ඇති සංකීර්ණ ඉඩම් අයිතිය හා භුක්ති ක්‍රම ප්‍රතිසංස්කරණය කොට කෘෂිකර්මීය ගතික කාර්යක්ෂම භාවයකින් පවතින එකක් බවට පත් කිරීම එක් අංගයකි. තැනින් තැන විසිර පවත්නා ඉතා කුඩා ඉඩම් කැබලි ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙලවල් කෙරෙහි ද අවධානය යොමු වේ. ඒකීය භෝග රටාවක් යටතේ පවතින නිෂ්පාදන ව්‍යුහය භෝග විවිධාංගිකරණය, ශෂ්‍ය මාරුව, විධිමත් ජල පාලන ක්‍රම හා පස සංරක්ෂණය වැනි වැඩ පිළිවෙලවල් මගින් ප්‍රතිසංස්කරණය කිරීම ද මෙම නවීකරන ක්‍රම උපායට ඇතුළත්ය. ගොවීන්ට අවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් සහ අලෙවි පහසුකම් මෙන්ම ඔවුන්ගේ පාරිභෝගික අවශ්‍යතාවයන් ක්‍රමවත් අයුරු ඉටු කර ගැනීම සඳහා සංවිධානාත්මක උපකාරී සේවාවන් ඇති කිරීමද තවත් වැදගත් අංගයකි. තමන්ට ලැබෙන ආදායම සැකසුරුවම් කමින් යුතුව භාවිතා කිරීම, ගේ දොර හා පරිසරය පිරිසිදුව තබා ගැනීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, අධ්‍යාපනය, ගෘහ අර්ථ ශාස්ත්‍රය ආදී යහපත් ජීවිතයකට අවශ්‍ය අංග සම්බන්ධයෙන් පුහුණුව හා දැනුම ලබා දෙනු සඳහා පිළියෙල කරන ලද ප්‍රජා සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමද මෙහි ඇතුළත් තවත් වැදගත් අංගයකි.

මෙම වැඩ පිළිවෙල සකස් කිරීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදීත් එහි විවිධ මට්ටම් වලින් ජනතා සහභාගිත්වය ලබා ගත යුතු වීමද එහි වැදගත් අංගයකි. සංවර්ධන සැලසුම් සකස්

කිරීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදී ද එම සැලසුම් වලින් පල ප්‍රයෝජන ලබන ජනතා කොටස්වල සහභාගිත්වය අත්‍යවශ්‍ය බව සැලකේ. මේ සඳහා ජනතාව සංවිධානය කිරීමේදී පහත සඳහන් මූලධර්ම පදනම් කර ගත් ජනාවාස ක්‍රමයක් ඇති කිරීමට මහවැලි සංවර්ධන සැලැස්මෙන් බලාපොරොත්තු වේ.

1. ප්‍රජා ඒකාබද්ධතාවයක් පවත්වා ගැනීම;
2. ගොවීන් අතුරින් කාර්යක්ෂම නායකත්වයක් ඉස්මතු කර ගැනීම;
3. ස්වයං පාලනය සඳහා ඔවුන් පුරුදු පුහුණු කිරීම;
4. ප්‍රජා සංවර්ධනය.

මෙම මූලධර්ම මත පදනම් කර ගත් ජනාවාස රටාවක භෞතික සැලැස්ම කෙසේ විය යුතුද? උතුරු මැද පලාතේ පුරාණ ගම්වල පිහිටීම සලකා බලන කල මෙම ගම්වලට ආවේණික පැහැදිලි ලක්ෂණ කීපයක් ඇති බව හෙළි වෙයි. ගම පහලම මට්ටමේ ඒකකය වන අතර, ගම් 4 ක් හෝ 5 ක් ඒක රාශී වීමෙන් තුලාන වශයෙන් විශාල ඒකකය සෑදේ. එක් තුලානයකට අයත් ගම් කීපයේ ඇතැම්විට කුල වශයෙන් හෝ ජාති වශයෙන් හෝ වෙනස් ප්‍රජාවන් පදිංචි වී සිටිනු දැකිය හැකිය. මෙම රටාව නූතන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරු සකස් කර මහවැලි ජනාවාස ඇති කිරීමට ද බලාපොරොත්තු වේ. පවුල් 80 සිට 100 දක්වා ප්‍රමාණයක සංඛ්‍යාවකින් සැදුම් ලත් කුඩා ගම මහවැලි ජනාවාස රටාවේ කුඩාම ඒකකය වන්නේය. මෙවැනි ගම් 4 ක් හෝ 5 ක් එකතුව මහ ගමක් සෑදේ. මේ එක් මහ ගමක් එක ග්‍රාම සේවක වසමක් වෙයි. මෙම මහ ගමට පොදු සේවා මධ්‍යස්ථානයක් පිහිටවනු ලබන අතර, එහි ව්‍යාප්ති සේවා කාර්යාලයක්, වෙළඳ සැල්, බැංකු, පුස්තකාල ආදී පහසුකම් සලසා ගත හැකිය. මෙම මධ්‍යස්ථානයට එක් ගමක සිට දුර සැතපුම් දෙකකට හෝ තුනකට වැඩි නොවන්නේය. එක් එක් කුඩා ගමක මෙයට අනුරූප වශයෙන් සුලු සේවා මධ්‍යස්ථානයක් බැගින් පිහිටවනු ලැබේ. කුඩා ගම්මාන එකිනෙකට සම්බන්ධ කිරීම පිණිස මාර්ග පහසුකම් සංවර්ධන මණ්ඩලය විසින් සපයනු ඇත. මහවැලි සංවර්ධන සැලැස්මේ I වන අවස්ථාවේ I වන යෝජනා ක්‍රමයේ 2 වන අදියර යටතේ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අක්කර හැත්තෑ එක්දාහක පමණ ප්‍රදේශයක් තුල කුඩා ගම් 189 ක් හා තුලාන මට්ටමේ මහ ගම් 47 ක් පමණ ඉදි කිරීමට අදහස් කර ඇත. මහ ගම්මාන 3 ක් හෝ 4 ක් එකතු වූ විට එක් කලාපයක් සෑදේ. දසදාහක පමණ ජන සංඛ්‍යාවක් අයත් වන මෙම කලාපය ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයකට සමාන වන්නේය. මහාරෝග්‍ය ශාලා, උසස් මට්ටමේ පාසැලක් වැනි අනෙකුත් පහසුකම් කලාපයට පොදු සේවා මධ්‍යස්ථානයකදී සපයනු ලැබේ. මේ අන්දමට මුළු ප්‍රදේශය තුල කලාප 9 ක් ඇති කිරීමට නියමිතය.

එසේ ඇති කරනු ලබන ජනාවාස සංවිධානය හා පාලනය පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. කෘෂිකාර්මික යෝජනා ක්‍රම මෙහෙයවීම හා පාලනය පිළිබඳ දැනට පවත්නා සංවිධාන උපක්‍රම වලින් ඉහත සඳහන් පරමාර්ථයන් හා අපේක්ෂාවන් ඉටු කර ගැනීම දුෂ්කර විය හැකිය. නිලධාරීන් විසින් ඒකපාක්ෂිකව කරනු ලබන මෙහෙයවීම ක්‍රම ක්‍රමයෙන් ස්වකීය ප්‍රජාවේ සියළුම කටයුතු ජනතාව වෙතටම පැවරීම අරමුණු කර ගත් පාලන උපක්‍රමයන් ක්‍රියාත්මක කිරීමට ද බලාපොරොත්තු වේ. ගමක් පාසා පිහිටුවීමට නියමිත ගොවි සමාජ ගම් මට්ටමේ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම භාර ගත යුතු අතර, කෘෂිකාර්මික, වාරිමාර්ග හා ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය පිණිස නිලධාරීන් තිදෙනෙක් ද ගොවි සමාජ සමඟ එක්ව වැඩ කිරීම සඳහා පත් කෙරේ.

එම නිලධාරීන්ට ගොවි සමාජවල නිල බලයෙන් හෝ සාමාජිකත්වයක් පැවරෙන්නේ නැත. ඔවුන් එම සමාජවල කටයුතුවලට සහභාගී විය යුත්තේ ගොවීන්ගේ ඉල්ලීම හා ආරාධනය පරිදිය. රජයේත්, ජනතාවගේත් ඒකාබද්ධ ප්‍රයත්නයක් ඇති විය හැක්කේ මෙවිටයි. එසේම මෙම ක්‍රමය යටතේ රජයෙන් යම් යම් සේවාවන් ඉටු වන අතර, ජනතාව විසින් ද ස්වකීය යුතුකම් හා වගකීම් ඉටු කිරීමට නොපැකිලිව ඉදිරිපත් වනු ඇත. හිමිසුම් ගත ආර්ථිකය පිළිබඳ මූලධර්මයෙන් පැහැදිලි වන්නේ මෙවැනි තත්වයකි.

ස්වකීය කටයුතුවලදී ස්ව කැමැත්තෙන් ඉදිරිපත්ව මුළු ප්‍රජාවේ පොදු අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට සමත් ගොවි පිරිසක් අවශ්‍ය බව මෙයින් පැහැදිලි වෙයි. මේ සඳහා පදිංචි කරවීම පිණිස ගොවීන් තෝරා ගැනීමේදී මෙතෙක් භාවිතා කල ක්‍රම සංශෝධනය කළ යුතු වෙයි. ගොවිතැන පිළිබඳ අභ්‍යාසයන් හා අත්දැකීම් ඇති මෙන්ම සාමූහික වැඩ කිරීම පිළිබඳ හැකියාවන් ඇති ගොවීන් වැඩි වශයෙන් තෝරා ගැනීමට හැකිවනයේ අලුත් තෝරා ගැනීමේ ක්‍රම අනුගමනය කරනු ඇත. එසේම ජනතාව සමඟ සුහද සම්බන්ධයකින් කටයුතු කිරීමට අවශ්‍ය අවබෝධය හා පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කර ගැනීමද අවශ්‍ය වන්නේය. මේ සඳහා නිලධාරීන් හා ජනතාව අතර ඇති සංස්කෘතික පරතරය හැකිතාක් අඩු කර ගත යුතු වෙයි.

ඉහත සඳහන් ජනාවාස ක්‍රමයක් යටතේ සංවර්ධන කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට නම් යම් යම් උපකාරී සේවා පිහිටුවා ගැනීම අවශ්‍යය. වාරිමාර්ග, මංමාවත් ආදී අංග රජය විසින් සපයනු ලබන අතර, පදිංචිය සඳහා රු. 300/- ක මුදලක් ද ගෙවනු ලැබේ. දෙමසක් ඇතුළත ගොවීන් විසින් ස්වකීය ගොවි සමාජ පිහිටුවා ගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ පාරිභෝගික හා නිෂ්පාදන අවශ්‍යතා සඳහා ගොවි සමාජයෙන් ණය ලබා ගැනීමට ද වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. කන්න දෙක තුනක් ඇතුළත ගොවියා විසින්ම ස්ථිර වාසස්ථානයක් ඇති කර ගත යුතුය. මේ සඳහා එක් ගොවියකුට අක්කර 1/2 ක ඉඩම් කැබැල්ලක් ලැබේ. ගොවි බිමක් වශයෙන් එක් ගොවියෙකුට ලැබෙන්නේ අක්කර 2 ක ගොඩ ඉඩමක් හෝ අක්කර 3 ක මඩ ඉඩමකි. පදිංචි කරු අවුරුදු 25 ක් ඇතුළත තම ගොවි බිමේ වටිනාකම ගෙවා අයිතිය පිළිබඳ සින්නක්කර ඔප්පුවක් ලබා ගත යුතුයි.

ඉහත සඳහන් උපකාරී සේවාවන්ට අමතරව අධ්‍යාත්මක වශයෙන් ගොවීන්ට මෙන්ම නිලධාරීන්ට ද එකමුතුව තම තමන්ගේ සංවර්ධන කටයුතු කර කියා ගැනීමට හැකිවන සේ ඔවුන්ට පුහුණුව හා අභ්‍යාසය ලබා දෙන ප්‍රජා සංවර්ධන හා පුහුණු කිරීමේ ක්‍රමානුකූල වැඩ සටහනක් ද ක්‍රියාත්මක කරනු ලැබේ. ගොවි ජනතාවට මුහුණ දීමට සිදු වන ප්‍රශ්න ඔවුන් හා ව්‍යාපෘත නිලධාරීන් අතර නිරතුරු සංවාදයක් මගින් හඳුන්වා ගන්නා අතර ගොවි සමාජය හා නිලධාරීන් අතර, ප්‍රශ්න සාර්ථකව විසඳා ගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් ඇති වන පරිදි වැඩ පිළිවෙලවල් සකස් කරනු ලැබේ. ජනපද ව්‍යාපාරවලදී ගොවීන් සතු පිනිසත් බව නොසලකා ඔවුන් යාන්ත්‍රික තත්වයක ලා සැලකූ අතීත ආකල්පයන් ඉවත් කරනු ලබන අතර, මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ජනාවාස ක්‍රමයෙහි වැදගත්ම අංගය වනුයේ ගොවියා පිනිසෙකු ලෙස සලකා ඔහුට ඔහුගේ සමාජයීය හා ආර්ථික පරිසරය තුළ තෘප්තිමත් පුද්ගලයෙකු ලෙස ජීවත් වීමට මං සලසා දීමයි.

## සමුපකාර ගම්මානවල ඇතැම් ගැටළු

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ එන්. ජයනාදන්
මහතා විසිනි.

සමුපකාර ගම්මානයක ආරම්භක වැඩ කටයුතු සඳහා විවිධ ප්‍රමාණයේ මූලධන ආයෝජනයක් අවශ්‍ය වන්නේය. එවැනි ව්‍යාපාරයක නිශ්චිත කාර්යයන් සඳහා විවිධ ආධාර ගණනාවක් මුල් අවස්ථාවෙහිදී රජය විසින් සපයනු ලැබේ. මෙයින් අදහස් කෙරෙනුයේ එකී ව්‍යාපාරය සවිමත් ආර්ථික ඒකකයන් බවට පරිවර්තනය කිරීමෙහි ලා සාමාජිකයන්ට සහාය වීමකි.

අතීතයේදී ආරම්භ කරන ලද ජනපද ව්‍යාපාර වලදී මෙන් නොව සමුපකාර ගම්මාන සඳහා රජයේ මුදල් ආයෝජනය කරනු ලැබෙනුයේ බැංකු මාර්ගයෙනි. මෙවැනි ව්‍යාපාරයක් ආර්ථික වශයෙන් ශක්තිමත් තත්වයකට පත් වූ පසු ව්‍යාපාරයෙහි තත්වය සොයා බලා ණය මුදල් ලබා දීමේ හැකියාව පිළිබඳව තීරණයක් කරන ලෙස බැංකුවලට උපදෙස් දී ඇත.

සමුපකාර ගම්මාන ව්‍යාපාරයක මුල් අවස්ථාවේදී වගා කටයුතු සඳහා අවශ්‍ය වන බීජ වර්ග, පොහොර යනාදිය ද බැංකුව මගින් ගත හැකි ණය මුදලකින් ලබා ගත හැකි අතර එම ණය මුදල් පහසු වාර මුදල් වලින් ආපසු ගෙවීමට පිළිවන. සමුපකාර ගම්මානයක් සඳහා දෙනු ලබන දීර්ඝ කාලීන ණය අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් යත තෙත් පොලියෙන් නිදහස් වන්නේය.

සමුපකාර ගම්මානයක් භාරව කටයුතු කරන ව්‍යාපාර කළමනාකරුවෙකුට පැවරෙන වැදගත් වගකීමක් නම් බැංකු මෙන්ම අනෙකුත් ආයතන මගින් ද ලැබෙන ණය මුදල් නිසි පරමාර්ථයන් සඳහා වැය කරනු ලැබේද යන බවට වග බලා ගැනීමයි. කිසියම් ණය මුදලක්පිළිබඳව අවසාන නිශ්චිත තීරණයක් පාලන මණ්ඩලය විසින් ගනු ලැබුවද එම ණය මුදල වැය කිරීම පිළිබඳව පරීක්ෂා කිරීමේ කාර්යය පැවරෙනුයේ ව්‍යාපාර කළමනාකරුවන් වෙතය.

ව්‍යාපාර කළමනාකරුවෙකු වශයෙන් ව්‍යාපාරයේ සාමාජිකයන් අතර වැඩ කටයුතු බෙදා දීමේ ප්‍රශ්නයට ද මුහුණ දීමට සිදු විය හැකිය. සමුපකාර ගම්මානයක වගා කටයුතු පිළිබඳව විවිධ අංශ තිබේ. කිරි පට්ටි අංශය, වැල් දොඩම් අංශය, උක් කොටු අංශය ආදී වශයෙනි. සාමාජිකයන් වශයෙන් ඉටු කරනු ලැබිය යුතු විවිධ කාර්යයන් සඳහා ඔවුන් කවර ආකාරයකින් යෙදවිය යුතු වන්නේද යන්න තීරණය කිරීම ඉතාමත් ඇළකිල්ලෙන් හා ප්‍රවේශමෙන් ඉටු කළ යුතු කාර්යයකි. ඇතැම් කාර්යයන් සඳහා සාමාජිකයන් දක්වන ආකල්පයන් සහ ඔවුන් තුළ ඇති හැකියාවන් පිළිබඳව හොඳින් දැනගෙන සිටීම අතිශයින් අවශ්‍ය වේ. ඇතැම්විට එක් සාමාජිකයෙන් කුතුළක් ඇති කිරීමේ අංශයෙහි වැඩ කිරීමට කැමැත්තක් දැක්වීමට පුළුවන. ඇතැම්විට තවත් අයෙකුට ඒ සඳහා කැමැත්තක් මෙන්ම හැකියාවක්ද තිබීමට පිළිවන. මෙවැනි හැකියාවන් මෙන්ම ඔවුන්ගේ ආකල්පයන් සොයා බලා ගැටුමක් ඇති නොවන පරිදි සාමාජිකයන් විවිධ කාර්යයන්හි නිරත කරවීම ව්‍යාපාර කළමනාකරුවෙකු සතු වැදගත් කාර්ය භාරයක් වන්නේය.

මාරුවෙන් මාරුවට එක් එක් අංශවලට සාමාජිකයන් යෙදවීම පිළිබඳවද ප්‍රශ්නයක් නගන ලදී. සමුපකාර ගම්මානයෙහි විවිධ අංශ පිළිබඳව සෑම සාමාජිකයෙකුම දැනගෙන සිටීම වැඩ දායක වුවත් එක් කාර්යයක නිරත සාමාජිකයෙක් නිතර නිතර තවත් කාර්යයක යෙදවීමෙන් අවසාන

වශයෙන් ලැබෙන ප්‍රතිඵලය වැඩ දායක නොවන්නට පිළිවන. මේ කරුණු සළකා බලා ඇතැම්විට සෑහෙන කාලසීමාවකින් පසුව සාමාජිකයන් එක් කාර්යයකින් තවත් කාර්යයකට මාරු කිරීම ගැන තීරණයක් ගැනීමට ව්‍යාපාර කළමනාකරුවෙකුට පිළිවන.

නිදසුනක් වශයෙන් වැල් දොඩම් වගාව සම්බන්ධයෙන් වැඩ කරන සාමාජිකයන් හට එක් කන්නයක්වත් අවසාන වන තෙක් එහි වැඩ කිරීමට ඉඩක් තිබිය යුතුය. වෙනත් අංශයක වැඩ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් කැමැත්තක් දක්වන්නේ නම් කන්නය අවසාන වූවාට පසුව එම සාමාජිකයන් වෙනත් කාර්යයන් සඳහා මාරු කිරීමට පිළිවන.

ව්‍යාපාර කළමනාකරුවන් හට මුහුණ දීමට සිදු වන තවත් ප්‍රශ්නයක් නම් සාමාජිකයන් අතර සිටින වැඩ පැහැර හරින්නන් පිළිබඳව ප්‍රශ්නයයි. මෙවැන්නක් නිවැරදි කර ගැනීමට හැකියාවක් නොමැති නම් ඒ සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කිරීමට සමූපකාර ගම්මාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂ විධි විධාන ඇත.

සමූපකාර ගම්මානයකින් ලැබෙන ඉතිරි කිරීම් කවර ආකාරයකින් යෙදවිය යුතුද යන බවද සැළකිලිමත් විය යුතු ප්‍රශ්නයකි. මුල් අවස්ථාවේදී ඉතිරි කිරීම් සාමාජිකයන් අතර බෙදා දීමට අදහස් කරනු නොලැබේ. ඒවා සමූපකාර ගම්මාන ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනය සඳහා උපයෝගී කර ගනු ඇත. හදිසියෙන් කිසියම් භෝගයකින් ලද සෑහෙන ආදායමක් අනුව ලැබෙන ඉතිරි කිරීම් වලින් කොටසක් සාමාජිකයන් හට දිරි ගැන්වීමේ දීමනාවක් වශයෙන් බෙදා දීම පිළිබඳව කල්පනා කර බැලීමට පිළිවන.

සමූපකාර ගම්මානයක තවත් වැදගත් අංශයක් වනුයේ සාමාජික සහභාගිත්වයයි. පාලක මණ්ඩලයට අයත් වන සාමාජිකයන් මෙන්ම අනෙකුත් සාමාජිකයන්ද රැස්වීම්වලට සහභාගී වීම තහවුරු කළ යුතු අතර එම රැස්වීම්වලදී ඔවුන්ගේ අදහස් නිරතුරුවම ඉදිරිපත් වන විධියට කටයුතු සැළසීමට ව්‍යාපාර කළමනාකරු උත්සුක විය යුතුය. සාමාජිකයන් හට නිහඬ පුද්ගලයන් ලෙස සිටීමට ඉඩ දිය යුතු නොවේ. ව්‍යාපාරයේ පරිපාලනය පිළිබඳව සම්පූර්ණ වගකීම අවසාන වශයෙන් ඔවුන් වෙත පවරා දීම අපේක්ෂා කරන හෙයින් සෑම සාමාජිකයෙක්ම ව්‍යාපාරයේ කාර්යශීලී උද්යෝගීමත් පුද්ගලයන් විය යුතුය.

සමූපකාර ගම්මාන වලින් මෙතෙක් ලද අත්දැකීම් අනුව නිගමනය කළ හැක්කේ අක්කර දෙකකට ආසන්න බිම් ප්‍රමාණයකින් එක් සාමාජිකයෙකුට රු. 300/- ක පමණ මාසික ආදායමක් ලබා ගත හැකි බවයි. මෙවැනි ආදායම් තත්වයක් ඇති කර ගැනීමට ව්‍යාපාර කළමනාකරුවන් සෑමවිටම සාමාජිකයන් හට උපදෙස් දිය යුතුය.

කණ්ඩායම් වශයෙන් වැඩ කිරීම සහ නායකත්වය ද සමූපකාර ගම්මානයක ඉතාමත් වැදගත්ය. අද තරුණයන් හෙට නායකයන් බවට පත් වන හෙයින් නායකත්වයේ නියම ලක්ෂණ ඔවුන් තුළ බිහි කරවීමට කටයුතු කළ යුතුය. විශේෂයෙන් තරුණ පිරිසක් සමඟ කටයුතු කිරීමට ඉදිරිපත් වන ව්‍යාපාර කළමනාකරු, ව්‍යාපාරයට අදාළ වන සාමාජික ප්‍රශ්න පිළිබඳව පුළුල් අවබෝධයක් ඇති කර ගැනීම අත්‍යවශ්‍ය වන්නේය.

## කෘෂිකාර්මික ජනාවාසකරනයෙහි ඇති ගැටළු

කෑගල්ල දිසාපති කපිල පතිරණ විමලධර්ම මහතා විසිනි.

තරුණ ජනාවාස ක්‍රම ශ්‍රී ලංකාවෙහි නව හැඳින්වීමක් නොවේ. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් පසුගිය දශකවානුවේ ඇතැම් ප්‍රදේශවල ජනපද ව්‍යාපාර අරඹා තරුණයින් පදිංචි කරවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විනි. එහෙත් පැරණි ගොවි ජනපද ව්‍යාපාරවල දක්නට ලැබෙන ආකල්පයෙන් මෙම තරුණ ජනපද ව්‍යාපාර ද මුදා ගත නොහැකි විය. මෙම තරුණ ජනපද ව්‍යාපාර බොහෝවිට සාමූහික පදනමක් මත නොව පෞද්ගලික ඉඩම් කට්ටි හිමි පදනමක් මත කරගෙන යන ලදී.

විශාල වශයෙන් මූලධන ආයෝජනයක් ඇතිව ආරම්භ කරන ලද මෙවැනි ව්‍යාපාරයන්හි සාර්ථකත්වය අවිනිශ්චිත වූ හෙයින් ජනාවාස කරනය පිළිබඳව නව අදහස් ඉස්මතු වන්නට විය. සාමූහික වශයෙන් තරුණයින් කෘෂිකාර්මික කාර්යයෙහි නියුතු කරවීමේ නව ආකල්පයක් බිහි වූයේ රැකියා නොමැති තරුණයින් හට ස්වාධීන ජීවනෝපායක් ලබා දීමේ පරමාර්ථය පෙරදැරි කරගෙනය. සාමූහික පදනමක් මත ආරම්භ කරන ලද තරුණ ජනාවාස යෝජනා ක්‍රම බොහොමයක් පිහිටා ඇත්තේ තෙත් කලාපයේ වතුවලය. සමූපකාර සම්මාන, තරුණ ජනාවාස යෝජනා ක්‍රම වැනි මෙවැනි යෝජනා ක්‍රම දැන් තරමක් දුරට ප්‍රචලිතව ඇත.

එම සාමූහික රටාව තුළ මෙතෙක් ලද අත්දැකීම් පිළිබඳව සළකන කල්හි සාමූහිකත්වය පිළිබඳ සංකල්පය තරුණ පෙලට පමණක්නොව යෝජනා ක්‍රම සැළසුම්කරන සහ ක්‍රියාවට නගන නිලධාරීන්ට පවා අමුතු දෙයක් බව පෙනී යයි. රජයේ නිලධාරීන් පිළිබඳව සළකන කල්හි සමාජවාදී අදහස් පිළිබඳව තැකීමක් නැති පිරිසක් හැටියට අන්තවාදීව ඔවුන් ගැන සළකනු ලැබෙන අතර අනෙක් අතට තරුණයින් පිළිබඳවද සළකන කල්හි විප්ලවීය අදහස් අතින් අන්තවාදී දර්ශනයක් පසු පස දිව යන පිරිසක් ලෙස සැලකීම සාමාන්‍ය සිරිතක් බවට පත්ව ඇත. එහෙත් මෙම ආකල්පය සම්පූර්ණයෙන්ම සාවද්‍යය. කිසියම් රාමුවක් තුළ දීර්ඝ කා ලයක් තිස්සේ හිරවී තිබීම හේතුකොටගෙන එක් කොටසකට නිරවශේෂයෙන්ම ලැබී ඇති දර්ශනයක් වෙනස් කිරිම එක් රැයකින් සිදු කළ හැකි දෙයක් නොවේ. මෙවැනි පිරිසක් පෙරලියකට යොමු කිරීමද පහසු දෙයක් නොවේ. එහෙයින් නව අදහස් ඔවුන් තුළට පිවිසවිය හැක්කේ පුහුණුවක් මගිනි. සාමූහිකත්වය පිළිබඳ සංකල්පය ද පුහුණුව හා බැඳියාව තුළින් සාර්ථක කර ගත හැකි බව දැන් ප්‍රත්‍යක්ෂව ඇත.

සාමූහික ජනවාසයකට සවිරසාර පදනමක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වන්නේය. මෙවැනි ජනාවාස පසු තලයෙහි අනාගතය තෙක් දිව යන කිසියම් නිශ්චිත දර්ශනයක් තිබිය යුතුය. මෙවැනි ව්‍යාපාරයක වැඩ පිළිවෙල එදිනෙදාට පමණක් සීමා විය යුතු නොවේ. සමීප වශයෙන් සළකා බැලීමේදී කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම හා රැකියා අවස්ථාවන් සැපයීම තරුණ ජනාවාස යෝජනා ක්‍රමයක අරමුණ වූවද ඊට වඩා දූරදර්ශී සංකල්පයක් මෙම ජනාවාසකරනය පිළිබඳ වැඩ පිළිවෙලට නිතැතින්ම අයත් වි ය යුතුය.

මෙනයින් අනාගතය තෙක් දිවෙන දර්ශනය ගැන සළකන විට එය දේශපාලනය පිළිබඳ හැඟීමගින් තොරව කල නොහැක්කක් වන්නේය. රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින

නිලධාරීන් වශයෙන් එම ප්‍රතිපත්ති ආශ්‍රිත දර්ශනය පිළිබඳ අවබෝධයක් ලබා ඒවා ක්‍රියාත්මක කිරීමේදී කිසියම් බැඳියාවක් ඇති කර ගැනීම වැදගත් වේ.

ඇතැම්විට තරුණ ජනාවාස කරනය විනාශකාරී ව්‍යාපාරයක් ලෙස විවේචනයට ලක් වීමට ඉඩ තිබේ. එවැනි විවේචනයක් කළහැකි වන්නේ මෙම ව්‍යාපාරවලට විදේශීය දේශපාලන දර්ශනයක් පිළිබඳ අදහස් සමීප කළහොත් පමණකි. අප රටෙහි පිහිටුවනු ලබන ජනාවාස උදෙසා පිට රටින් ගෙන ආ දර්ශනයක් හෝ බැහැරින් උපුටා ගත් ආකෘතියක් අවශ්‍ය නැත. ඇතැම්විට ඈත අතීතයේ අප සතුව තිබූ වටිනා ආකෘති හා ආදර්ශ අපට නැවත පුනරුත්ථාපනය කිරීමට පිළිවන. ඊශ්‍රායලයෙහි දක්නට ලැබෙන කිබුට්ස් හෝ චීනයේ දක්නට ලැබෙන කොමියුන් වැනි තරුණ ජනාවාස ක්‍රම ඒ අනුසාරයෙන්ම මෙහි පිහිටුවීම වැඩ දායක වන්නේද යන්න සළකා බැලිය යුතුය. තරුණ ජනාවාස යෝජනා ක්‍රමයන්හි ක්‍රියාකාරීත්වය හා සාර්ථකත්වය පිළිබඳව විනිශ්චයක් දිය හැකි වන්නේ ඇතැම් විට පරම්පරාවක් ගත වූ පසුවය. අපට හුරු අපට පුරුදු ආකෘතීන් සොයා ගැනීම එතරම් අපහසු නොවේ. දේශීය සම්ප්‍රදාය තුළ ගැබ්ව ඇති සංස්කෘතික-සාමාජික වශයෙන් වැදගත් සාමූහිකත්වය පිළිබඳ දර්ශන දැනුදු නොමැරී පවතින තැන් එමට ඇත. අපේ සිංහල ගැමි සමාජයේ අවිච්ඡින්නව එන හර හා ආකෘති අනුසාරයෙන් සාමූහික ජනාවාස කරනයකට අවශ්‍ය සැකිල්ල සොයා ගැනීම අසීරු නොවේ. ලංකාවේ ගම්බද පරිසරයේ තවමත් නොනැසී පවතින දිය මුරේ, බෙත්ම සහ කට්ටි මාරු වැනි ක්‍රම දැනට ඇතැම්විට වචනවලට පමණක් සීමා වී තිබුන ද ඒවායෙහි සාමූහිකත්වයේ දර්ශනය පිළිබඳ සංකල්පය ගැබ්ව ඇත. මෙවැනි සාංස්කෘතික අංග වටා ආර්ථික රටාවක් ගෙති ඇත. උතුරු මැද පළාතේ සිංහල ගම් ගොඩ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය අනුසාරයෙන් ජනාවාස කරනයෙහි අපට ගැලපෙන සාමූහික රටාව ඇතැම්විට සොයා ගැනීමට පුළුවන. සාමූහිකත්වය යනුවෙන් මෙහිදී අදහස් කෙරෙනුයේ පෞද්ගලිකත්වය මුළුමනින්ම යටත් කිරීමක් නොවේ. කිසියම් ප්‍රමාණයකින් පෞද්ගලිකත්වය ද රැකෙමින් සාමූහිකත්වය වඩාත් ඉස්මතු විය යුතුය. ශ්‍රී ලංකාවේ අත්දැකීම අනුව, දැන් තිබෙන සාමූහික ජනාවාසවලට නමක් දීම අවශ්‍ය නම් ඊට 'ගම්ගොඩ' ජනාවාස යැයි නම් කිරීමට හැකි වේ.

ජනාවාස යෝජනා ක්‍රමයකදී ඇතැම් විට මුහුණ දීමට සිදු වන ගැටළුවක් නම් වගකීම් පැහැර හරින්නන් පිළිබඳ ප්‍රශ්නයයි. මෙය බොහෝවිට සිදු වන්නේ ජනාවාසයෙහි තරුණයින් පදිංචිව නොසිටින නිසාත්, එමෙන්ම සාමූහිකත්වය පිළිබඳ හැඟීමක් ඔවුන් තුළ මැනවින් පිහිටා නැති නිසාත්ය. තෙත් කලාපයේ පිහිටවූ ඇතැම් සමූපකාර ගම්මාන හා තරුණ ජනාවාසවල පාලනය පිළිබඳ අසතුටුදායක තත්වයන් පැන නැගුනේ මුලදී මෙවැනි ජනාවාස කරනයක් පිළිබඳව අවබෝධයක් හා අත්දැකීමක් ඇති නිලධාරීන් මෙම ව්‍යාපාර මෙහෙයවීම සඳහා සොයා ගැනීමට අසීරු වූ හෙයිනි. ජනාවාසයකට ව්‍යාපාර කළමනාකරුවෙක් යොදවනු ලැබෙනුයේ තාවකාලික අඩුපාඩුවක් පිරිමැසීමට විනා චිරස්ථිත පදනමක් හෝ අධිකාලමයක් වශයෙන් නොවේ. මෙම වැඩ පිළිවෙල අවිච්ඡින්නව ක්‍රියාත්මක වුවහොත් සාමාජිකයින් බොහෝවිට ව්‍යාපාර කළමනාකරු මත රඳා පැවතීමට දක්වන නැඹුරු තාවය වැඩි වේ. එවිට සාමාජිකයින් හට පාලනය පැවරීම පිළිබඳව අසතුටුදායක තත්වයක් ඇති වීමට පිළිවන. එසේම ස්වයං පාලනය සාක්ෂාත් කර ගැනීම සඳහා එය යහපත් පදනමක් ද නොවේ.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇතැම් තරුණ ජන වාසයන්හි සාමාජිකයෝ කෙටි කාලයක් තුළ සාමූහිකත්වය පිළිබඳව ප්‍රගුනත්වයක් ලබා පාලන වගකීම් තමන් වෙත පවරාගෙන ඇත. බොහෝවිට

ගම්වල උසස් අධ්‍යාපන පහසුකම් නො ලද හෙයින් ඉගෙනීම තවා නප්පාල් වුවද සහජ නායකත්ව ලක්‍ෂණ ඇති තරුණයින් මෙවැනි ව්‍යාපාර වලදී ඉස්මතු වේ. එසේම එවැනි නායකත්වය ඉස්මතු වන විධියට පාලන ක්‍රමය ද සකස් කළ යුතු වන්නේය.

ජනාවාසයක අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා මුල් අවුරුද්දේදී යටත් පිරිසෙයින් නිලධාරීන් පස් දෙනෙක්වත් පත් කළේ සැලසුම් කරනය, ඇස්තමේන්තු ආදී මූලික වැඩ කටයුතු පිළිබඳව සාමාජිකයින්ට අවබෝධයක් නොමැති හෙයිනි. එසේම රජයෙන් සෑහෙන මුදලක් මෙම ව්‍යාපාර සඳහා වැය කරන හෙයින් එම මුදල් දූරදර්ශී වශයෙන් ආයෝජනය කිරීම පිළිබඳව සහතික වීමද අවශ්‍ය විනි. එහෙත් ක්‍රමයෙන් මේ සෑම කාර්‍යයක්ම පිළිබඳව සාමාජිකයින්ට අවබෝධයක් ලැබෙන පරිදි, මූලික සැලසුම් ඉදිරිපත් කළ යුතු වේ. වගකීම් ඔවුන් වෙත පැවරෙන පරිදි උපක්‍රම යොදා සංවිධානය ඒ අයුරින් හැසිරවීමට ව්‍යාපාර සංවිධායකට හැකියාවක් තිබිය යුතුය.

මෙවැනි ව්‍යාපාරයක් සාර්ථකත්වය කරා යොමු කිරීමට නම් ප්‍රදේශයේ දේශපාලන වාතාවරනය පිළිබඳව ද අවබෝධයක් සාමාජිකයින්ට තිබිය යුතුය. යටත් පිරිසෙයින් මුල් අවස්ථාවේදීවත් මෙවැනි ව්‍යාපාර සඳහා දේශපාලන නායකත්වයක් තිබිය යුතුය. එවැනි නායකත්වයකින් ලැබෙන ශක්තිය ව්‍යාපාරයේ කටයුතු සඳහා මහෝපකාරී වන්නේය. එහෙත් ක්‍රම ක්‍රමයෙන් ස්වයං පාලනය වර්ධනය වන ආකාරයට, බාහිර අය අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් සහ එදිනෙදා පරිපාලනයෙන් ඈත් විය යුතුය.

සමූපකාර ගම්මානය අවට ඇති පරිසරයෙහි සමාජමය, ආර්ථිකමය හා සංස්කෘතිකමය පෙරළියක් ඇති කිරීමට ද සමූපකාර ගම්මාන පොහොසත් විය යුතුය. මෙවැනි ව්‍යාපාරයක අනුගමනය කරන කෘෂිකාර්මික නවීකරන ක්‍රම යනාදිය අවට ගම්වල ප්‍රචලිත වීමට අවකාශ ලබා දීමෙන් හෝ වෙනත් නොයෙකුත් ආකාරයේ කටයුතු වලින් ගම්වාසීන් සමඟ ආර්ථික හා සාමාජික සම්බන්ධතාවයන් ඇති කර ගැනීම ඇතැම් අනියම් බාහිර කරදර වලින් මිදීමේ මාර්ගයක් වේ. ශ්‍රම දානය ආදී කටයුතු මගින් ගම්වාසීන් සමඟ සුහද සම්බන්ධතාවයන් ඇති කර ගැනීමට සමූපකාර ගම්මාන සැලකිලිමත් විය යුතුය. සමූපකාර ගම්මානයකින් අවට ගම්වලට ආලෝකයක් වැටෙන විදියට එහි කටයුතු සකස් කිරීම ඉතාමත් වැදගත් වේ.

පොදුවේ ගත් කල ස්වයං පාලනය පිළිබඳ අවබෝධයක් තරුණ පිරිසට ලබා දීමටත්, අඩු වියදමෙන් රැකියා සැපයීමේ අවශ්‍යතාවයන් ලබා ගැනීමටත්, සංවර්ධනයට සහභාගී වීමටත් අරමුණු කෙරෙන ජනාවාස යෝජනා ක්‍රම වනාහී අවම මුදල් ආයෝජනයක් කර ඇති සරල ව්‍යාපාරයක් හැටියට සැලකිය හැකි වේ.

---

# කෘෂි භාණ්ඩ අලෙවිය පිළිබඳ ගැටළු

පරීයේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී පියදාස සේනානායක මහතා විසිනි.

අලෙවිකරණය යන්නෙන් සරලව අදහස් වන්නේ නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩය මාරු වීමයි. නිෂ්පාදකයා බොහෝවිට කරන්නේ භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමයි. එමගින් ඒ තුළට ස්වරූපී උපයෝගිතාවයක් ඇතුළු කිරීමයි. භාණ්ඩයක් නිපදවන තැනැත්තාම එය පරිභෝජනය කරන්නේ නම් එතැනදී අලෙවිකරණයක් ඇත්තේ නැත. යමෙකු නිපදවන භාණ්ඩයක් පරිභෝජනය කරන්නා වෙනකෙකු වීම වෙළඳපොල අර්ථ ක්‍රමයක ලක්ෂණයකි. පාරිභෝගිකයෙකුට අවශ්‍ය වන කිසියම් භාණ්ඩයක් අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ස්ථානයේදී අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ලබා දීම අලෙවිකරනයෙන් කරනු ලබන්නකි. ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් ගත් කළ එය්ද පාරිභෝගිකයාට උවමනා අවස්ථාවේදී ලබා ගැනීමට හැකියාවක් නො තිබුනොත් ඉන් ප්‍රයෝජනයක් ඇත්තේ නැත. එම භාණ්ඩය තමාට අවශ්‍ය ස්ථානයේදී ලබා ගත හැකි වීම ද එවැනිම වැදගත් කරුණකි. මෙම කරුණු දෙක ඉටු වන්නේ අලෙවිකරණය මගින් නිසා, කිසියම් භාණ්ඩයකට හෝ සේවාවකට කාල උපයෝගිතාවයක්, ස්ථාන උපයෝගිතාවයක් අන්තර්ගත කරන්නේ අලෙවිකරණය මගින් බව කිව හැකිය.

අද නිතර නිතර අසන්නට ලැබෙන දෙයක් නම්, විශේෂයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ නිපදවන්නාට ඒ සඳහා සාධාරණ මිළක් නො ලැබෙන බවය. අනික් අතට ඒවායේ පාරිභෝගිකයන්ට ඉතා අධික මිළක් ගෙවීමට සිදුවන බවය. පාරිභෝගිකයා ගෙවන මිලෙන් කවර ප්‍රතිශතයක් නිෂ්පාදකයාට ලැබුණොත් එය සාධාරණ මිළක් වේද? යන්න මෙහිදී වැදගත් වන ප්‍රශ්නයකි. මෙහිදී නිෂ්පාදකයා ලබන මිල හා පාරිභෝගිකයා ගෙවන මිල අතර පවත්නා පරතරය හඳුනා ගැනීම වැදගත්ය. මෙම පරතරය අලෙවිකරණ වියදම් ලෙස බොහෝවිට හඳුන්වනු ලැබේ. සමහරෙකු පෙන්වා දෙන අදහසක් නම්, නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩය ගමන් කිරීමේදී ඊට උපකාර වන ආයතනයන්ගේ සංඛ්‍යාව උඩ මෙම පරතරය රඳා පවත්නා බවය. භාණ්ඩයක පාරිභෝගිකයා නිෂ්පාදකයාම වූ විට අලෙවිකරණයක් අවශ්‍ය නොවන්නාසේම මිල පරතරයක් හෝ මිල පිළිබඳ ප්‍රශ්නයක්වත් ඇති වන්නේ නැත. එහෙත් නිෂ්පාදකයා කෙලින්ම පාරිභෝගිකයෙකුට තම භාණ්ඩය විකුණන විට ඒ සඳහා මිලක් නියම වන අතර පාරිභෝගිකයා ගෙවන සම්පූර්ණ මිල නිෂ්පාදකයාට ලැබේ. එසේම, නිෂ්පාදකයාගෙන් භාණ්ඩය මිලදී ගෙන එය පාරිභෝගිකයාට විකිණීම සඳහා අතරමැදියකු ඇති වූ විට, (අපි ඔහු 'වෙළෙන්දා' ලෙස හඳුන්වමු) පාරිභෝගිකයා ගෙවන සම්පූර්ණ මිල නිෂ්පාදකයාට නොලැබේ. මන්ද? එම කාර්යයේදී නිෂ් පාදකයාටත් පාරිභෝගිකයාටත් සහාය වූ වෙළෙන්දාට පාරිභෝගිකයා ගෙවූ මිලෙන් යම් ප්‍රමාණයක් ලබා ගැනීමට සිදු වන හෙයිනි. වෙළෙන්දා විසින් තබා ගන්නා මෙම ප්‍රමාණය, එම භාණ්ඩ අලෙවියේදී ඔහු විසින් දරණ ලද වියදම් (එනම්, ප්‍රවාහන ගාස්තු, ගබඩා ගාස්තු, සේවක වැටුප්, ගෙවල් කුලී, විදුලිය වැනි පොදු කාර්ය වැය ආදිය) සහ එම කාර්යයේ තවදුරටත් යෙදී සිටීමට අවශ්‍ය වන කිසියම් ගෙවීමකින් ද සමන්විත වනු ඇත. මෙම ගෙවීම ලෙස ඔහු තබා ගන්නා ප්‍රමාණය විශාල වුවහොත් වෙනත් පුද්ගලයින් ද ව්‍යාපාරයට පිවිසීමෙන් එයින් කොටසක් කඩා ගැනීමට උත්සාහ දරනු ඇත. තරඟ න්‍යාය යටතේ, මෙසේ පිටතින් පුද්ගලයන් ඇතුළු වීම නවතින්නේ, එහි යෙදී සිටින සියළු දෙනාටම ව්‍යාපාරයේ තවදුරටත් රැඳී සිටීමට පමණක් සෑහෙන ''ප්‍රමාණික ලාභ'' පමණක් ලැබෙන විටය.

එහෙත් ව්‍යවහාර ලෝකයේදී ඇති තත්වය නම්, ආර්ථික විද්‍යාවේදී ඉගැන්වෙන තරඟ න්‍යාය අකුරට ක්‍රියාත්මක නොවීමය. බොහෝවිට අපට අද දකින්නට ලැබෙන්නේ තරඟයේ අසම්පූර්ණ අවස්ථාවකි. අලෙවිකරණ ක්‍රියාවලියේදී එක් එක් අවස්ථාවේදී සහභාගී වන ආයතන හා පුද්ගලයන් අතර එකමුතුකමක්, ගිවිසුම්වලට එළඹී මිල කිසියම් මට්ටමක තබා ගැනීමේ හැකියාවක් ඔවුන් සතුව පවතී. මේ නිසා තරඟ න්‍යායෙන් කියැවෙන අන්දමට ඔවුන්ට එම ව්‍යාපාරයේ රැඳී සිටීමට පමණක් උවමනා කරන ප්‍රමාණයට වඩා අත්‍යාධික ලාභ ලැබීමක් දක්නට පුළුවන.

මීට අමතරව, බොහෝවිට පාරිභෝගිකයා හා නිෂ්පාදකයා සම්බන්ධ කරන අතරමැදියන් ඇත්තේ එක් අයකු පමණක් නොවේ. ඕනෑම භාණ්ඩ අලෙවියක් සම්බන්ධයෙන් අද විවිධාකාර අතරමැදියන් රාශියක් දක්නට ලැබේ. තොග වෙළඳුන්, කොමිස් නියෝජිතවරුන්, ප්‍රවාහන නියෝජිතයන්, භාණ්ඩ රැස් කිරීමේ යෙදී සිටින්නන්, සිල්ලර වෙළඳුන් ආදී වශයෙනි. ඒ නිසා අලෙවිකරණයේදී සම්බන්ධිත අතරමැදියන්ගේ ගණන වැඩි වූ තරමට නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර පවත්නා මිල පරතරය ද වැඩි වන බව එක් අතකින් දැක්විය හැකිය.

නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර පවතින මිල පරතරයට තවත් හේතුවක් නම් අලෙවිකරණ ක්‍රියාවලියේදී යම් යම් සේවාවන් රැසක් සැපයීමට සිදු වීමයි. විශේෂයෙන් කෘෂිකාර්මික ද්‍රව්‍ය අලෙවිය සම්බන්ධයෙන් කල්පනා කරනවිට තැන තැන විසිර පවත්නා කුඩා ගොවිපල වලින් අතිරික්ත නිෂ්පාදනයන් රැස් කර ගැනීම, ගබඩා කිරීම, වර්ග කිරීම, අලෙවිය සඳහා පිළියෙල කිරීම, ඇසිරීම, ප්‍රවාහනය, හා අලෙවිය සඳහා පොදු කාර්ය පිරිවැය දැරීම ආදී සේවාවන් රාශියක්ම ඉටු විය යුතුව තිබේ. මේ සියල්ලටමත් වඩා වැදගත් වන්නේ, අවසන් වශයෙන් භාණ්ඩය පාරිභෝජනය කරන්නා එම භාණ්ඩය මිල දී ගන්නාතෙක් අලෙවිකරන කටයුතු වලදී එම භාණ්ඩ තොගය සඳහා මුදල් යෙදවීමය. ගොවියාට තම භාණ්ඩ තොගය විකුණූ විටම මුදල් ලබා ගැනීම අවශ්‍ය වේ. එහෙත් අවසන් වශයෙන් පාරිභෝගිකයා මුදල් ගෙවන්නේ ඊට ටික දිනකට පසුවය. මේ අතරතුර කාලය සඳහා මුදල් යෙදවීම එක කරුණකි. අනික් කරුණ නම්, අස්වැන්න නෙළීමට පෙර යම් යම් අවශ්‍යයන් සඳහා ගොවීන්ට මුදල් අවශ්‍ය වීමයි. එවිට ඒ සඳහා ණය සැපයීමට ද අලෙවිකරණයේ යෙදී සිටින්නන්ට සිදු වේ.

මේ කරුණු අනුව සලකන විට කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන්නාට ලැබෙන ප්‍රමාණය සාධාරණ ද අසාධාරණද යන්න තීරණය කිරීමේදී, ඉහත කී අන්දමේ සේවාවන් සඳහා ද කිසියම් ප්‍රමාණයක් වෙන් නොකළහොත් එය අර්ථ විරහිත දෙයක් බව කිව හැකිය.

නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර මිල පරතරයට බලපාන තවත් වැදගත් සාධකයක් නම්, එම භාණ්ඩය පාරිභෝගිකයා කරා ළඟා වීමට ප්‍රථම තවත් නිෂ්පාදන ක්‍රියාවලියන්ට භාජ්‍ය වෙනවාද යන්නයි. උදාහරණයක් වශයෙන් ආහාර හා කෘෂිකර්ම සංවිධානය 1956 දී පැවැත්වූ සමීක්ෂණයකදී පෙන්නුම් කර

ඇති ආකාරයට අමෙරිකා එක්සත් ජනපදයේ පාරිභෝගිකයකු පාන් රාත්තලක් සඳහා ගෙවන මිලෙන් ගොවියාට ලැබෙන්නේ 18%ක් බවත්, ඉන්දුනීසියාවේ පාරිභෝගිකයෙක් හාල් සඳහා ගෙවූ මිලෙන් 61%ක්ම ගොවියාට ලැබුණු බවත් දක්වා තිබේ. ගොවියාගේ සිට පාරිභෝගිකයා දක්වා නිෂ්පාදනය මාරුවීමේදී තවත් ක්‍රියාවලින් ගණනාවකටම භාජනය වේ නම් මෙහිදී ඒ අලෙවිකරණ වියදම්වලට සාධාරණ පදනමක් දැක්විය හැකිය. එහෙත් අප විසින් වැලිමඩ ප්‍රදේශයේ එළවළු අලෙවිය සම්බන්ධව පැවැත්වූ සමීක්ෂණයකදී හෙළි වී ඇත්තේ පාරිභෝගිකයෙකු ගෝවා රාත්තලකට ගෙවූ මිලෙන් ගොවියාට ලැබෙන්නේ 18%ක් පමණක් බවයි. මෙය සැළකිල්ලට ගත යුතු කරුණක් වන්නේ, අලෙවිය සඳහා සූදානම් කරනු හැරෙන්නට වෙනත් නිෂ්පාදන ක්‍රියාවලියකට එම භාණ්ඩ භාජන නොවීම නිසයි. ඒ නිසා අතරමැදියන් ලෙස හඳුන්වනු ලබන වෙළඳුන් හා ඔවුන්ගේ ලාභ ආන්තිකයන් පිළිබඳ අප නිගමනවලට එළඹිය යුත්තේ ඉහත සඳහන් කරුණු ද සැළකිල්ලට ගැනීමෙනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඈත පිටිසර ගමක තක්කාලි රාත්තලක් ශත 8 ට ගොවියාගෙන් මිලට ගනු ලැබුවත්, කොළඹදී කිසි විටකත් තක්කාලි රාත්තලක් රු. 2/-ට අඩුවෙන් ලබා ගත නොහැකි නම් එතැන නිෂ්පාදකයාත් පාරිභෝගිකයාත් ගසාකෑමක් අනිවාර්යයෙන්ම සිද්ධ වෙතැයි අපට නිගමනය කළ හැක.

විද්‍යාත්මක අලෙවිකරණයක් කෘෂි භාණ්ඩ සඳහා අවශ්‍ය වන්නේ ප්‍රධාන කරුණු දෙකක් නිසාය. මින් පළමුවැන්න නම් අද සාගින්නෙන් පෙලෙන බොහෝ දෙනෙකුට එසේ වී ඇත්තේ ඔවුන්ට දැරිය හැකි ප්‍රමාණයට වඩා ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍යයන් මිළ වීමයි. මේ මිළෙන් විශාල කොටසක් අලෙවිකරණ පිරිවැයෙන් සමන්විත නිසා එම පිරිවැය අඩු කළ තරමට දුප්පත් පාරිභෝගිකයාට එම ද්‍රව්‍ය ලබා ගැනීමට එමගින් ඉඩ කඩ සැලසෙන හෙයිනි. අනික් කාරණය නම්, නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා අලෙවිකරණයෙන් සැපයෙන සානු බලයයි (Incentives). යම් නිෂ්පාදකයෙකු තමන්ගේ අවශ්‍යතා සඳහා පිරිමැසෙන ප්‍රමාණයට වැඩියෙන් නිපදවන භාණ්ඩ තොගය සාධාරණ මිලකට විකුණා ගන්නට නො ලැබෙන්නේ නම් නිෂ්පාදනය යැපුම් මට්ටමේ ඊළඟ පවතිනවා විනා වැඩියෙන් නිපදවීම පිණිසඔහු දිරි ගැන්වීමක් ඇති නොවේ. ඒ නිසා විද්‍යාත්මක අලෙවිකරණයක් පවතී නම් ගොවියාට සාධාරණ මිලකට තම අතිරික්ත නිෂ්පාදනය විකුණා ගැනමට හැකිවන නිසා ඔහු වැඩි වැඩියෙන් නිෂ්පාදනය කිරීමට පෙළඹෙන අතර ඔහුගේ ජීවන තත්වය ද උසස් කර ගැනීමට හැකි වනු ඇත.

ඒ නිසා අප නිතරම කිසියම් රටක හෝ ප්‍රදේශයක හෝ අලෙවිය පිළිබඳ පවත්නා ගැටළු පරීක්ෂා කිරීමේදී මේ අරමුණු දෙක පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතුය.

ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ එක් ක්‍රමයක් නම් රජයේ මැදිහත් වීමෙන් සහතික මිලක් නියම කිරීමයි. සහතික මිල යෝජනා ක්‍රමයක් බොහෝවිට ගොවියාට එම භාණ්ඩය විකිණිය හැකි අවම මිලක් සහතික කරයි. තම නිෂ්පාදනය අලෙවි කරගත හැක්කේ කවර මිලකට දැයි නිශ්චිත වශයෙන් දැන ගත හැකි වූ විට කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතුදැයි කල් ඇතිව නිගමනය කිරීමට ගොවියාට පහසු වේ. අද ලංකාවේ වී, කුරක්කන්, වැනි ධාන්‍ය වර්ග හා මිරිස්, කව්පී වැනි අතිරේක බෝග සඳහා, එවැනි සහතික මිළ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

සහතික මිල ක්‍රමයන්ට යටත් වන භාණ්ඩ පිළිබඳ අලෙවිය ගැන කථා කරනවිට ඒ භාණ්ඩ. ගණ දෙකකට බෙදා කථා කළ හැක.

(අ) වී හා මිරිස් වැනි වෙළඳ පොළේ සාපේක්ෂ වශයෙන් අනවය ඉල්ලුමක් ඇති භාණ්ඩ;
(ආ) කුරක්කන්, මුං ඇට වැනි ඉල්ලුම අනම්‍ය එහෙත් වී හා මිරිස් තරම් ඉල්ලුම් අනම්‍යතාවය දැඩි නැති භාණ්ඩ.

මෙයින් පළමු කී ගනය හා බැඳී පවත්නා ගැටළු දෙවන ගණයේ භාණ්ඩ සම්බන්ධව ගැටළුවලට වඩා බොහෝසෙයින් වෙනස්ය.

1. වී හා මිරිස් සම්බන්ධයෙන් පෞද්ගලික වෙළඳුන් ගෙවීමට සූදානම් මිල, රජයේ සහතික මිලට වඩා අතිශයින් වැඩිය. මෙය අප ඉහතින් දැක්වූ දෙවන අරමුණ එනම් නිෂ්පාදනය දිරි ගැන්වීම පිළිබඳව නම් සාර්ථක දෙයකි. එහෙත් පාරිභෝගිකයා පිළිබඳව අප දැක්වූ පළමු අරමුණ ගැන බැලූවිට, රජයන් විසින් ඉඩ දිය නොහැකි තත්වයකි.

2. මෙම ද්‍රව්‍යයන් සඳහා පුද්ගලික වෙළඳුන් ගෙවීමට සූදානම් මිළ, රජයේ වෙළඳ ප්‍රතිපත්තිය හා බැඳී පවතී. රජය මෙම භාණ්ඩ ආයාත කොට බෙදා හරින්නේ නම් මිල ඉතා පහල මට්ටමකට වැටීමට ඉඩ තිබේ. විශේෂයෙන් වී මිළ, සහල් සලාකය හා පිටි ලබා ගැනීමට ඇති ඉඩකඩ සමඟ සෘජු සබඳතාවයක් පෙන්නුම් කරයි.

3. මේ භාණ්ඩ සම්බන්ධයෙන් ගොවීන්ට ඇති ගැටළුව නම්, (විශේෂයෙන් වී පිළිබඳව) රජයේ ඒකාධිකාර නියෝග යටතේ සමූපකාරවලට වී භාර දීමට යාමේදී ඇති වී තිබෙන දුෂ්කරතාය. මිනුම් පිළිබඳ දුෂ්කරතා, බොල් වැලි ආදිය පිළිබඳ සම්මතයන් උවමනා ප්‍රමාණයෙන් විකිණීමට ඇති දුෂ්කරතා, මුදල් ලබා ගැනීමට ඇති දුෂ්කරතා ආදිය මෙහිදී වැදගත් වේ.

සහතික මිළ ක්‍රමය යටතේ ඇති අනෙත් භාණ්ඩ සම්බන්ධයෙන් ද ප්‍රධාන අලෙවිකරණ ගැටළු කීපයක් දක්නට ලැබේ.

1. මේ භාණ්ඩ සම්බන්ධයෙන් පුද්ගලික වෙළඳුන් ගෙවන මිල ගණන් සමහර අවස්ථාවලදී සමූපකාරය/රජය ගෙවන මිල ගණන්වලට වඩා තවමත් අඩුය.

2. ගොවි මහතුන්ගේම අදහසට අනුව ඉහත දැක්වූන කාරණයට සම්බන්ධ ඉතා වැදගත් හේතුවක් නම්, ගොවි ජනතාවගෙන් වැඩි දෙනෙක් මේ සහතික මිල යෝජනා ක්‍රමයන් ගැන හෝ ගෙවන මිළ ගණන් ගැන දැන නොසිටීමයි. වී සඳහා පවතින සහතික මිළ ක්‍රමය පිළිබඳ සෑහෙන ප්‍රචාරයක් දෙන නමුදු අනිත් භාණ්ඩ සම්බන්ධයෙන් එසේ නොමැත. මෙය එක් හේතුවක් විය හැක.

3. සහතික මිළ ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බැවින්, අස්වනු නෙලා ගත් විගසම මේ භාණ්ඩවල මිල සීඝ්‍රයෙන් පහල යන අතර, අවාරයේදී විවෘත වෙළඳ පොලේ මිළ දැඩි ලෙස ඉහළ යයි.

එළවළු, පළතුරු වැනි අනෙකුත් ගොඩ බෝග පිළිබඳ තත්වය මීට වඩා වෙනස්ය. මෙහිදී සහතික මිලක් නියම වී නැති අතර, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් සකස් කරනු ලබන පළතුරු වර්ග කීපයක් සඳහා නියමිත මිලක් ලබා ගැනීමට ඉඩ කඩ පවතී. (වැල්දොඩම්, අන්නාසි වැනි) එහෙත්, මෙහිදීත්, සමහර නිෂ්පාදකයන්ට තම ද්‍රව්‍ය අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට භාර දීමට පහසුකම් සැලසී නොමැති වීම ප්‍රශ්නයකි. විශේෂයෙන් ගම්බදව එළවළු හා පළතුරු සඳහා ඇති ප්‍රධානම අලෙවි මාර්ගය වන්නේ ප්‍රාදේශීයව පිහිටා ඇති වෙළඳාම් පොල හෝ තම නිවසට පැමිණ මේ ද්‍රව්‍ය රැස් කිරීමේ යෙදී සිටින පුද්ගලික වෙළෙන්දන්ය. සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රාදේශීය වෙළඳාම් පොළකට අයත් වන ප්‍රදේශයේ අරධ විෂ්කම්භය සැතපුම් 10ක් පමණ වේ. මෙහිදී මතු වන ප්‍රධානම ගැටළුව නම් ප්‍රවාහන පහසුකම් පිළිබඳ ප්‍රශ්නයයි. එක් අතකින් මාර්ග අපහසුකමුත් අනික් අතින් ඒවා ප්‍රවාහනය සඳහා සුදුසු වාහන නොමැති වීමත් බරපතල ගැටළුවකි. තවත් ප්‍රශ්නයක් නම් මෙවැනි වෙළඳාම් පොලක් සාමාන්‍ය යෙන් පැවැත්වෙන්නේ සතියකට එක් වරක් පමණක් වීමය. මේ නිසා ගොවින් සියළු දෙනාටම තම භාණ්ඩ එකම දිනයකදී වෙළඳාම් පොලට ගෙන ඒමට සිදු වන නිසා විශේෂයෙන් ඒ ඒ භාණ්ඩයේ නිෂ්පාදනය අධික අවස්ථාවලදී මිල ගණන් ඉතාම අඩුවේ. අනික් ප්‍රශ්නය නම් එපමන දුරක් ඉතා මහන්සියෙන් ගෙනෙන ද්‍රව්‍ය තමන්ට අවශ්‍ය මිලකට විකුණා ගත නොහැකි වුවහොත්, ආපසු ගෙන යාමට හා ගෙන ගොස් නරක් නොවී තබා ගැනීමට පුළුවන් කමක් නැති නිසා, වෙළඳුන් නියම කරන මිලකට මෙම භාණ්ඩ අලෙවි කිරීමට සිදු වීමයි. මේ නිසා මෙම ගොවියන්ගේ කේවෙල් කිරීමේ ශක්තිය ඉතාම අඩුය.

මෙහිදී ඔවුන් මුහුණ පාන අනෙක් ප්‍රශ්නය නම් වෙළඳුන් එකතු වී කරනු ලබන සාමූහික මිල අඩු කිරීම්වලට යටත් වීමට සිදු වීමය. ගම්බද වෙළඳාම් පොලවලදී බහුලව දක්නට ලැබෙන්නකි මෙය.

කිරුම් මිනුම් අතින් ඇති අසාධාරණකම් ද මෙවැනි අවස්ථාවන්හිදී ඉතාම වැඩිය. බොහෝ සමූපකාර සමිති මෙම ද්‍රව්‍ය රැස් කිරීම පිළිබඳ උනන්දුවක් නො දක්වන නිසා එම භාණ්ඩ අලෙවිය තනිකරම වාගේ පුද්ගලික වෙළඳුන් අත පවතී.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ඒ ඒ ප්‍රදේශවලට වාහන යවා එළවළු රැස් කර ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ ද ගොවීන්ගේ අදහස අනුව ඇතැම් ප්‍රදේශවල එතරම් සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවේ.

මේ ආකාරයට ලංකාවේ කෘෂි නිෂ්පාදන සඳහා ඇති අලෙවි ව්‍යුහයේ පවත්නා ගැටළු හේතු කොටගෙන පාරිභෝගිකයාටත් නිෂ්පාදකයාටත් කරදර විඳින්නට සිදු වී ඇති බව අප විසින් පිළිගත යුතුව තිබේ. මේ නිසා සමූපකාර වැනි ආයතන මේ අංශයට සම්බන්ධ වී පෞද්ගලික වෙළෙඳුන් හා තරඟයක යෙදෙන්නේ නම් එය ගොවියාට මෙන්ම පාරිභෝගිකයාට ද සහනයක් වෙනවා ඇත.

---

# ප්‍රති සංවිධානය කළ ග්‍රාමීය ආයතන හා කෘෂිකාර්මික සංවර්ධනය

ග්‍රාමීය ආයතන හා එළදා වර්ධන නීති අධ්‍යක්ෂ
අයි. කේ. වීරවර්ධන මහතා විසිනි.

දිවයිනෙහි ඇති වී තිබෙන ආර්ථික හා සමාජයීය වෙනස්කම් පසුබිම් කරගෙන කෘෂිකර්මය සැළසුම් කළ යුතු බව දැන් පිළි ගෙන ඇති සත්‍යයකි. පසුගිය වසර හෝ දෙක ඇතුළත ශ්‍රී ලංකාවේ පාලනමය ක්ෂේත්‍රයෙහි මෙන්ම කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රයෙන්හිදීත් අමුතුම මාදිලියේ පරිවර්තනයන් සිදු වෙමින් පවතී. මෙම පරිවර්තන ඒ ආකාරයෙන්ම අවබෝධ කරගෙන පරිවර්තනයට සරිලන පරිදි ආයතනික වශයෙන් අවශ්‍ය වන රටාවද වෙනස් කළ යුතු වන්නේය.

ඉතාමත් වැදගත් ලෙස සැළකිය හැකි ඉඩම් ප්‍රතිසංස්කරණය පිළිබඳව සළකන කල්හී එම ප්‍රතිසංස්කරණයට අනුරූප වශයෙන් නොයෙකුත් ආයතනික වෙනස්කම් ද සිදු කළ යුතුව ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණය බෙහෙවින් සංකීර්ණ ක්‍රියා මාර්ගයක් වන අතර එහි සාර්ථකත්වය ලඟා කර ගැනීමට නම් ඉඩම් ප්‍රතිසංස්කරණ නීති රීති ක්‍රියාත්මක කිරීමෙහි ලා උපකාරක වන විවිධ සේවාවන් ද සැපයිය යුතුය. මෙම කරුණු සලකා බලා පසුගිය වසර ඇතුළත කෘෂිකාර්මික එළදා වර්ධන පනත, කෘෂිකාර්මික ඉඩම් පනත වැනි නව පනත් මගින් කෘෂිකර්මය පිළිබඳව ඇති සම්ප්‍රදායික ආකල්පය ඉවත් කර නව ආකල්පයක් ඇති කිරීමට ආයාසයක් ගනු ලැබීන.

මෙතෙක් කල් කෘෂිකර්මය පිළිබඳව සළකන ලද්දේ වෙන් වෙන් වශයෙනි. රටෙහි නොයෙක් නොයෙක් භෝග සඳහා ඇති වන ඉල්ලුම අනුව ඒ ඒ භෝග සඳහා දක්වන අවධාරණයද වැඩි කරන ලදී. කෘෂිකාර්මික කටයුතුවල ඒකාබද්ධ තාවයක් එවකට නොතිබුණි. එහෙත් කෘෂිකර්මය යනුවෙන් ගොඩ ගොවිතැන, මඩ ගොවිතැන, සත්ව පාලනය ආදී කරුණු ඇතුළත් වන පරිදි කෘෂිකර්මය පිළි ගැනීමට නීතිමය පදනම දැන් සළසා ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණය පිළිබඳ නව ආකල්පයත්, කෘෂිකාර්මික එළදා වර්ධන කමිටු පිළිබඳ නව අදහසත් ඉදිරිපත් කරන්නේ වැටකින් වට වූ පමණින්ම ඉඩමක ඇති දේවල් පිළිබඳව එක් පුද්ගලයෙකුට තීරණයක් කිරීමට බැරි බවයි. භූමිය දැන් පොදු වස්තුවක් බවට පත්ව ඇති අතර සංවර්ධනය උදෙසා මහ පොළොව උපයෝගී කර ගැනීම පිළිබඳව වූ තීරණය මුළු රට වෙනුවෙන්ම ගැනීමට සිදු වී තිබේ.

දීර්ඝ සම්ප්‍රදායක් ඇති පාලන ක්‍රමයක ප්‍රතිඵල වශයෙන් ඇති වුනු නිලධාරී වාදය පිළිබඳ දර්ශනය දැන් යල් පැන ගොස් ඇති අතර දේශපාලන අධිකාර, ජනතා කමිටු, ගොවි කාරක සභා, එළදා වර්ධන කමිටු ආදී ජනතා ආයතන මගින් ඉතාමත් වැදගත් තීරණ ගැනීමෙහි ලා ජනතාවට සහභාගී වීම සඳහා අවස්ථාව සළසා තිබේ.

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳව පැහැදිලි දර්ශනයක් මෙතෙක් අපට නොතිබුණි. ඉඩම් සංවර්ධන ආඥා පනතේ සංවර්ධනය පිළිබඳ මූලික පදනමක් ඇත. එමෙන්ම කුඹුරු පනතින් අඳ ගොවියන් හට අඳ අයිතිය ආරක්ෂා කර දීමට උත්සාහ කරන ලද්දේ අස්වැන්න වැඩි කෙරේතැයි යන අපේක්ෂාවෙනි. එහෙත් මෙම කරුණ පිළිබඳ ඒකාග්‍රතාවයක් කවර අවස්ථාවකදීවත් දක්නට

නො ලැබුණි. කෘෂිකාර්මික එළදා වර්ධන පනතින් මුල සිට අග දක්වාම හුවා දක්වනුයේ කෘෂිකාර්මික සංවර්ධනයයි. කෘෂිකර්මීය පිළිබඳ කාර්ය සංවිධානය එහි පැහැදිලිව දක්වා ඇත. පහත සඳහන් කරුණු මෙම පනතින් පැහැදිලි කර තිබේ.

1. ඉඩමක් පරිහරනය කරන්නෙක් සතු වගකීම් – වගා කළ යුතු භෝග පිළිබඳව තීරණය කිරීම, මනා තත්වයකින් ඉඩම පරිභෝජනය කිරීම හා සංරක්ෂණය ආදිය.
2. පොදු වගකීම් – කලට වේලාවට ගොවිතැන් කිරීම.

මෙවැනි කරුණු සඳහා නීතිමය වශයෙන් කටයුතු කිරීමට කෘෂිකාර්මික එළදා වර්ධන පනතින් ඉඩ කඩ සැලසේ.

දිවයින පුරා පිහිටුවා ගෙන යනු ලබන එළදා වර්ධන කමිටුවලට නොයෙක් බලතල පැවරීමට තීරණය කර ඇත. රජයේ ප්‍රතිපත්ති ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් බිහි කරන ලද මෙම ආයතනික රටාව සංවර්ධන ක්‍රියාවලියෙහි ලා බෙහෙවින් වැදගත් වන්නේය. ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු අළලා පරිපාලන වශයෙන් සංවර්ධන වැඩ පිළිවෙලක් ඉදිරිපත් කිරීමට එළදා වර්ධන කමිටුවට අවස්ථාව සැලසේ. ගොඩ මඩ වශයෙන් සෑම කෘෂිකාර්මික ඉඩමකටම අදාළ වන පරිදි නීතිමය බලතල මෙම කමිටුවට ලැබෙන අතර දේශපාලනමය වශයෙන් ප්‍රබල ශක්තියක් ද ලැබෙන්නේය. 1975/76 කෘෂිකාර්මික ක්‍රියාත්මක වැඩ සටහන් සකස් කිරීමේ භාරධූර වගකීම එළදා වර්ධන කමිටුවට පැවරේ. මෙතෙක් කල් ප්‍රාදේශීය ආදායම් නිලධාරී මට්ටමෙන් සංවර්ධන ක්‍රියාවලිය අරභයා ගනු ලැබූ නොයෙකුත් තීරණයන් මින් පසුව ගැනීමට සිදු වන්නේ එළදා වර්ධන කමිටුවක් අනුසාරයෙනි.

ආයතනික වශයෙන් එතරම් දක්ෂතාවයන් හා හැකියාවන් ඇති පුද්ගලයින් පත් කලත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා නොයෙකුත් සේවාවන් අවශ්‍ය වේ. සේවා පහසුකම් සැලසිය නොහැකි ආයතනයක් ස්ථිර තත්වයකට පත් නොවනු ඇත. මෙම කරුණු සලකා බලා සෑම එළදා වර්ධන කමිටුවකටම ඒකාබද්ධ කෘෂි සේවා මධ්‍යස්ථාන පිහිටුවීමටත් රජය තීරණය කර ඇත. ගොවීන් හට තමන්ට අවශ්‍ය සේවාවන් එක වහලක් යටදීම ලබා ගැනීමට පිළිවන් වන පරිදි විවිධ සේවා පහසුකම් මෙම මධ්‍යස්ථානයේදී සැලසෙනු ඇත.

එළදා වර්ධන කමිටු යටතේ ගොවි කාරක සභා ක්‍රමය මුළුමනින්ම සංශෝධනය කරනු ලැබෙන අතර ගම් මට්ටමේ කෘෂිකාර්මික සැලැස්ම පිළියෙල කිරීම, ඉඩම් ලේඛනය සකස් කිරීම, එළදා වර්ධන කමිටුවේ නියෝජිතයන් ලෙස අක්කරබදු රැස් කිරීම ආදී කාර්යයන් ගොවි කාරක සභා වෙත පැවරේ. එළදා වර්ධන කමිටුවලට ප්‍රාග්ධන පහසුකම් සලසා ඇති නිසා එම ප්‍රදේශයේ ගොවි කාරක සභා මගින් කෘෂිකාර්මික අවශ්‍යතාවයන් ගොවීනට ලබා දී උසස් තත්වයේ සංවර්ධන වැඩ පිළිවෙලත් ක්‍රියාත්මක කිරීමට අපහසුකමක් ඇති වේ යයි අපේක්ෂා කළ නොහැක. ගොවි නිෂ්පාදන අලෙවි කිරීමේ ප්‍රශ්නය දැන් තරමක් ව්‍යාකූල තත්වයක පවතින හෙයින් මෙම කාරණයෙහි ලා මැදිහත් වීමටත් ගොවි කාරක සභා හා එළදා වර්ධන කමිටුවලට පිළිවන.

එක් එක් දිස්ත්‍රික්කයක් පාසා ගොවීන්ගේ අයිතිය පිළිබඳව යුක්තිය පසිඳලීමේ අභිප්‍රාය ඇතිව කෘෂි විනිශ්චය සභා පිහිටුවනු ලැබේ. මෙම විනිශ්චය සභාවලට දිස්ත්‍රික් උසාවි සතු බලතල ලැබෙන අතර එවැනි විනිශ්චය සභාවක විනිශ්චයට භාජනය වන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ නීතිමය ප්‍රශ්නයක් උඩ පමණකි.

මේ අනුව ඉඩම් නැති ජනතාව වෙත ඉඩම් බෙදා දෙනු ලැබෙන අතර එම ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය ආයතනික රටාවද, නීතිමය අධිකාලමද මෙයින් යොදා ඇත. එළදා වර්ධන කමිටු පනතේ සහ කෘෂිකාර්මික පනතේ අභිප්‍රායන් සපුරා සාර්ථක වුවහොත් සංවර්ධන කාර්යයට ජනතාව සහභාගී වීමේ විශිෂ්ට පරමාර්ථයද සාර්ථක වන්නේය.

---

# ආර්ථික සංවර්ධනයෙහි ලා ග්‍රාමීය පරිපාලන ක්ෂේත්‍රයේ කාර්ය භාරය

රත්නපුර අතිරේක දිසාපති එච්.සී.මානික්කවාසගර් මහතා විසිනි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳව කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා පාලන ක්ෂේත්‍රයෙහි ප්‍රමාණවත් පරිවර්තනයක් සිදු කළ යුතුව ඇත. මේ පිළිබඳව සළකා බැලීමේදී ආර්ථික සංවර්ධනය සඳහා අතීතයේ මෙහි පැවති ග්‍රාමීය පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳව විමර්ශනයක යෙදීම වැදගත් වන්නේය. බ්‍රිතාන්‍ය පාලන යුගයේදී ආර්ථික සංවර්ධනයත්, ග්‍රාමීය පරිපාලන ක්ෂේත්‍රයත් අතර සම්බන්ධතාවයක් නො තිබුනි. ග්‍රාමීය පරිපාලනය යනුවෙන් එවකට අදහස් කළේ නීතිය හා සාමය රැකීම සහ ආදායම් රැස් කිරීම පමණකි. එවැනි තත්වයන් යටතේ පෞද්ගලික ව්‍යවසායකයින් හට තම ව්‍යාපාරයන් දියුණු කර ගැනීමට අවස්ථාවක් ලැබෙන අතර එවකට සිටි පාලකයින්ගේ පරමාර්ථය වූයේ ඔවුන්ගේ ව්‍යාපාරයන් සඳහා සරිලන වාතාවරණයක් බිහි කිරීමය. ඉඩම් අවශ්‍ය අවස්ථාවලදී මුඩු බිම් පනත මගින් ඉඩම් ඕනෑ කරන අයට ඒවා ලබා දීමට කටයුතු සලසනු ලැබිනි.

එවකට පැවති ග්‍රාමීය පරිපාලන ක්ෂේත්‍රයෙහි ග්‍රාමීය මට්ටමේ වැදගත් පුද්ගලයෙක් වූයේ ගම් මුලාදෑනියාය. ගමෙහි වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසියම් ප්‍රමාණයක වගකීමක් ඔහු වෙත පැවරුන අතර ඔහුට ඉහළින් කෝරළේද, අනිකුත් ප්‍රාදේශීය නිලධාරීන්ද, මුළු ප්‍රදේශය භාර ආණ්ඩුවේ ඒජන්තවරුන් ද එකී පාලන ක්‍රමයෙහි වැදගත් තනතුරු ඉසුලූහ. නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීම හැරෙන්නට වෙනත් අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීමට රජයට අවශ්‍ය වූ අවස්ථාවන්හිදී මෙම කාර්ය ආණ්ඩුවේ ඒජන්ත වෙත පවරන ලදී. ඔහු මෙය ඔහුගේ අනිකුත් සහායක නිලධාරීන් වෙත භාර දී ඔවුන් ලවා එය ඉටු කරවන ලදී. මෙම ක්‍රමය වික කලක් මෙපරිද්දෙන් අනුගමනය කලායින් පසුව ප්‍රාදේශීය වශයෙන් වාරිමාර්ග ආදී වැඩ කටයුතු කරගෙන යාමේ අවශ්‍යතාවය පැන නැගුනි. එවකට මෙවැනි කාර්යයන් උදෙසා ජනතාවගේ අදහස් විමසීමක් නොතිබුණ අතර ජනතා සහභාගීත්වය ද නොවීය. මෙවැනි කාර්යයක් නිරතුරුවම අවශ්‍ය නිලධාරීන් ලවා රජයේ දිසාපති විසින් ඉටු කරනු ලැබීන.

එවකට පවා ආසියාවේ අනිකුත් සංවර්ධිත දේශයන්හි මීට වෙනස් ක්‍රම අනුගමනය කරනු ලැබීන. අසල්වැසි ඉන්දියාවෙහි පස් අවුරුදු සැලසුම් ආරම්භ කරන ලද අතර රට සංවර්ධනය කිරීම සඳහා සැලසුම්ගත ක්‍රියා මාර්ගයන් ඔවුන් විසින් අනුගමනය කරනු ලැබීන. මේ අතරතුර ග්‍රාමීය සාමාජික රටාවෙහි නොයෙකුත් සංවිධාන හා ආයතන බිහි වන්නට පටන් ගත්තේය. බ්‍රිතාන්‍ය පාලන යුගයෙහි පවා ඇතැම් බලතල සහිතව ගම් සභාව ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වූනි. ඈත අතීතයේදී ලංකාවෙහි ගම් සභා ක්‍රමයක් තිබුණු බවට සාක්ෂි ඇති අතර එම ගම් සභා තත් ගම් ප්‍රදේශය දියුණු කිරීමෙහි ලා ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් අනුගමනය කළ බවට ද සාක්ෂි ඇත. එහෙත් බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ තිබුණු ගම් සභාවට කෘෂිකාර්මික සංවර්ධනයෙහි ලා කවර හෝ කාර්ය භාරයක් නො පැවරුන. ගම් සභා ක්‍රමය ප්‍රති ශෝධනය කිරීමෙන් පසුව වාරිමාර්ග වැඩ කටයුතු ගම් සභාවට අයිති කාර්යයක් බවට පත් වූයේය. මෙපරිද්දෙන් සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ජනතා සහභාගීත්වයෙහි මූලාරම්භය ඇති වූනි. පසුව විවිධ සේවාවන් උදෙසා රජයේ දෙපාර්තමේන්තු පිහිටුවන ලද අතර ගම් සභා සතු රාජකාරී පිළිබඳවද නියමයන් ඇති කර, වෙළඳ පොළවල් පවත්වාගෙන යාම, ඇතැම් වර්ගයේ අය බදු රැස් කිරීම ආදී නිශ්චිත

කටයුතු සමූහයක් ගම් සභාව වෙත පවරා දෙන ලදී. 1948 දී පටන් ආර්ථික සංවර්ධනයෙහි ලා ගැමි ජනතාව සතු හැකියාවන් ස්වේච්ඡාවෙන් යෙදවීම පිළිබඳව සොයා බැලීමේ පරමාර්ථයෙන් ඇතිව ග්‍රාම සංවර්ධන සමිති බිහි වුනේය. ගම් සභාවලට අනුරූපව ග්‍රාම සංවර්ධන සමිති දියුණු කිරීමට අදහස් කරන ලද අතර විවිධ මාදිලියේ සංවර්ධන කටයුතු සඳහා එම සමිතිවලට අරමුදල් වෙන් කරනු ලැබීය. ආණ්ඩුවේ ඒජන්තගේ සහයෝගය ඇතිව මංමාවත්, ඇළ පාරවල් යනාදිය ඉදි කර සංවර්ධනයෙහි ලා ග්‍රාම සංවර්ධන සමිති සහාය වුවත් ඔවුන් විසින් ඉදි කරන ලද ඈ ඉදිරියටත් පවත්වාගෙන යාමට හැකියාවක් ඒවාට නො තිබුණි. මේ අයුරින් ඉදි කරන ලද මංමාවත් ආදිය නඩත්තු කිරීමේ කාර්යය ගම් සභාවට පැවරුනේය.

1956 න් පසුව කෘෂිකාර්මික සංවර්ධනයට ග්‍රාමීය ජනතාව සහභාගී කරවා ගැනීම සඳහා ග්‍රාමීය පරිපාලන රටාව සකස් කිරීම සම්බන්ධයෙන් කල්පනා කරන ලදී. ගොවි කාරක සභා දිවයින පුරා ඇති කරන ලද අතර ඒවා මගින් ජනතා සහභාගිත්වය කිසියම් ප්‍රමාණයකින් තහවුරු වුවද එය තවත් අමතර ආයතනයක් බවට පත් වුනි. ගොවි කාරක සභා ඇතැම්විට ඉඩම් හිමියන්ගේ ග්‍රහනයට හසු වූ අතර ආර්ථික සංවර්ධනයට අත දීමෙහි ලා මෙතයින් බාධා එම ගොවි කාරක සභාවලට ඇති වුනි. එසේම විවිධ සේවා සමූපකාර සමිති ඇති කරන ලද අතර පාරිභෝගික භාණ්ඩ සැපයීම සඳහා පමණක්නොව වෙනත් ආකාරයකින් විවිධ සංවර්ධන වැඩ කටයුතු භාර ගැනීමට ද හැකියාවක් මෙම සමූපකාර සමිතිවලට තිබුණේය. එහෙත් මේවා අපේක්ෂා කළ අයුරින් සංවර්ධන වූයේද යන්න විමසිල්ලට භාජනය විය යුතු කාරණයකි.

1970 දී කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා නිශ්චිත වැඩ පිළිවෙලක් පස් අවුරුදු සැලැස්මෙන් ඉදිරිපත් කරනු ලැබීන. භාරතයෙහි පස් අවුරුදු සැලැස්මක් සැකසීමේදී එය සෑම 'පංචයට්' ආයතනයකටම සහ ප්‍රාදේශීය රජයකටම යවන ලදී. මේ අයුරින් ශ්‍රී ලංකාවේ පස් අවුරුදු සැලැස්මෙන් සංවර්ධනය සඳහා ජනතාව සහභාගී කරවා ගැනීම සඳහා පළමුවරට ස්ථිර වැඩ පිළිවෙලක් ආරම්භ වුනි. මෙම පරමාර්ථය සපුරා ගැනීමේ අපේක්ෂාව ඇතිව ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල දිවයින පුරා පිහිටුවන ලදී. ජනතා සහභාගිත්වය පිළිබඳ සංකල්පය ගැමි ජනතාවට අවබෝධ කර දීමේ පරමාර්ථය ද ඇතිව මෙවැනි සංවර්ධන මණ්ඩල ඇතැම් විට එක් ගම් සභා ප්‍රදේශයකට සීමා වන පරිදි පිහිටුවනු ලැබීන. රජයෙන් මෙම සංවර්ධන මණ්ඩල සඳහා මූලික ප්‍රාග්ධනයක් සපයන ලදී. ප්‍රදේශයෙහි ඇති ආර්ථික හා තාක්ෂණික හැකියාවන් මෙන්ම මිනිස් සම්පත් පිළිබඳව ද සොයා බලා එවැනි හැකියාවන් හා සම්පත් එම ප්‍රදේශයේ සංවර්ධනයට උපයෝගී කර ගැනීම සංවර්ධන මණ්ඩලයන්හී මූලික පරමාර්ථය විය.

පුළුල් වශයෙන් සංවර්ධන කාර්ය භාරයක් ඉටු කිරීමට ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයකට ශක්‍යතාවයක් තිබේද යන්න අනාගතය විසින් විසඳිය යුත්තකි. කෙසේ හෝ මේවා ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනය මුළුමනින්ම භාර ගත හැකි සවිමත් ප්‍රබල එක් ආයතනයක් පිහිටුවීමේ වටිනාකම දැනුදු එලෙසම දක්නට ලැබේ. මෙවැනි තත්වයක් යටතේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් එළදා වර්ධන කමිටු ඇති කරන ලදී. මේවායේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය පිළිබඳව විනිශ්චයක් කිරීමට අදහස් කිරීම තවම සාධාරණ නොවේ. ශ්‍රී ලංකාවෙහි පුරාතනයේ පැවති ගම් සභාවෙන් පසුව ගොවීන් හට සිය සේවාවන් එකම වහලක් යටතේ ලබා ගත හැකි පරිදි පළමුවරට කෘෂි සේවා මධ්‍යස්ථාන දැන් ඇති කර ඇත. එසේම ඇතැම් බදු රැස් කිරීමේ

බලතල ද එළදා වර්ධන කමිටුවට පැවරේ. රු.50,000/- ක බැංකු අයිරාවක් ලබා ගැනීමට මෙම කමිටුවලට පිළිවන් වන අතර තවත් නොයෙකුත් මාර්ග මගින් ආදායම් ලබා ගැනීමට පිළිවන් වන විධියට එළදා වර්ධන කමිටු ආරම්භ කර ඇත. මෙනයින් බලන කල මෙය මුදල් අතින් මෙන්ම බලතල අතින් ද සවිමත් ආයතනයක් බවට පත් වේ. කෙසේ වෙතත් ප්‍රදේශයෙහි ගොවිතැන හා අදාළ කටයුතු පමණක් නොව වෙනත් සංවර්ධන වැඩ කටයුතු ද භාර ගැනීමේ හැකියාව එළදා වර්ධන කමිටුවට තිබේ නම් එය වඩාත් වැඩ දායක වන්නේය.

ඊට අමතරව කෘෂිකාර්මික සංවර්ධනයට දේශපාලන නායකත්වයක් දීමේ අරමුණ ඇතිව දේශපාලන අධිකාර ආරම්භ කෙරුණි. මෙපරිද්දෙන් ප්‍රාදේශීය සැලසුම් කමිටුවට ජනතා සහභාගිත්වය ලැබීම තහවුරු වන අතර ජනතාව තුළින් පැන නැඟුන නායකත්වයක් එයට හිමි වන්නේය. එහෙත් ඇත්ත වශයෙන්ම කෙලින්ම ජනතාවගෙන් අදහස් විමසීමේ ක්‍රියා මාර්ගයක් තවමත් සකස් කළ යුතුව ඇත. පහළම මට්ටමෙන් ජනතාවගේම අදහස් ඉස්මතු වන ක්‍රියා මාර්ගයකට පදනම වැටී ඇතැයි දැන් සිතිය හැක.

මෙහි ලා තවත් වැදගත් කාර්යයක් වන්නේ ප්‍රදේශයක් පිළිබඳව සළකා එම ප්‍රදේශයේ සියුම් සංවර්ධන කාර්යයන් වෙනසක් නැතිව භාර ගත හැකි එක් ආයතනයක් ඇති කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමයි. ඉන්දියාවෙහි එක් ප්‍රදේශයක සෞඛ්‍යය, වාරිමාර්ග, කෘෂිකාර්මික, කර්මාන්ත ආදී වශයෙන් සියළුම කාර්යයන් ඉටු කිරීමේ වගකීම 'පංචයට්' ආයතනයට පැවරේ. ඇතැම් විට 'පංචයට්' ආයතන සමූහයක් එක්ව පුළුල්ව විශාල ප්‍රදේශයක් උදෙසා සංවර්ධන කටයුතු භාර ගනී. චීනයෙහි එක් ගමක සංවර්ධන කටයුතු සපුරා භාර ගැනීම සඳහා 'කොමියුන්' ආයතනයක් ඇත. සාමය හා නීතිය රැකීම පමණක්නොව තත් කාලීන සැලසුම්වල තමන්ගෙන් ඉටු විය යුතු කොටස ද 'කොමියුන්' ආයතනය හොඳාකාරව දනී.

කෙසේ වෙතත් පස් අවුරුදු සැලැස්මේ ජනතා සහභාගිත්වය ද සංවර්ධන කාර්යයෙහි ලා අරමුණු කර ඇත. ප්‍රාදේශීය සංවර්ධනය එළදා වර්ධන කමිටු මගින් සිදු කෙරේ නම් එය අතිශයින් වැඩ දායක වනු ඇත. පුළුල් බලතල කෘෂිකාර්මික එළදා වර්ධන කමිටුවට ලැබී ඇති බැවින් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා ක්‍රියාරම්භ කිරීමේ ශක්තිය ඇති හොඳම ආයතනය එය වනු ඇත.

---

## අදහස් හුවමාරුව පිළිබඳ ගැටළුව

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි ඊ.කේ.පෙරේරා මහතා විසිනි.

අදහස් හුවමාරුව පිළිබඳ ක්ෂේත්‍රය නව අධ්‍යයන ක්ෂේත්‍රයකි; වෙනම විෂයයක් ලෙස පිළි ගනු ලැබුවේද මෑතක සිටය. අදහස් හුවමාරුව යනු කුමක්ද? මෙනයින් අපේක්ෂා කරනුයේ කවර ප්‍රතිපලයක්ද? මෙම ප්‍රශ්න පිළිබඳව සලකා බැලිය යුතුය.

කලින් සම්බන්ධතාවයක් නොතිබි ගම් දෙකක් එක් කරන මාවතක් ඉදි කළොත්, එම ගම් දෙකෙහි ජනතාව අතර අදහස් හුවමාරුවකට එය ඉවහල් වේ. ඈත ගම්බද පෙදෙසක තිබෙන ගුවන් විදුලි යන්ත්‍රයකින් හෝ එවැනි පෙදෙසකට ලැබෙන පුවත්පතකින්, බාහිර ලෝකයේ සිදු වන දෑ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට එම ප්‍රදේශයේ ජනතාවට පිළිවන් වේ. මේ මාධ්‍ය වලින් සිදු වනුයේ අදහස් හුවමාරුවයි.

යුරෝපයෙහි මුද්‍රණ යන්ත්‍රය පිහිටුවීමත් සමගම, 15 වෙනි සිය වසෙහිදී වර්තමාන අදහස් හුවමාරුව පිළිබඳ ක්‍රම ඇති වුනේ යැයි සලකනු ලැබේ. ඇත්ත වශයෙන්ම ඊට බොහෝ කලකට ඉහතදී මෙම විෂය මුල් බැසගෙන තිබී අතර එහි මල්පල ගැන්වුනේ මද කලකට පසුවය.

තැනින් තැනට සංක්‍රමනය වන්නෙක් ලෙස මිනිසා ජීවත් වූ, අවුරුදු දහස් ගණනක් ඈත යුගය දෙස විමසිලිමත් වෙමු. දිවා කාලයෙහි ආහාර සොයමින් තැනින් තැන යන ඔහු, රාත්‍රී කාලයෙහි සතුරන්ගෙන් හෝ නපුරු සතුන්ගෙන් සිදු විය හැකි අනතුරු වලින් මිදෙනු වස් සිය ගුහාවට වැදෙයි. ඔහු ගුහාවට පිවිසෙන දොරටුවෙහි සිය සගයෙක් ආරක්ෂකයෙකු ලෙස තවතනුයේ රාත්‍රියෙහි අවදිව සිට, ඇතැම්විට සිදු විය හැකි අනතුරක් පිළිබඳව ක්‍රියාකාරී වීමට අනෙකුත් අයට දැන්වීමේ අදහසිනි. ආක්‍රමණය පිළිබඳ තර්ජනය අවසාන වූ පසුව, එය මැඩ පැවැත්වීම සඳහා ඔවුන් ගත් ක්‍රියා මාර්ගය මින් පසුව එවැනි තත්වයකදීත් අනුගමනය කිරීමට තරම් නිවැරදිද ආදී වශයෙන් ඊස්ව සාකච්ඡා කරති.

පසුගිය සියවසර දෙකෙහිදී, විශේෂයෙන් පසුගිය දශක හය තුළ අදහස් හුවමාරුව පිළිබඳ ශිල්ප ක්‍රමය සීඝ්‍රයෙන් දියුණු විනි. අද තිබෙන මුද්‍රණ යන්ත්‍රයකට පුවත් පත් ලක්ෂ ගණනක් මුද්‍රණය කිරීමට හැකි අතර, ප්‍රකාශයට පත් කර පැය ගණනක් ඇතුළත එම පුවත් පත් කියවීමට හැකි වන අයුරු ලෝකයේ ප්‍රධාන නගර වෙත ඒවා බෙදා හැරීමට පිළිවන. වොෂින්ටන්, ලන්ඩන්, නවදිල්ලිය, පීකිං හෝ වෙනත් ඕනෑම නගරයක කියැවෙන ප්‍රවෘත්ති නිවේදනයකට කන් දීමට ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් පිළිවන් වේ. මෙහි ලා අතිශයින්ම වැදගත්ම නිපැයුම වුනේ රූපවාහිනියයි. මිනිසා පළමුවරට හඳ මත පා තබා ඇවිදින බව, විසිත්ත කාමරයක සිට දැක ගැනීමට නරඹන්නන් හට හැකි වුනේ රූපවාහිනිය මගිනි.

අදහස් හුවමාරුව පිළිබඳ ශිල්ප ක්‍රමයෙහි ප්‍රබල සංවර්ධනයක් තිබියදීත්, එම කාර්ය පද්ධතියේ ප්‍රධාන පරමාර්ථයන් අද පවා නොවෙනස්ව පවතී. එම පරමාර්ථ වනුයේ සමීක්ෂණ කාර්යය, අර්ථ නිරූපන කාර්යය, ක්‍රියාරම්භ කරවීම සඳහා පණිවිඩය වාර්තා කිරීම සහ අනුගමනය කළ ක්‍රියා මාර්ගය අවසාන වශයෙන් තක්සේරු කිරීමත්ය.

වර්තමාන කෘෂිකාර්මික සංවර්ධනය සමඟ අදහස් හුවමාරුව පිළිබඳ විෂය කවර අයුරින් ගැළපේද? වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හෝ ඉංජිනේරුවෙක් හෝ නීතිඥයෙක් වීමට පෙර අවුරුදු පහක් හයක් සරසවි මට්ටමේ පුහුණුව ලැබිය යුතු බව පිළිගත් සත්‍යයකි. එහෙත්, වෙනත් වෘත්තීය කාර්ය භාරයක් ඉසිලීමට තරම් ප්‍රවීණ නොවන, රැකියාවක් නොමැති අයෙකුට පවා ලාභ ගෙන දෙන වෘත්තියක් වශයෙන් කෘෂිකර්මය කළ හැකි බවද අපි අදහස් කරමු.

අද කෘෂිකර්මය විද්‍යාත්මක කෘෂිකර්මය විය යුතුය. කෘෂිකර්මය ව්‍යාපාරයක් වශයෙන් සාර්ථක කර ගැනීම සඳහා, පස, භෝග රටාව, සත්ව පාලනය, භූමියෙන් උපරිම පල ලබා ගැනීම, වෙළඳ පොළ මිල ව්‍යුහය අනුව වැවිය යුතු භෝග වර්ගය තෝරා ගැනීම, අලෙවි පහසුකම් ආදිය පිළිබඳව ගොවි ජනතාවට අවබෝධයක් තිබිය යුතුය. මෙවැනි ශිල්පීය කරුණු ගැන මෙන්ම තමනට අවශ්‍ය බීජ වර්ග, පෝර, ණය පහසුකම් ආදිය මැනවින් සංවිධානය කර ගැනීමටද ඔවුන් දැන සිටීම අවශ්‍ය වේ. කෘෂිකර්මය පිළිබඳ සම්ප්‍රදායික පිළිවෙත් සහ විශ්වාසයන්ගෙන් බැහැරව, එය නවීකරණයකට යොමු කරවීමේ කාර්යයෙහි ලා ගොවිතැන් කටයුතු හා අදාළ වන ශිල්පීය හා ආයතනික කරුණු ගැන අවබෝධයක් ගොවි ජනතාවට ලබා දිය යුතුය.

මෙකී ශිල්පීය හා ආයතනික කරුණු පිළිබඳ දැනුම ලබා ගත හැක්කේ විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, ආයතන හා මණ්ඩල ආදියෙහි සේවය කරන ඒ පිළිබඳ විශේෂිත දැනුම ඇති අයගෙනි. එවැනි අය සතු දැනුම එය අවශ්‍ය වන ගොවි ජනතාව වෙත ලබා දීම අදහස් හුවමාරුව පිළිබඳ විෂයය සතු ප්‍රධානතම කාර්යය වේ.

යුග දෙකක් අතර සන්ධිස්ථානයක් ඇති කරන අතිශයින් වැදගත් පනත් තුනක් පසුගිය දෙවසර තුළ සම්මත කරන ලදී. ඉඩම් සීමා කිරීමේ පනත, කෘෂිකාර්මික පලදා වර්ධන පනත සහ කෘෂිකාර්මික ඉඩම් පනත සිදු කරන පෙරළිය තවම අපට අවබෝධ වී නැත්තේ, අපි එම පෙරළියට ඉතාමත් ආසන්නව සිටින හෙයිනි. එහෙත් තව අවුරුදු 15 කදී හෝ 20 කදී රටෙහි ඉතිහාසය ලියන්නෙක්, මෙම නීතිවල ත්‍රිත්වය පිළිබඳව සඳහන් කරනු ඇත්තේ ශ්‍රී ලංකාවේ ගොවිජන සේවා ඉතිහාසයෙහි මෙතෙක් සම්මත වූ, අතිශයින් වැදගත් දූරදර්ශී නීති රීති මාලාවක් ලෙසය.

මෙම නීති රීති අනුව, මිනිසා සහ භූමිය අතර නව සම්බන්ධතාවයක් බිහි වේ; නව ආයතන ඇති වේ. පළමුවර කෘෂිකාර්මික සැලසුම් සහ සංවර්ධනය පිළිබඳ කාර්ය භාරය නිලධාරීන්ගෙන් ඉවත් කර ගොවි ජනතාව වෙත පවරනු ලැබ ඇත. කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව මහඟු ආයතනයකි. එහි නිර්මාතෘවරයන් අදහස් කරන පරමාර්ථයන් ඉටු වේ නම් මෙම ආයතනය ගොවි ජනතාවට ඉමහත් සහනයක් වනු ඇත. මෙම ආයතනය මඟින් ගොවීන් හට වැදගත් තැනක් හිමි කර දෙන අතරම එය ඔවුන් වෙත අති මහත් වගකීමක් ද පවරයි.

මෙවැනි වටාපිටාවක් යටතේ ගොවි ජනතාව වෙත පැවරෙන වගකීම් සහ ඔවුන්ගේ හැකියාවන් පිළිබඳව අවබෝධයක් ඔවුන් තුළ ඇති කරවීම ව්‍යාප්ති සේවකයින් සතු කාර්ය භාරය වේ. මෙම ආයතනවල වැඩ කටයුතුවලට සහභාගීව, තමන් වෙත පැවරී ඇති බලතල හොඳින් ක්‍රියාත්මක කිරීමටත්, නිවැරදි නිගමනවලට එළඹීමටත් ගොවි ජනතාව හට අවබෝධයක් ලබා දිය යුතු වන්නේය.

අදහස් හුවමාරුව පිළිබඳ විෂයය යනුවෙන් මෙහිදී අදහස් කෙරෙනුයේ කලින් සඳහන් කළ පරිදි දන්නා අයගෙන් දැන ගැනීමට අවශ්‍ය අය වෙත තොරතුරු සැපයීමය. ගොවි ජනතාව

සැලකිල්ලක් දක්වනුයේ, ඔවුනට අවබෝධ කර ගත හැකි, ඔවුන්ගේ ප්‍රායෝගික ගැටළු විසඳීමට ඉවහල් වනු තොරතුරු පිළිබඳවය. සිය සම්ප්‍රදායික පිළිවෙත් වලින් බැහැරව, නවීකරණයකට ගොවි ජනතාව පෙළඹවීමට අදහස් හුවමාරු මාධ්‍යය සමත් විය යුතුය. ඔහුගේ ජීවන රටාව වෙනස් කළ හැකි විය යුතුය.

පෙළඹවීම යන වචනය මෙහිදී භාවිතා කළෙමු. පෙළඹවීම යනුවෙන් අදහස් කරන සංකල්පය බෙහෙවින් දුෂ්කර අදහසකි. පුළුල්ව සලකන කළ එය දිරි ගැන්වීමක් වශයෙන් සඳහන් කිරීමට පිළිවන. නිදසුනක් වශයෙන් වගා පිළිවෙතක් අනුගමනය කරන ගොවීන් තිදෙනෙක් පිළිබඳ අවස්ථාව ගනිමු. එක් ගොවියෙක් එය අනුගමනය කර ඉදිරියටත් දියුණු කරන අතර දෙවැන්නා කෙටි කලක් එය අනුගමනය කර අත් හැර දමයි. තෙවැන්නා කෙසේවත් පිළි නොපදී. මෙහිදී පළමුවැනි ගොවියා පෙළඹවීමකට ලක් වූ බවත්, දෙවැන්නා සෑහෙන තරමින් පෙළඹවීමට හැකි වූ බවත්, තෙවැන්නා කවර හෝ පෙළඹීමකට ලක් නොවූ බවත් අදහස් කෙරේ.

පෙළඹවීම පිළිබඳ සංකල්පය සංකීර්ණ වනුයේ එයින් මානව චින්තනය සහ පැවැත්ම පිළිබඳ අධ්‍යයනයක් අදහස් කැරෙන හෙයිනි. මිනිසා කවර වූ හෝ සමාජයක, කණ්ඩායමක, ප්‍රජාවක සාමාජිකයෙකි. සෑම ජන කොට්ඨාශයකටම ආවේණික වූ සම්ප්‍රදායන්, චාරිත්‍ර වාරිත්‍ර සහ සාමාජික හා ආගමික පිළිවෙත් ඇත. සාමාජික ඒකාග්‍රතාවයක් උදෙසා මේවා ඉවහල් වුවත් ඇතැම්විට ඉදිරි ගමනෙහි ලා බාධක ලෙසද ක්‍රියාත්මක වන්නේය. දියුණුවට යොමු වන මගෙහි බාධක හැටියට සැලකෙන මානව සිතුම් පැතුම් සහ ආකල්ප වලින් පුද්ගලයින් බැහැර කිරීමට සෑම මාධ්‍යයක්ම උපයෝගී කරගත ප්‍රයත්නයක් දැරීම අදහස් හුවමාරුව පිළිබඳ විෂය ක්ෂේත්‍රයේ වැදගත් කාර්යයකි.

කෘෂිකාර්මික සංවර්ධනය වෙන් වශයෙන් සලකා බැලිය නොහැක. එය සාමාජික හා ආර්ථික පරිවර්තනයේ එක් කොටසකි. සාමාජීක-සංස්කෘතික පෙරළියක් පිළිබඳ වාතාවරණයක පමණක්, කෘෂිකාර්මික සංවර්ධනයක් සිදු විය හැක.

මෙපරිද්දෙන් තොරතුරු හුවමාරු කිරීමෙහි ලා, ජන ප්‍රචාරක මාධ්‍ය එකක් හෝ වැඩි ගණනක් උපයෝගී කර ගත හැක. ඇතැම්විට ගොවීන් මුහු ගැසී ඔවුන් සමග පෞද්ගලිකව කථා කිරීමට පිළිවන; නැතහොත් කණ්ඩායම් වශයෙන් ගොවීන් මුණ ගැසීමට පිළිවන. එසේත් නැතහොත් පුවත් පත, ගුවන් විදුලිය සහ සිනමා මාධ්‍ය මගින් ගොවි ජනතාව වෙත තොරතුරු සැපයීමට පිළිවන. මේ එක් එක් මාධ්‍යයක් සතුව එහි හැකියාවන් සහ සීමාවන් ඇත. සාමාන්‍ය තොරතුරක් හෝ තත්වයක් පිළිබඳව ගොවි ජනතාව තුළ අවබෝධයක් ඇති කිරීමට නම් ජන ප්‍රචාරක මාධ්‍ය ආධාරකාරී විය හැක. එහෙත් එකී තොරතුරු ශිල්පීය ස්වභාවයක නම් කණ්ඩායම් සහ පෞද්ගලික ක්‍රම වඩාත් වැඩදායී වේ.

ශ්‍රී ලංකාවේ වී ගොවිතැන් කරන දිස්ත්‍රික්ක පහක ගොවිජන සේවා තත්වය පිළිබඳව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයනයකදී මේ බව ඔප්පු විනි. මෙය විෂය-ඒකාබද්ධ අධ්‍යයනයක් වූ අතර ගොවියා හා අදහස් හුවමාරුව එක් අංශයක් වූයේය. නව බීජ වර්ගයක් පිළිබඳව වැනි සාමාන්‍ය තොරතුරක් කියා පෑමට ප්‍රචාරක මාධ්‍ය වඩාත් ප්‍රයෝජනවත් බවත් ශිල්පීය කාරණයක් පිළිබඳ අවස්ථාවකදී පෞද්ගලිකව අදහස් ලබා ගැනීමට ගොවීන් වඩාත් කැමති බවත් මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වූයේය.

මෙම විෂයය පිළිබඳව කටයුතු කරන්නෙක් තමා සහ තොරතුරු ලබා ගන්නන් අතර අවංක, සුහද, නිහතමානී සම්බන්ධතාවයක් ඇති කර ගත යුතුය. අප ගොවීන් හට උදව් දීමට අවංකව උත්සාහ කරන බව ගොවීන් වටහාගතහොත්, අප බලාපොරොත්තු වන පරිදි කටයුතු සිදුනොවන විටත් ඔවුන් අප සමඟ එක්ව සිටිනු ඇත.

තොරතුරු හුවමාරුව පිළිබඳ ව්‍යායාමයක සාර්ථකත්වය මැන ගත හැක්කේ කෙසේද? එය දැන ගත හැක්කේ ගොවීන්ගෙන් පමණකි. ඔබගේ පණිවිඩය ඔවුනට ලැබුනේද, එය ඔවුන් විසින් වටහා ගනු ලැබීද, ඒ අනුව කටයුතු කර කිසියම් දියුණුවක් ළඟා කර ගැනීමට ඔවුනට හැකි වූනේද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය. මෙය ඉතා අවශ්‍ය ක්‍රියා මාර්ගයකි.

ව්‍යාපාර කළමනාකරුවන් වශයෙන් ඔබගෙන් වැදගත් සේවයක් අපේක්ෂා කෙරේ. ඔබගේ කාර්යයෙහි පරමාර්ථ පිළිබඳව ඔබ තුළ පැහැදිලි අවබෝධයක් තිබිය යුතු වේ. ජනාවාසයෙහි දියුණුව ඇති කරන සාධක පිළිබඳව මෙන්ම එහි දියුණුවට බාධා ඇති කරන කරුණු දැන ගැනීමට ද ඔබට පිළිවන් විය යුතුය. ගැටළුවක් අවබෝධ කර ගත් පසු රට සම්බන්ධ අය සමඟ සාකච්ඡා කර එය විසඳා ගැනීමට තැත් කළ යුතුය. ගැටළුව ඔබගේ ප්‍රවීණතාවය ඉක්මවා යයි නම් ඒ බව දන්වා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ වෙත ලිපියක් එවන්න. ඒ පිළිබඳව අභ්‍යාස පාඨමාලාවක් මගින් හෝ වෙනත් ක්‍රියා මාර්ගයක් මගින් ඔබේ ගැටළුවට විසඳුමක් ලබා දීමට ආයතනය උත්සුක වනු ඇත.

රජයේ දෙපාර්තමේන්තු, ආයතන හා මණ්ඩල ගණනාවකින් තොරතුරු රැසක් ගලා එයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 'ගොවිකම් සඟරාව' සහ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ 'ගොවි ජනතාව' සඟරාව සිංහලෙන් හා දෙමළෙන් පළ වේ. ඔබට ප්‍රයෝජනවත් විය හැකි වෙනත් ප්‍රකාශන ගණනාවක් ඇත. මෙම ප්‍රකාශන ගෙන්වාගෙන ජනාවාස ව්‍යාපාරයෙහි සාමාජිකයින් සමඟ ඒවායේ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට පිළිවන. මෙම තොරතුරු ප්‍රයෝජනවත් වූයේද, ඔබට ඉදිරිපත් කිරීමට කිසියම් අදහසක් තිබේද යනාදිය පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවලට දැන්වීමට පිළිවන.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගොවි වැඩ සටහන් ද ඔබට ප්‍රයෝජනවත් විය හැක. මේවායේ අඩංගු වන විෂයයන් පිළිබඳව සාකච්ඡා කිරීමට, ඒ ගැන අදහස් දැක්වීමට ඉඩ ඇත. වැඩ සටහන් පිළිබඳව ඔබගේ අදහස් දැක්වීමෙන් එම වැඩ සටහන් දියුණු කිරීමට ඔබ උපකාරී වේ.

වර්තමානය පෙරළියකට මුහුණ දී සිටින කාලයකි. සංවර්ධනය වන රටවල සමාජයීය-ආර්ථික සංවර්ධනය "භයානක ආරෝහණයක්" යැයි අප්‍රිකානු නායකයෙක් වරක් පැවසීය. ඇත්තෙන්ම එය හිමාලය තරණය වැනිය. එක්වරම කඳු මුදුන දෙස නොබලා මෙතෙක් අප පියමං කර ඇති දුර කෙතෙක්දැයි සැලකිල්ලට ගෙන පියවරෙන් පියවර ඉදිරියට යාම අපගේ ප්‍රයත්නය විය යුතුය.

---

## ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසයන්හි අත්දැකීම්

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ගොඩ්ප්‍රි මුතුකුඩ මහතා විසිනි.

අවුරුද්දක පමණ කාලයක් තුළ ක්‍රියාත්මක වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාසයන්හි මූලික සංකල්පය අතිතුත් තරුණ ජනාවාස යෝජනා ක්‍රමයන්හි මූලික සංකල්පවලට වඩා මඳක් වෙනස් වේ. ජනාවාසයක් ගොඩ නැංවීමේදී අනුගමනය කරන මූලික ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඇතැම් විට වෙනස් වීමට පිළිවන. වියළි කලාපයේ ආරම්භ කරන ලද තරුණ ජනාවාස යෝජනා ක්‍රමවලදී බොහෝවිට වාරිමාර්ග පහසුකම්, මාර්ග පහසුකම් වැනි යටිතල අවශ්‍යතාවයන් සැපයීමට රජයට මුලමණින්ම සිදු විනි. එහෙත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් තෙත් කලාපයෙහි ඇරඹූ තරුණ ජනාවාසවල අලුතින්ම වාරිමාර්ග පහසුකම් සැලසීමකින් හෝ වේවා වෙනත් ක්‍රියා මාර්ගයකින් හෝ වේවා අළුත් බිමක් ජනාවාස කිරීමේ සංකල්පය දක්නට ඇත. බොහෝවිට වතු ක්‍රමය යටතේ කිසියම් මට්ටමකින් මෙන්ම භෞතිකමය වශයෙන් සංවර්ධිත තත්වයක තිබූ ඉඩමක් නව මුහුණු වරකින් ජනාවාස කිරීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාසවල දක්නට ලැබෙන මූලික ලක්ෂණයක් වේ. බොහෝවිට මෙම ඉඩම්වල අවුරුදු 50 කට පමණ පෙර සිට තිබූ භූමි පරිභෝජන රටාවන් සහ ඝෝචර වූනු ජනාවාස සැළැස්මක් දක්නට ලැබුණි. මෙනයින් කුරුණෑගල කොළඹ, පුත්තලම වැනි තෙත් කලාපීය ප්‍රදේශයන්හි පොල් වතුවලත්, රත්නපුර, නුවර, නුවරඑළිය, කෑගල්ල වැනි ප්‍රදේශවල තේ සහ රබර් වතු වලත් අරඹන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාසයන්හි ඒවාටම ආවේනික වූ විශේෂිත නව රාමුවක් ඇත.

මෙවැනි ජනාවාසයක භෞතික සැලැස්ම, භූමි පරිහරනය, ආයතනික ප්‍රශ්න සහ පොදු ප්‍රතිපත්ති සහ කාර්ය පරිපාටිය පළමු කොටම වැදගත් ලෙස සලකන ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ජනාවාසකරනයේදී බෙහෙවින්ම වැදගත් කොට සලකනු ලැබෙනුයේ භෞතිකමය සැලැස්මයි. අක්කර 400ක් හෝ 500ක් පමණ වන තේ සහ රබර් වත්තක් සඳහා අවශ්‍ය භෞතික සැලැස්ම ඉදිරිපත් කිරීමේදී මුලින්ම කරන ලද්දේ සම්ප්‍රදායික වශයෙන් පස්, ජලය සහ ඉඩම් පිළිබඳ විශේෂඥයින් විසින් එම ඉඩම පරීක්ෂා කර බලා ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කිරීමයි. දැනට තිබෙන භූමි පරිහරන රටාව, එම ඉඩමේ සංවර්ධිත හැකියාව, ජනාවාසකරනයට අවශ්‍ය වන ප්‍රාග්ධන වියදම් ආදිය පිළිබඳව සාමාන්‍ය සැලැස්මක් ප්‍රථමයෙන් ඉදිරිපත්කරනු ලැබේ. එහෙත් නිලධාරීන් විසින් සකස් කරන ලද මෙම සැලසුම් බොහෝවිට ක්‍රියාත්මක කිරීමේදී කල්පිත බවට පත් විනි. ජනාවාසයට තෝරාගනු ලැබෙන සාමාජිකයින් ද සමඟ එකතුව එම ඉඩමෙහි සංවර්ධිත හැකියාවන් පිළිබඳව සලකා කෙටි කාලීන සැලසුම් ඉදිරිපත් කරන අවස්ථාවන්හිදී බොහෝවිට නිලධාරීන්ගේ සැලැස්ම කල්පිත තත්වයකට පත්වේ. මෙවිට එම සැලැස්මට සහභාගී වන සාමාජිකයින්ගේ අදහස් අනුව එම ඉඩම පතුව පවතින

සාවාද්‍ය ඉඩම් පරිහරන රටාව නවීකරණයකට යොමු කරනු ලැබේ. සාමාන්‍ය අදහසක් ඇතිව ඉදිරිපත් කරන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී සාමාජික සහභාගිත්වය හා අදහස් උදහස් අනුව ක්ෂණික වූත් සියුම් වූත් පරිවර්තනයකට යොමු වන්නේය.

තේ, රබර් සහ පොල් වගා අනුව භූමි පරිහරන රටාවකට ඇබ්බැහි වී තිබුණු බොහෝ ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන නොගෙන ඇති බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාසකරන වැඩ පිළිවෙළලදී ඉස්මතු වූනු වැදගත් කාරණයක් විය. ඇතැම් වතු, පාලනය අතින් කෙතරම් හොඳින් පවත්වාගෙන ගියත් රටෙහි අවශ්‍යතා වයන්ට සරිලන පරිදිත්, උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි පරිදිත් එම පරිහරන රටාව නවීකරණය කිරීමට බොහෝවිට ඉඩ කඩ තිබුනි. තේ, රබර් සහ පොල් වවා ඇති නොයෙකුත් වතුවල අතුරු භෝග වැවීම සඳහා බොහෝ ඉඩ කඩ තිබුණු බව පැහැදිලි විය.

ජනාවාසකරණයෙහිදී තෙවනුව වැදගත් වන කාර්යයන් වනුයේ ආයතනය සංවර්ධනය කිරීමයි. ජනාවාසයන් ආරම්භ කළ පළමු හාර පස් මාසය තුළ සාමාජිකත්වයේ සහභාගිත්වය ඇතිව සමූපකාර සමිතිය ශක්තිමත්ව සංවිධානය කිරීම සඳහා ආයාසයක් ගනු ලැබේ. බොහෝ ජනාවාස අතරමග කඩාකප්පල් වූයේ මෙනයින් පාලන කටයුතු භාර ආයතනය සංවර්ධනය නොවූ හෙයිනි. ජනාවාසයෙහි භෞතික සැලසුම ක්‍රියාත්මක කිරීම මෙහෙයවන්නේ සමූපකාර සමිතිය හෙයින් පාලන බලතල සතු සංවිධානයක් හැටියට එය මැනවින් ශක්තිමත්ව හසුරුවීමට සෑම උපක්‍රමයක්ම යෙදිය යුතු වන්නේය. ජනාවාසයක සමූපකාර සමිතිය ගොඩ නැංවීමේදී සාමාජිකයින් සතු **බලතල** නිලධාරීන් වෙත පැවරුනහොත් සාමාජික අදහස් යටපත් වන්නේය. එවිට නිල බල වාදය ඉස්මතු වන අතර ස්වයං පාලන ක්‍රියාවලිය එතැනදීම නතර වන්නේය. ජනාවාසයක නිලධාරීන් කළ යුත්තේ මෙම කාර්ය මූලික වශයෙන් මෙහෙයවීම පමණි. ස්වයං පාලනය පිළිබඳ හුරුවක් හා පුරුද්දක් ලබා දිය හැක්කේ සාමාජික අදහස් ක්‍රම ක්‍රමයෙන් ඉස්මතු වී මුළු සමිතිය සතු පාලන බලතල සාමාජිකයින් වෙතම සපුරා පැවරුනොත්පමණකි.

ජනාවාසකරණය පිළිබඳ වැඩ පිළිවෙළෙහිදී මෙතෙක් කල් ආවේනිකව තිබූ රටාවක් වෙනස් කිරීමට සිදු වේ. මිනිසා යාන්ත්‍රික තත්වයක ලා සැලකූ ක්‍රමය පියවරෙන් පියවර වෙනස් කර මිනිසාගේ මානුෂිකත්වය හා අයිතිවාසිකම් පිළිබඳ හරි අවබෝධයක් ලබා දීමට හැකි වන පරිදි ජනාවාසකරණය පිළිබඳ නව සංකල්ප බිහි කළ යුතු වේ. ඇතැම්විට මෙවැනි අවබෝධයක් ඔවුන් තුළ ඇති කිරීම මඳක් දුෂ්කර කාර්යයක් වන්නට පුළුවන. එහෙත් තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයක් ලැබුණු සැනින් කම්කරු පන්තිය එම අවබෝධය අනුසාරයෙන් අතිශයින් **විචක්ෂණ** ලෙස සංවර්ධන කාර්යයට සහභාගි වේ. කාලාන්තරයක් තිස්සේ ස්ථාවරත්වයකට පත්ව තිබූ ක්‍රමය පරිවර්තනයකට හසු කරවීමේදී එයට සම්බන්ධිත පුද්ගලයින්ගේ ආකල්පයන් වෙනස් කිරීම ඇතැම් විට දුෂ්කර කාර්යයක් වීමට පිළිවන. කෙතෙක් දුෂ්කර වුවත්, විධිමත් ක්‍රියාමාර්ගයක් මගින් මෙය සාක්ෂාත් කරගැනීමට ප්‍රයත්නයක් දැරිය යුතුවේ.

# ජනාවාසකරනයෙහිදී අදාළ වන සංස්කෘතික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ තරුණසේන ජයලත් මහතා විසිනි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාමූහික ජනාවාස යෝජනා ක්‍රමවලදී සංස්කෘතික කටයුතු හා අදාළ වන්නේ දැනට සංස්කෘතික යන සංකල්පයට අයත් වන පුස්තකාල හා ක්‍රීඩා පහසුකම් පමණක් නොවේ. තරුණ පිරිසක් ඒකරාශි වී සාමූහික හැඟීම් වලින් යුතුව එක් තැනක ජීවත් වනවිට ඔවුන් අතර ඇති වන්නට ඉඩ තිබෙන නොයෙකුත් ගැටීම් වලින් එවැනි ව්‍යාපාරයක ස්ථිර පදනමට අහිතකර බලපෑමක් ඇති නොවන අයුරු මිනිසුන් වශයෙන් සාමූහිකව හැසිරීමේ පුරුද්දක් ලබා දීම මෙම ව්‍යාපාරවල සංස්කෘතික කටයුතු වශයෙන් ප්‍රධාන ලෙස අරමුණු කරනු ලැබේ.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාස ව්‍යාපාරවලදී බොහෝවිට දීර්ඝ කාලයක් තිස්සේ කම්කරුවන් හා සේවකයින් වශයෙන් ඉතාමත් දිළිඳු පරිසරයක ජීවත් වූ පිරිස් තමන් සේවය කළ වතු යායෙහිම ස්වාමීන් හා අයිතිකරුවන් බවට පත් වන්නේය. ස්වාමියකුගේ පාලනයට යටත්ව දීර්ඝ කාලයක් තිස්සේ තම අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් නොමැතිව සිටි පිරිසක් තුළ ඔවුන්ගේ හිමිකම් පිළිබඳව අවබෝධයක් ඇති කිරීම එතරම් පහසු කාර්යයක් නොවේ. ඔවුන්ගේ සිත් සතන් තුළ අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනයක් ඇති කිරීම ඉතාමත් අවශ්‍ය කාරණයක් වන අතර ජනාවාස ව්‍යාපාරයක ආදායම් තත්වය වැඩි වී භෞතික සම්පත් වැඩිවත්ම ඒ හා සමාන අනුරූප අධ්‍යාත්මික දියුණුවක් ද ඇති කිරීමට සිදු වන්නේය. ඇතැම්විට කලින් වහලුන් මෙන් සේවය කළ පිරිසකට ස්වාමීන් මෙන් කටයුතු කිරීමට අවබෝධයක් ලබා දීමේදී මෙම පරිවර්තනයට හසු වන පුද්ගලයින්ගේ සිත් තුළ අති විශාල පෙරළියක් සිදු කිරීමට අනිවාර්යයෙන්ම සිදු වන්නේය.

අතීතයේදී ජනපද ව්‍යාපාර ඇති කරන ලද නමුත් එවැනි ව්‍යාපාරවල පුද්ගලයින්ගේ භෞතික සංවර්ධනය විනා අධ්‍යාත්මික දියුණුවක් පිළිබඳව කිසිදු ක්‍රියා පරිපාටියක් පුළුල් වශයෙන් ආරම්භ නොකරන ලදී. ඉතාමත් දුරස්තර ප්‍රදේශවල සිටි ජාති, කුල, ආගම් වශයෙන් විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයින් එක් ස්ථානයක පදිංචි කරවීමේදී සංස්කෘතික වශයෙන් ඇති වන්නට පිළිවන් ගැටළු පිළිබඳව එම සැලසුම් කරුවන්ගේ සිත් තුළ අවබෝධයක් නොතිබෙන්නට ඇත.

මේ හේතුකොටගෙන පැරණි ජනපද ව්‍යාපාරවල සංස්කෘතික වශයෙන් පුළුල් දියුණුවක් හෝ අධ්‍යාත්මික වශයෙන් එහි සාමාජිකයින්ගේ සිතුම් පැතුම්වල දියුණුවක් අවාසනාවකට මෙන් දක්නට නො ලැබුනි. අභ්‍යන්තර වශයෙන් පුද්ගලයෙකුගේ දියුණුව උදෙසා මනා මාර්ගෝපදේශකයන් අවශ්‍ය බවත්, එවැනි ක්‍රියා මාර්ගයකින් තොරව සංස්කෘතික දියුණුවක් ඇති විය නොහැකි බවත් දැන් අපි අවබෝධ කරගෙන ඇත්තෙමු. පැරණි ජනපද ව්‍යාපාරවලදී බොහෝවිට තම අසල්වැසියන්ගේ ඕනෑ එපාකම් පිළිබඳව සොයා බලා සවිමත් සාමාජික රටාවක් බිහි කිරීමට එම ජනපදිකයින්ට හැකියාවක් හෝ අවස්ථාවක් නො ලැබුනේ ඔවුන් සිය දිවි පැවැත්ම උදෙසා ඉතාමත් දුෂ්කර ජීවිත සටනක යෙදී සිටිය හෙයිනි. මිනිසාගේ ස්වාධීනත්වය පිළිබඳ හැඟීම කෙරෙහි නොසළකා සෑම අවශ්‍යතාවයක්ම රජයෙන්ම ඉටු කරලීමට සැලසුම් කර තිබූ හෙයින් බොහෝවිට මෙම ජනපදිකයින් භෞතිකමය වශයෙන් සංවර්ධනය වීම හැරෙන්නට වෙනත් සමාජයීය දියුණුවක් පිළිබඳව තැකීමක් කළේ නැත.

මෙම ජනපද ව්‍යාපාරවල ආදායම් තත්වය දියුණු වී ජනපදිකයින් හට මුදල් ඔවුන් අපේක්ෂා නොකළ පරිදි ලැබෙන්නට පටන් ගත් විට නොයෙකුත් ප්‍රශ්නද ඒ සමඟම උද්ගත විනි. මෙතෙක් කල් විශාල වශයෙන් මුදල් පරිභෝජනය පිළිබඳ පුරුද්දක් හෝ අවබෝධයක් නොලැබූ ඔවුන් තමන් ලද වස්තුව උචිත පරිදි ආයෝජනය කිරීමට නොහැකි වික්ෂිප්ත තත්වයකට පත් විනි. ඔවුන්ගේ මුදල් වලින් නිසි පරිදි ප්‍රයෝජන ගැනීමට නොදත් ඔව්හු ලෙහෙසියෙන් සුරාව, සූදුව, දුරාචාරය වැනි සමාජ විරෝධී ක්‍රියාවලට ඇබ්බැහි වූහ. මෙම සමාජයීය පෙරළිය මැනවින් වටහා ගත් වානිජ බල වේගයන් ද මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගත්හ. පෞද්ගලික ව්‍යාපාරිකයා ක්‍රමයෙන් මෙම මුදල් ජන පදිකයින්ගෙන් ඇද ගැනීම සඳහා සිය ව්‍යාපාර ජනපද අතර ආරම්භ කළහ. මේ නිසා ජනපදිකයින්ගේ මුදල් විනාශ වී ගිය අතර හොර සුරාව ආදී සමාජ විරෝධී ව්‍යාපාරයන් ජීවන සම්ප්‍රදායක් බවට පත් විනි. රජ රට ජනපදවල සිදු වූයේ මෙයයි.

මෙම තත්වය පිළිබඳව අපි දැන් පාඩම් ඉගෙනගෙන ඇත්තෙමු. අළුතින් ආරම්භ කරන ජනාවාසද ආර්ථික වශයෙන් සවිමත් තත්වයකට පත්ව සාමාජිකයින් අත වැඩි වශයෙන් මිළ මුදල් හැසිරෙන විට ඉහත කී තත්වයම මේ ජනාවාස වලටත් බෝ වීමට ඉඩ තිබේ. එහෙයින් මෙවැනි ජනාවාසවල සාමාජිකයින් හට සාමූහිකත්වය, පරිත්‍යාගය වැනි යහපත් චරිතාංග පිළිබඳව හොඳ අවබෝධයක් ලබා දීම අතිශයින් වැදගත්ය. අපගේ ජාතික ලක්ෂණ වශයෙන් අප අතර තිබූ දැනට යටත්ව තිබෙන සහෝදරත්වය, සුහද බව වැනි සම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ ඉස්මතු වන පරිදි ජනාවාස සැලසුම්වල සංස්කෘතික පදනම යෙදිය යුතු වන්නේය. මෙම යහ ගුණ ලක්ෂණ ඉස්මතු කර ගැනීමක් පමණක් සිදු කළ යුතුව ඇත. ඇතැම්විට සිංහල, ද්‍රවිඩ විරස්තික සමගියක් සඳහා ජනාවාස වලින් සවිමත් අඩි තාලමක් දැමිය හැකියා.

මෙනයින් ජනාවාස යෝජනා ක්‍රමයක සංස්කෘතික කටයුතු යනුවෙන් දූරදර්ශීව හා පුළුල්ව සළකා බලන කල අප අදහස් කරන්නේ ජනාවාසයක ජීවත් වන සාමාජිකයින් අතර සුහද බව හා සහයෝගය මැනවින් ප්‍රචලිත කර ඔවුන්ගේ ජීවන රටාව මුළුමනින්ම වෙනස් කිරීමට ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීමයි.

---

## ජනාවාසවල සමාජ ගැටළු

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිළධාරී ටියුඩර් සිල්වා මහතා විසිනි.

මේ පාඨමාලාවෙහි මීට කලින් කරන ලද දේශනයන්හිදී ජනාවාසවල ආර්ථික අංශයෙහි ඇති වැදගත්කම අවධාරනය කරන ලදී. ජනාවාස ආර්ථික ව්‍යාපාරයන් වශයෙන් පවත්වා ගතයුතු බවට කිසිම ප්‍රශ්නයක් නැත. ඒවායේ ආර්ථික දියුණුව ලබා ගැනීමෙන් තොරව ඒවා සාර්ථක කර ගැනීමට නොහැකිය. නමුත් ජනාවාසවල සමාජ අංශය ගැන ද අපගේ අවධානය යොමු විය යුතුය. එක් අතකින් ජනාවාසවල ආර්ථික දියුණුව ලබා ගැනීම සඳහා යහපත් සමාජයක් ඒවා තුළ තිබිය යුතුය. අනෙක් අතට මේවා පිහිටුවීමේදී ආර්ථික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් ද ඒවා යහපත් තත්වයක් ගනු ඇතැයි බලාපොරොත්තු වන ලදී. මේවායේ සමාජ අංශය ගැන ද අප අවධානය යොමු කළ යුත්තේ මේ නිසයි.

මීළඟට සමාජ ගැටළු යනුවෙන් අප අදහස් කරන්නේ කුමක්දැයි සොයා බලමු. සමාජ විද්‍යාඥයින්ගේ අදහස් අනුව සමාජ ගැටළු යනු සමාජය තුළින්ම මතු වන්නාවූත්, එමෙන්ම සමාජයේ බහුතරයකට අහිතකර වන්නාවූත් සමාජ ලක්ෂණයන්ය. මේ අනුව ගංවතුර වැනි දෙයක් සමාජ ප්‍රශ්නයක් වන්නේ නැත. එයට හේතුව එය බිහි වන්නේ ස්වභාවික කරුණක් නිසා වන හෙයිනි. එසේ නැතහොත් එය සමාජය තුළින් උද්ගත වූ ලක්ෂණයක් නොවේ. නමුත් සූදුව වැනි දෙයක් සමාජ ගැටළුවක් වශයෙන් සැළකීමට පුළුවන. එයට හේතුව එය සමාජය තුළින්ම බිහිවූ, එමෙන්ම සමාජයේ වැඩි කොටසකට අහිතකර වන්නාවූත් සමාජ ලක්ෂණයක් වීමයි. මෙසේ සමාජය තුළින්ම බිහි වන්නාවූත්, සමාජයේ බහුතරයකට අහිතකර වන්නාවූත් සමාජ ලක්ෂණ විශාල ප්‍රමාණයක් ලංකාවේ නොයෙකුත් ජනාවාස වල දක්නට ලැබෙන බව මෙතෙක් කරන ලද නොයෙකුත් හැදෑරීම් වලින් පෙනී ගොස් ඇත.

ලංකාවේ නොයෙකුත් විධියේ ජනාවාස දක්නට ලැබෙන බව අපි දනිමු. ගොවි ජනපද, සමූපකාර ජනාවාස, තරුණ ගොවිපලවල්, ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපාර මේවායින් කිහිපයකි. මෙහිදී අප වැඩිපුර සැළකිල්ලක් දක්වන්නේ දැනටමත් සෑහෙන ඉතිහාසයක් ඇති ගොවිජනපදවල දක්නට ලැබෙන සමාජ ප්‍රශ්න කෙරෙහිය.

මෙවැනි සමාජ ප්‍රශ්න මේ ජනාවාසවල උද්ගත වන්නේ මක්නිසාදැයි අපි ඊළඟට සළකා බලමු. මෙවැනි ජනාවාස ස්වභාවික ගම්වලට වඩා බෙහෙවින්ම වෙනස් ස්වරූපයක් ගනී. ඒවායේ බොහෝවිට පදිංචිව සිටින්නේ නොයෙක් පළාත් වලින් පැමිණි, නොයෙක් ජන කොටස්වලට අයත් වන මෙන්ම නොයෙක් සිරිත් විරිත් ඇති අසමජාතීය ජන කොටස්ය. එබැවින් පුරාණ ගම්වල දක්නට ලැබෙන සමාජ සමගිය, සමාජ සහයෝගය මේ ගම්වල දක්නට ලැබෙන්නේ නැත. පුරාණ ගම්වල සමාජ ගැටළු නැති බවක් මෙයින් අදහස් වන්නේ නැත. මින් අදහස් වන්නේ මේ නව ජනාවාසවල පුරාණ ගම්වලට වඩා වැඩියෙන් සමාජ ගැටළු පවත්නා බවකි.

ජනාවාසවල දක්නට ලැබෙන සමාජ ගැටළු මොනවාදැයි කියා දැන් අපි සොයා බලමු. ජනාවාසවල දක්නට ලැබෙන මූලික සමාජ ගැටළුව ආර්ථික හා සමාජ සහයෝගීතාවය නොමැති බව ලෙස සැළකිය හැකිය. ලංකාවේ පුරාණ ගම් අතරත් නොයෙකුත් සමාජ ආර්ථික සහයෝගයන් දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් වී ගොවි තැනෙහි අත්තන් ක්‍රමය, බෙත්ම ක්‍රමය වැනි ලක්ෂණ දක්නට ලැබේ. සාමාන්‍ය ගමක එක ගෙදරක කෙනෙකුට අසනීපයක් හෝ වෙනයම් කරදරයක් ඇති වුවහොත් අසල් වාසීන්ගෙන් නොයෙකුත් උදව් උපකාර ලැබේ. මේ තත්වය ජනාවාසවල දක්නට ලැබෙන්නේ විරල වශයෙනි. ඔවුන් බොහෝවිට තමන්ගේ අසල්වාසීන් සැක කිරීමටත්, වෛරයෙන් පසු වීමටත් ඉඩ තියෙන බව පෙනී ගොස් ඇත. ජලය බෙදා හැරීම වැනි වැඩ වලදී තමන්ගේ අසල්වාසීන් කෙරෙහි කිසිම සැළකිල්ලක් නොදැක්වීම නිසා නොයෙකුත් ප්‍රශ්න උද්ගත වී ඇත. වී ගොවිතැන හරිහැටි සංවිධානය කිරීම සඳහා කළයුතු කන්න රැස්වීම් වැනි දේවල්වලට ජනපදවාසීන් සහභාගී වන්නේ ඉතා අඩුවෙනි. ජනපදවාසීන් ... ඇත. හදිසියකදී අත මාරුවට මුදලක් ඉල්ලා ගැනීමට ජනපද වාසීන්ට කිසිවෙකු නොමැත. මීටත් වැඩිය බරපතල දෙයක් වන්නේ ලෙඩකදී දුකකදී ඔවුන්ට පිහිට වීමට කිසිවෙකු නො සිටීමයි. මේ තත්වය නිසා ජනපදවාසීන් බොහෝවිට අසරණ තත්වයකට පත් වී ඇත.

ජනපදවල දක්නට ලැබෙන මීට අනුබද්ධ තවත් සමාජ ප්‍රශ්නයක් නම් නියම නායකත්වයක් දියහැකි පුද්ගලයන්ගේ විරලකමයි. ඕනෑම සමාජයක් හොඳින් ක්‍රියාත්මක වීම සඳහා ක්‍රියාශීලී නායකයින් සිටිය යුතු බව දැනට පිළිගෙන ඇති කාරණයකි. සමාජයේ වෙනස්කම් ඇති කිරීමේදී, සමාජ සංවිධාන කටයුතු වලදී මූලිකත්වය ගෙන ක්‍රියා කරන්නේත්, සමාජයේ සිටින නොයෙකුත් දෙනා එකට එකතු කරන දාමයක් වශයෙන් කටයුතු කරන්නේත් මේ නායකයින්ය. කිසියම් සමාජයක මෙවැනි පුද්ගලයන් නොමැති වුවහොත් ඒ සමාජ සංවිධානය කිරීමේදී නොයෙකුත් දුෂ්කරතා එතු වේ. උදාහරණයක් වශයෙන් මෙවැනි පුද්ගලයන් නැති විට සමාජ වෙනස් කිරීම් ඇති කිරීමට දුෂ්කරය. එක අතකින් ජනාවාසවල මෙවැනි පුද්ගලයන් නැතිකම පුදුමයට කරුණක් නොවේ. ගොවිජනපද ගතහොත් ඒවායේ පදිංචි වී සිටින්නේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි විවිධ ජන කාණ්ඩවලට අයිති මිනිසුන් බව අපි කළින් සඳහන් කරන ලදී. මේ තත්වය නායකයින් වර්ධනය වීමට බාධාවකි.

ජනාවාසවල දක්නට ලැබෙන තවත් සමාජ ප්‍රශ්නයක් නම් නොයෙකුත් විධියේ සමාජ ඝට්ටනය. සමහරවිට මේ ජනාවාසවල සිටින නොයෙකුත් පවුල් අතර හෝ නොයෙකුත් කාණ්ඩ අතර ගැටීම් සිදුවිය හැකිය. තවත් සමහරවිට මේ ජනාවාස අතර නොයෙකුත් ගැටීම් සිදු වීමට ඉඩ තිබේ. මේ ලක්ෂණය වියළි කළාපයේ ගොවිජනපදවල බහුල වශයෙන් දක්නට ලැබෙන්නකි. ගොවි ජනපදවල මෙවැනි ගැටීම් ඇති වීමට නොයෙකුත් හේතු ඇති බව සොයාගෙන ඇත. ඇතැම් විට මේ ගැටීම් ඇති වන්නේ ඉඩම්වල මායිම් සම්බන්ධයෙනි. තවත් විටක ජලය බෙදා ගැනීමේදී ගැටීම් ඇති වේ. බොහෝගානේ යන ගවයින් නිසාද මෙවැනි සමාජ ගැටීම් ඇතිවේ.

මෙවැනි ගට්ටන ඇති වීමට තවත් හේතුවක් නම් ගැහැණුන්ය. ජනපදවල මෙවැනි සමාජ කුලල් කා ගැනීම්වලට පසුබිම් වූ කරුණු විමසන විට කුල භේද, ජාති භේද, දේශපාලන භේද සහ පරම්පරා අතර ඇති ගැටීම් වැදගත් වන බව පෙනී යයි. මුල් යුගයේ ආරම්භ කරන ලද ගොවි ජනපදවල නොයෙකුත් කුලවල, නොයෙකුත් ජාතිවල අය එකට පදිංචි කරන ලදී. මොවුන් අතර නොයෙකුත් මත භේදයන් උද්ගත විය. කුලය අතර ඇති ගැටීම් බොහෝවිට අධික වන්නේ විවාහ ගනු දෙනු වලදීය. උදාහරණයක් හැටියට එක් ජනපදයක සිටින තරුණයෙක් සහ තරුණියක් ප්‍රේම සම්බන්ධයකට පැටලීමේදී ඔවුන් දෙදෙනා කුල දෙකකට අයත් වීමට ඉඩ තිබේ. මෙවිට මේ දෙදෙනාගේ දෙමව්පියන් මේ සම්බන්ධයට විරුද්ධකම් පෑමට ඉඩ තිබේ. මේ තත්වය ඇතැම්විට මේ කුල දෙකේ ජන සමූහයා අතර ගැටීමක් ඇති වීමට හේතු වේ. දේශපාලන මත භේද විශේෂයෙන්ම උද්ගත වන්නේ ඡන්ද කාලයේදීය.

ජනාවාසවල දක්නට ලැබෙන තවත් සමාජ ගැටළු කිහිපයක් නම් සූදුව, සුරාව සහ සොරකමයි. මේ අතින් ගොවි ජනපද සහ අලුතින් පිහිටුවා ඇති සමූපකාර ගොවිපලවල් වැනි ජනාවාස අතර එතරම් වෙනසක් නැත. මේවායේ වාසය කරන ඇතැම් කොටස් සුරාව සහ සූදුවෙහි ඇලී ගැලී වාසය කරති. ඇතැම්විට ඔහු උපයන මුදල් වලින්වැඩි කොටසක් වැය වන්නේ මේවාටය. මේ නිසා ආර්ථික සංවර්ධනය සඳහා මුදල් යෙදවීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන්නේ නැත. එපමණක් නොව සුරාව සහ සූදුව සමාජයේ නොයෙක් කුලල් කා ගැනීම් වලට ද හේතු වේ. සූදු පොලවල් වලදී සහ සුරා පොලවල් වලදී ඇති වන සමහර මත භේද කෙළවර වන්නේ මිනී මරා ගැනීම් වලිනි. මේ තත්වය නිසා විශේෂයෙන්ම ගොවි ජනපදවල නොයෙකුත් ප්‍රශ්නයන් උද්ගත වී ඇත. මෙවැනි ප්‍රශ්න මේ ජනාවාසවල බහුලව උද්ගත වී ඇත්තේ ඒවායේ වෙනත් සමාජවල දක්නට ලැබෙන සමාජ පාලකයන් දක්නට නො ලැබෙන නිසාය. පුරාණ ගම්වල සුරාව සහ සූදුව සමාජ පිලිලයක් වශයෙන් සළකා ඒවායේ නියැලී සිටින අය සමාජයේ පිළිකුලට ලක් වේ. නමුත් ගොවි ජනපදවල එකිනෙකාගේ වැඩ ගැන ජනපද වාසීන් සැළකිල්ලක් නො දක්වන නිසා දුරාචාරයේ නියැලී සිටින අයට ඔවුන්ගේ කටයුතු බාධා රහිතව කරගෙන යාමට හැකි වී ඇත.

මීට අමතරව දික්කසාද වැනි අඹු සැමි මත භේද, දෙමව්පියන් වයස් වූ පසු ඔවුන්ට නො සැළකීම, ගණිකා වෘත්තිය වැනි දේවල් ගොවි ජනපදවල බහුල වශයෙන් උද්ගත වී ඇති බව පෙනී ගොස් තිබේ. මේ කරුණු නිසා ජනාවාසවල වාසය කරන අය දෙස අවට ගම්වල වාසය කරන ගැමියන් බලන්නේ පිළිකුලෙනි. උතුරු මැද පළාතේ 'කොලනි කාරයා' යන වචනයෙන් අදහස් කරන්නේ පහත් සමාජ තත්වයක් ඇති දුරාචාරයට හුරු වූ පුද්ගලයින්ය.

ඊළඟට මේ සමාජ ගැටළු විසඳීම සඳහා ගත යුතු පියවරවල් මොනවාද යන්න කෙටියෙන් සාකච්ඡා කර බලමු. මේ ජනාවාස ඇති කිරීමේදී සමාජයේ එක්සත්කම රැකෙන ආකාරයට බොහෝදුරට එකම ප්‍රදේශවලට සහ එකම ජන කොටස්වලට අයිති පුද්ගලයන් පදිංචි කරවීම මෙහිදී ප්‍රයෝජනවත්ය. ජනාවාසවල භෞතික සැළැස්ම ද මෙහිලා වැදගත් වන කරුණකි. තීරු ක්‍රමයට ඇල වේලි දිගේ මිනිසුන්

පදිංචි කරනවා වෙනුවට පොකුරු ක්‍රමයට පිනියුත්ව ගොනු කොට පදිංචි කරවීමද සමාජ සමගිය තහවුරු කිරීමට හේතු වනු ඇත. එසේම නොයෙකුත් විධියේ පොදු කටයුතු සඳහා ශ්‍රමදාන වැඩ කටයුතු සංවිධානය කිරීම ද මෙහි ලා වැදගත්ය. පාරවල් කැපීම, ළිං සෑදීම, සොහොන් පිට්ටනි සෑදීම වැනි දේවල් සංවිධානය කිරීමට පුළුවන. මෙහිලා යොදා ගත හැකි තවත් උප ක්‍රමයක් නම් විවාහ වැනි දේවල් වලින් එක් ජනාවාසයක සිටින නොයෙකුත් පවුල් අතර සම්බන්ධතාවය තහවුරු වන ආකාරයට ක්‍රියා කිරීමය. සම්ප්‍රදායික ක්‍රීඩා, ආගමික උත්සව වැනි දේවල් ද මේ සඳහා උපයෝගී කර ගැනීමට පුළුවන. ක්‍රීඩා සහ සංස්කෘතික පහසුකම් වර්ධනය කිරීම ද ඇතැම් සමාජ ගැටළු ලිහිල් කර ගැනීම සඳහා උපකාරී වනු ඇත. මෙවැනි කටයුතු වලදී ජනාවාස පාලනය කරන නිලධාරී මහතුන්ට වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට පුළුවන.

## ජනාවාස ව්‍යාපාරයක කළමණාකරනය

විශ්‍රාම ලත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්. ඝනගරත්නම් මහතා විසිනි.

පසුගිය හය අවුරුදු කාලය තුළ මුතියංකට්ටු තරුණ ජනාවාස ව්‍යාපාරය මගේ කළමනාකාරිත්වයට භාජනය විය. මෙම කාලය තුළ මෙකී ව්‍යාපාරයෙහි ඇති වූ දුෂ්කරතා සහ ඒවා මැඩීමට ගනු ලැබූ ක්‍රියා මාර්ගයන් පිළිබඳව සළකා බැලීම වැදගත් කොට සළකමි. 1965 දී මුතියංකට්ටු වැව ඉදි කරන ලද අතර එම ප්‍රදේශය සම්ප්‍රදායික වශයෙන් වී ගොවිතැනට හසුව තිබී ප්‍රදේශයක් නිසා මුලින් අදහස් කරන ලද්දේ පුළුල් වශයෙන් වී වගා කිරීමටය. මෙම වැව ආශ්‍රිතව වී ගොවිතැන් කිරීම සඳහා ආරම්භයේදී 500 ක් පමණ දෙනා තෝරා ගනු ලැබිණ. එහෙත් මෙම ව්‍යාපාරය යටතේ මිරිස් හා ළූනු වැවීම පිළිබඳව අවධාරනයක් දක්වන ලෙස රජය ඉල්ලා සිටි හෙයින් පසුව වාරිමාර්ග ක්‍රම යටතේ වී වගාවෙන් වැඩි ආදායම් ලබා ගැනීමට පුරුදුව සිටි ඇතැම් අය අසහනයකට පත් වූහ. 1967 දී මෙම ව්‍යාපාරය යටතේ මිරිස් සහ ළූනු පමණක් වගා කිරීමේ කොන්දේසි යටතේ නැවත ඉඩම් බෙදා දෙන ලදී. සම්ප්‍රදායික වශයෙන් වී ගොවිතැනට ඇබ්බැහිව සිටි පිරිසක් මිරිස්, ළූනු වැනි බෝග කෙරෙහි සැළකිල්ලක් නොදැක්වීම මුලින් මුහුණ දෙන්ට සිදු වූ එක් ගැටළුවක් විනි.

තවත් වැදගත් ප්‍රශ්නයක් වූයේ ව්‍යාපාරයෙහි පදිංචි කරවීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීමයි. අසල්වැසි යාපනය දිස්ත්‍රික්කයෙහි පවතින ඉඩම් හිඟය හේතුකොට ගෙන එම දිස්ත්‍රික්කයෙන් තෝරාගත් තරුණයින් මෙම ව්‍යාපාරයෙහි පදිංචි කරවීමට යැමේදී විශේෂයෙන් ප්‍රදේශයෙහි පදිංචි කරුවන්ගෙන් නොයෙක් විරෝධතා පැන නැගුනි. මෙවැනි ප්‍රශ්න මුතියංකට්ටු ව්‍යාපාරයෙහි ආරම්භයේදී ඇති වූ ඇතැම් දුෂ්කරතාවයන් විය.

මුතියංකට්ටු ජනාවාස ව්‍යාපාරය සඳහා රජයේ පිළිවෙතට අනුව මිරිස් හා ළූනු පිළිබඳව වගා රටාව සකස් කරන ලද්දේ ප්‍රදේශයෙහි එවකට තිබූ හැකියාවන් සොයා බලා ඒ අනුවය. ප්‍රදේශයෙහි වී ගොවිතැනේ සිටින්නන් මෙන්ම ඊ ගොවිතැන සඳහා කලින් තෝරා ගනු ලැබූවන් ද මෙම නව වගාව පිළිබඳව සැක පහල කර සිටි හෙයින් ප්‍රදේශයෙහි ලාභදායි අයුරින් මිරිස් හා ළූනු වගා කළ හැකි බව ප්‍රදර්ශන මාර්ගයෙන් පෙන්නා දීමට සිදු විනි.

මූලාරම්භයක් වශයෙන් අක්කර 36 ක් සඳහා තරුණයන් 18 දෙනෙක් තෝරාගෙන එක් අක්කරයක මිරිස්ද, අනෙක් අක්කරයෙහි වෙනත් භෝගද, වගා කිරීමට කටයුතු සලස්වන ලද්දේය. මෙහි ප්‍රතිඵල ඉතාමත් සාර්ථක වූ අතර 1968 පැවති මිළ ගණන් අනුව මෙම තරුණයන් 18 දෙනාගෙන් 15 දෙනෙක්ම රුපියල් 2000 ඉක්මවූ ශුද්ධ ආදායමක් තම වගාවෙන් ලැබූහ. මෙම ක්‍රියා මාර්ගය අනෙක් අයට හොඳ ආදර්ශයක් විය. මේ අනුව ව්‍යාපාරයෙහි පදිංචි කරුවන් තෝරා ගනු ලැබූ අතර, මුලින් එක් අයෙකුට අක්කර 2 බැගින් බෙදා දෙන ලදී.

ව්‍යාපාරයෙහි සාර්ථකත්වය කෙතරම්ද කිවහොත් මෙහි පදිංචි කරුවන් 300 ක් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේදී උගත් තරුණයින් 13,500 ක් මේ සඳහා අයදුම් පත් එවා තිබුනි.

වියළි කලාපයෙහි කවරවූ හෝ ගොවිකටයුතු ව්‍යාපාරයක අතිශයින් වැදගත් වන්නේ වාරිමාර්ග පහසුකම් පිළිබඳ ප්‍රශ්නයයි. බොහෝවිට එගා කමිටුවල කාලයෙන් 75%ක් පමණ ගත වන්නේ වාරිමාර්ග ප්‍රශ්න සඳහාය. එහෙයින් මෙවැනි ව්‍යාපාරයක වාරිමාර්ග සේවාවන් සපයන විවිධ තරාතිරමේ නිලධාරීන් සමග සුහද තාවයකින් කටයුතු කිරීම ඉතාමත් අවශ්‍යය. ජනාවාස ව්‍යාපාරයෙහි ගොවිතැන් කටයුතු කරගෙන යාම සඳහා කලට වේලාවට ජලය සැපයෙන බවට එග බලා ගැනීම මෙවැනි ව්‍යාපාරයක් භාරව කටයුතු කරන්නෙකුගේ වැදගත් වගකීමක් වනු ඇත. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයන්ද මේ ව්‍යාපාරවල වැදගත් කාර්යභාරයක් උසුලන්නෝ වෙත්. ඇතැම් විට මෙවැනි නිලධාරීන් සතු කාර්යභාරය පිළිබඳව නිවැරදි අවබෝධයක් ඔවුන්ට ලබාදීමට සිදුවන්ට පිළිවන.

ජනාවාස ව්‍යාපාරයෙහි සමූපකාර සමිතියද ඉතාමත්ම වැදගත් එකකි. ව්‍යාපාරයෙහි සාමාජිකයන් හට අවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා ඔවුන් විසින් පිහිටුවා ගනු ලබන සමූපකාර සමිතිය ව්‍යාපාරයේ සංවර්ධනයට අතිශයින් අවශ්‍ය වන්නේය.

මුතියංකට්ටු ව්‍යාපාරය තුළින් ලත් අත්දැකීම් අනුව ප්‍රකාශ කළ හැක්කේ තරුණ ජනාවාස ව්‍යාපාරය ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ගෙනදෙන ව්‍යාපාරයක් වන බවයි. වයස 20-30 අතර තරුණ අය; ඇතැම් විට අධ්‍යයන පොදු සහතිකය උසස් පෙළ පවා සමත් තරුණයන් 700 පමණ මෙම ව්‍යාපාරයේ ගොවිතැන් කටයුතු වල නියැලී සිටිති. මෙම ව්‍යාපාරයෙහි බොහෝ තරුණයින් රජයේ නියම කර ඇති නව ඉලක්කද අභිබවා ආදායම් ලබාගෙන ඇත. තරුණයන් අතර පවතින සුහද සම්බන්ධතාවයත් උද්යෝගයත් නිසා මුතියංකට්ටු ව්‍යාපාරය තුළින් නව පරම්පරාවක් බිහිවන බව පෙනේ. ගොවිතැන් කටයුතු වල නිරත වීම එතරම් උසස් තත්වයක ජීවන මාර්ගයක් නොවේය යන ආකල්පය දැන් මුළුමනින්ම වෙනස්ව ඇති අතර මුතියංකට්ටු ව්‍යාපාරයෙහි බොහෝ තරුණයින් ඇතැම් විට ට්‍රැක්ටර් යන්ත්‍ර පවා හිමිකර ගෙන ආදායම් අතින් උසස් තත්වයකට පත්ව සිටිති. දැනට ගොවිතැන් කටයුතු පිළිබඳව නව යුගයක් උදාව ඇති හෙයින් කෘෂිකාර්මික සංවර්ධනයෙහි ලා මෙවැනි ජනාවාස ව්‍යාපාර වලින් අතිශයින් වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට හැකි වන්නේය.

---

## කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නීතිමය වෙනස්කම්

**ග්‍රාමීය ආයතන සහ එළදාව වර්ධන නීති අධ්‍යක්ෂ අයි. ජේ. වීරවර්ධන මහතා විසිනි.**

කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මෑතදී සිදුව ඇති වෙනස්කම් අතිශයින් වැදගත් වන්නේය. ගොවිතැන් කටයුතු පිළිබඳව මෙතෙක් නොවූ, වීරෑ පෙරළියක් දැනට සිදු වෙමින් පවතී. දියුණු වෙමින් පවතින රටක සංවර්ධනය පිළිබඳව මූලික පෙරළියක් කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේය. කෘෂිකර්මය පිළිබඳව සලකන කල්හි මෙවැනි පරිවර්තනයක් සඳහා නීතිමය වෙනස්කම් සිදු කිරීම අනවශ්‍ය යයි මතයක් තිබිනි. එහෙත් කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා පළමුවෙන්ම කළ යුතුව ඇත්තේ නීතිමය වෙනස්කම් මගින් පදනම පිළිබඳව රටාව මුළුමනින් වෙනස් කිරීමය. පසුගිය වසර කිහිපය තුළ ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් අතිශයින් වැදගත් කරුණු කිහිපයක් ඉටුව ඇත.

කෘෂිකාර්මික පදනම වෙනස් කිරීමේ පරමාර්ථය අරබයා දූරදර්ශී පනත් ගණනාවක් සම්මත කරන ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ පනත, කෘෂිකාර්මික එළදාව වර්ධන පනත, කෘෂිකාර්මික ඉඩම් පනත, රජයේ ඉඩම් විකිණීමේ පනත සහ කෘෂිකර්ම රක්ෂණ පනත මේවායින් සමහරකි. මෙම පනත් ඉදිරිපත් කරන ලද්දේ නවීකරණයක් සඳහා යොමු වන නව වැඩ පිළිවෙළක් යටතේ ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් නව ආකල්පයක් ඇති කිරීමටය.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් මෙතෙක් කල් පැවැති සංවර්ධන රටාවට වෙනස් ස්වරූපයක් ආරෝපනය වේ. මෙම පනත යටතේ පෞද්ගලික අයිතිවාසිකම ගොඩ ඉඩම් අක්කර 50 කටත්, කුඹුරු ඉඩම් අක්කර 25 කටත් සීමා වන්නේය. මෙතෙක් කල් අක්කර සිය දහස් ගණන් හිමි කර ගෙන ඒවායින් ලබන ආදායම එක් තැනකට ඒකරාශී වීමේ ආකල්පය මුළුමනින් වෙනස් වන අතර රටෙහි ආර්ථික රටාවෙහි ද අලුතුම ස්වරූපයක් ඇති වන්නේය. මේ පනත අනුව අක්කර 50 ට අඩු කුඩා ඉඩම් හිමියන්ගේ ආර්ථිකයක් රටෙහි ඇති වේ. දැන් කල්පනා කර බැලිය යුතුව ඇත්තේ විශාල වතු යායවල් අනුව නොව කුඩා ඉඩම් පිළිබඳව වූ ආර්ථික රටාවක් සම්බන්ධයෙනි. එවකට වතු හිමියන් උත්සාහ කළේ තව තවත් වතු යායවල් හිමි කරගෙන ඔවුන්ගේ ආදායම් තර කර ගැනීමටය. දැන් ඔවුනට සිදුව ඇත්තේ තමන් සතු අක්කර 50 ක ඉඩමෙන් සූක්ෂම ක්‍රම මගින් උපරිම ආදායමක් ලබා ගැනීමටයි. මෙහිදී ඉඩම් පරිහරන රටාව පිළිබඳව බරපතල වෙනසක් සිදු වන්නේය.

මෙම පනත යටතේ රජයට අත් කර ගන්නා ලද වතු කවර ආකාරයකින් පරිහරනය කළ යුතුද යන බවද වැදගත් වන්නේය. මෙම ඉඩම් නොයෙකුත් ක්‍රම මගින් පොදුවේ ජනතාවගේ ප්‍රයෝජනය උදෙසා භාවිතා කළ හැකි වන්නේය. ඉඩම් ප්‍රතිසංස්කරණය විශාල වශයෙන් උඩරට ගැමි ජනතාව කෙරෙහි බලපාන බව පෙනෙන්නට ඇත. මේ ප්‍රදේශවල ග්‍රාමීය ජනතාව බොහෝ විට ජීවත් වනුයේ අවට්න් වට වූ වතු වලින් යුත් මිටියාවත්වලය. මිටියාවතින් ඔවුන් නඩාලීම මේ රටේ මහා සංවර්ධන ව්‍යාපාරයේ එක් කොටසකි. මේ මහ වතු යායවල්වල කලින් භෝග වගා කර තිබුනේද එකල අවශ්‍යතාවයනට ගැලපෙන පරිදිය. එහෙත් මේ තත්වයම ඉදිරියටත් කරගෙන යාම කෙතෙක් දුරට වැඩ දායකද යන්න ගැන දැන් සැළකිය යුතුව ඇත. රටෙහි

භූමි පරිහරනය යනුවෙන් හැඳින්වෙන්නේ මෙයයි. මෙනයින් සාමාජික ප්‍රශ්න රැසක් විසඳීමට අපේක්‍ෂා කෙරේ.

ඉඩම් භුක්තිය පිළිබඳව පෙරළියක් ඇති කරන නීති රීති එක්වරම සර්ව ප්‍රකාරයෙන් සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන පරිදි සකස් කළ නොහැක. මෙවැනි පනතක සාර්ථකත්වය තීරණය කිරීම සඳහා අත්දැකීම් අවශ්‍ය වන්නේය. ඇතැම්විට ඒ ඒ අවශ්‍යතාවයන්ට අනුරූප වන පරිදි වරින් වර ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම අවශ්‍ය වනු ඇත.

කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත, ඉඩම් ප්‍රතිසංස්කරණය නීතියටම සම්බන්ධ වූවකි. බොහෝවිට ඉඩම් ප්‍රතිසංස්කරණ පනතක් ඉදිරිපත් කිරීමේදී එල්ල වන චෝදනාව නම් පෞද්ගලික අයිතිය පොදු අයිතියට මාරු වීමේදී කාර්යක්‍ෂම තාවය සහ ආර්ථිකමය ඵලදායීතාවය හීන වන බවය. ඇතැම්විට පරිවර්තන ක්‍රියාවලියෙහිදී මෙය සිදුවන්ට පුළුවන. මෙවැනි කරුණු සලකා බලා කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත ඉදිරිපත් කරන උද්දේ ඉඩම්වල නිෂ්පාදන තත්වයන් ආරක්‍ෂා කර ගැනීම සඳහාය. රටේ සංවර්ධනයට අවශ්‍ය වන පරිදි නිෂ්පාදන තත්වයන් ඉදිරියටත් පවත්වාගෙන යාමට මෙම පනතින් ඉඩ කඩ සැලසේ. මෙම ක්‍රියා මාර්ගයන් තුළින් භූමිය පිළිබඳව මෙතෙක් පැවැති ආකල්පය වෙනස් වන්නේය. එය රටේ සංවර්ධනය සඳහා යෙදවිය යුතු වන්නේය.

කෘෂිකාර්මික ඉඩම් නීතිය කුඹුරු පනතට නව මුහුණුවරක් දීමකි. දැනට අවුරුදු 10 කට පමණ පෙර තිබූ තත්වයට ගැලපෙන පරිදි සකස් කරන ලද කුඹුරු පනතේ අඩු පාඩු සලකා එය වර්තමාන තත්වයට සරිලන පරිදි නව ආකල්ප වලින් යුතුව සකස් කිරීමකි කෘෂිකාර්මික ඉඩම් පනත. කලින් කුඹුරු පනත කුඹුරු ඉඩම් සඳහා පමණක් සීමා වුවත් නව පනත ශ්‍රී ලංකාවේ සෑම කෘෂිකාර්මික ඉඩමක්ම සම්බන්ධයෙන් වන්නේය. කෙසේ වෙතත් කුඹුරු පනත යටතේ අඳ ගොවියන් සතුව තිබූ අයිතිවාසිකම් මෙම පනතින් ඉදිරියටත් ආරක්‍ෂා කෙරේ. කුඹුරු පනතින් අඳ ගොවි අයිතිය පිළිබඳව නිගමනයකට එළඹීමේ ක්‍රියා මාර්ග විධායක නිලධාරීන් වෙත පැවරුනත් නව පනතින් එම වගකීම කෘෂිකාර්මික විනිශ්චය අධිකාරවලට පැවරෙන්නේය.

මෙවැනි පනතක් යටතේ ග්‍රාමීය මට්ටමේ නව ආයතන ගණනාවක් බිහි වන්නේය. දිවයින පුරා විසිර සිටින නව ලක්‍ෂයක් පමණ වූ ගොවීන් උදෙසා කලින් පෞද්ගලික පදනමක් මත කරගෙන යන ලද ව්‍යාප්ති සේවාවන් සඳහා ආයතනික පහසුකම් සැළසීමේ පොදු ක්‍රියා මාර්ගයක් ගෙන ඇත. එක් ගම් සභා ප්‍රදේශයකට එකක් වශයෙන් ඵලදා වර්ධන කමිටු සහ ග්‍රාමීය මට්ටමේ ගොවි කාරක සභා නීතිමය පදනමක් මත පත් කරනු ලැබේ. තවද සෑම ඵලදා වර්ධන කොමිටි ප්‍රදේශයන් සඳහා කෘෂි සේවා මධ්‍යස්ථානයන් ආරම්භ වනු ඇත.

සිය වගා කටයුතු සඳහා සිදු වන නොයෙකුත් ආපදා සහ අනතුරු ගැන කටයුතු කිරීම සඳහාත් විශේෂයෙන් භව සම්පත රක්‍ෂණය කිරීම සඳහාත්, කෘෂි කාර්මික රක්‍ෂණ පනත ඉදිරිපත් කර ඇත.

මෙතෙක් කල් ජනපද වාසීන් ලෙස ජීවත් වූ අයට සිය බිම් කට්ටිය හිමි කර ගැනීමට ඉඩ කඩ රජයේ ඉඩම් විකිණීමේ පනතින් සැලසේ. මෙනයින් බලන කල කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා පදනම වෙනස් කිරීමට ඇති නීති රීති දැන් සකස් වී ඇත. මේවායේ සාර්ථකත්වය ක්‍රියාකාරිත්වය තුළින් තීරණය කර ගත යුතු වන්නේය.

---

# ඉඩම් භාවිතය - අවශ්‍ය ප්‍රතිසංශෝධන

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ භූගෝල විද්‍යාව
පිළිබඳ මහාචාර්ය හිරාන් ඩයස් විසිනි

සංවර්ධන කාර්යාවලියෙහි ලා ඉඩම් පරිභෝජනයද අතිශයින් වැදගත් ස්ථානයක් ගනී. ප්‍රයෝජන ගත හැකි ඉඩම් වලින් උපරිම අයුරින් ප්‍රතිඵල ලබා ගැනීම අරමුණු කෙරෙන වැඩ පිළිවෙලක් ඉතාමත් වැදගත් වන්නේය. අතීතයේදී මහවැලි වැනි මහා පරිමාණ ව්‍යාපාර යටතේ විශාල ප්‍රදේශයක් තුළ ඉඩම් බෙදා දෙන ලදී. මෙවැනි ව්‍යාපාරයන් යටතේ බෙදා දෙන ලද ඉඩම් වලින් නිසි පරිදි උපරිම ප්‍රයෝජන ගනු ලැබේද යන්න දැන් ප්‍රශ්නයකට තුඩු දෙන කාරණයක්ව පවතී.

අත්දැකීම් වලින් දැනට පැහැදිලිව ඇති පරිදි උඩ වළවේ වැනි පෙදෙස්වල භූමියෙහි සුදුසුකම්වලට නොගැලපෙන වගාවන් කරගෙන යනු බොහෝවිට දක්නට ලැබේ.

කවර ආකාරයක හෝ ඉඩමක් සඳහා භෝග රටාව පිළිබඳව නිගමනයකට එළඹීමට පෙර භූ රසායනය ආදී කරුණු සම්බන්ධයෙන් ඉඩම පරීක්ෂා කිරීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි. බොහෝවිට ලබා ගත හැකි ජල පහසුකම්, වාරිමාර්ග පහසුකම් ආදී ප්‍රශ්න මෙන්ම ඇතැම් පෙදෙස්වල දක්නට ලැබෙන ජලය බැස නොයන ඉඩම් පිළිබඳ ප්‍රශ්න ආදිය ගැනද සැලකිලිමත් විය යුතුය. එමෙන්ම ඉඩම්වල පිහිටීම, ප්‍රමාණය, වෙළඳ පොළවලට පිවිසීමට ඇති පහසුකම් යනාදිය ගැනද සැළකිය යුතුය.

ඉතාමත් පුළුල් වශයෙන් ලංකාවේ ඉඩම් බෙදා දක්වන්නට පුළුවන. ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ජල පහසුකම් ඇති වගා කළ හැකි ඉඩම්, වියලි කලාපයේ දක්නට ලැබෙන ජලය බැස නොයන විල්පු වැනි ඉඩම්, වැසි ජලය පමණක් ලබා ගත හැකි ගොඩ ඉඩම් වශයෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි අතර රට වඩා සියුම් වූ කරුණු අනුවද ඉඩම්වල සුදුසුකම් පරීක්ෂා කළ හැක. සුදුසුකම් අනුව ඉඩම් භාවිතයට නොගෙනීමෙන් භූමියෙන් ගත හැකි නිසි ප්‍රයෝජන ගැනීමට නුපුළුවන් වනවා පමණක්නොව හොඳින් වගා කළ හැකි සරු බිම් නගර හා ගොඩනැගිලිවලට යට වී පාඩු සිදු වේ. මුදල් විශාල සම්භාරයක් වැය කොට සංවර්ධනය කරන ව්‍යාපාරවල මෙසේ සිදු වූ විට එය විශාල පාඩුවකි. පැරණි ලාංකිකයන් ඉඩම්වල සුදුසුකම් අනුව කුඹුරු, හංගොඩ, හේන් වශයෙන් ඉඩම් බෙදාගෙන භාවිතය කරන ලදී. එකල ඉඩම් භාවිතය ඉතාමත් උචිත අයුරින් කරගෙන යන ලදී. ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය වන තරම් ජලය ප්‍රමාණයක් ලබා ගත නොහැකි එහෙත් දෛනික අවශ්‍යතාවයන් සඳහා ජලය ලබා ගත හැකි ස්ථාන පමණක් ආරෝග්‍යශාලා, පාසැල් වැනි පොදු සේවාවන්ද, වෙළඳාමද කරගෙන යන සේවා මධ්‍යස්ථාන සඳහා උපයෝගී කර ගැනීම වැඩ දායකය. වියලි කලාපයේ ජනපද ව්‍යාපාර සඳහා ඉඩම් වෙන් කිරීමේදී මෙවැනි කරුණු ගැනද, මිනිසුන්ගේ අනිකුත් උවමනාවන් ගැනද සැලකිලිමත් වී මදිය. හුදෙක් ජලය සැපයීම මත මඩ ඉඩම් ගොඩ ඉඩම් ලෙස පමණක් අවධානය යොමු කොට ඇත.

එහෙත් මෙම වර්ගීකරණයද ශාස්ත්‍රීය හෝ ශිල්පීය නොවූ බව පරාක්‍රම සමුද්‍රය ආශ්‍රිත ජනපද පිළිබඳව අප විසින් කරන ලද පරීක්ෂණයකදී හෙළිදරව් විනි. එහි කුඹුරු ගොවිතැන් කළ

හැකි, ජලයෙන් යට වන ඉඩම් ඇතැම් විට ගොඩ ඉඩම් වශයෙනුත්, වී ගොවිතැන් සඳහා ජලය ලබා ගත නොහැකි ඉඩම් මඩ ඉඩම් වශයෙනුත් ජන පදිකයින්ට බෙදා දී තිබුණු බව පැහැදිලි වූනේය. ගොඩ ඉඩම් ලෙස බෙදා දුන් ඉඩම්වල ප්‍රධාන වගාව ලෙස වී වගාව කරන බව දක්නට ලැබුණි. මෙවැනි සාවද්‍ය වර්ගීකරණයක් ජනාවාසයක දක්නට ලැබේ නම් එය නිරවද්‍ය කර ගැනීම ව්‍යාපාර කළමනාකරුවන්ට පැවරිය යුතු රාජකාරියකි.

ගොවිතැන් සඳහා ඉඩම් වෙන් කිරීම මෙන්ම ජනාවාස හෙවත් ජනතාව පදිංචි කරවීම සඳහා ඉඩම් වෙන් කිරීම පිළිබඳවද සැලකිල්ලක් දැක්විය යුතු වේ. මෙතෙක් කල් අප භාවිතා කළ ක්‍රමය වූයේ විශාල ඉඩම් ප්‍රදේශයක් කට්ටි වශයෙන් වෙන් කර එක් එක් කට්ටියක එක් පවුලක් වශයෙන් පදිංචි කරවීමයි. මෙම ක්‍රියා මාර්ගය අයහපත් බවත්, සාමූහිකව ගම් වශයෙන් ජනාවාස ඇති කිරීමෙන් සාමාජිකයින් හට සේවා පහසුකම් වඩාත් පුළුල් ලෙස ලබා ගත හැකි බවත් දැන් පිළිගෙන ඇත. මෙවැනි ගම් ඇති කිරීමේදී ඒවායේ සාමාජිකයින් උදෙසා ඇඹුරු යනාදිය වෙන් කළ යුත්තේ ඔවුන්ගේ සේවාවන් ද උපරිම අයුරින් ගොවිතැන් කටයුතුවලට ලබා ගත හැකි වන පරිද්දෙනි. මෙවැනි ජනාවාසයක පිවිසුම් මාර්ග, ප්‍රවාහන පහසුකම් ආදිය ද එහි භූමි රටාවට සරිලන පරිදි ඇති කළ යුතු වේ. එමෙන්ම ඒවා සඳහා ජනපදිකයින් තෝරා ගැනීමේදී සමාජ විද්‍යාත්මක කරුණුද සැලකිල්ලට භාජන විය යුතුයි.

ගොවිතැන සඳහා මෙන්ම සත්ව පාලනය උදෙසා ද ඉඩම් වෙන් කිරීම අවශ්‍ය වන්නට පිළිවන. නව කෘෂිකාර්මික සංවර්ධන සැලැස්මෙහි සත්ව පාලනය සම්බන්ධයෙන් අවධාරනයක් යොමු කර ඇති අතර වී ගොවිතැන් ආදී කටයුතු සඳහා අවශ්‍ය මී හරකුන් ලබා ගැනීමේ ප්‍රශ්නය අනුවද සත්ව පාලනය වැදගත් වන්නේය. පුළුල් වශයෙන් ගවයින් දෙනුන් දෙනෙක් ඇති කිරීමේ වැඩ පිළිවෙලක් පිළිබඳව සලකා බලන කල්හි යම් යම් ප්‍රදේශවල ගවයින් ඇති කිරීමේ කාර්ය භාරය යම් යම් පවුල් වෙත පවරා ගවයින් ගාල් කිරීම සඳහා මෙන්ම තණ බිම් සඳහා ද ඉඩම් වෙන් කරවීම වඩා සාර්ථක වැඩ පිළිවෙලක් ලෙස පිළි ගැනීමට ඉඩ ඇත. එහෙයින් සත්ව පාලනය සඳහා අවශ්‍ය ගොවිපලවල් ඇති කිරීම සම්බන්ධයෙන් ද ජනාවාස කරණයෙහිදී සැලකිල්ලක් දැක්විය යුතුය. සීඝ්‍ර ජනගහණ ව්‍යාප්තියක් ඇති වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටක් මුළුමනින්ම කෘෂිකර්මයෙන් පමණක් යැපීමට අපේක්ෂා කිරීම වැඩ දායක නොවන හෙයින් කෘෂිකර්මීය අනුරූපව කර්මාන්තද දියුණු කිරීම අවශ්‍යය. ජනාවාස තුළ සුළු පරිමානයේ කර්මාන්ත ඇති කිරීමට හැකියාවන් තිබෙන හෙයින් එවැනි කර්මාන්ත සඳහා උපයෝගී කර ගත හැකි ඉඩම් වෙන් කිරීමද භූමි පරිභෝග රටාවෙහි වැදගත් තැනක් ගනී. ඇතැම්විට මහා පරිමාණයේ කර්මාන්ත ඇති කළ යුතු වන්නේ කුඩා ජනාවාස ආශ්‍රයෙන් නොව නගර ආශ්‍රයෙනි. භූමි පරිභෝගය සැලසුම් කිරීමේදී මේ ගැනද සැළකිය යුතුයි. භූමි පරිභෝග රටාව පිළිබඳව ආරම්භයේදී ඇති කර ගන්නා ලද සැලැස්ම මුල් අවස්ථාවෙහිදී ආර්ථික වශයෙන් පිළි ගනු ලැබිය හැකි වුවත්, සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී ඇතැම්විට මෙම තත්වය වෙනස් වේ. ඇතැම්විට මුලින් තිබුණු ජලය පිළිබඳ තත්වය කල් යාමේදී වෙනස් වීමට පිළිවන. එවිට එම තත්වයට සරිලන පරිදි භූමි පරිභෝග රටාවද වෙනස් කිරීමට උත්සුක විය යුතුය. ඇතැම්විට ආර්ථිකමය වශයෙන් කිසියම් භෝගයක් සඳහා ඇති වන ඉල්ලුමෙහි අඩු හා වැඩි බව අනුව එම භෝගය වගා කරන ඉඩම් ප්‍රමාණය ද එම ඉල්ලුමට සරිලන පරිදි වැඩි හෝ අඩු කළ යුතු වන්නේය. එහෙයින් භූමි පරිභෝග රටාව කලින් කලට පරීක්ෂා කොට අවශ්‍ය සංශෝධන කිරීමද සංවර්ධන නිලධාරීන්ගේ වගකීමක් වේ.

## වියළිකලාපීය හා තෙත්කලාපීය ඉඩම් පරිහරණය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමුපකාර ජනාවාස අංශයේ
ආර්. එම්. එස්. රත්නායක මහතා විසිනි

මෙරට දක්නට ඇති පාරම්පරික ජනාවාස ක්‍රම කාලාන්තරයක් තිස්සේ දියුණු වූ, ඒවා බව පෙනේ. මෙම ජනාවාසයන්හි දියුණුවේ උපරිම අවස්ථාව (උදා :- වියළිකලාපීය ගංගොඩ, වෙල්යාය සහ හේන වැනි සම්පූර්ණ ක්‍රමයක්) ගැන බලනවිට යමෙකුට පෙනෙන්නේ යැපීමට තරම් පමණක් වූ ආර්ථික රාමුවක් තුළ ඇති සමතුලිත මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය හා නිෂ්පාදන ශක්තියයි. එකල දැනට වඩා රටේ ඉඩම් හා ශ්‍රමය ද අඩු මිලකට ලබා ගැනීමේ හැකියාව තිබුණි. එම ගොවීන් තමන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට පමණක් නිෂ්පාදනය කළ අතර භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට නොසිතූහ.

ඉඩම් හා ජනගහණය අතර අධික අනුපාතයක් හා මෙවැනි ආර්ථික රාමුවක් තුළ ජීවත් වූ සෞඛ්‍ය, ස්වයංපෝෂිත ග්‍රාමීය සමාජයක් තුළ නම් මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබුණි. නමුත් ඉඩම් හා ජනගහණය අතර වූ අනුපාතය අඩු වී ඇති සෑම ගම්මානයකටම තම අවශ්‍යතාවයනට වඩා අතිරික්තයක් නිෂ්පාදනය කිරීමට සිදු වී ඇති මෙවැනි අවධියක අප අනුගමනය කළ යුත්තේ කෙසේ වූ ක්‍රියා මාර්ගයක්ද?

දැනට දක්නට ඇති ප්‍රධානතම වැවිලි භෝග වූ තේ, පොල්, රබර් ආදියද එම වගාවන්ට සරිලන පරිසරයන්හි වගා කර භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට පැරැන්නන් නොසිතූහ. එමනිසා වගාවන් භූමියට, පසට හා පරිසරයට එකඟ වන පරිදි වෙනස් කොට ගොවියාටත්, රටටත් උපරිම නිෂ්පාදනයක් හා ලාභයක් ලැබෙන පරිදි භෝග රටාව වෙනස් කළ යුතු වේ.

දැනට වියළි කලාපයේ දක්නට ඇති වාරිමාර්ග ව්‍යාපාර, ඒ පිළිබඳව හොඳින් අධ්‍යයන කොට සකස් කරනු ලැබූ ඒවාය. තෙත්කලාපය පිළිබඳව එතරම් අවබෝධයක් නොමැති නමුත් වියළි කලාපයේ පස, භූ ලක්ෂණ හා අනිකුත් ස්වභාවික සම්පත් පිළිබඳව ගැඹුරට අධ්‍යයනය කර ඇති නිසා ඒ පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ඇත.

වර්ෂ 1960 ට පෙර ලංකාවේ වියළි කලාපීය ජනපද ව්‍යාපාර හා වාරිමාර්ග ව්‍යාපාර ආරම්භ කිරීමේදී පස, ජලවහනය හා අනිකුත් ස්වභාවික සම්පත් ගැන කිසිම අධ්‍යයනයක් නොකර වැවක් නිර්මාණය කර ඒ යටතේ ජනපද ව්‍යාපාර ඇති කර එහි ජනපදිකයින් පදිංචි කරවන ලදී. භූමියේ ඇති හැකියාවන් පිළිබඳව ශාස්ත්‍රානුකූල පර්යේෂණයන් නොකරන ලද මෙවැනි අවස්ථාවන්හිදී මනා ජලවහනයක් ඇති ප්‍රදේශවල පවා අනවශ්‍ය ලෙස වැව් හා කුඹුරු නිර්මාණය කර තිබුණු බව පසුව පැහැදිලි විය. මෙයින් සිදු වූයේ අපේක්ෂා නොකල පරිදි ජලය අපතේ යාම පමණක්නොව ආයෝජනය කල මූලධනයට සරිලන ප්‍රතිලාභයන් නොලැබී යාමයි. මෙම ක්‍රමය යටතේ කුඹුරු ගොවිතැන් කිරීමට පමණක් උත්සාහ කළ අතර වෙනත් උස්බිම් භෝග වගාවන් සඳහා සිත නො යෙදවූහ.

මෙසේ සිදු වූයේ පාංශු සිතියමක ආධාරය නොමැතිව එවැනි වාරිමාර්ග ව්‍යාපාර සැලසුම් කළ නිසාය. පාංශු සිතියමක් පසුබිම් කර ගෙන එවැනි ව්‍යාපාර සැලසුම් කළා නම් මනා

ජලවහනයක් ඇති බිම්වල වැව් හෝ කුඹුරු නොසෑදීමට ඉඩ තිබුනි. ඒ වෙනුවට දුර්වල ජලවහනයක් ඇති පසින් යුත් ප්‍රදේශ මෙම කාර්ය සඳහා යොදා ගත හැකිව තිබුනි. පාංශු සමීක්ෂණ, පාංශු වර්ගීකරණ හා ඉඩම් වර්ගීකරණ ආදී කටයුතු ආරම්භ කර මෙවැනි ව්‍යාපාර සැලසුම් කිරීම ආරම්භ කළේ 1960 වර්ෂයෙන් පසුවය. වියලිකලාපීය පස් වර්ග, මනා ජලවහනය, අපරිනත ජල වහනය හා දුර්වල ජලවහනය යනාදී වශයෙන් ජලවහනයේ ඇති අක්‍රමවත් භාවය අනුව පමණක්නොව පසෙහි හැඹුර අනුවද වර්ගීකරණය කරන ලදී.

රජයේ පරීයේෂණායතනවල කෙරුනු පරීයේෂණ වලින් පසෙහි සාරවත් බව අනුව භෝග වගාව කළ, නොකල හැකි බව තීරණය කෙරුනි. 1964-1965 වර්ෂවල මෙම පරීයේෂණ කටයුතු දියුණු වී නොයෙක් වර්ගයේ පස් වර්ගවලට මොන වර්ගයේ භෝග වඩා හොඳින් ගැලපේද යන්න දැන ගැනීමට හැකි විය. නමුත් ඒ වනවිටත් අප බලාපොරොත්තු වූ අවස්ථාවට පැමිණ නොතිබුනේ එම වර්ගීකරණයන් සියළු අන්දමින් සම්පූර්ණ නොවී තිබුණ නිසාය. මොන වර්ගයේ පස්වල, මොන වර්ගයේ භෝග ව්‍යාප්ත කර වැඩිම ආර්ථික ඵල ප්‍රයෝජන හා වැඩිම රැකියා නියුක්තිය සැලසිය හැකිද යන්න ගැන එවකටත් අප දැන සිටියේ නැත.

මහවැලි ව්‍යාපාරය පිළිබඳව පාංශු වර්ගීකරණය හා භෝග රටාව පිළියෙල කරද්දී පාංශු විශේෂඥයන්ගේ අදහස් පමණක්නොව කෘෂි විශේෂඥයන්ගේ ද ආර්ථික විද්‍යාඥයන්ගේ ද අදහස් සොයා බලන ලදී. මේ අනුව ආර්ථික වශයෙන් වැදගත් වන පරිදි පසට සරිලන භෝග රටාවක් ගැන නිගමනයකට එළඹිය හැකි විය. එපමණක් නොව වැඩිම රැකියා පහසුකම් සැලසීම සඳහා භෝග රටාවන් කෙසේ වෙනස් කළ යුතුද යන්න ගැනත් අධ්‍යයනය කිරීමට හැකි විය. මේ අනුව ගොවියාට හා රටට වැඩිම ආර්ථික වාසියක් සැලසෙන පරිදි භෝග වර්ග හා භෝග රටාව පසට හා අනිකුත් ස්වභාවික සම්පත්වලට අනුකූලව වෙනස් කළ යුතු ආකාරය ගැන දැන ගැනීමට ලැබුනි.

මෙම පරීයේෂණයන්ගෙන් පසු ඉතා සමීප අධ්‍යයනයන් කර ආදර්ශ ගොවිපලවල් ආරම්භ කරන ලදී. මේ සැලසුම් අනුව එක් පවුලකට ජලය සපයූ කුඹුරු අක්කර 2 කුත් ගෙවතු සඳහා අක්කර 1/2 කුත් ලැබුනි. මෙම ජලය සැපයිය හැකි බිම් ප්‍රදේශවල මහ කන්නයේ කුඹුරුද යල් කන්නයේ වෙනත් භෝග වර්ගද වගා කෙරුනි. දුර්වල ජල වහනයක් ඇති ප්‍රදේශවල කුඹුරුද උස් බිම්වල සුක්ෂම අන්දමේ ගොඩ භෝග වගාවද කරන ලදී. මේ අනුව එක් ගොවි පවුලකට තම මාසික ආදායම රු. 400/- ක් පමණ දක්වා වැඩි කර ගැනීමට අවස්ථාව සැලසුනි. 1970-1971 කාලසීමාවේදී වාරිමාර්ග ව්‍යාපාර ගැන විශාල දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව සැලසී තිබුනි. මෙසේ ආරම්භ කරනු ලැබූ මුත්තායන්කට්ටුකුලම්, විශ්වමාඩුකුලම් හා පැල්වැහැර වැනි ආදර්ශ ව්‍යාපාර අද සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ.

ජනාවාස යෝජනා ක්‍රම ආරම්භ කිරීමේදී ජනාවාසිකයින් සඳහා වාසස්ථාන හා ගෙවතු සැලසුම් කිරීමේදී වඩාත් පරීක්ෂාකාරී විය යුතුය. පැරණි ජනාවාසිකයින් බොහෝවිට වැව් ආශ්‍රිතව ජීවත් වූ අතර සෑමවිටම ඉහළින් පිහිටි උස්බිම් වාසස්ථාන සඳහාත්, වැවට පහළින් පිහිටි බිම් කුඹුරු ගොවිතැන් සඳහාත්, වඩාත් ඉහළින් පිහිටි බිම් හේන් ගොවිතැන් සඳහාත් උපයෝගී කර ගත්හ. දැනට අනුගමනය කරන පිළිවෙත අනුව කලින් මෙන් විසිර පැවති වාසස්ථාන වෙනුවට ප්‍රධාන ඇලෙන් දිවෙන අතු ඇළ මාර්ග ආශ්‍රිතව පොකුරු ජනාවාස ඇති කිරීමට බලාපොරොත්තු

වනු ලැබේ.

තෙත් කලාපයෙහි බිම් දැනටමත් නොයෙකුත් ජනාවාස පිහිටුවා භාවිතයට ගෙන ඇතත් වියලි කලාපයේ භූමිය පිළිබඳව මෙන් ක්‍රමවත් වූත්, පුළුල් වූත් සමීක්ෂණ මෙතෙක් කර නොමැත. ඉඩමක් ප්‍රයෝජනයට ගැනීමේදී එම ඉඩමෙහි භෞතික සම්පත් ඇසුරින් ලද හැකි උපරිම ප්‍රයෝජනයන් පිළිබඳව පළමුකොටම සලකා බැලිය යුතුය. ඉඩමෙහි ඇති විවිධ පස් වර්ග පිළිබඳව සාධාරණ වර්ගීකරණයක් කර ඒ අනුව භෝග රටාව පිළියෙල කිරීම වැදගත් වන්නේය. තෙත් කලාපයේ මෑතදී ඇති කරන ලද ජනාවාස සම්බන්ධයෙන් ද බොහෝවිට භූමිය පිළිබඳව සුදුසු වර්ගීකරණයක් කිරීමට ප්‍රයත්නයක් දරන ලදී. හදිසි වැඩ පිළිවෙලක් යටතේ ජනාවාස ඇති කරනු ලැබුවද ඉඩමෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වන පරිදි භූමිය පිළිබඳව සමීක්ෂණයක් කර එයට සරිලන භෝග රටාවන් ද ඇති කිරීමට ජනාවාස සැලසුම්කරණයේදී සැමවිටම සැලකිලිමත් විය යුතුය.

---

# ගොවිපළ් සැළසුම්කරණය සහ අය වැය සකැසුම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අර්ථ ශාස්ත්‍රඥ ඩී.ර්.එ/ජ්.සුරවීර මහතා විසිනි.

## 1. හැඳින්වීම

පසුගිය කාල පරිච්ඡේදයේ ලංකාවේ කෘෂිකර්ම නිෂ්පාදනය සීඝ්‍රයෙන් වර්ධනය කිරීම සඳහා නොයෙක් වැදගත් පියවර ගැනින. මේ පියවර වලින් විශේෂයෙන් සඳහන් කළ හැක්කේ වී සහ අනෙකුත් බෝග නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඇතිව නවීන කෘෂිකාර්මික ක්‍රම සහ වැඩි දියුණු කල වී වහී අප ගොවීන්ට හඳුන්වා දීම සහ ඒවා පතල කිරීමට ගත් උත්සාහගනයන්ය. මෙම වෑයම් බොහෝදුරට සාර්ථක වී ඇති බව පසුගිය කාලය තුළ ඇති වූ කෘෂිකාර්මික වර්ධනයෙන් අපට පෙනී යයි.

නමුත් මේ දක්වා ප්‍රධාන වශයෙන් අපේ අවධානය යොමු වී ඇත්තේ, නවීන ක්‍රම සහ දියුණු කල බෝග වහී භාවිතයෙන් නිෂ්පාදනය වැඩි කර ගැනීම විනා ආර්ථික වශයෙන් වියදම් හැකි තරම් අඩු කොට, උපරිම නිෂ්පාදනයක් ලබා එක් එක් ගොවිපලෙන් වැඩි ලාභයක් ලැබීම නොවේ. ආහාර හිඟ වීමේ තර්ජන, ආනයනය කරන ආහාර ද්‍රව්‍යවල මිළ ඉහළ යාම ආදිය නිසා අපට හැකි තරම් ඉක්මනින් කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය විය. මේ සඳහා ඉහත දැක්වූනු පරිදි නව ශිල්පීය ක්‍රම සහ දියුණු බෝග වහී වැඩි වැඩියෙන් භාවිතා කිරීමට සිදු විය.

නමුත් ගොවිපල් ව්‍යාපාර ඒකක මෙන් සලකා ඒවා වෙළඳ ව්‍යාපාර මෙන් උපරිම ලාභයක් ලැබීමේ චේතනාවෙන් පවත්වාගෙන යාමේ කාලය දැන් පැමිණ තිබේ. මෙම අරමුණ සපුරා ලීම සඳහා අපට එක් එක් ගොවිපල් අධ්‍යයනය කිරීම සඳහා <u>ගොවිපල් පාලන විද්‍යාව</u> අවශ්‍ය වේ.

## 2. ගොවිපල් පාලන විද්‍යාව යනු කුමක්ද?

ගොවිපල ශත වර්ෂ ගණනාවකට පෙර වර්ධනය වූ ආර්ථික හා සමාජයීය ආයතනයක් වුවද ගොවිපල් පාලන විද්‍යාව බිහි වූයේ මෑතකදීය.

මෙම විෂයෙහි කෙටි ඉතිහාසය නිසා එහි ස්වභාවය, විෂය ප්‍රමාණය හා වැදගත්කම මේ දක්වාට හරි හැටි හඳුනාගන නැත. ගොවිපල් පාලන විද්‍යාවට විවිධ පුද්ගලයින් විසින් විවිධ අර්ථ දී ඇති බව අපට පෙනී යයි.

ගොවිපල් පාලන විද්‍යාව යනු ගොවියෙකුගේ දෛනික ක්‍රියා පරිපාටියට වඩා දෙයක් නොවන බව සමහරු කල්පනා කරති. තවත් පිරිසක් එය නිෂ්පාදන ආර්ථික විද්‍යාවට හෝ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාවට තවත් නමක් යයි සිතති. රජයේ ගොවිපලක ගොවිපල් කළමනාකරුවකුගේ වැඩ කොටසට ගොවිපල් පාලන විද්‍යාව යැයි සමහරු පවසති. සැමටම පිළිගත හැකි නිශ්චිත නිර්වචනයක් මේ දක්වා ඉදිරිපත් කර නැති නමුත් අපගේ පරමාර්ථයන් සඳහා ගොවිපල් පාලන විද්‍යාව පහත දැක්වෙන අයුරින් විග්‍රහ කළ හැක.

ගොවිපල් පාලන විද්‍යාව යනු, එක් එක් ගොවිපලින් උපරිම සහ අඛණ්ඩ ප්‍රතිපල හෝ ලාභ ලැබෙන පරිදි භූමිය, ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සුදුසු ලෙස සංයෝග කිරීමටත්,

ක්‍රියාත්මක කිරීමටත් සුදුසු බෝග ව්‍යාපාර සහ සත්ව ව්‍යාපාර තෝරා ගැනීමටත් ඒවා මනා අන්දමින් සංයෝග කිරීමටත් උගන්වන විද්‍යාවකි.

ගොවිපල් පාලන විද්‍යාව පුහු විද්‍යාවක් මෙන්ම ප්‍රායෝගික විද්‍යාවකි. දත්ත එකතු කිරීම, විශ්ලේෂණය සහ එමගින් කරුණු පැහැදිලි කිරීම සහ මූලධර්ම සොයා ගැනීමත් මෙම විද්‍යාවේ වැදගත් අංගයක් වන බැවින් එය පුහු විද්‍යාවකි. ඒ අතරම ගොවිපල්වල ඇති වන ගැටළු පරීක්ෂා කිරීම සහ පිළියම් සොයා ගැනීම මෙම විද්‍යාවේ තවත් අංගයක් බැවින් එය ප්‍රායෝගික විද්‍යාවකි.

කෙටීන් කියතොත් ගොවිපල් පාලන විද්‍යාව යනු ගොවිපලක් වෙළඳ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට උපකාරී වන විද්‍යාවකි.

## 3. ගොවිපල් පාලන විද්‍යාවේ වර්තමාන වැදගත්කම

ලංකාවේ ගොවීන්ගෙන් සැළකිය යුතු සංඛ්‍යාවකට ගොවිතැන පාරම්පරිකව කෙරෙන කාරියයක් නොව ලාභ ලැබීම සඳහා කරන වෙළඳ ව්‍යාපාරයක් බවට ක්‍රමයෙන් පරිවර්තනය වෙමින් පවතී. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ නවීන ගොවිතැන් ක්‍රම සහ අළුත් වැඩි දියුණු කල බෝග වර්ග පසුගිය කාලයේදී බොහෝසෙයින් ජනප්‍රිය වීම නිසා ඇති වූ නිෂ්පාදනයේ වර්ධනයයි. මෙසේ ගොවිතැන ලාභ ලැබීමේ චේතනාවෙන් වෙළඳ ව්‍යාපාරයක් මෙන් පවත්වාගෙන යාමට බොහෝ ගොවීන් තැත් කරන අවස්ථාවකදී එය කාර්යක්ෂම ලෙස කළමනාකරනය කිරීමත්, ව්‍යාපාර ක්‍රම භාවිතා කිරීමත් අත්‍යවශ්‍ය වශයෙන්ම සිදු විය යුත්තකි.

දැනට අප රට ගොවිකටයුතු ක්ෂේත්‍රයේ නොයෙක් වැදගත් වෙනස්කම් ඇති වන අවදියකි. ළඟදී සම්මත කර ගන්නා ලද පනත් —කෘෂිකර්ම පළදාව වර්ධන පනත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මෙම වෙනස්කම් වලින් ප්‍රධාන තැනක් ගනී. මෙම පනත් දෙකෙන්ම මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ අපට ඇති දුර්ලභ සම්පත් වලින් විශේෂයෙන් ඉඩම් වලින් උපරිම පළදාවක් ලබා ගැනීමයි. පළදාව වර්ධන පනතින් බලාපොරොත්තු වන්නේ කෘෂිකාර්මික ඉඩම් පළදායී ලෙස යොදා ගැනීම සහ පාලනය කිරීමත්, කෘෂිකාර්මික බෝග හෝ සත්ව ව්‍යාපාර කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමත්, එමගින් උපරිම පළදාවක් ලබා ගැනීමත්ය. එම පනතේ සඳහන් කර ඇති හැටියට යම් කෘෂිකාර්මික ඉඩමක ප්‍රමාණය, පිහිටීම සහ ස්වභාවික සම්පත් ගැන සලකා ඒ අනුව භූමියට වඩාත් සුදුසු වන පරිදි බෝග වගා කිරීම හෝ සත්ව පාලන ව්‍යාපාර පවත්වාගෙන යාම, එම ඉඩමේ පදිංචි කරු හෝ අයිතිකරු වන සෑම අයකුගේම යුතුකමක් වනු ඇත. මෙම පනතේ අඩංගු නීති රීති අනුව නිෂ්පාදන තත්වය හා ප්‍රමාණය යන දෙකම සාර්ථක අන්දමින් පවත්වාගෙන යාම සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ අදහසින් යුතුව හොඳින් ඉඩම පාලනය කිරීමද පදිංචි කරුගේ හෝ අයිති කරුගේ යුතුකමක් වනු ඇත.

ඉහත සඳහන් විග්‍රහයෙන් මෙම පනත මනා ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිපල් පාලන විද්‍යාවේ ඇති වැදගත්කම පැහැදිලිව අවබෝධ වනු ඇත. කෙටීන් කියතොත් පළදාව වර්ධන පනතින් ගොවීන්ගෙන් බලාපොරොත්තු වන්නේ ගොවිපල් පාලන විද්‍යා මූලධර්ම හා ශිල්පීය ක්‍රම භාවිතා කර උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීමයි.

## 4. ගොවිපළ් සැලසුම්කරණය සහ අය වැය සකැසුම

අනාගතයේදී ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කරනු ලබන ඕනෑම වැඩ සටහනකට සැලසුමක් යැයි කිව හැක. ගොවිපළ් සැලසුමක් යනු ගොවිපළ් ව්‍යාපාරයක අනාගත සංවිධානය සහ ක්‍රියාකාරිත්වය සඳහා පිළියෙල කර ගනු ලබන වැඩ සටහනකි. ගොවිපළ් සැලසුමකට දෙ ආකාරයකින් අර්ථ දිය හැක. පළමුව ගොවියා විසින් තම ගොවිපලේ කිරීමට බලාපොරොත්තු වන සම්පූර්ණ ප්‍රති සංවිධානයකට ගොවිපළ් සැලසුමක් යැයි කිව හැක. දෙවනුව, ඔහු තම ගොවිපලේ එක් බෝගයක් සඳහා කිරීමට බලාපොරොත්තු වන ගොවිතැන් ක්‍රමයක වෙනසකට ද ගොවිපළ් සැලසුමක් යැයි කිව හැක.

ගොවිපළ් අය වැයක් යනු ගොවිපලෙහි අනාගතයේදී ඇති කරන්නට බලාපොරොත්තු වන ඕනෑම වෙනසක් අගය කිරීම සඳහා පිළියෙල කර ගත් එම වෙනස සඳහා යන වියදම් ද, ලැබීමට බලාපොරොත්තු වන ආදායම් ද ඇතුළත් ලිඛිත සැලැස්මකි. උදාහරණයක් වශයෙන් ගොවිපලෙහි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන දියුණු ගොවිතැන් ක්‍රමයක් හෝ අළුත් උපකරණයක් පාවිච්චිය සඳහා යන වියදම් සහ අපේක්ෂිත ආදායම් සැසඳීමට අය වැයක් සකස් කර ගත හැක. එසේම ගොවිපලේ බෝග සහ බෝග සංයෝගයේ සම්පූර්ණ ප්‍රතිසංවිධානයක් සඳහා යන වියදම් සහ අපේක්ෂිත ආදායම් ගැන සොයා බැලීමට ද ගොවිපළ් අය වැය ලේඛනයක් සාදා ගත හැක.

ගොවිපළ් සැලසුම සහ අය වැය ඉතා ළඟින් එකිනෙකට සම්බන්ධ වී ඇති හෙයින් වෙන් වෙන් වශයෙන් පැහැදිලිව අර්ථ දීම සමහරවිට දුෂ්කර විය හැකිය. නමුත් විශේෂයෙන් මතක තබා ගත යුත්තේ අය වැයක් පිළියෙල නොකර සැලැස්මක් පිළියෙල කර ගත හැකි බවය. නමුත් සැලැස්මක් නොමැතිව අය වැයක් තිබිය නොහැකිය. එනමුත්, සැලැස්මක් අගය කිරීම සඳහා අය වැයක් අවශ්‍ය වේ.

## 5. දැනට ලක්වැසි ගොවීන් තම ගොවිපළ් සැලසුම් කරන්නේද?

නොදියුණු ප්‍රදේශයක වුවද සෑම ගොවියකුටම තමන්ගේ භූමිය, ශ්‍රමය සහ අනෙකුත් සම්පත් කෙසේ යොදන්නේද, කිනම් බෝග වගා තෝරා ගන්නේද, ඒවා කෙසේ සංයෝග කරන්නේද යනුවෙන් සහ තමන්ගේ දෛනික ක්‍රියා මාර්ගය සඳහාද යම්කිසි සැලැස්මක් ඇත. ලක්වැසි ගොවීන් සියලු දෙනාම පාහේ මෙවැනි දළ සැලැස්මක් සාමාන්‍යයෙන් සිතේ තබාගන ඇති නමුත් එය ලිඛිතව පිළියෙල කරන්නේ ඉතා කලාතුරකිනි. එමෙන්ම ඔවුන් තම සැලසුම් සඳහා යන වියදම් සහ ආදායම් රුපියල් ශත වලින් ලේඛන ගත කොට අය වැය පිළියෙල කරනු ලබන්නේ කලාතුරකිනි.

මෑත කාලයේදී ඇති වුනු ගොවීන්ගේ ආර්ථික දියුණුව නිසාත්, ගොවිතැන ව්‍යාපාරයකට පරිවර්තනය වෙමින් පවතින නිසාත් ගොවිපළ් සැලසුම්කරනය සහ අය වැය සකැසුම කෙරෙහි වහාම අපගේ අවධානය යොමු විය යුතුය. මෙම සැලසුම් සහ අය වැය ගොවීන්ට පමණක් අවශ්‍ය වන දෙයක් ලෙස නොසැළකිය යුතුය. ව්‍යාප්ති නිලධාරීන්ටත්, පර්යේෂණ නිලධාරීන්ටත්, ගොවිතැන ගැන උනන්දුවක් දක්වන සෑම තෙනෙකුටත් මෙම ක්‍රමය වැදගත් වේ.

ගොවිපළ් සැලසුම සහ අය වැය ගොවිපළ් පාලන විද්‍යාවේ වැදගත් අංගයකි. ගොවිපළ් පාලන විද්‍යාවෙන් බලාපොරොත්තු වන උපරිම ආදායමක් ලැබීම සඳහා නිෂ්පාදන සාධක සුදුසු ලෙස යෙදීමටත්, භෝග තෝරා ගැනීමටත් බෝගවල සුදුසු සංයෝගය සඳහාත් සැලසුම්කරණය සහ අය වැය අත්‍යවශ්‍ය අංගයකි.

බොහෝ ගොවීන් තම අනාගත ක්‍රියා මාර්ගය සඳහා සිතහේ යම්කිසි සැලැස්මක් ඇතත්, ඔවුන් මේ සැලසුම් සඳහා මග පෙන්වන්නා ලෙස අතීතය දෙස බැලීමට පුරුදු වී ඇත. සාමාන්‍ය ගොවියා තමාට නවීන ක්‍රම පාවිච්චියට ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට නොගනියි. ඔහු අනාගතයේදී කිරීමට බලාපොරොත්තු වන්නේ එක්කෝ ඔහු අතීතයේ කල දෙයම හෝ තම සහෝදර ගොවීන් විසින් සාමාන්‍යයෙන් කරනු ලබන දෙයයි. නමුත් සංවිධානය කල ගොවිපල් සැලසුම්කරනය ගොවීන්ට අනාගතය දෙස බැලීමට උගන්වයි. මේ නිසා සම්ප්‍රදායික මත දරන ගොවියා සිය ප්‍රශ්න දෙස බලන ආකාරයේ වෙනස්කමක් ඇති කරලීමට ගොවිපල් සැලසුම් උපකාරී වෙයි.

බොහෝවිට එත්තරා හමක හෝ ප්‍රදේශයක ගොවිතැන දියුණු කිරීමට ඇති හැකියාවන් පැහැදිලිව පෙනෙන තුරු ගොවිපල් සැලසුම් කිරීම එතරම් පලදායක නොවේ. ගොවිපලේ සැලසුම් ක්‍රමයක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගොවීන්ට මග පෙන්විය හැකි පුහුණු දක්ෂ ව්‍යාප්ති සේවයක් අවශ්‍ය වේ. අස්වැන්න හා නිෂ්පාදනය වැඩි කරලීම සඳහා අත්හදා බැලූ සරල නවීන ගොවිතැන් ක්‍රම අවශ්‍යය. කෘෂිකාර්මික ණය අවශ්‍ය ප්‍රමාණයන් අවශ්‍ය වේලාවට පහසුවෙන් ලබා ගැනීමට ඉඩ කඩ තිබිය යුතුය. පෝර, කෘෂි රසායන ද්‍රව්‍යයන් පහසුවෙන් ලබා ගැනීමට පුළුවන්කම තිබිය යුතුය. වර්ධනය වන නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා සතුටු දායක වෙළඳ පොලවල් තිබිය යුතුය. ඉහත දැක්වුනු තත්වයන් සතුටුදායකව පවතී නම් ගොවිපල් සැලසුම් ක්‍රමය සාමාන්‍ය ගොවියාට ඉමහත් ආධාරයක් වේ.

6. <u>ගොවිපල් සැලසුම් කිරීම ගොවියාට උපකාරී වන්නේ කෙසේද?</u>

මූලික වශයෙන් ගොවිපල් සැලසුම හා අය වැය ගොවියාට පහත දැක්වෙන දේ සංවිධානාත්මකව සහ ක්‍රමවත්ව කිරීමට උපකාරී වෙයි.

1. ගොවියාට තමා අවට දෙස බලා, තමන්ට අනාගතයේදී උපකාරී විය හැකි නව මත හා දියුණු ක්‍රම ගැන පැහැදිලි අදහසක් ලබා ගත හැකිය.

2. ගොවියාට තමන්ගේ වර්තමාන තත්වය සහ අතීත අත්දැකීම් දෙස ප්‍රවේසමෙන් බලා තමන්ට වඩාත් සුදුසු නවීන ගොවිතැන් ක්‍රම මොනවාදැයි හඳුනා ගැනීමට උපකාරී වෙයි.

3. අලුත් ක්‍රම සහ අදහසුත්, තමාගේ තත්වයත් දෙස බලා තමා විසින් භාවිතයට ගත යුතු අදහස් සහ ක්‍රම මොනවාදැයි පැහැදිලි තීරණයකට එළඹීමට ගොවියාට උදව් වෙයි. උදාහරණයක් වශයෙන් තමා වගා කරන බෝග සඳහා නව ක්‍රම කෙසේ පාවිච්චියට ගත යුතුද? එක් එක් බෝගයෙන් වවන අක්කර ප්‍රමාණය කොපමණද? ඒවා කෙසේ වගා කරන්නේද? යන ප්‍රශ්න සම්බන්ධයෙන් තීරණ ගැනීමට උපකාරී වෙයි.

4. තමා විසින් භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන අනාගත සැලසුම් සඳහා යෙදවුම් (පෝර, බීජ, කෘෂි රසායන ආදිය) අවශ්‍ය ප්‍රමාණය හා යන වියදම හඳුනා ගැනීමට උපකාරී වෙයි.

5. ගොවියාට තම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ණය හෝ මුදල් ප්‍රමාණය හඳුනා ගැනීමට උපකාරී වෙයි.

6. තමන්ට බලාපොරොත්තු විය හැකි අස්වැන්න හා නිෂ්පාදන ප්‍රමාණය කොපමණදැයි හඳුනා ගත හැක. එමෙන්ම ඔහු තමන් ගත් ණය පියවන්නේ කෙසේද? අනෙකුත් අවශ්‍ය වියදම් දරන්නේ කෙසේද? ආදී ප්‍රශ්න ගැන පැහැදිලි අවබෝධයක් ලැබීමට උපකාරී වෙයි.

## 7. ගොවිපල් සැලසුම් කිරීම සඳහා මග පෙන්වන මූලධර්ම

සමහරවිට ලාභය හෝ ආදායම ගොවියා ගොවිතැනින් බලාපොරොත්තු වන එකම පරමාර්ථය නොවීමට ඉඩ තිබේ. ගොවියාගේ ශරීර සනීපය, සතුට, සමාජ තත්වය ආදී සාධකයන් ගොවියාට සමහර අවස්ථාවන්හිදී ලාභයට වඩා වැදගත් විය හැක. නමුත් මග පෙන්වන මූලධර්ම අඩංගු පහත දැක්වෙන සාකච්ඡාවේදී ගොවියාගේ එකම පරමාර්ථය වැඩිපුර ආදායම් ලබා ගැනීම යනුවෙන් සලකනු ලැබේ.

### 7.1 තුලනාත්මක ආර්ථික වාසි ගෙන දෙන න්‍යාය:

ගොවිපලක් සඳහා බෝග තෝරා ගැනීම රඳා පවත්නේ පහත දැක්වෙන කරුණු උඩය:

(අ) ගොවිපල් භූමියේ පසෙහි භෞතික ලක්ෂණ. (පසෙහි සශ්‍රික භාවය, ජලය රඳා පැවැත්ම ආදිය)

(ආ) ප්‍රදේශයේ ස්වභාවික ලක්ෂණයන් (වර්ෂාපතනය, උෂ්ණත්වය, හිරු එලිය, කෘමි හා රෝග තර්ජන ආදිය)

(ඇ) ප්‍රවාහන සහ අලෙවි කිරීමේ පහසුකම් සහ වියදම්

(ඈ) සමාජයීය සාධක (ශ්‍රමය ලබා ගැනීමේ ඉඩ කඩ, ප්‍රදේශයේ සම්ප්‍රදායන්, සිරිත් විරිත් ආදිය)

යම්කිසි ගොවිපලක හෝ කෘෂිකාර්මික ප්‍රදේශයක එක්තරා බෝග වර්ගයක් වැවීම සඳහා අනෙකුත් ගොවිපල් හා ප්‍රදේශයන්ට වඩා විශේෂ වාසියක් තිබිය හැකිය. ගොවිපල් සැලසුමක් සෑදීමේදී මෙම විශේෂ වාසිය ගැන සැලකිය යුතුය. නොයෙක් නොයෙක් වර්ගවල බෝග හෝ සතුන් පවත්වාගෙන යෑම සඳහා මූලික අවශ්‍යතා මේ එක් එක් බෝගය හෝ සත්ව වර්ගය සඳහා වෙනස් වේ. එනිසා මේ එක් එක් වර්ගයේ බෝග හෝ සතුන් පවත්වාගෙන යාම සඳහා මූලික අවශ්‍යතා එක් එක් බෝග හෝ සත්ව වර්ගයා සඳහා වෙනස් වේ. එනිසා මේ බෝග හෝ සත්ව වර්ග භෞතික හා අනෙකුත් සම්පත් ඒවායේ වගාවට හෝ පවත්වාගෙන යාමට නොව සුදුසු ප්‍රදේශවලට හඳුන්වා දිය යුතුය. ගොවිපලෙහි භූමි සම්පත් එකිනෙකට බොහෝ දුරට වෙනස් විය හැකි බැවින් මෙම විශේෂ වාසිය රටවල් දෙකක් අතර ප්‍රදේශ දෙකක් අතර හෝ ගොවිපල් දෙකක් අතර ප්‍රායෝගික වශයෙන් සැලකිල්ලට භාජන කළ හැක.

එක් ගොවිපලක හෝ ප්‍රදේශයක විශේෂ වාසිය සොයා ගැනීම සඳහා පහසු මාර්ගයක් ඇත. එනම් එක් භූමි ප්‍රමාණයක එක් එක් බෝග වර්ගය වගා කිරීමෙන් ලැබෙන ශුද්ධ ආදායම්වල සාපේක්ෂ සීමාව ගනන් බැලීමයි. බෝගයකින් ලැබිය හැකි ශුද්ධ ආදායම රඳා පවත්නේ

(1) අක්කරයකට අස්වැන්න (2)ඒකකයක වෙළඳ මිල සහ (3) නිෂ්පාදනය සඳහා යන වියදම යන කරුණු මතය. ඒ නිසා එක්තරා බෝගයක වැඩි අස්වැන්නත්, වැඩි ඒකක මිලත්, අඩු නිෂ්පාදන වියදමත් යන කරුණු සියල්ල මෙම බෝගය සඳහා තුලනාත්මක වාසිය හඟවයි. එමෙන්ම මෙම කරුණු තුනම වැඩි ලාභ ලැබීමට හේතු වේ.

## 7.2 නිෂ්පාදන සාධක මනා ලෙස සම්බන්ධ කර ගැනීම:

නිෂ්පාදන සාධක යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වන්නේ භූමි, ශ්‍රමය සහ ප්‍රාග්ධනයයි. ගොවිපලක මෙම සාධක ඉතා සුදුසු ලෙස සංයෝග කර ගත යුතුය. ගොවිපලක භූමිය හෝ ප්‍රාග්ධනය අවශ්‍ය ප්‍රමාණයට වැඩිවද, ශ්‍රමය අවශ්‍ය ප්‍රමාණයට අඩුවද තිබේ නම් එම ගොවිපලේ භූමිය හෝ ප්‍රාග්ධනය අපතේ යා හැක. එමෙන්ම ශ්‍රමය අනෙකුත් සාධකයන්ට වඩා අවශ්‍ය ප්‍රමාණයට වැඩිව තිබුනොත්, එයින් ශ්‍රමයේ කාර්යක්ෂම බවත්, ශ්‍රමය සඳහා ලැබෙන දීමනාවත් අඩු වී ගොවියාගේ ජීවන තත්වය පහල බැසීමට හේතු වේ.

දැනට ගොවීන් වැඩි දෙනෙක් පාවිච්චි කරන මෙම සාධකවල සම්ප්‍රදායානුකූල සංයෝගය, බිහි වී ඇත්තේ අවුරුදු ගණනාවක අත්දැකීම් වලිනි. එනිසා සැලසුම් කරන්නන් හට ගොවිපලක වර්තමාන සාධක සංයෝගය මග පෙන්වන්නා හැටියට සලකා දැනට ඇති නවීන ගොවිතැන් ක්‍රම ආදිය ප්‍රයෝජනයට ගෙන තවත් දියුණු සැලසුම් සෑදිය හැක.

දැනට අප රට දක්නට ඇති දුප්පත්කම අඩු පලදාව ආදී නොයෙකුත් අසමාන කම්වලට හේතු වී ඇත්තේ භූමි, ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන සාධකයන්ගේ තේරුමක් නැති සංයෝගයයි. මේනිසා ගොවිපල් සැලසුම් පටන් ගත යුත්තේ ගොවිපල් සම්පත්වල ක්‍රමානුකූල සංයෝගයකින්ය.

භූමි ප්‍රමාණය අඩුව ශ්‍රම ප්‍රමාණය වැඩිව තිබේ නම් කළ යුත්තේ භූමි ප්‍රමාණය වැඩි කිරීම හෝ ශ්‍රමය අඩු කිරීම හෝ එම පිලියම් දෙකම කිරීමයි. ගොවියාට තව වැඩිපුර ඉඩම් කුලියට, අඳයට හෝ අන්කිසි විධියකින් ලබා ගැනීමට නොහැකි නම්, එවැනි ගොවියකුට තම ගොවිතැනේ ස්වභාවය, ක්‍රමය හෝ සූක්ෂම භාවය වෙනස් කිරීමට උපදෙස් දිය යුතුය. එසේත් නැත්නම් ගොවියා විසින් යම්කිසි බාහිර ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ ප්‍රමාණවත් ඉඩම් ලබා ගැනීමට හැකි ප්‍රදේශයකට සංක්‍රමණය වීමට උපදෙස් දිය යුතුය.

## 7.3 ගොවිපලේ ව්‍යාපාරයන් තෝරා ගැනීම හෝ ඒවායේ සංයෝගය

(මෙහිදී ව්‍යාපාරයන් ('Enterprise') යනුවෙන් ගොවිපලේ පවත්වාගෙන යන බෝගයන් හෝ සම්බන්ධ ව්‍යාපාරයන් හැඳින්වේ.)

ගොවිපලක් එක් ව්‍යාපාරයකින් පමණක් යැපීමට තැත් කිරීම සාමාන්‍යයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කලාතුරකින් කෙරෙන්නෙකි. ගොවිපලක ඇත්තේ එක් ව්‍යාපාරයක් පමණක් නම් ශ්‍රමය බොහෝසෙයින් අපතේ යාම සහ අනෙකුත් සම්පත් අපතේ යාමද සිදු වේ. (නමුත් මෙය කර්මාන්ත වල වෙනස් තත්වයක් ගනී.)

තරමක් දුරට විවිධාංගකරණයක් ඇති වනසේරිදී සෑදූ බෝග ව්‍යාපාරයන් කීපයක සංයෝගය ලංකාවේ ගොවිපලවල් සඳහා ඉතා සුදුසු වන අතර වැඩි ආදායමක් ලැබීමටද හේතු වේ.

එනමුත් මෙය 'හොඳම සංයෝගය' යි යනුවෙන් සෑම ප්‍රදේශයකටම ගැලපෙන එක් සැලසුමක් ඉදිරිපත් කිරීම කල හැකි කාර්යයක් නොවේ. නමුත් බෝග හෝ සත්ව ව්‍යාපාර තෝරා ගැනීමේදී හා සංයෝග කිරීමේදී සමහර පුළුල් මූල ධර්මයන් ප්‍රයෝජනයට ගත හැක. මෙම න්‍යායන් මග පෙන්වීමට පමණක් මිස ගොවිපළ් සැලසුම් සෑදිය හැකි 'උපකරණයන්' මෙන් භාවිතයට නොගත යුතුය.

## 8. ගොවිපල ව්‍යාපාර වර්ග

ගොවියකුගේ පරමාර්ථය තම මුළු ගොවිපලින් හැකි තරම් විශාල ශුද්ධ ආදායමක් ලැබීමයි. ගොවිපලේ එක් ව්‍යාපාරයකින් පමණක් අධික ආදායමක් ලැබීමෙන් පමණක් මුළු ගොවිපලෙන් උපරිම ආදායමක් ලැබිය නොහැකි බව බොහෝ ගොවීන් තේරුම් නොගනිති. සමහරවිට එක් ගොවියකු තම අසල්වැසි ගොවියාට වඩා තම ප්‍රධාන ව්‍යාපාරයෙන් අධික ආදායමක් ලැබුවත් එම අසල්වැසි ගොවියා තම මුළු ගොවිපලෙන් වැඩි ශුද්ධ ආදායමක් ලැබීමට ඉඩ තිබේ.

එක් එක් ව්‍යාපාරයෙන් සාපේක්ෂ ආදායම සලකා බැලීමේදී කෙළින්ම ලැබෙන ලැබීම් අනියම් ලැබීම් ගැනද සැලකිල්ල යොමු කළ යුතුය. රනිල බෝගයන් වගාව නිසා ඇති වන පසෙහි සශ්‍රීක භාවය, අනියම් ලැබීමකි. මෙම ලැබීම බෝග නිෂ්පාදන විකුණා ලැබෙන ආදායම මෙන්ම වැදගත් බව සිතේ තබා ගත යුතුය. සත්ව ව්‍යාපාරයකින් ලැබෙන සත්ව පෝර පසෙහි සශ්‍රීක භාවය ඇති කරන වැදගත් අතුරු නිෂ්පාදනයකි.

ගොවිපලේ ශුද්ධ ආදායමට කරන ආධාරය, අතුරු නිෂ්පාදන ආදිය ගැන සලකා බැලීමේදී ගොවිපළ් ව්‍යාපාර වර්ගයන් කිහිපයක් ඇති බව පෙනේ. මෙම වර්ගයන්ගෙන් ප්‍රධාන ඒවා නම් (1) ප්‍රධාන මුදල් ව්‍යාපාර (2) අතිරේක ව්‍යාපාර (3) ආධාර ව්‍යාපාර සහ (4) ගෘහ පරිභෝජන ව්‍යාපාර වේ.

### 8.1 ප්‍රධාන මුදල් ව්‍යාපාර:

මුදලින් ලැබෙන ගොවිපළ් ආදායමේ වැඩි කොටසක් ලබා දෙන ගොවිපලේ ඇති ප්‍රාග්ධනය සහ ශ්‍රමයෙන් වැඩි කොටසක් යොදවා ඇති ප්‍රධාන ව්‍යාපාරයට ප්‍රධාන මුදල් ව්‍යාපාර යයි කියනු ලැබේ.

ගොවිපළ් ආදායමින් වැඩි කොටසක් ලබා දිය හැකි එකම අවස්ථාවකදී භූමිය සහ ශ්‍රමය අවශ්‍ය වන තරඟකාරී ව්‍යාපාර කිහිපයකින් එකක් තෝරා ගැනීමට සමහරවිට ගොවියාට සිදු වේ. මෙම අවස්ථාවලදී වැඩිම ශුද්ධ ආදායමක් ලැබෙන ව්‍යාපාරය සාමාන්‍යයෙන් ගොවියාට තෝරා ගත හැක.

මෙසේ එක් ප්‍රධාන මුදල් ව්‍යාපාරයක් තෝරා ගත්තාට පසු එම ව්‍යාපාරය සඳහා ගොවිපලේ සම්පත් භාවිතයේදී ප්‍රමුඛත්වය දිය යුතුය. ඉන්පසු අනෙකුත් ගෘහ ව්‍යාපාර මෙම ප්‍රධාන ව්‍යාපාරය වටා ඇතුළත් කරගත යුතුය. බොහෝ ප්‍රධාන ව්‍යාපාරවලට ශ්‍රමය ආදී සම්පත් වැඩි වශයෙන් අවශ්‍ය වන්නේ එක්තරා කාලසීමාවක් තුලදීය. අනෙකුත් අවධිවලදී මෙම සම්පත් එතරම් අවශ්‍ය නොවේ. මේ නිසා මෙම කාලවලදී සම්පත්වල නියම ප්‍රයෝජනය ගැනීම සඳහා අනෙකුත් අමතර ව්‍යාපාර ඇතුළත් කර ගත යුතු වේ.

## 8.2 අතිරේක ව්‍යාපාර

භූමිය සහ අනෙකුත් සම්පත් සඳහා විශේෂ තරඟයක් නොකරන ප්‍රධාන නොවූ මුදල් ව්‍යාපාරවලට අතිරේක ව්‍යාපාරයන් යැයි හඳුන්වනු ලැබේ. බොහෝ ප්‍රධාන මුදල් ව්‍යාපාරයන් සඳහා අවුරුද්ද මුළුල්ලේම ගොවිපලේ සම්පත් අවශ්‍ය නොවන නිසා සෑම ගොවිපලකම පාහේ අතිරේක ව්‍යාපාර ඇතුළත් කිරීමට බොහෝ ඉඩ කඩ ඇත. උදාහරණයක් වශයෙන් කුකුලන් ඇති කිරීමේ ව්‍යාපාරයක් දැක්විය හැක.

## 8.3 ආධාර ව්‍යාපාර

ගොවිපලක එක් ව්‍යාපාරයක පලදාව වැඩි කිරීමට උපකාර වන තවත් ව්‍යාපාරයක් තිබේ නම් එයට ආධාර ව්‍යාපාරයකැයි කිව හැක. මෙම ආධාර ව්‍යාපාර වලින් බොහෝවිට මුදලින් යම්කිසි ආදායමක් ලැබුණත් එම ආදායම ව්‍යාපාරයේ නිෂ්පාදනය සඳහා යන වියදම පියවීමට ප්‍රමාණවත් නොවේ. ගණකාධිකරනයේනීති රීති අනුව මෙම ආධාර ව්‍යාපාර ශුද්ධ ලාබයක් පෙන්වන්නේ කලාතුරකිනි. නමුත් මෙම ව්‍යාපාර යම්කිසි අනෙකුත් ව්‍යාපාරයක ලාභය වැඩි කිරීමට උදවු වන නිසාත්, ඊ අතරම අපතේ යන ශ්‍රමය සහ අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගනු ලබන නිසාත් මුළු ගොවිපලේ ශුද්ධ ආදායම වැඩි කර ගැනීමට ආධාර වේ.

බොහෝ ගොවිපලවල්වල මෙවැනිආධාර ව්‍යාපාරයන් ඇතුළත් කිරීමට ඉඩ කඩ ඇත. බොහෝවිට වඩාත්ම සුදුසු වන්නේ ආධාර ව්‍යාපාර නොව 'ආධාර–අතිරේක' ව්‍යාපාර වේ.

## 8.4 ගෘහ පරිභෝජන ව්‍යාපාර

ගෘහ පරිභෝජන ව්‍යාපාර යනු ගොවියාගේ නිවසේ පාවිච්චියට ගන්නා ආහාර ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීමට පවත්වාගෙන යන ව්‍යාපාරයන්ය. මෙයින් වඩාත් වැදගත් උදාහරණයක් වශයෙන් ගෙවත්ත හැඳින්විය හැක. ලංකාවේ ගොවීන්ට විශේෂයෙන්ම යැපීම් තත්වයේ සිටින ගොවීන්ට ගෙවත්ත ඉතා වැදගත් වේ. අනෙකුත් උදාහරණ වශයෙන් කිරි එළදෙනුන් එකෙක් හෝ දෙදෙනෙක්, මී මැසි ව්‍යාපාරයක් ආදිය හැඳින්විය හැක.

# 9. ගොවිපල ව්‍යාපාරයන් තෝරා ගැනීමේදී හෝ සංයෝගයන් තෝරා ගැනීමේදී වැදගත්වන කරුණු

## 9.1 ශ්‍රමය බෙදා හැරීම:

හොඳම සංයෝගය නම් අවුරුද්ද මුළුල්ලේම ගොවිපලේ ඇති ශ්‍රමය පලදායි කටයුතුවල සහ ගොවිපල පවත්වාගෙන යාමේ කටයුතුවල යෙදවිය හැකි කුලී ශ්‍රමය ලබා ගත හැකි සංයෝගයකි. නමුත් අවාසනාවකට මෙන් මෙම හොඳම සංයෝගය ලබා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තකි. එනිසා හැකිතරම් ශ්‍රමය ප්‍රයෝජනයට ගැනෙන විධියේ සංයෝගයන් තෝරා ගත යුතුය.

එමෙන්ම ශ්‍රමයේ සම්පූර්ණ ප්‍රයෝජනය ලැබෙන ලෙස සංයෝගය සකස් කර ගැනීමේදී ගොවිපලෙන් ලැබෙන මුළු ශුද්ධ ආදායම පරිත්‍යාග නොකළ යුතුය. මෙයින් අදහස් වන්නේ ශ්‍රමයෙහි මුළු ප්‍රයෝජනය ගැනීම සඳහා පාඩු විඳීමට සිදු වන ව්‍යාපාරයන් ඇතුළත් නොකල යුතු බවයි.

### 9.2 <u>භූමි පාවිච්චිය:</u>

හැකිතරම් දුරට ගොවිපලේ ඇති ඉඩම් සියල්ල ප්‍රයෝජනයට ගත යුතු අතර සෑම ඉඩම් කැබැල්ලකම එයට ඉතා සුදුසු ව්‍යාපාරයන් පවත්වාගෙන යා යුතුය.

### 9.3 <u>අතුරු නිෂ්පාදනවල පාවිච්චිය:</u>

ප්‍රධාන ව්‍යාපාර වලින් යම්කිසි අතුරු නිෂ්පාදන ලබා ගත හැකි නම් මෙම අතුරු නිෂ්පාදන සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි වනයේ අනෙකුත් ව්‍යාපාරයන් ඇතුළත් කල යුතුය. උදාහරණයක් වශයෙන් පිදුරු පාවිච්චියට ගැනීම සඳහා හරකෙක් හෝ කිහිප දෙනෙක් ඇති කරගත හැකි මෙන්ම ගෙවත්තේ එළුවකු ඇති කළ හැක.

### 9.4 <u>පසෙහි සශ්‍රීක බව පවත්වාගෙන යාම:</u>

පසෙහි සශ්‍රීක භාවය සහ පලදායී බව පවත්වාගෙන යාමට හැකි වන ලෙස බෝග රටාවන් සහ අනෙකුත් ව්‍යාපාර සංයෝගයට ඇතුළත් කළ යුතුය. සුදුසු බෝග රටාවන් සහ බෝග සහ සත්ව ව්‍යාපාරයන් අතර ඇති 'සමබර' පවත්වාගෙන යා යුතුය. ජලවහනය සහ පස සේදී යාම වැළැක්වීමට උපකාරී වන ව්‍යාපාර ඇතුළත් විය යුතුය.

### 9.5 <u>සාපේක්ෂ අවදානම:</u>

බෝග අස්වැන්න අඩු වීමකින් හෝ විනාශ වීමකින් විවිධාංගකරණය කළ ගොවිපලකින් සම්පූර්ණ පාඩුවක් විඳීමට සිදු වන්නේ කලාතුරකින්ය. එහෙත් එක් බෝගයක් පමණක් ඇති ගොවිපලකින් එසේ වීමට ඉඩ තිබේ. ගොවිපලක ඉතා බලවත් අවදානම් හැටියට සැළකිය හැක්කේ කාලගුණ වෙනස්කම් සහ නිෂ්පාදනවල හදිසි මිළ අඩුවීමයි. බෝග ව්‍යාපාරයන් කිහිපයක් සංයෝග කිරීමෙන් අවදානම හැකි පමණ අඩු කර ගත හැකිය. නමුත් අවදානම් සම්පූර්ණයෙන්ම නැති කර ගැනීම සඳහා බෝග ව්‍යාපාරයන් බොහෝ ගණනක් සංයෝගයේ ඇතුළත් කර ගැනීම අනවශ්‍යය.

### 9.6 <u>ආදායම බෙදා හැරීම:</u>

අවුරුද්ද මුළුල්ලේම සතිපතා හෝ මාසිපතා ලැබෙන ස්ථිර ආදායමක් ගෙන දෙන සංයෝගයක්, අවුරුද්දකට වරක් හෝ දෙවරක් ආදායම විශාල කොටස් වශයෙන් ලබා ගත හැකි සංයෝගකම වඩා උචිත වේ. මෙසේ අවුරුද්ද මුළුල්ලේම ආදායම ලැබේ නම් අය වැය සකස් කිරීම, මුදල් ණයට ගැනීම සහ ගොවීන්ගේ මුදල් නාස්තිය බොහෝදුරට අඩු වේ. නමුත් වැඩි ආදායම් ලැබෙන ව්‍යාපාර අවුරුද්ද මුළුල්ලේම අඩු ආදායම් ලබන ව්‍යාපාරයන් සඳහා පරිත්‍යාග කළ යුතු නොවේ.

### 9.7 <u>ගොඩනැගිලි, සත්ව බලය සහ යන්ත්‍රෝපකරණ භාවිතයේ කාර්යක්ෂම භාවය:</u>

ගොඩනැගිලි, සත්ව බලය සහ යන්ත්‍රෝපකරණවල මුළු ප්‍රයෝජනය ලැබෙන සේ ගොවිපල් ව්‍යාපාර සංයෝග කර ගත යුතුය.

## 10 <u>ගොවිපල් සැලසුම් සෑදීමේ කාර්ය පටිපාටිය</u>

10.1 ගොවිපල් සැලසුම් කිරීමේදී පළමුවන පියවර වශයෙන් ගොවිපලේ සියළුම සම්පත්වල බඩු වට්ටෝරුවක් හෝ ලේඛනයක් පිළියෙල කර ගත යුතු යයි සමහර ගොවිපල් පාලන විද්‍යාඥයින්

යෝජනා කරති. නමුත් දියුණුවන රටවල තුඩා ගොවිපළවල ලේඛන තබා ගැනීම කෙරෙන්නේ කලාතුරකින් බැවින් සමහරවිට මෙවැනි ලේඛන සපයා ගැනීම දුෂ්කර විය හැකිය. එහෙත් මූලික වශයෙන් ගොවිපළ සැලසුම් කිරීම සඳහා දියුණු වන රටවල ගොවිපළ වලින් හැකි පමණ තොරතුරු රැස් කිරීම ප්‍රමාණවත් වේ.

## 10.2 ආරම්භක තොරතුරු සොයා ගැනීම:

සැලසුම් කරන්නා විසින් සැලසුම් කරන ප්‍රදේශය සඳහා පහත දැක්වෙන කරුණු ගැන ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතුය.

1. ප්‍රදේශයේ ස්වභාවික ලක්ෂණ (වර්ෂාපතනය, උෂ්ණත්වය, දවසේ කාල ප්‍රමාණය ආදිය)
2. ප්‍රදේශයේ ඉඩම් භුක්තිය පිළිබඳ තොරතුරු ( ඉඩම් හිමි-අඳ ගොවි සම්බන්ධය - අඳය ගෙවන ක්‍රම)
3. ගොවීන්ගේ සංවිධාන, ලබා ගත හැකි ව්‍යාප්ති සේවා, ණය ලබා ගැනීම සහ පොලී ක්‍රමය, අලෙවිය සහ වෙළඳ පොල පිළිබඳ තොරතුරු, ප්‍රවාහනය, ලබා ගත හැකි කුලී ශ්‍රමය, වැටුප්, පිටස්තර රැකියාවන්ට ඇති ඉඩ කඩ ආදිය.
4. ප්‍රදේශයට සුදුසු ගොවිපලවල ප්‍රමාණය සහ ගොවිපළ ආදායමට බලපාන කරුණු.
5. බෝග වගාව සහ සත්ව පාලනයට අදාළ සියළු ශිල්පීය ක්‍රම සහ තොරතුරු (පෝර, සත්ව ආහාර සහ බීජ ප්‍රමාණ ද, වගා කරන පිළිවෙල ශ්‍රමය බෙදා හැරීමේ පිළිවෙල අනුව)
6. පසෙහි තත්වය, ශස්‍ය මාරු ක්‍රම, නවීන බෝග සහ සත්ව වර්ග, නවීන ක්‍රම, ජලය සැපයීමේ ක්‍රම, පළිබෝධ හා රෝග මර්ධන ක්‍රම.
7. බොහෝවිට මෙම තොරතුරු සියල්ල සොයා ගැනීමට අපහසු වේ. නමුත් ප්‍රදේශයේ සේවය කර ඇති ව්‍යාප්ති නිලධාරියකුට මෙම තොරතුරු ගැන ප්‍රමාණවත් අවබෝධයක් තිබිය හැක. ඒ කෙසේ වෙතත් සම්පූර්ණ තොරතුරු සොයා ගැනීමට නොහැකි වුවත් සැලසුම් කරන්නා එයින් පසුබට විය යුතු නොවේ.

## 10.3 එක් එක් ගොවිපළෙහි දුර්වලතා පිරික්සීම:

ගොවිපළ සැලසුම් කිරීමේ ඊළඟ පියවර සැලසුම් සෑදීමට බලාපොරොත්තු වන එක් එක් ගොවිපළෙහි දැනට ඇති සංවිධානයෙහි හා ක්‍රියා කාරිත්වයේ දුර්වලතා පිරික්සීමයි. මෙබඳු පිරික්සීමකට ඇති හොඳම ක්‍රමය ප්‍රශ්න මාලාවක් ආශ්‍රයෙහි සැලසුම් කරන්නා විසින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කළ යුතුය.

1. ගොවිපළෙහි ඇති ඉඩම් ප්‍රමාණය ගොවියාට සතුටුදායක ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රමාණවත් වේද? ඉඩමෙහි ස්වභාවය, දැනට එය යොදා ඇති කාර්යයන් සඳහා සුදුසු වේද? දැනට ඇති ගොඩනැගිලි, භූමියේ දියුණු කිරීම්, උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන අංශයන් ප්‍රමාණවත් වේද? ඒවා සුදුසු වර්ගයේද? භූමි ශ්‍රමය සහ ප්‍රාග්ධන සංයෝගය සතුටුදායකද?

2. දැනට තෝරාගෙන ඇති බෝග සහ ඒවායේ සංයෝගය ගොවිපළෙහි සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබන ලෙස සකස් කර තිබේද? මෙම සංයෝගයෙන් පසෙහි සශ්‍රීක භාවය ආරක්ෂා වේද? ගොවියාට ප්‍රමාණවත් ආදායමක් ලැබේද? ගොවිපලෙහි ඇති ප්‍රධාන ව්‍යාපාර වලින් අනාගත ඉල්ලුම මිල සහ තුලනාත්මක වාසිය සලකා බලනවිට අනාගතයේදීත් වැඩි ආදායමක් ලැබේද? දැනට ඇති සංයෝගය අතිරේක සහ ආධාර ව්‍යාපාර ප්‍රයෝජනයට ගෙන ඇද්ද? මේවායේ වෙනස්කම් කළ යුතුද?

3. දැනට ලබන බෝග අස්වැන්න සහ සත්ව නිෂ්පාදනය දැනට ඇති නවීන ගොවිතැන් ක්‍රම වලින් ලබා ගත හැකි ප්‍රතිඵල සමඟ ගැලපේද? බීජ වර්ග, සත්ව වර්ග සුදුසු ඒවාද? **දැනට** පාවිච්චි කරන පෝර වර්ග කෘමි රසායන වර්ග හා ප්‍රමාණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ හා ගැලපෙන්නේද? අපතේ යාම වලක්වා තිබේද?

4. ශ්‍රමය කාර්යක්ෂම ලෙස යොදා ඇද්ද? කාර්යයන් සහ බිම් කැබලි ශ්‍රමයේ සම්පූර්ණ ප්‍රයෝජනය ලැබෙන ලෙස සැලසුම් කර තිබේද?

5. දැනට බෝග නිෂ්පාදන සඳහා ලබා ගත හැකි මිල සහ වෙළඳ පොළෙහි තත්වය ණය සහ මුදල් ලබා ගැනීමේ ක්‍රම, කළ යුතු වෙනස්කම් පිළිබඳ විග්‍රහයක්.

---

# කෘෂිකර්ම ශිල්පීය නවීකරණය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ව්‍යාප්ති අංශයේ, ටී. එම්. ජී. තෙන්නකෝන්
මහතා විසිනි.

කෘෂිකාර්මික ශිල්පීය නවීකරණය යනුවෙන් අදහස් කරනුයේ ගොවිතැන් වලින් ලබන අස්වනු වැඩි කිරීම සඳහා දියුණු හා සියුම් ක්‍රම අනුගමනය කිරීම යයි ඔබට සිතෙනවා ඇත. ආර්ථික වශයෙන් සංවර්ධිත තත්වයකට එළඹී ඇති රටවල්වල ගොවිතැන් කටයුතු පිළිබඳව මෙවැනි නව නැම්මක් ඇති වී තිබෙන අතර, අතිශයින් සියුම් උපක්‍රම ගොවිතැන් කටයුතුවලදී උපයෝගී කර ගනු ලැබේ. එහෙත් එවැනි සියුම් ක්‍රම, සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටක වර්තමානයේ පවතින තත්වයට සපුරා නො ගැළපෙන හෙයින් අප කල්පනා කර බැලිය යුත්තේ අපගේ කෘෂිකාර්මික තත්වයට සරිලන නවීකරණයන් පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතු පිළිබඳව අද පවතින තත්වය අනුව බෙහෙවින් දියුණු උපක්‍රම උපයෝගී කර ගැනීම සඳහා ගොවීන් හට ඇති හැකියාවත් සහ පහසුකම් ඉතා අල්පය. එහෙයින් දැනට පවතින ගොවි තත්වය අනුව අපගේ කෘෂි කාර්මික රටාව තුළ නව නැම්මක් ඇති කළ හැකි ශිල්පීය ක්‍රමයන් පිළිබඳව සළකා බැලිය යුතුය.

පළමු කොටම වී ගොවිතැන පිළිබඳව සළකා බලන කල්හී එක් දහස් නවසිය පනස් ගණන්වල තිබුණු තත්වය හා එක් දහස් නවසිය හැට ගණන්වල පැවති තත්වය අතර විශාල වෙනසක් දක්නට ලැබේ. මෙම කාලය තුළ ශිල්පීය වශයෙන් කෘෂිකර්මයෙහි විශාල පෙරළියක් තිබුණි. එක්දහස් නවසිය හතළිස් ගණන්වල වගා කිරීම සඳහා පැරණි වී වර්ග පමණක් ලබා ගත හැකි විය. 1957, 1958, 1959 වර්ෂ වලදී වී වර්ග දෙමුහුන් කිරීමේ වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් වශයෙන් එච්-4, එච්-7, එච්-8 ආදී එවකට දියුණු කළ වී වර්ග ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට ඉදිරිපත් කරන ලදී. 1964, 1965 හා ඊට පසු වර්ෂවලදී ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයේ නිෂ්පාදනයන් වූ අයි.ආර් 8, අයි.ආර් 5, අයි.ආර් 20, අයි.ආර් 22, අයි.ආර් 262 ආදී නවතම දියුණු කළ වී වර්ග අපට ලැබුණි. මෙම නවතම දියුණු වී වර්ග නිපදවීමේ පරමාර්ථය වූයේ ආහාර නිෂ්පාදන වේගය කඩිනම් කිරීම සඳහා වැඩි අස්වනු ලබා ගත හැකි වී වර්ග ගොවීන් වෙත හඳුනා දීමයි. එහෙත් මෙම වී වර්ග උසස් මට්ටමේ ගොවිතැන් ක්‍රමත්, ඒවායේ ක්‍රමිත වැඩීමට සරිලන පරිදි අවශ්‍ය පොහොර ආදියත් උපරිම මට්ටමකින් අනිවාර්යයෙන්ම යෙදිය යුතුයි යන ආකල්පය මේ සමඟම ව්‍යාප්ත වූ තවත් කරුණකි.

එහෙත් පොහොර සම්බන්ධයෙන්ම අද පවතින තත්වයන් අනුව මෙවැනි දියුණු වී වර්ග වගා කිරීම ඉදිරියටත් ඒ අයුරින්ම කළ හැකි ද යන්න අද බොහෝ දෙනෙකුට ප්‍රශ්නයක්ව පවතී. අයි.ආර් 8, වැනි ඉතා කොට වර්ගවල වී වගා කිරීමේදී මුල් අවස්ථාවෙහි ගස් අතර වල් පැළ වැඩීම වැඩියෙන් සිදු වන අතර එවැනි වී වර්ග සඳහා පොහොර භාවිතය ද තරමක් වැඩියෙන් සිදු කළ යුතු බව සැබෑය. එමෙන්ම පැරණි වී වර්ගවල ගස් ඉක්මනින් වැඩෙන නිසා නිරායාසයෙන්ම වල් පැළෑටි සමඟ තරඟ කිරීමට හැකියාවක් ඒවාට ඇත. කෙසේ වෙතත් මේ වී වර්ග දෙකෙන් ලබා ගත හැකි අස්වැන්නෙහි සෑහෙන වෙනස්කමක් ඇත. මෙම කරුණු සළකා බැලූ පර්යේෂණ නිලධාරීහු මෙම දෙවර්ගයෙන්ම ලබා ගත හැකි යහපත් අංග ඇතුළත් කර බී.ජී 11-11,

බී.ජී 3-5, බී.ජී 94-2, ඇල්.ඩී 66, බී.ඩබ් 78 වැනි රටට හොඳින් ගැලපෙන වී වර්ග නිෂ්පාදනය කර ඇත. මේ නිසා ඉබේම වාගේ තරමක් දුරට වල් පැල සමඟ කරඟ කළ හැකි එමෙන්ම යොදනු ලබන පෝර ප්‍රමාණය අනුව අස්වැන්න ද වැඩි කර ගත හැකි වී වර්ග දැන් අපට ලබා ගැනීමට පුළුවන.

නව වී වර්ග ඉදිරිපත් කළෙයින් පසුව එවැනි වගී වලින් පෝර භාවිතයෙන් තොරව වැඩි අස්වැන්නක් ලබා ගත නොහැකි යයි මතයක් ඇති විනි. එහෙත් පිලිපීනය, ලංකාව වැනි රටවල් වල කරන ලද පර්යේෂණ අනුව ඔප්පු වූයේ පෝර භාවිතය නැතිව වුවත් නව වී වර්ග වලින් පැරණි වී වර්ගවලට වැඩි අස්වැන්නක් ලබා ගත හැකි බවය. පෝර නොයෙදුවත් බීජ සැකසීම, නිසි කලට ගොවිතැන් කිරීම, පැල සිටුවීම, වල් මර්ධනය හා පළිබෝධ සංරක්ෂණය නිසි අයුරු සිදු කළ හැකි නම් නව වී වර්ග වලින් ඇත්ත වශයෙන්ම වැඩි අස්වැන්නක් ලබා ගැනීමට පිළිවන.

නව වී වර්ග ගොවිතැන් කිරීමේදී වගා පිළිවෙත් සම්බන්ධයෙන් බෙහෙවින් සැළකිලිමත් විය යුතුය. නිසි පරිදි කන්න ක්‍රමයක් අනුගමනය කර නියම වේලාවට වී වැපිරීම හෝ පැල සිටුවීම වැඩි අස්වැන්නක් ලබා ගැනීමට ඇති එක් ක්‍රියා මාර්ගයකි. විශේෂයෙන් වියළි කලාපයේ වියළි කාලයෙන් පසුව ලැබෙන මුල් වැසි නිසා ස්වභාවිකව පැලයකට ලැබෙන ජීවාන්තක ප්‍රමාණය වැඩි වේ. මෙය ක්‍රම දෙකකින් සිදු වේ. එනම්, වැසි ජලයේ ඇති ස්වභාවික ජීවාන්ත ප්‍රමාණය ප්‍රථම වැසිවල වැඩිකම හා වියළි කාලයෙන් පසු වගා ක්‍රියාකාරී වන ක්ෂුද්‍ර ප්‍රාණීන් නිසා පසෙහි වැඩි වන පැලවලට ලබා ගත හැකි ජීවාන්තක ප්‍රමාණය වැඩි වීමත්ය. මෙසේ ස්වභාවයෙන් ලැබෙන ජීවාන්තක වලින් ප්‍රයෝජන ගැනීමට නම් ගොවිතැන් ප්‍රමාද නොකොට නිසිකලට සිදු කළ යුතුය. කැකුලන් ගොවිතැන සාර්ථක වීමට හේතු වන එක් කරුණක් නම් එයයි.

නව වී වර්ග සමඟ ප්‍රචලිතව ගිය එක් මතයක් නම් පැල සිටුවීම වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා අනිවාර්ය දෙයක් නොවන බවයි. වී වගාවේදී පැලයට අවශ්‍ය වේලාවට පෝර සැපයීම හා කලට වේලාවට වල් මර්ධනය කරනු ලැබේ නම්, පැල සිටුවීම වැඩි අස්වැන්නක් සඳහා අවශ්‍ය නොවන්නේය. අද තත්වය අනුව කල්පනා කර බලනවිට මෙම ක්‍රම දෙකම ගොවීන් හට කළ නොහැකි තත්වයක් ඇති වී තිබේ. පෝර පිළිබඳව අධික මිළ ගණන් පවතිනා අතර වල් මර්ධන මැනවින් කළ යුතු නම් ඒ සඳහා යෙදිය යුතු රසායනික ද්‍රව්‍යයන් ද ලබා ගැනීමට අසීරු තත්වයක් දැන් උද්ගත වී ඇත. එහෙයින් නැවත වරක් පැල සිටුවීම පිළිබඳව කල්පනා කර බැලිය යුතු අවස්ථාවකට අපි එළඹ ඇත්තෙමු. පෝර භාවිතා නොකරන තත්වයක් යටතේ පැල සිටුවීමෙන් නිරන්තරයෙන්ම වැපිරීමෙන් ලබන අස්වැන්නට වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වේ. මෙය ප්‍රධාන හේතු දෙකක් නිසා සිදු වන බව කිව යුතුය. ඉන් එක් හේතුවක් නම්, පැල සිටුවීමේදී හොඳින් වල් පැළෑටි මර්ධනය වීමයි. දෙවැනි කරුණ නම්, සී සෑම නිසා පසට යට වන ඉපනැල්ල හා වල් පැළෑටි දිරාපත් වීම නිසා ස්වභාවයෙන් කුඹුරේ ඇති වන ජීවාන්තක ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් අපතේ යා නොදී ගොයම් ගසටම උරා ගැනීමට හැකි අවස්ථාවක් පැල සිටුවීම නිසා ඇති වීමය. නමුත් වී වපුරන අවස්ථාවලදී මෙසේ ස්වභාවයෙන් කුඹුරේ ඇති වන ජීවාන්තක ගොයමට උරා ගැනීමට අවස්ථාවක් නො ලැබෙන නිසා එම ජීවාන්තක ප්‍රමාණයන් අපතේ යන අතර ගොයම ද ජීවාන්තක ඌණතාවලට ගොදුරු වෙයි.

අනිත් අවශ්‍ය වගා ක්‍රමය නම් වල් මර්ධනයයි. නිසි පරිදි වල් මර්ධනය කිරීමට නම් ගොයම් ගස අභිබවා වල් පැළෑටි වැඩීමට පෙර එනම්, ගොයම් ගසට වයස සති තුනක් ඉක්මවීමට පෙර වල් පැළ මර්ධනය අනිවාර්යයෙන්ම කළ යුතුය. වල් මර්ධනය සති තුනකට වඩා ප්‍රමාද කළහොත් හොඩ වී වගාවක නම් වල් මර්ධනය නිසා වැඩි වන අස්වැන්නෙන් 75% ක් ද, මඩ වී වගාවක නම් වල් මර්ධනය නිසා වැඩි වන අස්වැන්නෙන් 50% ක ප්‍රමාණයක අඩු වීමක් ද සිදු වේ. මෙම කාර්යය සඳහා ඉතාමත් හොඳම ක්‍රමය නම් රසායනික ද්‍රව්‍ය භාවිතයයි. නමුත් අද තත්වය අනුව එයද කළ නො හැක. නමුත් පැළ සිටුවීමට පෙර වල් මර්ධනය වන අයුරු කුඹුරු සකස් කර ගැනීමට ඉඩ කඩ ලැබෙනවාත් හැර පැළ පේළිවලට සිටු වූවහොත් රසායනික ද්‍රව්‍ය යොදනවා වෙනුවට යාන්ත්‍රික ක්‍රමයට අනුව වල් පැළෑටි නිසි කලට මර්ධනය කර ගැනීමට ද හැකි වන්නේය.

ඊළඟට වැදගත් වනුයේ පොහොර භාවිතය පිළිබඳ ප්‍රශ්නයයි. දියුණු කළ වී වර්ග වලින් අපේක්ෂිත අස්වනු ප්‍රමාණය ලබා ගැනීමට නම් ගොයම් ගසේ වැඩීමට අනුරූප වන පරිදි වැඩි ප්‍රමාණයක් පොහොර භාවිතා කරන ලෙස නිර්දේශ කරන ලදි. එහෙත් නිර්දේශ ප්‍රමාණවලට අනුව පොහොර භාවිතා කිරීමට හැකියාවක් නොමැත. ලංකාවේ පොහොර භාවිතය පිළිබඳ වූ සාමාන්‍ය සංඛ්‍යා ලේඛනවලට අනුව හෙළිදරව් වී ඇත්තේ ලංකාවෙහි ගොවීන් පොහොර භාවිතා කර ඇත්තේ අවශ්‍ය ප්‍රමාණයෙන් 20% ක් පමණක් බවයි. දැනට පවතින පොහොර හිඟකම හේතුකොට ගෙන අතීතයෙහි ගොවීන් වී ගොවිතැනෙහි භාවිතා කළ පොහොර පිළිබඳව දැන් අපි සැලකිල්ලක් දක්වමු. දේශීය අමු ද්‍රව්‍ය වලින් ගොයම් ගසට අවශ්‍ය වන ජීවාන්තක ප්‍රමාණය ලබා දීම පිළිබඳව දැන් අපි කල්පනා කර බැලිය යුතුව ඇත. කොළ පොහොර, ගොම පොහොර සහ කොම්පෝස්ට් පොහොර භාවිතය ගොයම් ගසට අවශ්‍ය වන පොහොර ලබා දීමේ එක් ක්‍රමයකි. දේශීය අමු ද්‍රව්‍ය වලින් ලබා ගන්නා පොහොරවල ජීවාන්තක ප්‍රමාණය අතිශයින් අඩුය. කෙසේ වෙතත් ජීවාන්තක අඩංගු රසායනික පොහොර සෑහෙන ප්‍රමාණයක් ගොවීන් හට රජයෙන් බෙදා දෙනු ලැබේ. ලැබෙන පොහොර ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා එය ගොයම් පැලයේ වැඩීමට අවශ්‍ය වන අවස්ථාවේ දී යෙදීම ඉතාමත් වැදගත් වන්නේය.

පොහොර භාවිතයේ දී ප්‍රථමයෙන්ම බිම් පොහොර යොදා බිම් සකස් කළායින් අනතුරුව පැළ සිටුවා හෝ වී වපුරා දෙසතියකට පමණ පසුව ගොයම් ගසේ වැඩීමට අවශ්‍ය වන ප්‍රමාණයකට යූරියා පොහොර යොදනු ලැබේ. ඉන්පසුව දෙවන වතාවට පොහොර යොදනු ලැබෙනුයේ පැළ සිටුවා සති 4 ක් හෝ වැපිරීමෙන් පසුව සති 6 ක් ඉක්මවීමෙන් අනතුරුවය. රිකිලි වැඩීම සඳහා මෙය අවශ්‍යය. මින්පසුව එළඹෙනුයේ පොහොර යෙදීම ඉතාමත් අවශ්‍ය අවස්ථාවයි. එනම්, ගොයම් පැලවල හීන් බණ්ඩි ඇති වන අවස්ථාවයි. අනෙක් ගස්වල මෙන් පොහොර රැස් කර තබා ගැනීමේ තත්වය ගොයම් ගසට නොමැති හෙයින් මෙම අවස්ථාවේදී පොහොර යෙදීම අතිශයින්ම අවශ්‍ය වන්නේය. මෙය පැළ සිටුවා සති 8 කින් හෝ වී වැපිරීමෙන් පසුව සති 10 කින් එළඹෙන අවස්ථාවයි.

ගොඩ භෝග පිළිබඳව සලකා බලනවිට අපේ අවධානය යොමු විය යුත්තේ ස්වදේශීය ධන සම්පත් උපයෝගී කරගෙන ඒවායින් ලද හැකි උපරිම ප්‍රයෝජනය ගැනීමයි. මේ අනුව බලනවිට වගා කළ හැකි ඉඩම්, දැනට ඇති වාරිකම් හා සූර්ය ආලෝකය අපට ඇති වැදගත් ධන සම්පත් ලෙස සැලකිය හැක. මේවායින් නිසි ප්‍රයෝජන ගැනීමට නම් උපරිම ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමට වෙහෙසී ගන්නා අතර, කෘෂි දේශගුණික කලාපයන්ට හා පසේ පිහිටීම, ජල වහනය, පසේ භෞතික තත්වය හා පසේ රසායනික ස්වභාවය අනුව භෝග තෝරා ගැනීම; ස්ථිර භෝග අතර සුදුසු අතුරු භෝග වැවීම, මනා ජල පාලනයක් ඇති තැන්වල බහු භෝග වගා වැඩ පිළිවෙලක් අනුගමනය කිරීම, භෝග විවිධාංගකරණය හා හැකි සෑම වගාවකදීම දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම යන කරුණු ගැන අවධානය යොමු විය යුතුය.

## කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය

## <u>ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ අත්දැකීම්</u>

ප්‍රාදේශීය සංවර්ධන අධ්‍යක්ෂ හැරල්ඩ් ප්‍රනාන්දු මහතා විසිනි.

පස් අවුරුදු සැලැස්මේ ක්‍රියාත්මක පරමාර්ථයන් වශයෙන් ආරම්භ කරන ලද ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලවල අරමුණු සහ එම මණ්ඩල ක්‍රියාත්මක කිරීමේදී මෙතෙක් ලද ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය කිරීමට දැන් කාලය එළඹී ඇත. කලින් සැලසුම් සම්පාදනය කරන ලද්දේ විවිධ අමාත්‍යාංශයන්හී සහභාගිත්වය ඇතිව, මධ්‍යගත වැඩ පිළිවෙලක් අනුසාරයෙනි. එහෙත් ක්‍රියාත්මක මට්ටමේදී බොහෝවිට ඒවායේ අඩු පාඩුකම් හා ඌනතාවයන් දක්නට ලැබුනි. මෙම අඩු පාඩුකම් වලට ප්‍රධාන හේතුවක් වූයේ සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේදී ජනතා සහභාගිත්වය නොමැති වීමයි. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ඇරඹීමේදී ප්‍රධාන පරමාර්ථයක් වූයේ සැලසුම් සම්පාදන කාර්යාවලියෙහි ලා ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීමයි.

මේ අන්දමින් ජනතා සහභාගිත්වය ලබා ගැනීමට නම්, ජනතාව තුළ ආත්ම විශ්වාසය ඇති වන පරිදි සුදුසු සංවිධානයක් තිබිය යුතුය. එබැවින් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම සියල්ලක්ම පදනම් කර ඇත්තේ සමුපකාර ක්‍රමය උඩය. මේ කරණකොට නිෂ්පාදන බලයේ අයිතිය ඒ යෝජනා ක්‍රමයේ සහභාගී වන්නන්ට පැවරෙනවාත් සමගම එහි කළමණාකාරිත්වයට සම්පූර්ණ වගකීමද, ලාභයේ කොටසක් ලැබීමේ අයිතිය ද මේ සහභාගී වන්නන්ට ලැබෙනු ඇත. එවිට පුද්ගලික ව්‍යාපාරයක් ඇත්තාවූ සේව්‍ය සේවක සම්බන්ධකම්වලට සමාන වන ක්‍රමයක් මෙහි තිබෙන්නේ නැත.

ජනතාව සහභාගී කරවා ගැනීම ප්‍රධාන අරමුණ වන අතර සංවර්ධනයට දේශීය සම්පත් උපයෝගී කර ගැනීමද ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙළ යටතේ බලාපොරොත්තු වෙයි. මෙරටේ ඇති විවිධාකාර අගනා භෞතික සහ අනික් සම්පත් ඉතා විශාල වේ. ඒ අතරම දැනට ප්‍රයෝජනයක් නො ගන්නාවූ අහක යන ද්‍රව්‍යයන්ද විශාල වශයෙන් කාර්මික සංවර්ධනයට උපයෝගී කර ගත හැකිය.

තුන්වෙනුව ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල අනුසාරයෙන් දේශීය කාර්මික හා ශිල්පීය දැනීම විශාල වශයෙන් සංවර්ධනයට උපයෝගී කර ගැනීමට අදහස් කෙරේ. පාරම්පරිකව පැවතෙන්නාවූ ද, මෙරට අවුරුදු සිය දහස් ගණන්වල පැවතියාවූ ද කාර්මික ශිල්පීය ක්‍රම සොයාගෙන සංවර්ධනයට යෙදවීමට විශේෂ තැනක් මේ වැඩ පිළිවෙල යටතේ දෙනු ලැබේ. එමෙන්ම නොයෙකුත් හැකියාවන් සහ දක්ෂකම් ඇති අයවලුන් සොයාගෙන ඒ අය මගින් නොයෙකුත් කාර්මික යෝජනා ක්‍රම ඇති කිරීමද කරනු ලැබේ. නොයෙකුත් නවීන විද්‍යා අංශයන්හී පුහුණුව ලැබ, ඒවා ක්‍රියාවේ යෙදවීමට අවස්ථාවක් නොමැතිව සිටින ලාංකික විද්‍යාඥයන් සහ ශිල්පීය දැනුම ඇති අයට ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම තුලින් තමන්ගේ දක්ෂතාවයන් පෙන්වීමට ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙළ විවෘත වී තිබේ.

ඉහත සඳහන් පරමාර්ථ අනුව මෙතෙක් දිවයිනේ නොයෙකුත් ස්ථානවල විවිධ කෘෂිකාර්මික සහ කාර්මික යෝජනා ක්‍රම ඇති කර තිබේ. යුහු ඉංජිනේරු කාර්මික සමිති ගැන විශේෂයෙන්

කිවයුතු වේ. මෙම සමිති මගින් කර ඇත්තේ දිවයින පුරා විසිරී ඇති කම්මල් කරුවන් සංවිධානය කිරීමය. 1973 දී මෙවැනි ලුහු ඉංජිනේරු සමිති 76 ක් ඇති කරන ලදී. කම්මල් කරුවන්ට අමු ද්‍රව්‍ය ලබා දීම, අලෙවි සංවිධානයක් ඇති කිරීම කාර්මික ඥානය නවීකරණ ආකල්පයකට සරිලන පරිදි දියුණු කිරීම ආදිය මෙවැනි සමුපකාර සමිති මගින් කරනු ලැබේ. මෙම ලුහු ඉංජිනේරු සමිතිවල නිෂ්පාදනය සංවිධානය කිරීම කරණකොට 1973 දී කෘෂිකර්ම ආම්පන්න ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නතර කිරීමට හැකි විය. මේ අන්දමින් විදේශ විනිමය ඉතිරි කරවා ගැනීමට ලුහු ඉංජිනේරු සමිති අමු ද්‍රව්‍ය වශයෙන් පාවිච්චි කළේ නොයෙකුත් රජයේ ආයතනවල වර්ෂ ගණනාවක් තිස්සේ ගොඩ ගැසෙමින් තිබුන යකඩ සහ වානේ සුන්බුන්ය. මේ ලුහු ඉංජිනේරු සමිති නිෂ්පාදනවල තත්වය උසස් වනවා පමණක් නොව, දැන් සමහර සමිති පාඨශාලාවලට උවමනා විද්‍යා උපකරණ ඇතුළු වෙනත් නොයෙකුත් විශේෂ උපකරණ සෑදීමට පටන් ගෙන ඇත.

කම්මල් කාරයන් මේ අන්දමින් ලුහු ඉංජිනේරු සමිති මගින් සංවිධානය කරනවාත් සමගම මධ්‍ය පරිමාණ ලුහු ඉංජිනේරු සමිතිද ආරම්භ කරන ලදී. මෙවැනි සමිතිවල සාමාජිකයන් වූයේ නොයෙකුත් පළාත්වල වැඩ කරගෙන ගිය පට්ටල් කරුවන්, වාත්තු කරුවන්, වෙල්ඩින් වැඩ කළ අය ආදීහුය. මෙවැනි අය සංවිධානය කර, කෘෂිකාර්මික පොම්ප, රෝද දෙකේ ට්‍රැක්ටර් ආදී නොයෙකුත් කුඩා යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. මේ අන්දමින් ලුහු ඉංජිනේරු සමිති නිෂ්පාදනය සංවිධානය කරන විට, නොයෙක් ප්‍රකාර විරෝධතා පැන නගින්නට විය. මෙවැනි විරෝධතා ප්‍රධාන වශයෙන් පැමිණියේ විදේශ වලින් මෙවැනි නිෂ්පාදන ආනයනය කිරීමට පුරුදු වූ අයගෙනි.

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල මගින් කෙරෙනු ලබන තවත් වැඩ පිළිවෙලක් නම් ආහාර සැකසීමේ සමුපකාර සමිති ඇති කිරීමයි. මේවායින් අදහස් කෙරෙනුයේ ගම් ප්‍රදේශවල නිෂ්පාදනය කරනු ලබන කෘෂිකාර්මික භෝග සහ වෙනත් ද්‍රව්‍ය හැකි පමණ දුරට ඒ ප්‍රදේශවලම ආහාරය සඳහා සකස් කිරීමය. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රමයේ තවත් පරමාර්ථයක් ද මේ වැඩ පිළිවෙලෙන් පෙනේ. එනම්, හැකි පමණ දුරට ගම් ස්වයංපෝෂිත කිරීමයි. එවිට ගම් ප්‍රදේශයක වගා කරනු ලබන ඉදල් ඉරිඟු, කුරක්කන් ආදී ධාන්‍ය වර්ග කුඩු කිරීම හෝ පිටි කිරීම රජයේ හෝ පුද්ගලික විශාල ආයතන මගින් කිරීම අවශ්‍ය නොවේ. මේවා කුඩු කර හෝ පිටි කර පළාතේ අවශ්‍යතාවයන් සපුරා, අතිරික්තය වෙනත් ප්‍රදේශවලට යැවිය හැකි වේ. මේ අන්දමින්ම හකුරු සහ සීනි සෑදීමද, ජෑම්, උම්බලකඩ, මාලු, පෝර ආදී නොයෙකුත් ධීවර ආහාර වර්ග නිෂ්පාදනය කිරීමද ඒ ඒ ගම්වලම කර, ඒ ප්‍රදේශවල වැසියන්ට රැකියා ලබා ගත හැකිය. එමෙන්ම ගම් ප්‍රදේශයට අවශ්‍ය වන කෘෂිකාර්මික සහ වෙනත් උපකරණ සැපයීම ලුහු ඉංජිනේරු සමිති මගින් කළ හැකි වේ. තවද වෙනත් නිෂ්පාදන වැඩ පිළිවෙලවල් යටතේ පෝර නිෂ්පාදනය, ගොඩ නැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය, භූ සම්පත් උපයෝගී කර ගන්නාවූ නොයෙකුත් නිෂ්පාදනයන් ආදිය ගම් ප්‍රදේශවලම කිරීමෙන් ඒ ප්‍රදේශවල අවශ්‍යතාවයන් සපුරා, අතිරික්ත වෙනත් ප්‍රදේශවලට යවනවාත් සමගම, ඒ ඒ ගම් ප්‍රදේශවල නොයෙකුත් කර්මාන්ත ඇති වනු ඇත. එවිට රැකියා සොයාගෙන කොළඹ සහ වෙනත් නගරවල විශාල වැඩපලවලට ගම්වල තරුණ තරුණියන්ට ඇදී එන්නට අවශ්‍ය වන්නේ නැත.

මේ අන්දමින් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ කෙරෙන්නාවූ නොයෙකුත් නිෂ්පාදන වැඩ පිළිවෙලවල් ඇත. හූ කාර්මික සමූපකාර සමිති මගින් කෙරෙනුයේ පාරම්පරිකව පැවත එන්නාවූ මැටි භාණ්ඩ නිෂ්පාදන ශිල්පීන් සංවිධානය කිරීමද, ඒ නිෂ්පාදනවල තත්වය නගා සිටුවීමද, සායම් නිෂ්පාදනය කිරීම ආදී නොයෙකුත් හූ සම්පත් වලින් ලැබෙන්නාවූ කර්මාන්ත ඇති කිරීමද වේ. මැටි භාණ්ඩ නිෂ්පාදනය කරන අය තම නිෂ්පාදනයන් සඳහා උපයෝගී කර ගන්නාවූ උපකරණ දියුණු කිරීමෙන් සහ අවශ්‍ය කාර්මික දැනීම ලබා දීමෙන් ඉතාමත් උසස් වර්ගයේ මැටි භාණ්ඩ, පීරිසි කෝප්ප ආදිය මේ සමිති මගින් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. සමූපකාර සමිති මගින් මෙරට ඇත්තාවූ කුණු කසල සහ වෙනත් සුදුසු ද්‍රව්‍යයන් පාවිච්චි කර උසස් වර්ගයේ කොම්පෝස්ට් පෝර නිෂ්පාදනය කරනු ඇත. ඒ සමඟම වැඩි කල් යන්නට පෙර විශාල වශයෙන් පෝර නිෂ්පාදනය සඳහා සුදුසු යන්ත්‍ර නිෂ්පාදනය කර සැපයීමට ද අදහස් කර ඇත. ස්වදේශීය වෛද්‍ය සමූපකාර සමිති මගින් ගම් ප්‍රදේශවල සෞඛ්‍ය අවශ්‍යතාවයන් සපුරාලීමත් සමඟම ඉතා විශිෂ්ට වූ පාරම්පරික දැනීම සංවිධානය කිරීමත්, පරීක්ෂණ කිරීමත් අදහස් කෙරේ. මෙවැනි සමිති මගින් බේත් වර්ග එකතු කිරීමද, බේත් පැලෑටි වර්ග වගා කිරීමද, බේත් වර්ග නිෂ්පාදනය කිරීමද, වෛද්‍ය සේවා ලබා දීමද, ප්‍රදේශයේ ඇත්තාවූ වෛද්‍ය දැනීම එක්රැස් කිරීම සහ පරීක්ෂණ කිරීමද කරනු ලැබේ.

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල මේ අන්දමින් ක්‍රියාත්මක කිරීමේදී නොයෙකුත් කාර්මික හා ශිල්පීය දැනීම ඇති අයගේ සහාය ලබාගනු ඇත. මෙවැනි අය අමාත්‍යාංශයේ නොයෙකුත් කමිටුවල සහභාගී වෙති. ඒ කරණකොට දේශීයව ඇති කාර්මික හා ශිල්පීය දැනීම ගැන වැඩිදුරටත් සෝදිසි කිරීමත්, පරීක්ෂණ පැවැත්වීමත්, ඒවා කාර්මික හා කෘෂිකාර්මික යෝජනා ක්‍රමවල යෙදවීමත් කිරීමට හැකිව තිබේ. උදාහරණයක් වශයෙන් කියතොත්, වී අඟයියා අපේ පැරණි මුතුන් මිත්තන් විසින් විශාල වශයෙන් කාර්මික නිෂ්පාදන සඳහා උපයෝගී කරගෙන ඇති බවයි. තවද මෙරටෙහි ඇති යකඩ, තඹ වැනි ඛනිජ ද්‍රව්‍යයන් විශාල අන්දමින් අපේ පැරණි මුතුන් මිත්තන් කර්මාන්ත සඳහා යොදවාගෙන තිබෙන බව පෙනේ. එවැනි අමු ද්‍රව්‍යයන් දේශීය වශයෙන් ලබා ගන්නා පමණක්නොව, ඒ අය මේවායින් නිෂ්පාදනයන් කිරීමට ද යොදවා ගත්තේ දේශීය අමු ද්‍රව්‍යයන්ය. මෙරට සේරුවාවිල ඇති යපස්වල තත්වය ඉතාමත් උසස් වේ. එප්පාවල ඇති පොස්පේට් පාෂාණ වලින් පොස්පේට් පෝර සෑදීමද ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ කරනු ලැබේ. මෙතෙක් කල් මෙම පෝර පිට රටින් ගෙන්වන ලදී. එහෙත් වර්ෂ සිය ගණනකට සෑහෙන පොස්පේට් පෝර එප්පාවලින් ලබා ගැනීමට හැකි බව දැන් පෙනේ. තවද මේ අන්දමින් රොක් පොස්පේට් පෝර පමණක් නොව සුපර් පොස්පේට් ද වැඩිකල් යාමට පෙර නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

මේ අන්දමින් මෙරටෙහි ඇත්තාවූ කාර්මික දැනීම හා ශිල්පීය දැනීම සහ ඛනිජ සම්පත් උපයෝගී කරගෙන නොයෙකුත් ආකාර කර්මාන්ත ඇති කළ හැකි වේ. එවැනි කර්මාන්ත සාමාන්‍යයෙන් කුඩා පරිමාණයෙන් ඇරඹිය හැකිය. නොයෙකුත් ලෝහ වර්ග නිෂ්පාදනය කිරීමද කුඩා පරිමාණයෙන් කළ හැකි බව දැන් මේ සම්බන්ධයෙන් කරන්නාවූ පරීක්ෂණ වලින් පෙනී යයි. මෙරටෙහි ඇති ඛනිජ වැලි ඉතාමත් වටිනා සම්පතක් වුවත්, එය කෙලින්ම ජපානයට යැවීම ඉතාමත් කණගාටුදායක තත්වයකි. මෙම ඛනිජ වැලි පාවිච්චි කර, කුඩා හා මධ්‍යම පරිමාණයේ

කම්මාන්ත මගින් නොයෙකුත් වර්ගයේ ලෝහ මගින් නිෂ්පාදනය කළ හැකි බව දැන් කෙරීගෙන යන පරීක්ෂණ වලින් පෙනේ. එබැවින් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙළ යටතේ මෙවැනි දේශීය සම්පත් සහ දැනීම කාර්මික සංවර්ධනයට යොදවා ගැනීමට විශේෂ තැනක් දෙයි.

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ කෙරෙන්නාවූ, වැඩ සැකෙවින් මේ අන්දමින් කිව හැකිය.

I. සංවර්ධනය සඳහා ජනතාව සහභාගී කරවා ගැනීමද, නිෂ්පාදනය කිරීමේදී ජනතාවගේ ආත්ම විශ්වාසය ඇති කිරීම;

II. හැකි පමණ විශාල වශයෙන් දේශීය සම්පත් සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීම;

III. දේශීය කාර්මික හා ශිල්පීය දැනීම, විශේෂයෙන් පාරම්පරික සහ පෞරාණික කාර්මික දැනීම, සංවර්ධනයට විශාල වශයෙන් උපයෝගී කර ගැනීම;

IV. ගම් ප්‍රදේශ හැකි පමණ දුරට ස්වයංපෝෂිත කිරීම. එනම්, ඒ ප්‍රදේශ වලින් ලැබෙන අමු ද්‍රව්‍ය හෝ පිටින් ගෙනෙන අමු ද්‍රව්‍ය යොදවා නොයෙකුත් කාර්මික යෝජනා ක්‍රම ගම් ප්‍රදේශවල ඇති කිරීමය.

---

# ක්ෂේත්‍ර අධ්‍යයනය

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී ඩී. ද එස්. රත්නවීර මහතා විසිනි.

ක්ෂේත්‍ර අධ්‍යයනයට සහභාගී වන මහවැලි සංවර්ධන මණ්ඩලයේ නිලධාරී පිරිස විසින් පහත සඳහන් කරුණු පිළිබඳව විස්තර ලබා ගැනීම් මාර්ගයෙන්ද, ලබා ගත් විස්තර ආශ්‍රයෙන් පාඨමාලාවේ සාකච්ඡාවට සහභාගී වීමෙන් ද මෙම අධ්‍යයනය සාර්ථක කර ගත හැකි වේ.

## 1. ආයතන පිළිබඳ තත්වය:

ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමෙහි ලා කාර්ය භාරයක් කලක් තිස්සේ ඉටු කරන රජයේ මෙන්ම ස්වේච්ඡා සහ වෙනත් ආයතන ඇත. මෙම ආයතන ක්‍රමයෙන් පරිනාමය වන අතර වරින් වර රජය මගින් පනවනු ලබන නීති අනුවද වෙනස් වීම්වලට භාජනය වේ. මෙම ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. ඒවා ක්‍රියාත්මක වන්නේ කාර්යක්ෂම අන්දමින්ද? එම ආයතනවල කාර්යක්ෂම බවට බාධා ඇති කරන ගැටළු ඇත්නම් ඒ කුමණ හේතු නිසා ඇති වන ගැටළුද? කුමණ අන්දමේ ගැටළුද? යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ප්‍රයෝජනවත්ය. ග්‍රාමීය ආයතන ක්‍රියාත්මක කිරීමේදී එමගින් ඉටු විය යුතු සේවය ඉටු කර ගැනීම සඳහා ගම්බද ජනතාව තුළ ඇති මැදිහත් වීම, ඉදිරිපත් වීම සෑහෙන තත්වයකින් පවතීද? එසේ නො පවතින්නේ නම් මෙයට කුමණ හේතු බලපාන්නේද යනු සලකා බැලීම ප්‍රයෝජනවත්ය. මෙම ආයතන දැනට වඩා කාර්යක්ෂම තත්වයකින් දියුණු කිරීමට නම් කුමණ අන්දමේ පියවර ගත යුතුදැයි ඔබ කල්පනා කරන්නේද? එසේ කල්පනා කිරීමට කුමන හේතු ඉදිරිපත් වන්නේද? අධ්‍යයනය කිරීමට සුදුසු ආයතන අතර ගොවි කාරක සභා, කෘෂිකර්ම එලදා වර්ධන කමිටු, ග්‍රාමීය බැංකු, සමූපකාර සමිති, ගම ආශ්‍රිත පන්සල් සහ ආරාම, ග්‍රාමීය සංවර්ධන සමිති සහ ගම්බද කටයුතු කරන නිලධාරීන් ද පළමුවෙන් සඳහන් කළ යුතුය. සංවර්ධන කටයුතුවලට මැදිහත් වීම සඳහා මෙසේ විවිධ ආයතන පැවතීමෙන් සම්බන්ධීකරණයේ ගැටළු මතු වේද යන්න සොයා බැලීම වටී. එමෙන්ම යම් යම් කටයුතු ආයතන කිහිපයකට භාර දීම නිසා ගැටළු ඇති වී තිබේද?

## 2. ග්‍රාමීය ණය සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය පිළිබඳ ගැටළු:

වී ගොවිතැන හෝ ගොඩ වගාවන් සඳහා ණය පිළිබඳ නොයෙක් ප්‍රශ්න ඇත. ණය සැපයීමේදී ද රජයට සම්බන්ධ ආයතන මෙන්ම පුද්ගලික ආයතන ද ඇත. ගොවිකටයුතු සඳහා ණය අවශ්‍ය වන්නේ කුමණ හේතු නිසාදැයි සලකා බැලීම වටී. සැමදා ගොවිකටයුතුවල යෙදෙන ගොවීන්ට එක කන්නයක් සඳහා අවශ්‍ය පෝර හා කෘෂි රසායනික ද්‍රව්‍යවලට වැය වන මුදලවත් ඉතිරි කර ගත නොහැකි වී ඇත්තේද? ගොවියෙකුගේ සාමාන්‍ය ආර්ථික තත්වය අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය දෑවලට යන වියදම වැඩිදැයි ඔබ කල්පනා කරන්නේද? සාමාන්‍ය වශයෙන් මේ ගම්වල ගොවීන් ලබා ගන්නා ණය මුදල් කෘෂිකාර්මික සංවර්ධනයටම යෙදවෙන්නේද? එසේ නැත්නම් සමහර ගොවීන් විසින් එම මුදල් පරිභෝජනයට පවා යොදා ගනු ලබන්නේද? එසේ යොදා ගන්නේ නම් පෝර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය කලට වේලාවට නො ලැබීමේ හේතුවෙන් තමාට ඒ මුදල් වියදම් වන බව ගොවීහු පවසත්ද? නැතහොත් ඇත්තවශයෙන්ම ණය මුදල් ලබා ගන්නේ ප්‍රමාද වී හෙයින්

ඒවා කෘෂිකාර්මික කටයුතුවලට ප්‍රයෝජනයට ගත නොහැකි යයි ඔවුන්ගේ අදහසක් තිබේද? ණය නො ගන්නා ගොවීන් තමන්ගේ ගොවි කටයුතු දියුණු අන්දමට කරගෙන යන බව පෙනෙන්නේද? ඔවුන් විසින් පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය කෙරෙන්නේදැයි සලකා බැලීම ප්‍රයෝජනවත්ය. කෘෂිකාර්මික ණය ලබා ගන්නා ගොවීන් සහ එසේ ලබා නො ගන්නා ගොවීන්ගේ කුඹුරුවල නිෂ්පාදනත්වය අතර පැහැදිලි වෙනසක් තිබේද? කෘෂිකාර්මික ණය පිළිබඳ ගැටළු වලදී ගත හැකි පියවර කිහිපයක් ඔබට පැහැදිලි නම් සඳහන් කරන්න.

ගොවියෙකු විසින් ඉතා මහන්සියෙන් නිෂ්පාදනය කර ගන්නා ගොවි ද්‍රව්‍ය අලෙවි කර ගැනීමේ අපහසුවක් ඇත්නම් නැතහොත් ඔහුට ලබා ගත හැකි මිල අසාධාරණ අන්දමින් අඩු නම් ඔහුගේ උනන්දුව හා උද්යෝගය අඩු වන බව පැහැදිලිය. වී මිලදී ගැනීමට රජය මහත් පරිශ්‍රමයක් දරතත් සමහරවිට මිලදී ගන්නා සමූපකාර සමිති ආශ්‍රිත ගැටළු නිසා වී විකිණීමට ගොවි මහත්වරුන්ට යම් යම් ගැටළුවලට හා කරදරවලට මුහුණ දීමට සිදු විය හැකිය. මේ ප්‍රදේශවල වී ලබා ගන්නේ කිරීමෙන්ද? මැනීමෙන්ද? ඒ පිළිබඳ ගොවි මහත්වරුන්ගේ අදහස් මොනවාද? වී වර්ග කිරීම, ඒ සඳහා ගෙවීම් කරන ආකාරය, කමතේ සිට හෝ තමාගේ නිවසේ සිට වී ප්‍රවාහනය කිරීමේ වියදම් සහ ගැටළු පිළිබඳ අදහස් මොනවාද? මිරිස් එළවළු වැනි නිෂ්පාදන අලෙවිය පිළිබඳ පවතින තත්වය කුමක්ද? මෙහිදී රජයේ ආයතන වලින් ලැබෙන පහසුකම් මොනවාද? දැනට පවතින තත්වය කාර්යක්ෂම නොවේ නම් රජය හා අනුබද්ධ ආයතන මගින් ගත හැකි පියවර කුමක්ද? පුද්ගලික වෙළෙඳුන් විසින් මෙම ගොවි නිෂ්පාදන මිලදී ගැනීමේදී කුමන අන්දමේ පහසුකම් සලසා තිබේද? සමහර ගම්වලට මිරිස් වැනි ඉහල මිලක් ගෙන දෙන භෝග වගාව ප්‍රචලිත වීමෙන් පසුව පොදු ග්‍රාමීය ආර්ථිකයෙහි සැළකිය යුතු වෙනස්කම් ඇති වී තිබේද?

3. <u>ව්‍යාප්ති සේවාවන්ගේ පරිමාව සහ කාර්යක්ෂම බව:</u>

රජයේ ආයතන හා නිලධාරීන් මගින් පවත්වාගෙන යන ව්‍යාප්ති සේවාවන් සඳහා විශාල මුදලක් වැය වන බව අපි දනිමු. මෙම ව්‍යාප්ති සේවාවන් කාර්යක්ෂම අන්දමින් ඈත පිටිසර ගම්වලට පැතිර විහිදී ඇත්දැයි අධ්‍යයනයෙන් සොයා බැලීම වටී. මෙම සේවාවල යෙදී සිටින නිලධාරීන් වී වගාව මෙන්ම ගොඩ භෝග වගාවටද ව්‍යාප්ති සේවාවන් මගින් උපදෙස් දෙනු ලබන්නේද? එම නිලධාරීන් ව්‍යාප්ති සේවා උපදෙස් බෙදා හැරීමේදී කුමන මාර්ග අනුගමනය කරනු ලබන්නේද? බොහෝවිට ගෙයින් ගෙට හෝ සෑම ගොවි බිමකටම යාම අපහසු කාර්යයක් වන නමුත් සතියේ පොල වැනි ගොවි මහතුන් එක් වන ස්ථානවලදී නැතහොත් ගමේ පාසැල්වලදී කැඳවන ගොවි රැස්වීම්වලදී නැතහොත් ගොවි කාරක සභා රැස්වීම් ආග්‍රයෙන් මෙම සේවාවන් ලබා දෙන්නේද? ප්‍රචාරක කටයුතු කාර්යක්ෂමද? බීජ වර්ග බෙදා දීම කෙරේද? උපදෙස් බෙදා හැරීමේදී මුද්‍රිත පත්‍රිකා ආදිය බෙදා හරිනු ලබන්නේද? එය ලැබුණු බවට හා එයින් ප්‍රයෝජනයක් ලද බවට ගොවි මහත්වරු කරුණු ඉදිරිපත් කර ඇත්ද: ව්‍යාප්ති සේවාවන් දියුණු කිරීමට කුමණ අන්දමේ පියවර ගත යුතුදැයි ඔබ නිර්දේශ කරන්නේද?

## 4. ගමේ පවුල්වල ආර්ථික තත්වය:

අධ්‍යයනය කරන ගම්වල පවුල් කිහිපයක් පිළිබඳව ආර්ථික තත්වය දැන ගැන ගැනීම ප්‍රයෝජනවත්ය. මේ සඳහා ඉතාම දුප්පත් හෝ ඉතාම පොහොසත් වත්කම් මට්ටමේ පවුල් පමණක් තෝරා ගැනීම සමතුලිත බව නැති කරයි. ගමේ ආර්ථික තත්වය පිළිබඳ තබා ගන්නා පොදු උනන්දුව අනුව ආර්ථික මට්ටම් තුන හතරකින් ඒ ඒ පවුල්වල ආර්ථික තත්වය සුහදශීලීලාවෙන් සෘජු හා වක්‍ර මාර්ග වලින් වටහා ගත හැකිය. විවිධ මට්ටමේ පවුල් තෝරා ගැනීමට ඔවුන්ගේ ආර්ථික පදනම උපයෝගී කර ගත හැකිය. මේ ගම්වල සාමාන්‍ය වශයෙන් කෙරෙන්නේ වී ගොවිතැන පමණක් නම් පවුලක් සතු කුඹුරු අක්කර ප්‍රමාණය අනුව බොහෝවිට ඔවුන්ගේ ආර්ථික තත්වය රඳා පවතී. හේන් සහ කුඹුරු යන දෙකම ඇති ගම්වල මේ දෙක එක්කොට ලබා ගන්නා ආදායම මත ආර්ථික තත්වය රඳා පවතී. පවුලක ආදායම් තත්වය පිළිබඳ අදහසක් ඔවුන්ගේ ගෙදර හා එහි ඇති පරිහරණය කරන භාණ්ඩ දෙස බැලීමෙන් සාමාන්‍ය වශයෙන් ලබා ගත හැකිය. වැව් ආශ්‍රයෙන් කුඹුරු ගොවිතැන් කරන ගොවි මහත්වරුන්ගේ පවුල්වල ආර්ථික තත්වය, එම කුඹුරු යල මහ දෙක පුරුද්දක් වශයෙන් වැඩ කරන්නේද යන ප්‍රශ්නය මත රඳා පවතී. එමෙන්ම සමහර අවස්ථාවලදී නියඟය හෝ වැව්වලට ලැබෙන ජලයේ මඳකම ආදී කරුණු නිසා කුමන අන්දමේ ආර්ථික අසහනයකට මේ අය මුහුණ පා ඇත්දැයි සළකා බැලීම වටී. එවැනි ආපදා වලින් මුදා ගැනීමට පිළියම් ඇත්ද?

රජයේ නිලධාරීන් විසින් ගැමි පවුල්වල ආර්ථික තත්වය සොයා බැලීමේදී, කෙනෙකුගේ පුද්ගලික ප්‍රශ්න වන ආදායම් තත්වය වැනි ප්‍රශ්න පිළිබඳව ඉතා ප්‍රවේසමින් සොයා බැලිය යුතුය. සාකච්ඡාව ආරම්භයේදී සුහද බව ඇති කරන පිළිතුරු දීමට පහසු ප්‍රශ්න මතු කිරීම වැදගත්ය. එමෙන්ම නිලධාරීන් තුන් හතර දෙනෙක් එක් ගොවි මහතෙකුගෙන් මෙවැනි ප්‍රශ්න විසඳනවාට වඩා තනි නිලධාරියෙකු විසින් ප්‍රශ්න කරන්නේ නම් මැනවි. ආදායම් හා පුද්ගලික ප්‍රශ්න වලදී වක්‍ර මාර්ග වලින් ප්‍රශ්න කිරීම ප්‍රයෝජනවත්ය. නිදර්ශනයක් වශයෙන් තමා වගා කරන කුඹුරේ වපසරිය සහ බුසල් කීයක් වපුරන්නේදැයි දැන ගැනීම දළ වශයෙන් කුඹුරෙන් ලබා ගන්නා අස්වැන්න පිළිබඳ හැඟීමක් ඇති කරයි. මේ කන්නයේ බුසල් කීයක් කුඹුරෙන් ලැබේදැයි ඇසූ විට බොහෝ ගොවි මහත්වරු සත්‍ය පිළිතුර කැමැත්තෙන් දෙන බව අපේ හැඟීමයි. ගොවිපලක ආර්ථික තත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී ආදායම් මෙන්ම වියදම් අංශය ගැනද සැළකිලිමත් වීම වටී. දැනට පවතින උද්ධමනය ගම්වලට කොතරම් දුරට බලපා ඇත්ද? ඒ නිසා ඔවුන්ගේ ජීවන තත්වය පහල වැටී ඇත්ද? කෘෂිකාර්මික නිපැයුම්වල මිල අනුව උද්ධමනයේ අහිතකර ප්‍රතිඵල බලපා ඇත්තේ සුළුවෙන්ද?

## 5. සමාජ ව්‍යුහය හා ගැටළු:

ගමක ඇති වන සමාජ ගැටළු අභ්‍යන්තරික හෝ බාහිර විය හැකිය. සූදුව, සොරකම, හොර සුරා විකිණීම, කලහ කර ගැනීම ආදී අපරාධ සමහර ගම්වල ඇත. තෝරා ගන්නා ගම් තුන පිළිබඳ ඇති සමාජ ගැටළුවල තත්වය සැසඳීම ප්‍රයෝජනවත්ය. ග්‍රාම සේවක මහතාගේත්, ගමේ නායකයන්ගේත් අදහස් මෙහිදී ඉතා ප්‍රයෝජනවත් විය හැකිය. සාමාන්‍ය ගැමි පිරිස මේ ගැන කුමන අදහස් දරත්ද? අපරාධ වැඩි වීමට හේතු මොනවාද? ඒවා නැති කිරීම සඳහා රජයේ සහ වෙනත් ආයතනවලත්, ගමේ නායකයිනුත් කුමන අන්දමේ පියවර ගෙන තිබේද? ගමේ යම් යම්

අංශ අතර බෙදීමක් ඇත්නම් එවැනි බෙදීම්වලට තුඩු දෙන හේතු මොනවාද? එවැනි බෙදීම් නැති කොට ගම් දියුණු කිරීම සඳහා කුමන පියවර ගත යුතුද?

එක් ගමකට කිට්ටුව ඇති තවත් ගමක් **සමග** ආර්ථික, සමාජ හා දේශපාලන හේතු උඩ බේද වී සිටිය හැකිය. මෙවැනි බේද කාලාන්තරයක් තිස්සේ සමහර ගම් අතර පවතී. ඒවා නැති කිරීමට කුමන පියවරවල් ගත හැකිද? ගමේ සමාජ ව්‍යුහය පිළිබඳ ඔබගේ අදහස් මොනවාද? මෙම සමාජ ව්‍යුහයට පදනම් වී ඇත්තේ කුමන හේතුද? ග්‍රාමීය සමාජය ඒකරාශී කොට එක්සත් බවේ ශක්තිය තුළින් සංවර්ධන කටයුතු කරා මෙහෙයවීමට කුමන පියවර ගත හැකිද?

## 6. කෘෂිකාර්මික පිළිවෙත් සහ නිෂ්පාදනත්වය:

එක එක ගමට අදාළව ගොඩ මඩ ගොවිතැන් වලදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙල සම්ප්‍රදායිකද, නැතහොත් නව සොයා ගැනීම් හා ව්‍යාප්ති සේවාවන් ආශ්‍රයෙන් නව මඟකට යොමු වී ඇත්ද, සොයා බැලීම වැදගත්ය. වැඩි අස්වැන්නක් දෙන බීජ වර්ග පාවිච්චිය බහුල වශයෙන් කෙරේද? පැල සිටුවීම, පොහොර භාවිතය, කෘෂි රසායනික ද්‍රව්‍ය යෙදීම පිළිබඳ තත්වය කෙසේද යනාදී විස්තර ප්‍රයෝජනවත්ය. ඉහළ යන මිළ අනුව කෘෂිකාර්මික කටයුතුවල පිරිවැය පිළිබඳ කුමන අදහස් ප්‍රකාශ වන්නේද? වැව් වලින් ජලය ලබාගෙන කුඹුරු ගොවිතැන් කිරීමේදී ජලය පාවිච්චි කිරීම පිළිබඳ අනුගමනය කරන ප්‍රතිපත්ති මොනවාද? ජලය පරිහරනය කිරීමේ අකාර්යක්ෂමකම් ඇත්ද? මෙහිදී සීමිත සම්පත් උපරිම අන්දමට ප්‍රයෝජනයට ගැනීම කෙරේද යන්න සොයා බැලීම වැදගත්ය.

## 7. ග්‍රාමීය ආර්ථ ක්‍රමයේ වී මිළ වට සහ ගොඩ ගොවිතැනට ලැබෙන තැන:

කෘෂිකාර්මික නිෂ්පාදනවල මිළ පිළිබඳව මෑතදී විවිධ වැදගත් වෙනස්කම් ඇති විනි. වෙළඳ පොලේ එම නිෂ්පාදනයන්ගේ මිළ ආශ්‍රයෙන් වැඩි වීමත් සමඟ මේ ප්‍රදේශයේ ගම්වල ආර්ථ ක්‍රමයෙහි ද, කෘෂිකාර්මික නිෂ්පාදන රටාවෙහි ද සැළකිය යුතු වෙනස්කම් ඇති වුනු බව පෙනේ. විශේෂයෙන් මිරිස්වලට හොඳ මිලක් ලැබීමෙන් අනතුරුව ග්‍රාමීය ආර්ථ ක්‍රමයෙහි නොයෙකුත් වෙනස්කම් ඇති වුනු බව පැහැදිලිය. හේන් ගොවිතැනත් කුඹුරු ගොවිතැනත් අතර කාලය, ශ්‍රමය හා සීමිත සම්පත් ගොවි මහතුන් විසින් කුමන අන්දමට බෙදා ඇත්දැයි සොයා බැලීම වටී. හේන් ගොවිතැනින් ලැබෙන ලාභ කුඹුරු ගොවිතැනේ දියුණුවට යෙදවෙන්නේ ද ආදී ප්‍රශ්න ගැන සැ ළකිලිමත් වීම අවශ්‍යය.

## 8. සමාප්තිය:

දින දෙක තුනක් තුළ පැවැත්වෙන මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය නියමිත ප්‍රශ්න මාලාවක් අනුව සංවිධානය කෙරෙන්නේ නැත. වලස්වැව, **සිරිමාගම** සහ හැලඹෑව නමැති ගම් තුන අධ්‍යයනයට සුදුසු ලෙස තාවකාලිකව තීරණය කරගෙන ඇත. මෙම ගම් තුන සාමාන්‍ය ආර්ථික මට්ටම් අතින් ද එහි පවතින සමාජ ගැටළු ආදිය අතින් ද තවත් විවිධ අංශ අනුව ද එකිනෙකට වෙනස් වේ යැයි සිතිය හැකිය. මෙය නියම අයුරු පැහැදිලි වන්නේ අධ්‍යයනයෙන් පසුවය.

එහෙයින් ඒ ගම් තුන තෝරා ගත්තේ. අධ්‍යයනයට අවශ්‍ය විස්තර ලබා ගැනීමේදී බොහෝවිට ප්‍රදේශ භාර ග්‍රාම සේවක මහතා හමු වී සාකච්ඡා කිරීමෙන් ගමේ වැඩියෙන් පැමිණිලි ලැබෙන අංශ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය. කුමන අන්දමේ සමාජමය ගැටළු මෙම ගම්වල මතු වන්නේද? මේවාට හේතු කුමක්ද? යන්න පිළිබඳව ග්‍රාම සේවක මහතා තුළ අවබෝධයක් පවතිනු ඇත. එමෙන්ම ගම්වල නායකත්වය දරන පුද්ගලයන් තුළද මේ කරුණු පිළිබඳ අවබෝධයක් ඇත. මේ ගැටළු පිළිබඳව කුමන පියවරක් ගත යුතුදැයි යන්න බොහෝවිට එම අය හිත දුන් ගැටළු විය හැකිය. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ප්‍රයෝජනවත් වන්නේය. ගම්වල තරුණ පරපුර මේ පිළිබඳව කුමන අදහස් දරත්ද?

ගොවි කාරක සභා වැනි ආයතනවල සාමාජික හා නිලධාරී පිරිස ගම්වල ගොවි කටයුතුවලට අදාළ ගැටළු පිළිබඳව විස්තර ලබා ගත හැකි පුද්ගලයන්ය. විශේෂයෙන් සීමිත සම්පතක් වන වැව් ජලය උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගැනීමේදී කුමන අන්දමේ ගැටළු මතු වන්නේදැයි සොයා බැලීම ප්‍රයෝජනවත්ය. කුඩා ඉඩම් කැබලි සහ තමා සතු ඉඩම් නැතිත් නැත කුඩා කොටස් වශයෙන් විහිදී පැවතීම යන ගැටළු නිසා ගොවි මහතෙකුගේ ආර්ථික කටයුතුවලට කොපමණ අන්දමේ බලපෑමක් ඇත්දැයි සොයා බැලීම වැදගත්ය. තට්ටුමාරු කට්ටිමාරු ආදී ක්‍රම නිසා කුඹුරුවල නිපැයුමට කුමන බලපෑම් ඇත්ද? ආයතන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රදේශයේ ගොවි මහතුන් විසින් කුමන අන්දමේ සහභාගිත්වයකින් කටයුතු කරන්නේ ද යන්න සෙවීම අවශ්‍යය. ග්‍රාමීය ණය පිළිබඳව ග්‍රාමීය බැංකුවල ඇති විස්තර ආදියත්, කථා කරන ගොවි මහතුන්ගේ ණය තත්වය පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීම මනාය.

ක්ෂේත්‍ර අධ්‍යයනයට තිබෙන කාලය ඉතා කෙටිය. කණ්ඩායම් විසින් තමන්ගේ කාලය උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි පරිදි සංවිධානය වීම වැදගත්ය. තනි පුද්ගලයෙක් ලෙස වෙන් වී කටයුතු බෙදා ගැනීම ද වරදක් නැත. ගම්බද ගොවි මහතුන්ගෙන් ප්‍රශ්න කිරීමේදී ප්‍රසන්නව, කල්පනාකාරීව, ගෞරවාන්විතව, ප්‍රශ්න ඇසීම අවශ්‍යය. යම් ගොවි මහතෙක් එක්තරා ප්‍රශ්නයකට පිළිතුරු දීමට මැලි වන්නේ නම් ඒ ප්‍රශ්නයට පිළිතුරක් තරයේම බලාපොරොත්තු වීම සුදුසු නොවේ. සමහරවිට වක්‍ර මාර්ගයකින් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට උත්සාහ ගත හැකිය. ලැබෙන පිළිතුරු නියම සත්‍ය ඒවාදැයි සොයා බැලීමට වෙනත් තොරතුරු හා සසඳා බැලීම කළ හැකිය. මහවැලි ව්‍යාපාරය මගින් කරන්නට යන වැඩ කටයුතු ගැන මේ අවස්ථාවේදී ප්‍රශ්න පැන නැගුනොත් එම ප්‍රශ්න නියමිත නිලධාරීන් වෙත යොමු කරන්නට සලස්වන්න.

ක්ෂේත්‍ර අධ්‍යයනය අවසානයේදී එක් එක් ගම පිළිබඳව අත් අකුරෙන් ලියා ගත් කෙටි වාර්තාවක් සකස් කර ගැනීම අවශ්‍යය. මේ වාර්තාව දිගින් දිගට නො ලියා මූලික සටහන්වලට සීමා කිරීම ප්‍රයෝජනවත්ය. මෙම සටහන් හා කරුණු ඉන් අනතුරුව ඇති වන සාකච්ඡාවේදී එක් එක් කණ්ඩායමේ නියෝජිතයෙකු විසින් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ පොදු සාකච්ඡා වටයක් මෙහෙයවීම සිදු වේ.

## සමුපකාර ගම්මාන පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය

මෙම ක්ෂේත්‍ර අධ්‍යයනයේදී සහභාගී වන නිලධාරීන් විසින් අධ්‍යයනය කරන සමුපකාර ගම්මානයේ ආර්ථික, සමාජ හා පරිපාලනමය අංශ පිළිබඳව සැළකිල්ල දක්වනු ලැබේ.

### ආර්ථික අංශය:

ව්‍යාපාරයේ ආර්ථික සාර්ථකත්වය සඳහා කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත්ය. ගම්මානය ආරම්භයේ භූමිය සහ වගා තත්වය පිළිබඳ අවබෝධයක් අවශ්‍යය. ආරම්භයෙන් පසුව අද දක්වා වගා අංශයෙනුත්, ගොඩනැගිලි හා ඉඳි කිරීම් සහ ස්ථාවර වත්කම් අතින් දියුණු කිරීම් කොපමණ කර ඇත්ද? ව්‍යාපාරය වෙනුවෙන් කොපමණ මුදලක් ප්‍රාග්ධනය වශයෙන් ආයෝජනය කර ඇත්ද? කොපමණ මුදලයි නඩත්තුව සඳහා වැය කර ඇත්ද? ව්‍යාපාරයේ කටයුතු සඳහා රජයෙන් ආධාර, ණය සහ ව්‍යාපාරයේ කෘෂිකාර්මික කටයුතු වලින් වෙන වෙනම කොපමණ මුදල් ලබා ඇත්ද?

ව්‍යාපාරය සම්බන්ධව කරන ලද සැලසුම් සමග සසඳා බලනවිට සංවර්ධන කටයුතු කොපමණ දුර සාර්ථක අන්දමින් ඉටු කර ඇත්ද? වගා සැලැස්ම සහ ආදායම් වියදම් සැලැස්ම අනුව සළකා බලනවිට ලබා ඇති ප්‍රගතිය සහ අනාගතය පිළිබඳ අදහස් මොනවාද? ශ්‍රම යෙදවීම පිළිබඳව සහ ව්‍යාපාරයේ එක් එක් අංශ (රබර්, සත්ව පාලනය, වැලි දොඩම්) ආදිය පිළිබඳව පිරිවැය හා ආදායම් කෙසේ සැසඳෙන්නේද? ඒ අනුව බලනවිට ලාභ ලැබෙන කොටස් මොනවාද? ප්‍රාග්ධනය එක් එක් අංශවලට බෙදා ගත් විට ඇති වන තත්වය කුමක්ද? ව්‍යාපාරයේ ආර්ථික දියුණුව ගැන සළකන අතරම එයට බැඳීමෙන් පසුව සාමාජිකයන් ලත් ආර්ථික සෙත ගැනද සළකා බැලීම වටී. ඔවුන්ගේ ආදායම් හා වියදම් පිළිබඳවද සොයා බැලීම ප්‍රයෝජනවත්ය.

### සමාජ අංශය:

ගම්මානය තුළ ජීවත් වන සාමාජික පිරිස සමාජයක් වශයෙන් කුමන අන්දමේ කණ්ඩායම් ඇති කරගෙන තිබේද? සාමූහිකව කෙරෙන සමාජමය කටයුතුවලදී ඔවුන්ගේ මැදිහත් වීම යහපත්ද? සාර්ථකද? විශේෂයෙන්ම වයස් ගත එමෙන්ම සමුපකාර ගම්මානය ආරම්භ කිරීමට පළමුව කම්කරුවන් ලෙස කටයුතු කළ පුද්ගලයින් ද, අනතුරුව ගම්මානයට බඳවා ගන්නා ලද තරුණ පුද්ගලයින් ද අතර සමගිය හා එකඟත්වය තිබේද? එසේ නැතහොත් කණ්ඩායම් දෙකක් ලෙස පවතීද? ගම්මානයේ පුද්ගලයන් සහ අවට ගම්වල ගම්වාසීන් අතර සුහදතාවය ඇති ඇත්ද? එම ගම්වල ආගමික හා සංස්කෘතික කටයුතුවලට ගම්මානයේ සාමාජික සාමාජිකාවන් නිතර සහභාගී වන්නේද?

ගම්මානයට බැඳුනු තරුණ තරුණියන් සහ ඔවුන්ගේ දෙමාපියන් අතර කුමන අන්දමේ සම්බන්ධකම්, හමුවීම්, මුණ ගැසීම් ඇත්ද? ආදිය සොයා බැලීම ප්‍රයෝජනවත්ය.

<u>පරිපාලන අංශය:</u>

ගම්මානයේ සැලසුම් (ආර්ථික හා සමාජ) සංවිධාන කටයුතු (කණ්ඩායම් බෙදීම්, වැඩ මෙහෙයවීම් ආදිය) නායකත්වය, පාලනය ආදී කටයුතු පිළිබඳ පවතින තත්වය කෙසේද? පරිපාලන කටයුතු වලදී අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා තීරණ සාමාජික සාමාජිකාවන්ගේ අදහස් හා සිතුම් පැතුම් අනුව කෙරෙන්නේද? පරිපාලනයට ඔවුන් කෙසේ මැදිහත් වන්නේද?

ඉහත දැක්වුනු සියළු කරුණු පිළිබඳව ප්‍රශ්න විචාරන විට ගම්මානයේ පවතින පරිපාලන, සමාජ තත්වයට පටහැනි හෝ වන අන්දමට බාධා ඇති නොවන අන්දමට එසේ කිරීම අත්‍යවශ්‍යය. අප මේ ගම්මානය අධ්‍යයනය කරන්නේ මූලික වශයෙන් අපගේ පුහුණුවේ එක් පියවරක් වශයෙනි. යම් යම් දේ කළයුතු හෝ නොකළයුතු බවට උපදෙස් දීමක් හෝ අදහස් ප්‍රකාශ කිරීමක් අප මෙහිදී බලාපොරොත්තු වන්නේ නැත. විවේචන අප අතර පන්ති කාමරයේදී කළ හැකිය. අධ්‍යයනය කරන්නට යන මේ ගමන නිසා ගම්මානයට යම්කිසි ගැටළුවකට මුහුණ පෑමට නොවන අන්දමින් කටයුතු කිරීමට අපි බැඳී සිටිමු. අධ්‍යයනය අවසානයේදී කණ්ඩායම් තුනක් විසින් තම කණ්ඩායම් මගින් සකස් කර ගන්නා කෙටි වාර්තාව ආශ්‍රය කරගෙන ගම්මානයේ ආර්ථික, සමාජ, පරිපාලන අංශ පිළිබඳව කරුණු, පන්ති කාමරයේදී ඉදිරිපත් කරන අතර එය අරමුණු කරගෙන සාකච්ඡාවක් ඇති වේ.

---

## නිලධාරීන් හා මහජනයා අතර අදහස් හුවමාරු කිරීමේ ගැටළුව

ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නීති සහකාර අධ්‍යක්ෂ,
අමරහේවා මද්දුම මහතා විසිනි.

අදහස් හුවමාරුව පිළිබඳව වන විෂය අතිශයින් පුළුල් ක්ෂේත්‍රයක් වන්නේය. නිලධාරීන් හා මහජනතාව අතර, අදහස් හුවමාරු කිරීම පිළිබඳව ගැටළුව මෙහි දී ඇතිවූවකි. ලෝකයේ විශාල රටක ශ්‍රේෂ්ඨ රාජ්‍යපාලකයෙක් කියා ඇත්තේ කිසියම් ප්‍රශ්නයක් මැනවින් අවබෝධ කර ගැනීම එය විසඳීමේ එක් කොටසක් බවයි.

ප්‍රාග් ඓතිහාසික යුගයේදී ජනතාව කට්ටි වශයෙන් කෘෂිකාර්මික ජීවන ක්‍රමයක් මත යැපුණු අවදියෙහිදී සංකීර්ණ ආණ්ඩු ක්‍රමයක් නොතිබුණේය. එක් එක් කණ්ඩායම් අතර ඇති ගැටුම් හේතුකොට ගෙන රාජ්‍යත්වයේ ප්‍රභවය ඇතිවිනි. ඈත අතීතයේදී තිබූ රාජ්‍ය ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා නොයෙක් මාධ්‍ය ඇත. එම මාධ්‍යවලින් දැනීමට ලැබෙන පරිදි රජය හා ජනතාව අතර සම්බන්ධතාවය බොහෝසෙයින් පියෙක් සහ දරුවන් අතර පවතින සම්බන්ධතාවයට සමාන වූවකි.

ශ්‍රී ලංකාවෙහිද දුර අතීතයේදී රාජ්‍යත්වයේ ප්‍රධාන සංකේතය රජතුමා වූ අතර ඔහුගේ සහාය සඳහා යුව රජවරු සහ වෙනත් ප්‍රාදේශීය නායකයෝ සිටියහ. මෙවැනි රාජ්‍ය පාලන ක්‍රමයක් යටතේ රජතුමා හට ඒකාධිපති පාලන බලතල පැවරුනැයි සිතීම වරදකි. රාජ්‍ය පාලනයෙහිදී රටේ රජවරුද සම්ප්‍රදායික නීති රීති මාලාවකින් බැඳී සිටියහ. මෙම පැරණී රාජ්‍යයන් යටතේ රජතුමා හා මහජනතාව අතර අදහස් හුවමාරුව පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත නොවූයේ රජතුමා නිරතුරුවම රටවාසීන් දෙස සානුකම්පික හැඟීමකින් බැලූ හෙයිනි.

පෘතුගීසි ආක්‍රමනයත් සමග මෙම තත්වය වෙනස් වූ අතර, දේශීය සිතුම් පැතුම් පිළිබඳ අවබෝධයක් නොමැති, දේශීය භාෂා ගැන නොදන්නා පිරිසකට මුහුදුබඩ පාලනය අත්පත් විනි. සිය ආගම ප්‍රචලිත කිරීම සහ දේශීය සම්පත් සොරා ගැනීම ඔවුන්ගේ පරමාර්ථය වූ හෙයින් ජනතාව සමග සුහද සම්බන්ධතාවයකට එළඹීමට ඔවුහු උත්සුක නොවූහ. මීට පසු පැමිණි ලන්දේසීහු වාණිජමය පරමාර්ථයන් සපුරා ගැනීමට උනන්දුවක් දැක්වූ හෙයින් ජනතාව සමග වඩාත් කිට්ටු සම්බන්ධකමක් දැක්වීමට උත්සාහ කළහ.

1815 දී පැමිණි ඉංග්‍රීසීන් විසින් ආරම්භ කරන ලද පාලන ක්‍රමය 1947 තෙක් පැවති අතර මෙම පාලන ක්‍රමය පිළිබඳව අවබෝධයකින් තොරව එම පාලන ක්‍රමය අනුසාරයෙන් ඇතිවූ ගැටළුවක් පිළිබඳව සාකච්ඡා කිරීමට අපහසුය. ඉංග්‍රීසීන් විසින් තුන් සිංහලය තමන් නතු කර ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාව කොටස් ගණනකට බෙදා එක් එක් කොටස ඒජන්සියක් වශයෙන් පිහිටුවා ආණ්ඩුවේ ඒජන්ත වරුන් පත් කළහ. එවැනි ඒජන්ත වරයෙකු හට අධිකරන පාලන බලතල හිමිවූනි. එවකට නීතිය හා සාමය රැකීම,

අයබදු රැස් කිරීම සහ ඉතාමත් සුළු වශයෙන් සුභ සාධක කටයුතු කිරීම ආදිය ඉටු කිරීම ඒජන්ත සතු රාජකාරියක් වූ අතර ජනතාවට හා නිලධාරීන් අතර, අදහස් හුවමාරුවක් නොතිබුනේය. රජය හා ජනතාව අතර පරතරය එන්ට එන්ටම වැඩිවිය. එසේම පාලකයන්ගේ දැඩි අවධානය යොමු වූයේ තේ රබර් සහ කෝපි වගාව කෙරෙහි නිසා ජනතාවගේ ඕනෑ එපාකම් පැහැදිලිව සලකා බැලීමට රජයට අවස්ථාවක් නොලැබුනේය. එසේම එවැන්නක් සඳහා ඕනෑ කමක්ද රජයට නොතිබුනේය. මෙම තත්වය අනුව නිලධාරීන් ගමුවට පැමිණීමට ජනතාවට අවස්ථාවක් නොලැබුනේය. ඇතැම්විට මානව භක්තිය ඇසුරෙන් අත්දැකීම් ලත් පාලකයින් අතරින් පතර දක්නට ලැබුනද පොදුවේ ගත් කල ඒ ඒ ඒජන්ත වරුන්ගේ පෞද්ගලිකත්වයට අනුව පාලන කටයුතු ඉටු කරගෙන යනු ලැබිණ. අදහස් හුවමාරුව පිළිබඳව ප්‍රශ්නයක් මෙම තත්වයන් යටතේ උද්ගත නොවිය. දේශීය ජනතාව කෙරෙහි යම්කිසි විශ්වාසයක් නොතැබූහ. 1931 දී ශ්‍රී ලංකාවට සර්වජන ඡන්දබලය ලැබී ඇමති මණ්ඩලයේ වැඩි කොටසක් ලාංකිකයන්ට හිමි වූ පසු ව්‍යවස්ථා දායක සභාවේ ජනතාවගේ අදහස්ද නියෝජනය වූ නිසා එතැන් පිට නැවතත් අදහස් හුවමාරුව පිළිබඳ ගැටළුව ඇති උනේය. එවකට තිබුණු කච්චේරි වැනි සම්ප්‍රදායික ආයතනයකින් ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරවා ගත නොහැකි යයි ඇමති වරුන් අතර ඇතිවූ හැඟීම් නිසා රජය යටතේ විවිධ දෙපාර්තමේන්තු ඉක්මණින් බිහි වන්නට පටන් ගත්තේය. පාලන ක්‍රමයද ක්‍රමක්‍රමයෙන් විමධ්‍යගත වන්නට පටන් ගත් හෙයින් එම දියුණුවට අනුරූපව ජනතාවටද ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ලැබිණ.

1956 න් පසුව පුළුල් අයුරින් ජනතාවගේ අදහස් නියෝජනය වන්නට වූ හෙයින් අදහස් හුවමාරු කිරීම පිළිබඳ තත්වය සංකීර්ණ බවට පත් වූනේය. ජනතාවගේ සිතුම් පැතුම් ක්‍රමයෙන් ලියැලන්නට පටන් ගත්තේය. කච්චේරිය වැනි ආයතනයකින් විසඳාගත නොහැකි ඇතැම් ප්‍රශ්න විසඳාගැනීමේ භාරය ජනතාවටම පැවරෙන ගොවිකාරක සභා, විවිධ සේවා සමූපකාර සමිති වැනි ආයතන බිහිවූ හෙයින් ජනතාව හා නිලධාරීන් අතර අදහස් හුවමාරුව පිළිබඳ ගැටළු ඇති වන්නට පටන් ගත්තේය. නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටෙහි, පරමාධිපත්‍යය ජනතාව සතු වන්නේය. මෙම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය නිලධාරීන් පත් කරනු ලැබෙනුයේ ජනතා නියෝජිතයන්ගෙන් ලැබෙන බලතල අනුසාරයෙනි. නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම්, විනයානුකූල කටයුතු ආදී සියළුම බලතල ජනතා නියෝජිතයන්ගෙන් සැදුම් ලත් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරෙනු ඇත.

මෙම තත්වය යටතේ, මහජනයා හා නිලධාරීන් අතර අදහස් හුවමාරුව පිළිබඳ ගැටළුව කෙරෙහි අලුත් දෘෂ්ටි කෝණයකින් බැලිය යුතුව ඇත. රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ජනතා කොමිටි, උපදේශක කමිටු ආදිය පිහිටුවන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද පලදාව වර්ධන කමිටුපනත කෘෂිකාර්මික ඉඩම් පනත වැනි පනත් මගින් දැන් වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය ජනතාව වෙත පැවරී ඇත.

ජනතාවගේ අයිතිවාසිකම් හා ඔවුන්ගේ හැකියාවන් පිළිබඳව නිවැරදි අවබෝධයක් දැන් ජනතාවට ලැබී ඇත. එහෙයින් නිලධාරීන් හට නිවැරදි ක්‍රියා මාර්ගයකින් ජනතාව සමග එක්ව සංවිධාන කාර්යයෙහි ලා පෙරමුණ ගැනීමෙන් ජනතා ආයතනවල නියෝජිත වරුන් සමග එකට වැඩ කළ යුතු කාලය එළඹ ඇත.

## ග්‍රාමීය ඉතිරි කිරීම් සංවර්ධනයට උපයෝගී කර ගැනීම

ලංකා බැංකුවේ සිංහල අංශයේ කළමනාකාර ධීරඅත්තනායක මහතා විසිනි.

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයෙහි දේශීය හා විදේශීය වෙළඳාම දියුණු වූවායින් පසුව එක්දහස් අටසිය විසිගණන් වල ඉංග්‍රීසි ජාතිකයින්ගේ බැංකුවල ශාඛා මෙහි පිහිටුවන ලදී. මිට ටික කලකට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ඇතැම් ඉන්දියානු ජාතිකයන් වාණිජ රටාවේ ඇතැම් අංශවලට සම්බන්ධ වූ හෙයින් ඉන්දියාවේ බැංකුවල ශාඛා ද ශ්‍රී ලංකාවේ ඇති කරනු ලැබිණි. කෙසේ වෙතත් දේශීය බැංකුවක් පිහිටුවීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳ උද්ඝෝෂනයක් කළහැකි වූයේ එක්දහස් නවසිය ගණන් වලින් ද පසුවය. මෙම වකවානුවේදී මුදල් පොළියට දෙන්නන්ගේ ග්‍රහනයට දේශීය ජනතාව හසුව සිටි අතර ඇතැම්විට ණය ආපසු ගෙවීමට නොහැකි වීම නිසා වටිනා ඉඩකඩම් මුදල් ණයට දෙන්නන් හට හිමිවූනේය. මෙවැනි තත්වයක් යටතේ වුවත් දේශීය අවශ්‍ය තාවයක් වූ බැංකුවක් පිහිටුවීම සඳහා ඉල්ලා සිටීමට තරම් දේශපාලන වශයෙන් ශක්තියක් එක්දහස් නවසිය ගණන් වන තෙක් වුවද ස්වජාතිකයන් හට හිමි නොවිනි.

මෙවකට නොයෙකුත් වාණිජමය කටයුතු වල නිරත ව් සෑහෙන ආදායමක් උපයා ව්‍යාපාරිකයන් බවට පත් ස්වදේශික පිරිසක් ද සිටි හෙයින් ඔවුන්ගේ ඉල්ලීම් අනුව දේශීය බැංකුවක් පිහිටුවීම සඳහා වූ යෝජනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලද්දේය. මෙම යෝජනාව පිළිබඳව සළකාබැලීම සඳහා කොමිෂමක් පත් කරනු ලැබිණි. දේශීය බැංකුවක් රජයේ අරමුදල් සහිතව ආරම්භ කළ යුතු යයි මෙම කොමිෂම විසින් නිර්දේශ කරන ලදී. මේ අනුව 1939 දී ලංකා බැංකුව ආරම්භ කරන ලද අතර, ඉතාමත් කෙටිකාලයක් තුල අනෙකුත් සියළුම බැංකු අභිබවා කටයුතු කිරීමේ හැකියාව ලංකා බැංකුවට ලැබුණි.

මේ අතරතුර දේශීය සංවර්ධන කාර්යයන් සඳහා ලංකා බැංකුවෙන් සේවයක් නොසැළසෙන්නේ යයි මතයක් ප්‍රචලිත වූනේය. ලංකා බැංකුවෙහි ගනුදෙනු එවකට බලවත් ව්‍යාපාරිකයන්ට පමණක් සීමා වූ හෙයින් මෙම ප්‍රකාශනයෙහි කිසියම් සත්‍යතාවයක්ද ඇත. මෙවැනි තත්වයක් යටතේ 1961 දී මහජන බැංකුව ආරම්භ කරන ලද්දේ බැංකු සම්ප්‍රදායන් පිළිබඳව පරිවර්තනයක් ඇති කරමිනි. සාමාන්‍ය ජනතාව වෙත බැංකු පහසුකම් ලබා දීමත් බැංකු කටයුතු පිළිබඳව ඔවුනට අවබෝධයක් සළසා දීමත් පෙරදැරි කරගෙන ආරම්භ කරන ලද මෙම බැංකුවත් සමගම පසුගිය දශකය ඇතුලත බැංකු ක්‍රම පිළිබඳව වැදගත් දියුණුවක් දක්නට ඇත.

මූලාරම්භයේදී බැංකු කටයුතු උදෙසා ඉංග්‍රීසි භාෂාව පිළිබඳව දැනුමක් අවශ්‍ය යයි අදහසක් තිබිණි. එමෙන්ම සාමාන්‍ය ජනතාව උදෙසා නොව උගත් ධනවත් කොටසක් උදෙසා බැංකුවේ සේවාවන් වෙන්වූවා සේ පෙණිනි. එහෙත් අද පවතින තත්වය මීට ඉඳුරා වෙනස් වන්නේය. ඉතිරි කිරීමේ මාර්ගී වශයෙන් බැංකු ගණනාවකම සේවය සාමාන්‍ය ජනතාවට ලැබී ඇත.

ග්‍රාමීය ගොවි ජීවිතයෙහි බොහෝවිට ගොවිතැන සඳහා ලැබී තිබුණ ගොඩ ඉඩම් හෝ මඩ ඉඩම් ඒකකය ගොවීන්ගේ යැපීම සඳහා වත් අප්‍රමාණය. එහෙයින් ඉතිරි කිරීම් පිළිබඳව සළකා බැලීමට හැකියාව ඔවුන්ට නොමැත. මෙය දියුණු සමාජ ක්‍රමයක පැවැත්මට යෝග්‍ය තත්වයක්ද නොවේ. දැනට කරගෙන යනු ලබන සාමාජික පරිවර්තනය සඳහා මුල් වශයෙන් හේතුවූයේ ද මෙම තත්වයම වේ. දැන් දැන් ගැමි සමාජයෙහි ජීවත් වන්නවුන් අතර, ආර්ථික අතින් දියුණුවක් දක්නට ලැබේ. ඔවුන් විසින් වගා කරන ලද භෝග සඳහා වැඩි මිලක් ලැබේ. ගැමි ජනතාව අත දැන් වැඩි මුදලක් ගැවසෙන අතර, මෙය ඔවුනට නුහුරු නුපුරුදු තත්වයකි. ඉතිරි කිරීම් පිළිබඳව අවබෝධයක් සහ ඉතිරි කිරීමේ මාර්ග නොමැති නම් මෙම මුදල් නොදැනුවත්වම වියදම් වී අවසාන වීමට පිළිවන. මුදල් උපයා ගැනීමට වඩා එය මැනවින් පාලනය කිරීම අසීරුය. බොහෝවිට ගැමි ජනතාව අත ගැවසෙන මුදල් වෙළඳ ව්‍යාපාරිකයන් විසින් ඉතා පහසුවෙන් ඇදගනු ලැබේ.

බැංකු මාර්ගයෙන් ලබා ගත හැකි විවිධ සේවා පහසුකම් පිළිබඳව ගැමි ජනතාවට අවබෝධයක් ලබා දිය යුතුය. බැංකු මගින් මුදල් ඉතිරි කිරීම සඳහා ජනතාව උනන්දු කර විය යුතුය. දිවයින පුරා දැනට පිහිටුවා ගෙන යනු ලබන සෑම කෘෂිසේවා මධ්‍යස්ථානයකම ලංකා බැංකු ශාඛාවක් පිහිටුවනු ලබන හෙයින් ජනතාව වෙත බැංකු සේවා පහසුකම් හොඳින් සැලසෙනු ඇත. මහජන බැංකුව, ග්‍රාමීය බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව වශයෙන් කවර වූ හෝ බැංකුවක මුදල් තැන්පත් කිරීමට ඔවුනට පිළිවන. බැංකු සේවා පහසුකම් ලබා ගැනීම සඳහා හොඳ ඉංග්‍රීසි දැනුමක් වත් අන්ත වශයෙන් හොඳින් ලිවීමට කියවීමට හැකියාවක්වත් අවශ්‍ය නැත. තම අත්සන තැබිය නොහැකි අයෙකුට වුවද ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කිරීමට පිළිවන. අවශ්‍ය වනුයේ යහපත් මානසික තත්වයක් පමණකි. තමන් විසින් තැන්පත් කරනු ලබන මුදල් ඕනෑම අවශ්‍ය තාවයකදී සුළු මොහොතකින් ආපසු ලබා ගතහැකි බව ගැමි ජනතාවට අවබෝධ කර දිය යුතුය. එසේම එම මුදල් වලට සෑහෙන පොලියක්ද ලැබෙන්නේය. කෘෂිසේවා මධ්‍යස්ථානයක ඇති බැංකුවකින් වගා කටයුතු ආදී සිය අවශ්‍යතාවයක් උදෙසා ණය පහසුකම් ලබා ගතහැකි බව ඔවුනට අවබෝධ කර දිය යුතුය. ගැමි ජනතාව ක්‍රම ක්‍රමයෙන් ආටෝප ජීවිතයකට ඇබ්බැහි වී ඇති බැවින් ඔවුන් එම තත්වයෙන් මුදාලීමේ මාර්ගයක් වශයෙන් ඉතිරි කිරීම් සඳහා ඔවුන් උනන්දු කරවිය යුතුය.

ඉතිරි කිරීම් මගින් නොයෙකුත් විපුල ප්‍රයෝජන ලබා ගැනීමට පිළිවන. බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කළ පසු ඔහු බැංකුව සමග ගනුදෙනු කරුවකු වන අතර මෙහෙයින් බැංකුවෙන් ණය ගැනීමේ පහසුකම් සැලසේ. ණය ගැනීම සඳහා අවශ්‍ය වැදගත්ම සුදුසුකම වන්නේ, තමන් සතුව අදාල බැංකුවෙහි ගිණුමක් තිබීමයි. ලංකා බැංකුව කෙලින්ම ගොවියන් සමග කටයුතු කරන හෙයින් බැංකු කටයුතු සම්බන්ධයෙන් ගොවිජනතාවට අවශ්‍ය පහසුකම් සෑමවිටම සැලසෙන්නේය.

## උතුරුමැද පලාතේ සමාජ ව්‍යුහය

සාගින්නෙන් නිදහස් කිරීමේ ව්‍යාපාරයේ සමාජ විද්‍යාඥ පී. ගනේවත්ත මහතා විසිනි.

උතුරුමැද පලාත විශේෂයෙන් වියළි කටුක දේශගුනයක් සහිත ප්‍රදේශයක් වන අතර එය වන්නි පළාත යනුවෙන්ද හැඳින්වේ. මෙම ප්‍රදේශය කලින් රාජධානියක්ව පැවති හෙයින් වර්තමානයේ පවතින සමාජ රටාව කෙරෙහි එකී රාජධානියේ බලපෑම්ද අයත් වන්නේය. දැනට පවතින සමාජ රටාව පොදුවේ කොටස් 4 කට වෙන් කළ හැක.

1. පුරාණ ගම්
2. අළුත් ගම්
3. ජනපද
4. කුඩා නගර වශයෙනි.

බොහෝවිට පුරාණ ගම්වල සමාජ ව්‍යුහය තුල එයටම ආවේණික වූ ලක්ෂණ තිබුනේය. මෙවැනි ගමක් සෑම විටම වැවක් ආශ්‍රිතව, පැවති අතර උස් බිම් පෙදෙසක ජනතාව ජීවත් වූ ගම් ගොඩැල්ලත්, පහත් ප්‍රදේශයෙහි වෙල්යායත් මෙම ගමෙහි දක්නට ලැබුණු ලක්ෂණයක් විය. වියලි කලාපයේ තත්වය මෙසේ වුවද තෙත් කලාපයේ පුරාණ ගම් බොහෝවිට වැවක් ආශ්‍රිතව නොපැවතුනේය.

වියළි කලාපයෙහි ජනපද ආරම්භ කලායින් පසුව මෙම සමාජ ව්‍යුහය තුල නොයෙකුත් වෙනස්කම් සිදු වන්නට පටන් ගත්තේය. පිටතින් පැමිණි පුද්ගලයින් පදිංචි වී නව ගම් පිහිටුවන ලද අතර බොහෝ විට පුරාන ගම් හා නව ගම් අතර ඇතිවූ ගැටීම් නිසා ඒවායේ දියුණුවට බාධා ඇතිවිනි. වෙළඳාම සඳහා පහත රටින් මෙම ප්‍රදේශයට පැමිණි අය පැරණි ගම්මුන් සතු ඉඩකඩම් අයත් කරගෙන බොහෝවිට පුරාන ගම්වල පුද්ගලයින්ට වඩා බලපෑමක් ඇති කිරීමට හැකිවන තත්වයකට පත්ව සිටිසහ. එහෙත් උතුරු මැද පලාතේ පවතින සංස්කෘතික රටාව හා ඔවුන්ගේ සංස්කෘතික රටාවන් එකිනෙකට නොගැලපෙන හෙයින් මිශ්‍රිත සමාජ රටාවක් ඇති නොවූ අතර, මෙහි ප්‍රතිඵලය වූයේ අමුතුම මාදිලියේ සමාජ ක්‍රමයක් බිහිවීමයි. ජනපදිකයන් විසින් පැරණි ගම් වැසියන් පිළිබඳව සලකන ලද්දේ නූගත් ගැමිජන කොටසක් ලෙසිනි. මෙම ජන කොටස් දෙකෙහි පැවැත්ම, හැසිරීම් හා සිතුම් පැතුම් අතර ප්‍රබල පරතරයක් තිබ්හෙයින් පුරාණ ගම්මාන වලින් පරිබාහිරව කුඩා අළුත් ගම් ඇති වන්ට වූයේය. උතුරු මැද පලාතට පිටතින් පැමිණි අය වාණිජ ව්‍යාපාර අරඹා පුරාණ ගම් වැසියන් සතු ඉඩකඩම් ආදිය අත්පත් කරගත් හෙයින් තැන් තැන්වල ව්‍යාපාරිකයන් ඒකරාශි වී කුඩා නව නගරද බිහි වුනේය.

මේ එක් එක් කොට්ඨාශ අතර කුලභේද ධන භේද ආදී විවිධ හේතූන් අනුව නොයෙක් ගැටීම් තිබුණි. බොහෝවිට පහත රටින් පැමිණි පුද්ගලයින් කෙරෙහි පුරාණ ගම්වාසීන් කල්පනා කළේ සැක දනවන අදහස් ඇතිවය.

සමාජ රටාවක් තුල විවිධ සංස්ථාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා කුලභේදය පිළිබඳවද දැනගැනීම ඉතාම වැදගත් වේ. ඇතැම් ගම්වල වර්ග සහා පිහිටුවන ලද්දේ ඒ ඒ කුලය ආරක්‍ෂා කරගැනීමේ ප්‍රයත්නය සඳහාය. ඇතැම්විට කුලය පදනම් කරගෙන නොයෙක් ගම් අතර සම්බන්ධතාවයන් පැවතුනේය. උතුරු මැද පලාතේ ඒ ඒ ගම්වල පවා විවිධ කණ්ඩායම් ඇතිවීම පිළිබඳව තත්වයද, එම සමාජ රටාවේ විශේෂ ලක්‍ෂණයකි. වයස, දේශපාලනය, කුලය, අධ්‍යාපනය අනුව මෙන්ම වැඩිහිටි- තරුණ තත්වය අනුවද සමාජ ව්‍යුහයේ විවිධ කණ්ඩායම් ඇතිවිනි.

සමාජ රටාව තුල අතිශයින් වැදගත් වනුයේ නායකත්වය පිළිබඳ ප්‍රශ්නයයි. මෙතෙක් කර තිබෙන සමීක්‍ෂණ අනුව පුරාන ගම්වල නායකත්වය පොදුවේ කොටස් හතරකට බෙදීමට පිළිවන. ඇතැම්විට කුලය මෙන්ම වැඩිහිටි කම අනුවද නායකත්වයක් බිහිවේ. එසේම සමාජය තුල කලින් දරන ලද හෝ දැනට දරන තනතුරක් අනුව නිලබල නායකත්වයක් පවරා ගන්නෝද වෙති. තවත් ස්වරූපයක නායකත්වයක් වනුයේ විවිධ කරුණු සඳහා උපදෙස් දීම සම්බන්ධයෙන් ඇතිකර ගනු ලබන නායකත්වයයි. එසේම ආගමික කරුණු අතින් හා දේශපාලනය අනුව නායකත්වයක් ලබන්නෝද වෙත්.

පොදුජනතාව වෙත සැපයෙන සේවාවන් බොහෝවිට ඔවුන් වෙත ලැබෙනුයේ මෙම මතුපිටින් පෙනෙන නායකයන් මගිනි. මෙහිදී සිදුවන අසාධාරණයක් නම් මෙවැනි නායකත්වයක් මගින් බොහෝවිට එකී සේවාවන් එවැනි නායකයන්ගේ අනුගාමිකයන්ට පමනක් ලැබීමයි. නොයෙකුත් සමීක්‍ෂණ වලින් හෙළි දරව්ව ඇත්තේ මෙවැනි නායකයෝ බොහෝ දෙනෙක් සිය බලය වඩාත් තහවුරු කර ගැනීමේ පරමාර්ථය ඇතිව පොදු ජනතාවට ලැබිය යුතු සේවාවන් තමන් හට මෙන්ම තමන්ගේ අනුගාමිකයන්ට ලබා ගැනීමට කටයුතු සලසන බවයි. මෙහිදී පවතින තවත් අවාසනාවන්ත තත්වයක් නම් බොහෝ අවස්ථා වලදී ව්‍යාප්ති සේවාවේ නියුතු වූවන් සිය සම්බන්ධතාවයක් කෙලින්ම ජනතාව වෙත නොව මෙවැනි පුද්ගලයන් සමග ඇති කර ගැනීමයි.

එහෙත් මතුපිටින් පෙනෙන මෙම නායකත්වයට වඩා විධිමත් අභ්‍යන්තර යථාර්ථ නායකත්වයක් බොහෝවිට මෙවැනි ගම්වල තිබෙන්නේය. මෙම නායකත්වය පණගැන්වීමෙන් මෙකී ගම්වල පවතින සමාජ වෙනස් කම් හා ගැටීම් ඉවත් කළ හැකිවිය යුතුය. රාජ්‍ය සේවාවන් බොහෝවිට අතලොස්සකට පමණක් හිමිවීමට හේතුවූයේ එවැනි සේවාවන් නියම නායකත්වයක් මගින් ජනතාවට ලැබෙන්නට නොසැලැස්වීමය.

# රජය අත දෙන ගොවි ව්‍යාපාර

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි ඩී. ද එස්. රත්නවීර මහතා විසිනි.

රජය මැදිහත් වී ආධාර ලබා දීමෙන් මෑතදී ආරම්භ කරන ලද ගොවි ව්‍යාපාර වර්ග කිහිපයක් ඇත:

1. තරුණ ව්‍යාපාර
2. සමූපකාර ගම්මාන
3. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවි ව්‍යාපාර
4. සමූපකාර සාමූහික ජනාවාස
5. ජාතික තරුණ සේවා සභාවේ ගොවි ව්‍යාපාර

## තරුණ ව්‍යාපාර:

තරුණ ව්‍යාපාර 1965 ආරම්භ කොට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලැබේ. මධ්‍යම මට්ටමේ පරිපාලන කටයුතු එම දෙපාර්තමේන්තුවෙන් ඉටු කළද දිස්ත්‍රික්ක මට්ටමේ දිසාපති වරුන් සහ අනෙකුත් නිලධාරීන් මගින් තරුණ ව්‍යාපාර පාලනය වේ. තරුණ ව්‍යාපාරවල අරමුණු අතර පහත සඳහන් දැඹූලික වශයෙන් සඳහන් කළ හැකිය.

I. උගත් තරුණයන් කෘෂිකර්මීය තුලින් ආර්ථික ජන ජීවිතයට එක් කර ගැනීම. මේ අවධියේදී පාසැල් අධ්‍යාපනය ලත් තරුණ තරුණියන් රජයේ හෝ පෞද්ගලික ආයතනයක ලිපිකාර වෘත්තිය වැනි රැකියාවන් බලාපොරොත්තු වීම එවකට පැවති තත්වය වූ අතර එසේ තවදුර රැකියා සැපයීම ගැටළුවක් විය.

II. වගා නොකළ බිම් දියුණු කොට ජාතික නිපැයුම වැඩි කර ගැනීම අවශ්‍ය විය. ජනගහණය සීඝ්‍රයෙන් වැඩි වන අතර ජාතික නිෂ්පාදනයේ වැඩි වීම රට සෑහෙන ප්‍රමාණයක් ඉහලින් පවත්වා ගැනීම අවශ්‍ය විය.

III. පිට රටින් ගෙන්වන ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වාර්ෂික විදේශ විනිමය ඉපැයීමෙන් අඩක් පමණ වැය වීම ගැටළුවක් විය. දේශීය වශයෙන් තව තවත් ආහාර ද්‍රව්‍ය ඉපැයීමත් සම්ප්‍රදායික නොවූ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීමත් අවශ්‍ය විය.

රජය මැදිහත් වීමෙන් මුල් අවධියේ ආරම්භ කරන ලද ගොවි ජනපද ව්‍යාපාරවලට මෙම තරුණ ව්‍යාපාර තරමක් දුර සම්බන්ධකම් තිබේ. ඉඩම් කට්ටි තනි පුද්ගලයන්ගේ පාලනය, වගාව හා අයිතිය යටතට පත් කළ අතර රජය මගින් එක තරුණයෙක් වෙනුවෙන් රු. 8000/- ක් පමණ බොහෝවිට තරුණ ව්‍යාපාරවල දී වැය කරන ලදී. එහෙත් ගොවි ජනපද ව්‍යාපාරවලට වැය කළ අන්දමින් විශාල මුදලක් එක් එක් කට්ටි කරුවෙකු වෙනුවෙන් මෙම ව්‍යාපාරවල දී වැය කළේ නැත. ව්‍යාපාරවල ආරම්භක කටයුතු කැලෑ එළි කිරීම්, පිළිස්සීම් වැනි කටයුතු සාමූහික පදනමක් මත කිරීමෙන් ව්‍යාපාරයේ තරුණ පිරිස අතර සුහද සමාජමය වාතාවරණයක් ඇති කරන්නට යත්න දරන ලදී. මෙම ව්‍යාපාරවල සාමාජික තරුණ පිරිස රිසි වගාවන් දියුණු කිරීමට අවකාශ නොතිබූ

අතර පස, දේශගුණය හා භූමි ලක්ෂණයන්ට ගැලපෙන අන්දමේ බෝග රටාවක් නිලධාරීන් විසින් තීරණය කොට සම්මත කර ගන්නා ලදී. ගොවි ජනපද ව්‍යාපාරවල ජනපදිකයින් රජයේ නිලධාරීන්ගේ පාලනය හා වගකීම සහ ආධාර දිගින් දිගටම බලාපොරොත්තු වීම නිසා ප්‍රශ්න උද්ගත විය. තරුණ ව්‍යාපාර පාලනයේදී එහෙයින් නිලධාරීන්ට ගැති බවින් මිදී ස්වයං පාලනයක් කරා යොමු කිරීමට උත්සාහයක් ගන්නා ලදී. අරමුණු කරන ලදී.

දැනට ශ්‍රී ලංකාවේ මෙවැනි තරුණ ව්‍යාපාර 44 ක් පමණ ඇත. මෙම ව්‍යාපාර තුලින් අක්කර දොළොස් දාහක් පමණ බිම් පෙදෙසක් දියුණු කෙරෙන අතර 3900 ක පමණ තරුණ පුද්ගලයන්ට ගොවිතැන ජීවන මාර්ගය කර ගැනීමට ඉඩ ලබා දී ඇත. මෙම ව්‍යාපාරය පරිපාලනය සඳහා රජයේ නිලධාරීන් 100 කට වැඩි ගණනක් සම්බන්ධව සිටිති.

ගැටළු:

තරුණ ව්‍යාපාර ආරම්භයේදී ඉඩම් සංවර්ධන කටයුතු සාමූහිකව ආරම්භ කරන ලදී. ආරම්භ කොට දින 600 ක් දක්වා දවසකට එක තරුණයෙකුට රු. 2.00 ක යැපීම් දීමනාවක් දෙන ලදී. මේ ඉඩම්වල භූමියට, දේශගුණයට සරිලන අයුරු විවිධ භෝග වගා වගාවට කටයුතු යොදන ලදී. මෙම ව්‍යාපාරවල පාරවල්, ගොඩනැගිලි ආදිය තැනීම සඳහා ද සංවර්ධන කටයුතු සඳහා තරුණ ශ්‍රමය සංවිධානාත්මකව යොමු කිරීම හා පාලනය සඳහා ද රජයේ නිලධාරීන් යොදවන ලදී. තරුණයින් කණ්ඩායම් අතර ගැටළු ඇති වීමත්, ව්‍යාපාරයේ තරුණයින් සහ අවට ගම්වාසීන් අත අරගල හට ගැනීමත්, තරුණයින් හා නිලධාරීන් අත ගැටළු හා සමහරවිට විරුද්ධත්වයන් පැන නැගීමත් සමහර තරුණයින් නොයෙක් හේතූන් නිසා ව්‍යාපාර අතහැර යාමත්, වගා කරන භෝගවලට අදාළ ප්‍රශ්න මතු වීමත්, ප්‍රවාහන කටයුතු හා අලෙවිය පිළිබඳ ගැටළු උද්ගත වීමත් ආදී විවිධ බාධා මධ්‍යයේ මෙම ව්‍යාපාරය දියුණු කරන ලදී.

සමූපකාර ගම්මාන:

සමූපකාර ගම්මාන 1971 දී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී. සමූපකාර ගම්මාන අරමුණු අතර පහත සඳහන් දෑ මූලික වශයෙන් සඳහන් කළ හැකිය.

I. ග්‍රාමීය තරුණ තරුණියන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමට යම් ප්‍රමාණයකින් හවුල් වීම;

II. කෘෂිකර්මය සඳහා බඳවා ගන්නා තරුණ පිරිස එම ව්‍යාපාරවල තවදුරටත් තබා ගැනීම සඳහා ආධාරයක් ආර්ථික කටයුතු තුලින් ඇති කිරීම;

III. ආහාර ආනයනය සඳහා වාර්ෂිකව වැය කරන විදේශ විනිමය ප්‍රමාණය අඩු කිරීම සඳහා දේශීය ආහාර නිෂ්පාදන ප්‍රමාණය වැඩි කර ගැනීම;

IV. ගොවිකටයුතුවලට රජය මගින් තවදුරටත් ආධාර කරන නමුත් ගොවිපලවලට කරන වියදම් හැකි පිරිමැස්මෙන් අඩු මට්ටමකින් කිරීම.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ දැනට සමූපකාර ගම්මාන 50 කට වැඩි ගණනක් ආරම්භ කොට පවත්වාගෙන යනු ලැබේ. මෙම ගම්මානවල 6000 කට වැඩි තරුණ පිරිසකට කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට ඉඩ කඩ සැලැස්වෙනු ඇත. එමගින් අක්කර 15,000 ක පමණ බිම් ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට කටයුතු කරගෙන යයි.

## ප්‍රාදේශීය සංවර්ධන කමිටු ගොවි ව්‍යාපාර :

1971 දී සමූපකාර ගම්මාන ව්‍යාපාර අක්කර සියයකට වැඩි බිම්වල ආරම්භ කිරීමට රජය පියවර ගත් අතර එම අවුරුද්දේම රට කුඩා ඉඩම්වල ප්‍රාදේශීය සංවර්ධන කමිටු ගොවි ව්‍යාපාර ද අරඹන ලදී. මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට ද අරමුණු නොහොත් මූලික හේතු වූයේ සමූපකාර ගම්මාන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හේතුමය. සුළු වියදමකින් කුඩා ව්‍යාපාර ලංකාවේ විවිධ ප්‍රදේශවල පුළුල් අන්දමින් ආරම්භ කිරීමට මෙම ක්‍රමය නිසා හැකියාවක් ලැබින. මේ අතරම දිස්ත්‍රික්කවල ඇති කරන ලද දිස්ත්‍රික් සංවර්ධන කමිටු සංවිධාන මගින් මහජන මැදිහත් වීම් තුලින් ආර්ථික සංවර්ධනයට සැලසුම් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමට මෙම ව්‍යාපාර ඉවහල් විය. ගොවිකටයුතු මෙන්ම සත්ව පාලන කටයුතු ද මෙමගින් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාර පාලනය බොහෝවිට ප්‍රාථමික සමූපකාර සමිති මගින් කෙරින.

මෙවැනි ගොවි ව්‍යාපාර 500 ක් පමණ ආරම්භ කොට ඇති අතර අක්කර 11,000 ක් පමණ මෙම ව්‍යාපාරය යටතේ සංවර්ධනය කිරීමට පියවර ගැනේ. මෙම ගොවි ව්‍යාපාර මගින් 11,000 ක් පමණ පුද්ගලයින්ට රැකිරක්ෂා සපයා ඇති බව පෙනේ. සමහර ව්‍යාපාර හොඳින් ක්‍රියාත්මක වන අතර නොයෙකුත් හේතූන් නිසා තවත් සමහර ව්‍යාපාර අඩ පන වී ඇත.

## සමූපකාර සාමූහික ජනාවාස :

1972 අගෝස්තු මස සම්මත කර ගන්නා ලද ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව අක්කර ලක්ෂ 5 ක් පමණ ඉඩම් රජයට භාර වෙන බව පෙනේ. මෙම ඉඩම් වලින් විශාල ප්‍රමාණයක් වගා කළ ඉඩම්ය. තේ, රබර්, පොල්, වී හා කොකෝවා වැනි වගාවන් මේවායේ ඇත. මෙම ඉඩම් අතුරෙන් අක්කර 8000 ක පමණ ප්‍රමාණයක් දැනට සමූපකාර සාමූහික ජනාවාස ක්‍රමය යටතේ සංවර්ධනය කරගෙන යනු ලැබේ. අප මෙහිදී සාකච්ඡා කළ අනෙකුත් ගොවි ව්‍යාපාරවලට වඩා සැහෙන වෙනස්කම් මෙම ජනාවාසවල ඇත. මෙම ඉඩම් වලින් වැඩි කොටසක් රජයට ලබා ගන්නා අවධියෙහි ඉහතින් සඳහන් කළ අයුරු තේ, පොල්, රබර් හා වෙනත් වගාවන්ගෙන් යුත් ඉඩම්ය. අඩු ගණනේ බොහෝ ඉඩම්වල එක් කොටසකවත් මෙවැනි වගාවන් ඇති තත්වයක් පැවතින. මෙම ඉඩම් උපරිම ඵලදාව ලැබිය හැකි අන්දමින් සංවර්ධනය කිරීමේ කාර්ය භාරය මෙම ජනාවාසවල තරුණ පිරිසට පැවරී ඇත.

මෙවැනි ගොවි ව්‍යාපාර 25 කට වැඩි ප්‍රමාණයක් 1974 මැද භාගය වන විට ආරම්භ කොට පවත්වාගෙන යන ලදී. මෙමගින් ඉඩම් ප්‍රතිසංස්කරණ නීති යටතේ රජයට පැවරෙන එම ඉඩම්වල එවකට කටයුතු කරගෙන ගිය පිරිස් ඇතුළුව විශාල පිරිසකට රැකී රක්ෂා පහසුකම් සැපයේ.

## ජාතික තරුණ සේවා සභාවේ ගොවි ව්‍යාපාර :

1967 ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත මගින් සංස්ථාපිත මෙම සභාව විසින් තරුණයන් මැදිහත් කොට ගෙන අක්කර 2000 ක පමණ බිමක් සංවර්ධනය කිරීම සඳහා දැනට වැඩ කටයුතු අරඹා ඇත. උඩ වළවේ ආරම්භ කොට ඇති මෙම ව්‍යාපාර යටතේ දැනට තරුණයන් 250 ක් පමණ මගින් සේවය කරන අක්කර 500 ක පමණ ව්‍යාපාරයක් ඇත. මෙයද සමූපකාර පදනමක් මත ආරම්භ කොට පාලනය කරගෙන යන අතර මුල් අවධියේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සම්පත් ජාතික තරුණ සේවා සභාව මගින් වැය කරනු ලැබේ. මූලික කෘෂිකාර්මික යෙදවුම් සහ

උපදේශ ගණා නිමින භූමි සංවර්ධන මණ්ඩලය මගින් සපයනු ලැබේ. මෙම ව්‍යාපාරයේ විශේෂත්වයක් නම් එයට සහභාගී වන තරුණ පිරිස හැම දෙනාම ගොවිපලේ පදිංචි වී කටයුතු කිරීමය.

<u>වගකීම</u> :

මෙවැනි විවිධ ගොවි ව්‍යාපාර ආරම්භ කොට පවත්වාගෙන යාමෙන් රටේ ආර්ථික සංවර්ධනයේ වේගය වැඩි කිරීමත්, රැකී රක්ෂා සැපයීම වැඩි කිරීමත් මෙන්ම තරුණ පිරිස් විසින් පාලනය කරගෙන යන එහෙත් ස්වයං පාලනය ඇති කාර්යක්ෂම ගොවි ව්‍යාපාර බිහි කිරීම වැදගත් අරමුණු ලෙස සැලකිය හැකිය. මෙම ගොවි ව්‍යාපාරවල ඇති වන ජන සමාජය පිබිදුනු සමගි සම්පන්න ජන සමාජයක් ලෙස ගොඩ නැඟීමේ වගකීම ඒවා පරිපාලනය කරන අය වෙත පැවරේ. තරුණ පිරිස් සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ගේ පුහුණුව, මැදිහත් වීම හා ඔවුන්ගේ අදහස්වලට ඉඩ දීමට හැකි පමණ උනන්දු වීම මේවා පාලනය කරන නිලධාරීන්ගේ යුතුකම වන්නේය. නිලධාරී පාලනය මගින් ව්‍යාපාර දියුණු කිරීමට උත්සාහ කරනවා වෙනුවට තරුණ **සහයෝගය සහ ස්වයං** පාලනය තුලින් මේවා දියුණුව තරා යොමු කිරීමට උත්සාහ ගන්නේ නම් මැනවි.

---

# ව්‍යාප්ති සේවාවන්හි ගැටළු හා හැකියාවන්

දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි පී.එස්.ඩබ්.සී.විජේවර්ණසූරිය
මහතා විසිනි.

ව්‍යාප්ති සේවාවන් පිළිබඳව පුළුල් අත්දැකීමක් මා ලද අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති සේවා ගැටළු හා හැකියාවන් පිළිබඳව සඳහන් කරනු කැමැත්තෙමි. අනුරාධපුර දිස්ත්‍රික්කය පුළුල් අයුරින් මහවැලි යෝජනා ක්‍රමයේ ප්‍රතිපල ලබන පෙදෙසකි. මෙම පෙදෙසෙහි ගොවි මහතුන් සිය ගොවිතැන් කටයුතු අතීතයේදී වැව් ජලය ආශ්‍රිතව කරන ලද අතර වර්තමානයෙහි වැව් ආශ්‍රිත වාරිමාර්ග ක්‍රම මගින් ඔවුන් වෙත ජලය සපයනු ලැබේ. වර්තමාන වාරිමාර්ග ක්‍රමය අතීත ක්‍රමයට වඩා වෙනස් වනුයේ එය මහ කන්නයේ පුළුල් අයුරින් ගොවිතැන් කිරිම සඳහා සීමාවීමය. අතීතයේදී වැව්වල ජලය රැස් කරන ලද්දේ යල කන්නයේදීත් භාවිතයට ගැනීමේ අදහස ද ඇතිවය.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි දළ වගයෙන් අක්කර ලක්ෂ දෙකක් පමණ වන ඉඩම් වලින් අක්කර 65,000/70,000 ක් පමණ විශාල වාරිමාර්ග ක්‍රම යටතේද, අක්කර 40,000/50,000 ක් පමණ සුළු වාරිමාර්ග ක්‍රම යටතේ ද වගා කරනු ලැබේ. වාරිමාර්ග ජලය නොමැතිව අක්කර 30,000 ක පමණ ගොඩ ගොවිතැන් කරනු ලැබෙන අතර වැඩි හරියක් මිරිස්ද, සෑහෙන ප්‍රමාණයකට වෙනත් භෝගද වවනු ලැබේ. දැනට මෙම දිස්ත්‍රික්කයේ ජනගහනය ලක්ෂ තුනහමාරක් පමණ වන අතර විශාල වැව් 19 ක් පමණ ජල සම්පාදනය සඳහා උපයෝගී කෙරේ. බොහෝයෙයින් අඩු වර්ෂාපතනයක් ඇති වියළි ප්‍රදේශයක් වන මෙම දිස්ත්‍රික්කයෙහි සාමාන්‍යයෙන් ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා කාලයෙහි සෑහෙන වර්ෂාපතනයක් ලැබෙන අතර හේන් ගොවිතැන සඳහා විශේෂයෙන් මෙම වැසි ජලය උපයෝගී කර ගනු ලැබේ.

ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ නිලධාරියෙක් හැටියට මෙම දිස්ත්‍රික්කයෙහි සේවය කරද්දී ක්‍රමානුකූලව කන්න රැස්වීම් පවත්වා, ගොවිතැන් කටයුතු සංවිධානය කිරීමට ප්‍රයත්නයක් දරන ලදී. එවකට ඔක්තෝම්බර් මස ලැබෙන වර්ෂාවෙන් ගොවිතැන් කටයුතු සඳහා ප්‍රයෝජනයක් ගැනීමට උත්සාහ කර නොතිබී අතර පදවිය වැනි විශාල වාරිමාර්ග ව්‍යාපාරයකට අයත් වන පෙදෙසෙහි ගොවීන් පවා එක කන්නයකට වැඩියෙන් වගා කිරීමේ ප්‍රයත්නයක නොයෙදී තිබුණි. අහස් දිය ප්‍රයෝජනයට ගෙන කැකුලන් ගොවිතැන් කිරීමට ම විසින් යෝජනා කරන ලද අතර මුල් අවස්ථාවෙහිදී මෙය කළ හැකි යැයි ගොවීන් අතර විශ්වාසයක් නොවීය. මෙම කාර්යය ඉටු කර ගැනීමෙහි ලා නොයෙකුත් විරෝධතාවයන් හා බාධා මතු වුවත් කාර්යශීලී අයුරින් මෙන්ම නිහතමානිව මෙම ක්‍රියා මාර්ගයෙහි වැඩදායක බව ගොවීන් හට අවබෝධ කර දීමෙන් පසුව සාර්ථක ප්‍රතිපල ගෙන දෙන අයුරින් එය ක්‍රියාත්මක කළ හැකි විණි.

ව්‍යාප්ති සේවයෙහි ඇති ගැටළු පිළිබඳව සලකන කල විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ගොවි ජනතාව නොයෙක් කරුණු මැනවින් අවබෝධ කරගෙන නොසිටි බවයි. ජලය, ආර්ථිකමය වටිනාකමක් ඇති සැපයුමක් ලෙස ඔවුන් වටහාගෙන නොතිබීණ. ජලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව හොඳ අවබෝධයක් ඔවුනට ලබා දීම ව්‍යාප්ති සේවකයින්ගේ වගකීමකි. ජලය අපතේ නොයන පරිදි පිළිවෙලට නියර මඩ තැබීම වැනි කාර්යයක් පවා ඇතැම් ගොවීන් හට තේරුම් කර දීමට සිදු විණි.

අනුරාධපුරය වැනි විශාල වශයෙන් වී වගා කරන දිස්ත්‍රික්කයක කන්න රැස්වීම් පවත්වා නියමිත වේලාවට ගොවිතැන් කටයුතු සංවිධානය කිරීම අතිශයින් වැදගත්ය. එසේ නුවුවහොත් වැට, කඩොලු බැඳීම ආදී අවශ්‍යතාවන්-සපුරාගත නොහැක. ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය බලය, විශේෂයෙන් සත්ව බලය අනුරාධපුරයේ සෑහෙන ප්‍රමාණයකින් තිබෙන නිසා එම බලය යෙදවීමට ගොවීන් උනන්දු කරවිය යුතුය.

කෘෂිකාර්මික සංවර්ධනය හා අදාළ වන රජයේ දෙපාර්තමේන්තු ගණනාවක් ඇත. කෘෂිකර්ම, සමුපකාර, වාරිමාර්ග ආදී වශයෙනි. මේ සෑම ආයතන අතරම අදහස් පිළිබඳ සම්බන්ධීකරණයක් තිබිය යුතුය.

ව්‍යාප්ති සේවකයින්ගේ රාජකාරී කටයුතු සඳහා ඔවුනට පහසුකම් තිබිය යුතුවාක් මෙන්ම ඔවුන්ගෙන් ගොවීන් වෙත නිසියාකාර නිවැරදි උපදෙස් ලැබිය යුතුය. ගොවි~~පළ පා~~ලනය මැනවින් දියුණු කර ගැනීමට ගොවීන් හට උපදෙස් දීමෙන් වෙනත් අංශ වලින් සිදු වන පාඩු පිරිමසා ගත හැක. යල කන්නයේදී වෙනත් භෝග වගා කරවීමට උනන්දුවක් කළ යුතු වේ. විශේෂයෙන් කෙටිකාලීන භෝග වගාව සත්ව පාලනය ද සමග කරනු ලැබේ නම් එම භෝග සඳහා අවශ්‍ය පෝර ප්‍රමාණයක් ද ලබා ගැනීමට පිළිවන.

## කෘෂිකාර්මික විවිධාංගකරණය

කෘෂිකර්ම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ලෙස්ලි ශේරත් මහතා විසිනි.

කෘෂිකාර්මික අංශයෙහි විවිධාංගකරණය සඳහා වූ අවශ්‍යතාවය දැන් තියුණු ලෙස දැනෙයි. එක් දහස් නවසිය පණස් ගණන්වල මුල් භාගයේදී, එවකට සිටි සැළසුම් කරුවන් තීරණය කළේ අනෙකුත් සංවර්ධන ක්‍රියාවලියන් සඳහා පදනම ආහාර අතින් ස්වයංපෝෂිත වීම බවයි. ආහාර යනුවෙන් මෙහිදී සඳහන් කරන ලද්දේ සහල් පිළිබඳවය. යෝජිත උපාය මාර්ගයෙහි මූලික වරදක් වූයේ මෙය බව පෞද්ගලිකව සලකමි.

මෙපරිද්දෙන් සහල් අතින් ස්වයංපෝෂිත වීමට තීරණය කර, මුදල්, මිනිස් සම්පත් සහ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක්, එම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා යොදවන ලදී. පසුගිය දශක දෙක තුළ සිදු කරන ලද මෙම විශාල ආයෝජනය නිසා වී වැවීම පිළිබඳව දිවයිනෙහි අද පවතින ශිල්පීය දැනුම ආසියානු කලාපයේ මෙම අංශයෙන් ලද හොඳම ශිල්පීය දැනුමක් බව ලොව පිළිගත් අය විශ්වාස කරති. එහෙත් සෑම පුරවැසියෙකුටම සතියකට හාල් සේරු දෙක බැගින් දීමට තරම්වත් සහල් අතින් ස්වයංපෝෂිත බව තවම ලබා නැත.

තවර වූ, හෝ සාර්ථක කෘෂිකාර්මික ව්‍යාපාරයක් සඳහා කෘෂිකර්මීය පිළිබඳ ඉතාමත් වැදගත් සාධක දෙකක් වන, ශිල්පීය ඥානය සහ කෘෂිකර්මීය මෙහෙයවන පරිසරය ආශ්‍රිත තත්වයන් පිළිබඳව හොඳින් දැනගෙන සිටීම ඉතාමත් වැදගත්ය. ශිල්පීය ඥානය යනුවෙන් අදහස් **කෙරෙනුයේ**, පෝර යෙදීම පිළිබඳ ප්‍රමාණවත් පර්යේෂණ තොරතුරු, සුදුසු කෘමි නාශක හා වල් මර්දන බෙහෙත් ද්‍රව්‍ය, සුදුසු බීජ වර්ග ආදිය ගැන දැනගෙන සිටීමයි. භූමි පරිහරණ රටාව පිළිබඳව දැනගෙන සිටීම, කාලගුණ විද්‍යාව, කෘෂිකාර්මික කාර්යයෙහි නියැලි පුද්ගලයින්ගේ සමාජ-ආර්ථික තත්වයන්, ඔවුන්ගේ පිළිවෙත් සහ සිරිත් විරිත් ආදිය පරිසරය ආශ්‍රිත සාධකවලට ඇතුළත් වේ. ශිල්පීය ඥානය පිළිබඳව හොඳින් දැනගෙන සිටියද පරිසරය ආශ්‍රිත තත්වය පිළිබඳ අපගේ අවබෝධය ප්‍රමාණවත් නුවූයේ යැයි සඳහන් කිරීම නිවැරදි යයි සිතමි. ශිල්පීය කරුණු පිළිබඳ අවබෝධය නිසා පරිසරය ආශ්‍රිත කරුණු මැඩගෙන ගොඩ වී වගා කළ හැකි යයි කල්පනා කරන ලදී. අපගේ කෘෂිකර්මීය ප්‍රධාන වශයෙන් භෝග අවතීර්ණ ක්‍රමයක් වේ. වී පැලයක ක්‍රියාකාරීත්වය සලකා බලමු. විශේෂයෙන් සම්ප්‍රදායික වශයෙන් වගා කරන කළ වී සඳහා ඉතා විශාල ප්‍රමාණයක් ජලය අවශ්‍ය වේ. අක්කරයක් සඳහා වූ ජල ප්‍රමාණය, පසෙහි තත්වය සහ ගොවිපළ පාලන ක්‍රම අනුව අක්කර අඩි 5 සිට 15 දක්වා වෙනස් වේ. මෙතෙක් අස්වැද්දන ලද ඉඩම් අක්කර දශ ලක්ෂ 1.5 ක්, මහ කන්නය සම්පූර්ණයෙන් වගා කිරීම සඳහා ජලය සැපයීම තහවුරුව ලැබෙනුයේ අක්කර 450,000 කට පමණකි. මෙම ප්‍රමාණයෙන් 30%ක් පමණක් යල කන්නයේ වගා කෙරේ. උස්සාන වාරි ජලය සපයා ගත නොහැකි සෑහෙන ඉඩම් ප්‍රමාණයක් මෙම කුඹුරු අසල තිබුනද ඇතැම්විට මේවායේ කිසිවක් වගා කරනු නොලැබේ. එසේ නැතහොත් අවම යෙදවුම් සහිතව ඇතැම් භෝගයක් වගා කෙරේ. මෙවැනි භෝග පිළිබඳ ශිල්පීය දැනුම අතිශයින් අඩුය. මෙය ව්‍යාප්ති සේවකයින්ගේ සහ පර්යේෂණ නිලධාරීන්ගේ සැලකිල්ලට යොමු විය යුතු ක්ෂේත්‍රයකි.

ලෝකය පුරා බොහෝ කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි ධාන්‍ය මූලය එක් ධාන්‍යයකට වැඩි ගණනකින් සමන්විත වේ. (තිරිඟු සහ බඩ ඉරිඟු, තිරිඟු සහ බාර්ලි ආදී වශයෙනි) ශ්‍රී ලංකාවෙහි

අපගේ ධාන්‍ය මූලය වී පමණකි. කලින් සඳහන් කළ පරිදි වී වගාව සඳහා වැඩි ජලය ප්‍රමාණයක් අවශ්‍ය වන අතර වැසි නොලැබීමකින් හෝ වෙනත් කාරණයක් නිසා හෝ ජලය ලැබීම පමා වුවහොත් සමාජයීය වශයෙන් මෙන්ම දේශපාලනික වශයෙන් ද අයහපත් තත්වයක් උද්ගත වේ. එහෙයින්, භෝග පාළුවක් පිළිබඳ අනතුරින් මිදීම සඳහා යහපත් ක්‍රියා මාර්ගය ධාන්‍ය මූලය විවිධාංගකරණයකට යොමු කිරීමයි.

අපගේ කෘෂිකර්මයෙහි ධාන්‍ය මූලය විවිධාංගකරණයකට යොමු කිරීම යනුවෙන් අදහස් කෙරෙනුයේ, අපගේ ආහාරය ද විවිධාංගකරණයකට යොමු කිරීමයි. සංවර්ධිත සමාජයක ලක්ෂණයක් වනුයේ, විවිධ තත්වයක් සහිත දෛනික ආහාර වේලක් තිබීමකි. අර්ධ- සංවර්ධිත දේශයන්හී බොහෝවිට සමාජය ඒකීය ආහාර වේලකට සීමාව සිටී. ආසියානු ජාතිකයෙක් හට සාමාන්‍යයෙන් කැලරිස් 2,600 ක් පමණ අවශ්‍ය බව පෝෂණ විද්‍යාඥයෝ පවසත්. මෙම අවශ්‍යතාවය දැනට ශ්‍රී ලංකාවෙහි සිදු වන පරිදි ප්‍රධාන වශයෙන් සහල් වලින් සහ තිරිඟු වලින් පමණක් ලබා ගැනීම අවශ්‍ය නොවේ. අපගේ දේශගුණ තත්වයනට සරිලන වර්ගවල තිරිඟු වැවීම පිළිබඳ ශිල්ප ඥානය අපට තවම හොඳින් ලැබී නැති අතර සහල් සහ තිරිඟු මෙන්ම පෝෂ්‍ය දායක ඉදල් ඉරිඟු සහ බඩ ඉරිඟු ශ්‍රී ලංකාවෙහි බොහෝ ප්‍රදේශවල වගා කළ හැකි බව සැකයෙන් තොරව ඔප්පු වී ඇත. මෙම භෝග මුළුමනින්ම නව භෝගද නොවේ. මෙකී භෝග සඳහා අවශ්‍ය ජලය ප්‍රමාණය වී සඳහා අවශ්‍ය ප්‍රමාණයෙන් අඩක් පමණක් වන අතර ඉඩම් සඳහා වූ සමග තරඟයක ද නොයෙදේ. මෙයින් අදහස් කෙරෙනුයේ ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති අවුරුදුවලදී බඩ ඉරිඟු සහ ඉදල් ඉරිඟු වවා වැඩි අස්වැන්නක් ලබා ගැනීමට ඉඩ ඇති බවය. මේ අනුව ධාන්‍ය මූලය විවිධාංග කරණයකට යොමු කරවීමෙන්, සම්පූර්ණයෙන්ම භෝග පාළුවක් ඇති වීමේ බියෙන් මිදීමට පිළිවන.

---

# සමුපකාර ගම්මාන හා සමුපකාර ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා රාජ්‍ය වෙළඳ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ඩී.එම්.ඩී.මාරපන මහතා විසිනි.

සමූපකාරය යන වචනය පිළිබඳව වචනාර්ථයෙන් නිර්වචනයක් දීමේදී එකමුතුව වැඩ කිරීම යන අදහස ඉදිරිපත් කිරීමට පිළිවන. එහෙත් ප්‍රායෝගික වශයෙන් සමූපකාරය පිළිබඳව සළකන කල්හි ඊට වඩා පුළුල් වෙනස් ස්වරූපයක් ගනී. ඈත අතීතයේදී සමාජයීය රටාව තුළ එකමුතුව වැඩ කිරීම සඳහා නිරායාසයෙන්ම නොයෙකුත් ඒකක හෝ සංවිධාන ඇති වූයේය. බෙත්ම ක්‍රමය, පංගු ක්‍රමය, අත්තම් ක්‍රමය ආදී සමාජ සංවිධාන ඇති වූයේ බොහෝවිට ජනතාවගේ කාර්යයන් එකමුතුව පහසුවෙන් කරගෙන යාමේ පරමාර්ථයෙන් ඇතිවය. දැනට ප්‍රචලිතව පවතින සමූපකාර ව්‍යාපාරය කිසියම් නෛතික පදනමක් මත ගොඩ නන්වන ලද්දකි. සමාජ ධර්මතාවයන් අනුව සමාජයීය රටාවක අවශ්‍යතාවයන් පිරිමසා ගනු සඳහා නිතැතින් බිහිවූ එකමුතුව වැඩ කිරීම ආදී ක්‍රම වලින් බැහැරව සම්මත නීති රීති අනුකූලව පිහිටුවා ගත් සංවිධානයකි, සමූපකාර ව්‍යාපාරය. එය අවිධිමත් සංවිධානයක ප්‍රතිඵලයක් නොවේ. එක් අයෙකුගේ ශ්‍රමයෙන් වෙනත් අයෙක් යැපීමට ඉදිරිපත් වීම ඉවත් කිරීම, විවිධ සම්පත් එක සමානව භුක්ති විඳීම, සහභාගිත්වය අනුව ප්‍රතිධානයන් ලබා ගැනීම ආදී පරමාර්ථ පෙරදැරි කරගෙන බිහි කරන ලද සමූපකාර සංවිධාන ක්‍රමය ජාත්‍යන්තර තත්වයේ ව්‍යාපාරයකි.

සමානාත්මතාවය පදනම් කරගෙන මානව සමාජ ධර්මතාවයනට අනුරූප වන පරිදි සිය කැමැත්තෙන් එකමුතුවසාමාජිකයින්ගේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය දියුණු කිරීමේපරමාර්ථය අරබයා මෙම සංවිධානය කටයුතු කරයි. තනි තනිව වැඩ කිරීමේ ආකල්පය ඉවත් කර කිසියම් නිශ්චිත පරමාර්ථයක් සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් පිරිසක් එක්වන්ව කටයුතු කිරීම සමූපකාර සංවිධානයේ සාමාන්‍ය අදහස වන්නේය.

ජාත්‍යන්තර වශයෙන් පිළි ගත් සමූපකාර ප්‍රතිපත්ති මාලාවක් ඇත.

(1) විවෘත සාමාජිකත්වය –මෙයින් අදහස් කෙරෙනුයේ සමූපකාර මූඛ්‍ය පරමාර්ථයන් මුදුන් පමුනුවා ගැනීමේ හැකියාවක් ඇතැයි සැළකෙන ඕනෑම කෙනෙකුට සමූපකාර සංවිධානයක සාමාජිකත්වය ලබා ගැනීමට ඇති අයිතියයි.

(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය– සාමාජිකයින්ගේ අදහස් විමසීමක් අනුව, සංවිධානයේ දියුණුව උදෙසා බලපාන සෑම තීරණයක්ම පාහේ මහා සභාවේදී එළඹෙනු ලැබේ.

(3) කොටස් මුදලට සීමිත පොලියක් ගෙවීම– මෙය පුද්ගලික සමාගමක කොටස් ප්‍රමාණය අනුව ලාභ බෙදීමේ ක්‍රමයට ඉඳුරාම වෙනස් වන්නේය. සමූපකාර ව්‍යාපාරයෙහි කොටස් කරුවෙකුගේ කොටසකට ලැබෙනුයේ නියමිත පොලියක් පමණකි. අතිකුත් ලාභ වෙනත් ආකාරයකට බෙදී යන්නේය.

(4) සහභාගීත්වය අනුව ප්‍රතිධාන දීම – අතිරික්තිය බෙදී යනුයේ සාමාජිකයන් සහභාගී වන තත්වය අනුවය. මෙහිදී එක් එක් සාමාජිකයෙක් වැය කළ ශ්‍රමයට අනුව ලාභ බෙදා දෙනු ලැබේ.

(5) අධ්‍යාපනය දියුණු කිරීම – සාමාජිකයින් අතර දැනුම වැඩි කිරීම මෙනයින් අපේක්ෂා කෙරේ. ඇතැම් විටක සමුපකාර ගොවිපලක සාමාජිකයින් පිළිබඳව සළකන කල්හී නවීකරණ ක්‍රම ආදිය පිළිබඳව ශිල්පීය දැනුමක් ලබා දීම ද මෙනයින් සළකන්නට පුළුවන.

(6) සමුපකාර සමිති අතර සම්බන්ධතාවයක් ඇති කර ගැනීම – උසස් ජීවන ක්‍රමයකට ජනතාව හැඩ ගැස්වීමේ ව්‍යාපාරයක් හැටියට සමුපකාර ව්‍යාපාරය සළකන කල්හී එක් සමිතියක සුභ සාධනය ගැන පමණක් නොව අනෙක් සමුපකාර සමිති සමඟද ඇතැම්විට දේශීය මට්ටමෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමෙන් ද සම්බන්ධතාවයක් ඇති කර ගැනීමෙන් ව්‍යාපාරයේ උන්නතිය තකා කටයුතු කිරීම මෙනයින් අදහස් කෙරේ.

1895 දී ආරම්භ කරන ලද ජාත්‍යන්තර සමුපකාර සංවිධානය මගින් මෙම ප්‍රතිපත්ති නොයෙක් අවස්ථාවල අත්හදා බලා පිළි ගනු ලැබ ඇත. ඇතැම් විටක ජාත්‍යන්තර මට්ටමෙන් ව්‍යාපාරික සම්බන්ධතාවයන් ඇති කර ගැනීම සඳහා සමුපකාර සංවිධානය පදනමක් හැටියට උපයෝගී කර ගැනීමට පිළිවන.

ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති නොයෙකුත් සමුපකාර සංවිධාන පිළිබඳව සළකා බලන කල ඒවා එක් එක් අවශ්‍යතාවයනට අනුරූප වන පරිදි නන් වැදෑරුම් ආකාරයෙන් පිහිටුවා ඇති බව පෙනී යයි. ගොවිතැන් වැඩ කටයුතු දියුණු කිරීම උදෙසා විවිධ සමුපකාර සමිති ආරම්භ කර ඇත. සමුපකාර සේවා සමිති මෙනයින් පුමුඛස්ථානයක් ගනී. ගොවීන් වශයෙන් හෝ සාමාජිකයින් වශයෙන් හෝ තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේ පරමාර්ථය සඳහා සමුපකාර සේවා සමිති පිහිටුවා ගනු ලැබේ. විවිධ සේවා සමුපකාර සමිති ද මීට අනුරූපය. එවැන්නක් මගින් ඉටු කරනු ලබන පාරිභෝගික කටයුතුවලට අමතරව නොයෙකුත් සේවාවන් සැපයීමට ද එම සමිතිවලට භාර කිරීමට පිළිවන. එහෙත් මෙහිදී සාමූහිකව වැඩ කිරීමක් නොමැත.

තවත් මාදිලියක සමුපකාර සංවිධානයක් නම් සමුපකාර ඒකාබද්ධ ගොවිපලවල්ය. මේවායින් බොහෝවිට ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය සේවාවන් සපයා ගනු ලැබේ. ඇතැම්විට ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන පුද්ගලික කුඩා බිම් ඒකක ආර්ථිකමය ඒකකයන් හැටියට ඒකාබද්ධ කර එවැනි ඒකාබද්ධ ඉඩමක් සඳහා පොදු සැලසුම් ඇති කර ගැනීම මෙවැනි සමිතියක් මගින් කරනු ලැබේ. ලංකාවෙහි තරුණ ගොවි සමාජ මීට නිදසුන්

වශයෙන් දැක්විය හැක. ඉඩම් ප්‍රතිසංස්කරණ නීති රීති වලින් පසුව ඉන්දියාව, බල්ගේරියාව ආදී විදේශයන්හි ඒකාබද්ධ ගොවිපල ක්‍රමය බොහෝදුරට දියුණු වූයේය. සාමූහික ගොවිපල් ක්‍රමය කලින් සඳහන් කල ක්‍රම දෙකටම වෙනස් සමූපකාර සංවිධානයකි. මෙහි පුද්ගලික අයිතියට තැනක් නොලැබෙන අතර නිෂ්පාදන බිම පොදුවේ සමූපකාර සමිතියට අයත් වන්නේය. නිවහනක් ඉදි කර ගැනීම සඳහා කුඩා බිම් කැබැල්ලක් එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන් කර ගැනීමට පිළිවන. මෙහිදී සාමාජිකයෝ ශ්‍රම කාණ්ඩවලට බෙදී වැඩ කරත්. මෙවැනි සාමූහික ගොවිපල් ක්‍රමයක් සඳහා සාමාජිකයින් තෝරා ගැනීම ඉතාමත් සැලකිල්ලෙන් හා ප්‍රවේසමින් කළයුතු කාර්‍යයකි. පෞද්ගලික ආකල්පයන් බැහැර කර සාමූහිකව වැඩ කිරීමේ හැකියාවක් හා ලැදියාවක් ඇති අය මෙවැනි ව්‍යාපාරයක් සඳහා අනිවාර්‍යයෙන්ම අවශ්‍ය වන්නේය.

'කොමියුන්' නමින් හැඳින්වෙන ඒකකයද තවත් සමූපකාර සංවිධානයකි. මෙහිදීද නිෂ්පාදන භූමිය පුද්ගලයින් සතු නොවන අතර එය ඇතැම් විට පොදුවේ රජය සතු වන්නේය. මෙහි පවතින විශේෂත්වය නම් ජීවත් වීම පවා සමූපකාර ක්‍රමයටම ඉටු කිරීමයි. සේවා සැපයුම්, නිෂ්පාදන ආදී සියළුම කාර්‍යයන් සාමූහික ක්‍රමයට සිදු කරනු ලැබේ. ඊශ්‍රායලයේ 'කිබුට්ස්' මෙවැනි නිදසුනකි.

ශ්‍රී ලංකාවේ පවතින සාමූහික ජනාවාස සහ සමූපකාර ගම්මාන සාමූහික ගොවිපල ක්‍රමයට අයත් වේ. මේවායේ නිෂ්පාදන භූමිය රජය සතු වන අතර එය එකී ගම්මානයේ හෝ ව්‍යාපාරයේ පිහිටුවනු ලැබෙන සමූපකාර සමිතිය වෙත පවරනු ලබ ඇත. මෙවැනි ව්‍යාපාරයන් දියුණු කිරීමෙහි ලා කිසියම් රටක පවතින සාමාජික වාතාවරණය ද ආධාර කාරී වන්නේය. පෞද්ගලික අයිතිය කෙරෙහි ප්‍රවනතාවයක් දක්වන වාතාවරණයක සාමූහිකත්වය පිළිබඳ සංකල්පයන් දියුණු වීම කිසිසේත් සිදු නොවන්නකි.

මෙතෙක් පිහිටුවා ඇති තරුණ ජනාවාස ව්‍යාපාරයන්හි ඇතැම්විට දක්නට ලැබෙන දුබල තමක් නම් සාමූහිකව කටයුතු කිරීමෙහි ලා පවතින දුෂ්කරතාවයයි. එහෙයින් මෙවැනි සාමූහික ක්‍රියාමාර්ගයක් සඳහා තෝරා ගනු ලැබෙන තරුණ පිරිසට මුලදීම සාමූහිකත්වය පිළිබඳව මනා පරිචයක් ලබා දීම වැදගත් වන්නේය. එසේ නැතහොත් පෞද්ගලික අයිතිය පිළිබඳ හැඟීම් ඉස්මතු වන්නට ඉඩ ඇත. එකා මෙන් වැඩ කිරීමේ ආකල්පය ඔවුන්ගේ සිත් සතන් තුළ මැනවින් තහවුරු කිරීම අනිවාර්‍යයෙන්ම අවශ්‍ය දෙයකි.

සාමූහිකත්වය පිළිබඳ සංකල්පය ක්‍රියාත්මක වන ව්‍යාපාරයකදී සම්පූර්ණ පාලනය මුල සිටම සාමාජිකයින් වෙත පැවරීමෙන් ඇතැම්විට සංවිධානාත්මක දුෂ්කරතා ඇති වීමට පිළිවන.

ජනාවාස ව්‍යාපාර සැලසුමකදී එහි විවිධ කාර්‍යයන් සඳහා විවිධ මට්ටමේ ශිල්පීය අවබෝධයක් අවශ්‍යය. ඇතැම්විට මෙවැනි අවබෝධය සාමාජිකයින් හට මුල් අවස්ථාවේදී නොතිබෙන්නට පුළුවන. එහෙයින් ටික කලක් යන තෙක් ඔවුන්ට අත දීමක් වශයෙන් ඔවුන් වෙත මාර්ගෝපදේශකත්වය සැලසීම උදෙසා රජය තාවකාලිකව යම් යම් ක්‍රියා මාර්ග සලසයි. ව්‍යාපාර කළමනාකරුවෙකු වශයෙන් රජයේ නිලධාරියෙකු පත් කරනු ලැබෙනුයේ මෙම පරමාර්ථය යථාර්ථය සඳහාය. එවැන්නන් වුවද කටයුතු කළ යුත්තේ සාමාජිකයින්ගේ අදහස් උදහස් විමසීමෙන් එවැනි සාමාජිකයින් අතුරෙන් නායකත්වයක් බිහි වන පරිද්දෙනි.

තරුණ ජනාවාස ව්‍යාපාරයක ගිණුම් කටයුතු පිළිබඳව සලකන කල්හි එම ව්‍යාපාරයේ ගිණුම් කටයුතු පිළිබඳව මනා අවබෝධයක් පළමු අවස්ථාවකම සාමාජිකයින්ට ලබා දිය යුතුය. එසේම එම ගිණුම් කටයුතු නිරතුරුවම සාමාජිකයින්ගේ දැනීමට ලක් කළ යුතුය.

මෙවැනි ව්‍යාපාරයක සැලසුම් සැකසීමේදී සාමාජිකයින් නොසලකා හැරීම අතිශයින්ම අවධානයකය. ඇතැම්විට බොහෝ රටාව වැනි කාර්‍යයන්හිදී සාමාජිකයින් හට ශිල්පීය දැනුමක් නො තිබෙන්නට පිළිවන. එහෙත් මෙවැනි අවස්ථාවකද පවා ඔවුන්ගේ අදහස් විමසීමෙන් ව්‍යාපාරය කෙරෙහි සාමාජිකයන්ගේ චිත්ත සන්තානය තුළ කිසියම් ලැදියාවක් ජනිත කරවීමට පිළිවන.

මෙවැනි ව්‍යාපාරයක පිහිටුවා ඇති සමූපකාර සමිතිය එහි සාමාජිකයින්ගේ ශිල්පීය දැනුම පිළිබඳව මෙන්ම ඔවුන්ගේ සාමාජික, සංස්කෘතික තත්වයන් දියුණු කිරීම සඳහා ද කටයුතු කළයුතු වේ. කෘෂිකාර්මික ශිල්පීය නවීකරණය ආදිය පිළිබඳව අවබෝධයක් සාමාජිකයින්ට ලබා දීමට සමූපකාර සමිතිවලට කටයුතු කිරීමට පිළිවන. සාමාජිකයින්ගේ සංස්කෘතික පරිසරය දියුණු කිරීමේදී ඔවුන් හට ඔවුන්ගේ ආගමික දැනුම පුළුල් කර ගැනීම පිළිබඳ පහසුකම්, විනෝද ක්‍රීඩා පහසුකම් ආදිය ලබා දීමද අදහස් කෙරේ. මීටත් වඩා අවධාරනයෙන් සැළකිය යුතු වන්නේ එම ව්‍යාපාරය තුළ එකාවන්ව වැඩ කිරීමේ ආකල්පය ඔවුන් තුළ නොසැලෙන පරිද්දෙන් ඉපදවීමයි.

# තරුණ ගොවි ව්‍යාපාරවල අත්දැකීම්

සහකාර ඉඩම් කොමසාරිස් ආර්.එස්.ජයරත්න මහතා විසිනි.

ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජනාවාස යෝජනා ක්‍රම පොදුවේ තුන් වැදෑරුම් වශයෙන් විස්තර කිරීමට පුළුවන. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ගොවි ජනපද ව්‍යාපාර සහ තරුණ ගොවි ව්‍යාපාර, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද සමූපකාර ගම්මාන, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පිහිටුවා ඇති ජනාවාස යෝජනා ක්‍රම ආදී වශයෙනි. 1936 දී ආරම්භ කරන ලද ගොවි ජනපද ව්‍යාපාරයන්හී සම්ප්‍රදායික රටාව වෙනස් කර නව ආකල්ප සහිත වෙනත් ව්‍යාපාරයන් ආරම්භ කිරීමට අවශ්‍ය වූයේ මන්ද යන්න සළකා බැලිය යුතුය. අතීතයේදී ජනපද ව්‍යාපාර බොහෝ සෙයින් ආරම්භ කරන ලද්දේ වාරිමාර්ග ජලාශ්‍රිත ආශ්‍රයෙන් උතුරු මැද පලාතෙහිය. මේවා වැඩි වශයෙන් වී වගාව කෙරෙහි නැඹුරු වූ අතර එක්දහස් නවසිය පනස් ගණන් වලදී උස් බිම් ජනපද ව්‍යාපාර ද ඇති කරන ලදී. මෙය සිදු වූයේ ඉඩම් පිළිබඳව පැවති ඉල්ලුම හා සැපයුම අතර ඇති වූ විෂමතාවය හේතු කොටගෙනය. ජනපද ව්‍යාපාරවලදී බෙදා දෙන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය සීමිත වූ හෙයින් බොහෝවිට ගොවි ජනපද ව්‍යාපාරවල හෝ වේවා උස් බිම් ව්‍යාපාරවල හෝ වේවා තරුණයින් හට පුමුඛත්වයක් නො ලැබිනි.

එහෙත් සමූපකාර ගම්මාන ආදී නව තරුණ ව්‍යාපාරවලට සාමාජිකයින් තෝරා ගන්නා ලද්දේ සම්ප්‍රදායිකව පැවති ක්‍රමවලට ඉඳුරා වෙනස් ක්‍රියා මාර්ගයක් අනුවය. එක්දහස් නවසිය හැට ගණන් වන විට අධ්‍යාපනයේ ව්‍යාප්තිය හා සේවා වියුක්තිය ආදී ප්‍රශ්න නිසා තරුණයින් බොහෝ දෙනෙක් ගොවිතැනට සූදානම් වී සිටියහ. තරුණයින් හට සුදුසු පෙදෙස් වලින් ඉඩම් දී ඔවුන් සංවිධිත කාර්යයට සහභාගී කරවා ගැනීම 1935 සිට පවත්වාගෙන ආ ආර්ථික හා සාමාජික රටාවේ විකාශනයකි. ශ්‍රී ලංකාවේ ජනගහණය වාර්ෂිකව ශීඝ්‍රයෙන් වැඩි වන අතර වැඩි වන ජනගහණයට සරිලන පරිදි ඉඩම් ප්‍රමාණය කිසිසේත් වැඩි නොවේ. මෙවැනි තත්වයක් යටතේ කලින් මෙන් එක් පුද්ගලයෙකුට යම්කිසි ප්‍රමාණයක ඉඩම් ඒකකයක් ඉදිරියට ලබා දීමේ හැකියාව සැකයට භාජනය වන්නෙකි. එහෙයින් සීමිත ප්‍රදේශයක සියුම් අයුරින් හා විද්‍යානුකූලව සාමූහික ලෙස ගොවිතැන් කිරීමෙන් ඵලදායී තාවය වැඩි කර ගැනීමේ ශක්‍යතාවයන් පිළිබඳව සොයා බැලීමට සිදු විනි. පැරණි ගොවි ජනපද ව්‍යාපාර යටතේ වැඩි ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමට අපේක්ෂා කලත් සමූපකාර ගම්මාන වැනි සාමූහික තරුණ ජනාවාස යෝජනා ක්‍රමවලදී අදහස් කෙරෙනුයේ අඩු ඉඩම් ප්‍රමාණයකින් වැඩි ඵලදාවක් හා සේවා නියුක්ති අවස්ථාවක් ලබා ගැනීමයි.

1974 වන විට මෙතෙක් ලද අත්දැකීම් පසුතලයෙහි ලා කිසියම් දෘෂ්ටි කෝණයකින් තරුණ ගොවි ව්‍යාපාර පිළිබඳව සමාලෝචනයක යෙදීමට පුළුවන. මෙවැනි යෝජනා ක්‍රම පිළිබඳව බිහිව ඇති නව ආකල්පයනට අනුව දැන් සාමාජිකයින් වශයෙන් තෝරා ගනු ලැබෙනුයේ ඔහුගේ අධ්‍යාපනය, විද්‍යාත්මක ඥානය, කෘෂිකාර්මික පසු බිම ආදිය පිළිබඳව වැඩි සැළකිල්ලක් දක්වමිනි. කලින් ඇතැම් විට දුරස්තර දුෂ්කර ප්‍රදේශවල ගොවි ජනපද ව්‍යාපාර අරඹා ඒවාට පුද්ගලයින් යැවීමේදී අවිචාරාත්මකව ඔවුන් තෝරා ගැනීමක් සිදු විනි. එසේ සිදු වූයේ එවැනි

ප්‍රදේශයක ගොවිතැන් කටයුතු ආරම්භ කිරීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී ඇති වූ දුෂ්කර තාවයන් නිසාය.

කිසියම් රටක ආර්ථික හා සාමාජික ව්‍යුහය නිරතුරුවම වෙනස් වෙමින් පවතී. එවැනි රටාවක් තුළ ඇති වන අවශ්‍යතාවයනට සරිලන පරිදි යම් යම් සම්ප්‍රදායානුකූල ක්‍රියා මාර්ගයන් ද වෙනස් කළ යුතු වන්නේය. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ගොවි ජනපද ව්‍යාපාර ක්‍රමය පිළිබඳව 1961 දී නව ආකල්පයක් ඇති කළේ මෙම න්‍යාය අනුකූලවය. එබඳු නවසිය හැට ගණන්වලදී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ගොවි ව්‍යාපාරයන්හිදී ප්‍රමුඛත්වය දෙන ලද්දේ උද්‍යෝගිමත්, කායශීලී තරුණ පිරිසකටය. එවැනි තරුණ පිරිසක් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද කායශී පරිපාටිය යහපත් පරමාර්යක් ඇතිව යොදන ලද නමුත් අපේක්ෂිත සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී යම් යම් බාධක ඇති විනි.

දැන් ජනාවාස යෝජනා ක්‍රමවලට සාමාජිකයින් තෝරා ගැනීමේදී:

(1) සමූපකාර ක්‍රමයට ඇති කැමැත්ත;

(2) වයස් සීමාව;

(3) ගොවිතැන ජීවිකාව වශයෙන් තෝරා ගැනීමට ඇති කැමැත්ත සහ

(4) අධ්‍යාපනය

යන කරුණු කෙරෙහි දැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. සමූපකාර ක්‍රමයට ඇති කැමැත්ත යනුවෙන් මෙහිදී අදහස් කෙරෙනුයේ සාමූහිකව කිසියම් යෝජනා ක්‍රමයක් ප්‍රගතිය කරා යොමු කරවීමට දක්වන කැමැත්තයි. මෙවැනි ව්‍යාපාරයක සාමාජිකයින් අතර ආර්ථික, සාමාජික ආදි වශයෙන් විවිධ මට්ටමේ තරුණ පිරිසක් සිටිය හැකි අතර ඔවුන්ගේ ආකල්ප එක් අරමුණක් කරා යොමු කරවීම සංවිධානාත්මක වශයෙන් අසීරු වන්නට පිළිවන. දැනට ඇති කර ඇති තරුණ ගොවි ව්‍යාපාර පිළිබඳව ක්‍රමවත් විශ්ලේෂණයක් කළ හැක්කේ ඇතැම් විට තව ටික කලකින් පසුවය.

---

## ජනාවාස ව්‍යාපාරයක ගණන් තැබීමේ කටයුතු

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ඩී.ඩබ්.ප්‍රනාන්දු මහතා විසිනි.

කවර හෝ ව්‍යාපාරයක ගිණුම් කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම ඉතාමත් වැදගත් කාර්යයක් වේ. එම ගිණුම් කටයුතු පිළිවෙලින් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම පමණක් නොව එවැනි ක්‍රියා මාර්ගයකින් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලැබිය හැකි පරිදි ගිණුම් කටයුතු පවත්වාගෙන යා යුතු වන්නේය. සමුපකාර සමිති විවිධ ස්වභාවයෙන් පවතින අතර ඒවායේ ගිණුම් තැබීමේ කටයුතු ඉතාමත් සංකීර්ණ වන්නේය. එහෙත් සමුපකාර ගම්මානයක පිහිටුවනු ලබන සමිතියක ගිණුම් කටයුතු ඇත්ත වශයෙන්ම ලිහිල් විය යුතුය. සමුපකාර ගම්මානයක ගණන් තැබීමේ කටයුතු වැඩි වශයෙන් සම්මත ආකෘතියකට සීමා වී ඇත.

සමුපකාර ගම්මානයක සාමාජිකයින් විසින් ඉටු කරනු ලබන ක්‍රියා දාමයක් අනුව එනම්, ශ්‍රම භාවිතය, කෘෂිකාර්මික කටයුතු, නිෂ්පාදන කටයුතු ආදී වශයෙන් කරනු ලබන කාර්ය සමූහයකට අනුව මුදල් වැය කිරීම සම්බන්ධ වන අතර අවසානයේදී නිෂ්පාදන අලෙවියෙන් ප්‍රතිලාභ ලැබෙන්නේය. ආයෝජනයේ සිට ප්‍රතිලාභ ලබා ගැනීම තෙක් මුදල් වැය කිරීම පිළිබඳව සමුපකාර ගම්මානයක දක්නට ඇත්තේ ඉතාමත් ලිහිල් කාර්ය පරිපාටියකි. මෙවැනි ගම්මානයක ගණන් තැබීමේ කටයුතු සඳහා සම්මත ආකෘති පත්‍ර පිළියෙල කර ඇත්තේ ඉහත සඳහන් කළ කාර්ය සමූහය සඳහා වැය වන වියදම හා අවසානයේදී ලැබෙන ලාභ පිළිබඳ විස්තර ඉතාමත් පහසු අන්දමින් කැටි කර දැක්වීම සඳහාය. මුළු ගම්මානයේම ගිණුම් කටයුතු පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා ආකෘති පත්‍ර 11 ක් ඇත.

සමුපකාර ගම්මානයකට ආධාර මුදල්, කොටස් මුදල්, නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන මුදල් ආදී වශයෙන් නොයෙක් අන්දමින් මූල්‍ය ප්‍රතිලාභ ලැබේ. මෙසේ මුදලක් ලැබීමේදී ප්‍රථමයෙන්ම කළ යුතුව ඇත්තේ කුවිතාන්සියක් නිකුත් කිරීමයි. 51 යනුවෙන් ප්‍රථමයෙන් ඇත්තේ ලැබෙන මුදල් සඳහා නිකුත් කළ යුතු කුවිතාන්සිය පිළිබඳ ආකෘතියකි. ලැබෙන මුදල් සඳහා භාවිතා කරනු ලබන මෙම කුවිතාන්සිය, නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන මුදල් සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියම නොවේ. ඒ සඳහා වෙනම කුවිතාන්සියක් ඇත. ද්‍රව්‍ය අලෙවියකින් ලැබෙන මුදල් සඳහා හැර වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් සඳහා 51 වැනි ආකෘති පත්‍රය කුවිතාන්සියක් වශයෙන් උපයෝගී කර ගනු නො ලැබේ. කුවිතාන්සියක් නිකුත් කිරීමෙන් මුදල් භාර දෙන්නා හට නීතිමය වශයෙන් ඉටු විය යුතු අවශ්‍යතාවය ඉටු වන අතරම මුදල් ලබා ගන්නා සහ ඔහු අතර සම්බන්ධතාවයත්, විශ්වාස දායක බවත් ඇති වේ. එසේම මෙයින් ගිණුම් සටහනක් ද සම්පූර්ණ වන්නේය.

ආකෘති අංක 52 භාවිතා කළ යුතු වන්නේ කෘෂිකර්ම ද්‍රව්‍ය අලෙවියෙන් ලැබෙන මුදල් සඳහා නිකුත් කිරීමටය. මෙය මුදල් හෝ ණයට විකුණුම් පත යනුවෙන් නම් කර ඇත. මෙම ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වන්නේ සමුපකාර ගම්මානයේ කෘෂිකර්ම ද්‍රව්‍ය අලෙවි කර ලබා ගන්නා මුදල් සඳහා නිකුත් කරනු ලැබෙන කුවිතාන්සියක් වශයෙන් පමණකි. මෙම ආකෘති පත්‍රයෙහි, පහසු යොමුව සඳහා තොග පොතේ සහ විකුණුම් ජර්නලයෙහි පිටුවල යොමු අංක සඳහන්

කළ යුතු වන්නේ. එමෙන්ම විකුණනු ලබන ද්‍රව්‍ය පිළිබඳ විස්තර ද මෙහි සඳහන් කළ යුතුය.

අංක 53 වැනි ආකෘති පත්‍රය වවුචරයකි. ගෙවීමේ වවුචරයක් පිළියෙල කිරීමේ මූලික අදහස වන්නේ යම්කිසි ගෙවීමක් කිරීමට පෙර එහි ඇති ස්වභාවය, නිවැරදි තාවය සහ ගෙවීම අනුමත කිරීමට බලය ලත් නිලධාරියාගේ අනුමතිය ලබා ගැනීමද වේ. මෙම ආකෘති පත්‍රය සෑම මුදල් ගෙවීමක් සඳහා පිළියෙල කළ යුතු වන්නේය. ප්‍රධාන ගිණුම් අංකය, අනු ගිණුම් අංකය, දිනය, ගෙවීම් පිළිබඳ විස්තර ආදිය වවුචරයෙහි අනිවාර්යයෙන්ම සටහන් කළ යුතුය. යම්කිසි ගෙවීමක් සඳහා ලබා ගත් කුවිතාන්සියක් අමුණා තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ව්‍යාපාරයේ නොයෙකුත් සේවාවන් සපයා ගැනීම සඳහා ගෙවන ලද ගාස්තු වෙනුවෙන් කුවිතාන්සියක් වශයෙන් වවුචරය උපයෝගී කර ගනු ලැබේ. මෙවැනි කාර්යාවලියක් අනුගමනය කරනු ලැබෙනුයේ ආයතනයක මූල්‍ය කටයුතු පිළිබඳව කවර හෝ සැකයක් ඇති නොවන පරිද්දෙනි. ගිණුම් කටයුතු නිසි අයුරින් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයේ අය වැය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඕනෑම කෙනෙකුට ලබා ගත හැකි වන අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වන ප්‍රශ්න වලදී ලිඛිත සාක්ෂි මෙනයින් නිරායාසයෙන්ම ලැබෙනු ඇත. ව්‍යාපාරයක කළමනාකරු විසින් කරනු ලබන ගිණුම් කටයුතු පිළිබඳව පුළුල් අයුරින් අවබෝධයක් සාමාජිකයින් හට ලැබීමට සැලැස්වීම ද ඉතාමත් වැදගත්ය.

අංක 54 වැනි ආකෘති පත්‍රය සාමාන්‍යයෙන් මුදල් පොත හා සමාන දිනපතා පිළියෙල කළ යුතු ආකෘති පත්‍රයකි. ව්‍යාපාරයෙහි දෛනික අය වැය සටහන් මෙහි ඇතුළත් කරනු ලැබේ. මෙම ආකෘති පත්‍රය ක්‍රමානුකූලව දිනපතා පිළියෙල කරනු නො ලැබීමෙන් අය වැය පිළිබඳව විශාල ගැටළු මතු වීමට ඉඩ තිබේ. ව්‍යාපාරය හා අදාළ ගනු දෙනු එය කරනු ලබන අවස්ථාවේදීම මෙම ආකෘති පත්‍රයෙහි සටහන් කර තැබීම දූරදර්ශී මෙන්ම වැඩ දායක වීමට ද පුළුවන.

55 වැනි සම්මත ආකෘති පත්‍රය වේතන ඉපැයීමේ සටහන යනුවෙන් නම් කර ඇත. මෙය චෙක් රෝලකට සමාන වන අතර එක් එක් කාර්යය සඳහා වෙන් වෙන් වශයෙන් උපයෝගී කර ගත යුතු වේ.

ඊලඟට ඇත්තේ සම්මත ආකෘති පත්‍ර අංක 56 යි. එය මුළු ඉපැයීම් සාරාංශය හා ගෙවීම් සටහන යනුවෙන් නම් කර ඇත. මෙය වේතන ඉපැයීම් සටහනෙහි මාසික සාරාංශය වශයෙන් හැඳින්විය හැක. එක් එක් සාමාජිකයා විසින් ගොවිපලෙහි විවිධ කාර්යයන් සඳහා ගත කරන ලද දින ගණන පිළිබඳ ආකෘතියක් මෙන්ම ඔහු විසින් කරන ලද වැඩ පිළිබඳ සාරාංශයක් මෙම ආකෘතියේ දක්වනු ලැබේ. සාමාජිකයා විසින් ව්‍යාපාරයට ගෙවිය යුතු ණය මුදල්, කොටස් මුදල් ආදිය ඇත්නම් ඒවා අඩු කරගෙන ඔහුට ගෙවනු ලැබෙන ඉතිරි මුදල මෙහි සඳහන් වන අතර සාමාජිකයා සිය අත්සන තබා එම මුදල් ලබා ගනී. මෙම ආකෘති පත්‍රයෙන් එක් එක් සාමාජිකයෙක් ඒ ඒ කාර්යය සඳහා ගත කළ කාලය වෙනම අවබෝධ කර ගැනීමට පිළිවන. මෙම ආකෘති පත්‍ර සියල්ලේම එක් අංශයක් ආවරණය වේ. එනම් ශ්‍රමයට වැය කළ වියදම පිළිබඳ ගිණුම් ඉහත සඳහන් කළ ආකෘති පත්‍රයන්හි සටහන් වනු ඇත.

57 වැනි සම්මත ආකෘති පත්‍රය සැපයිය යුතු ද්‍රව්‍ය ලැයිස්තුව සඳහා වේ. යමුපකාර ගම්මානය ක්‍රමයෙන් දියුණු වී ව්‍යාප්ත වන විට එම ව්‍යාපාරයට අවශ්‍ය බඩු බාහිරාදිය සපයා ගැනීම සඳහා සැපයුම් ශාඛාවක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වනු ඇත. එවිට මෙම අංශය භාරව සිටීම සඳහා

ගබඩාකරුවෙක් ද පත් කර ගත යුතු වන්නේය. ඔහු විසින් ව්‍යාපාරය සඳහා අවශ්‍ය මෙවලත් සාමාජිකයින්ගේ ඉල්ලීම පරිදි කලින් නිගමනය කර ඇනවුම් කර ලබාගෙන තිබිය යුතුය. මෙම ඇනවුම් කිරීමේ කාර්යය සඳහා 57 වැනි සම්මත ආකෘති පත්‍රය භාවිතා කරනු ලැබේ.

ආකෘති පත්‍ර අංක 58 ද්‍රව්‍ය භාර ගැනීමේ සටහන වශයෙන් හැඳින්වේ. කලින් ඇනවුම් කරන ලද බඩු බාහිරාදිය භාර ගැනීම සඳහා මෙම ආකෘති පත්‍රය භාවිතා කරනු ලැබේ. තොග පොතේ පිටු අංක, ලදු පත් අංක, ලබා ගත් බඩු බාහිරාදිය පිළිබඳ විස්තර ආදී සටහන් මෙම ආකෘති පත්‍රයේ ඇතුළත් කරනු ලැබේ.

ආකෘති පත්‍ර අංක 59 ද්‍රව්‍ය මාරු කිරීමේ සටහන් පත යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ආකෘති පත්‍රය උපයෝගී කර ගනු ලැබෙනුයේ ඇනවුම් කර ලබා ගත් බඩු සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් සඳහා බෙදා දීමේදී ඒ පිළිබඳ සටහන් ඇතුළත් කිරීමටය.

පෝරිම අංක 60 හි සඳහන්ව ඇත්තේ තොග අංශයෙන් වෙනත් අංශවලට මාරු කරන ලද ද්‍රව්‍ය පිළිබඳ සාරාංශ ඇතුළත් ජර්නලය යනුවෙනි. මෙහි මාසිකව සඳහන් කළ යුතුව ඇත්තේ ඒ ඒ අංශ සඳහා යෙදවූ ද්‍රව්‍යවල වටිනාකමය.

ආකෘති පත්‍ර අංක 61 තොග පිළිබඳ සටහන් ඇතුළත් කළයුතු ආකෘතියකි. ව්‍යාපාරයට ලැබුණු දේවල්වල ප්‍රමාණය සහ ඒවා නිකුත් කළ ප්‍රමාණය පිළිබඳ සටහන් මෙම ආකෘති පත්‍රයෙහි ඇතුළත් කළ යුතු වේ. මෙම ආකෘතියෙහි එක් පිටුවක් එක් ද්‍රව්‍යයක් සඳහා වෙන් කර ඇත.

කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි දී එක එක භෝග වර්ගය සඳහා වැය කරන ලද ශ්‍රමයේ වටිනාකමද, වෙනත් යෙදවීම්වල වටිනාකමද වෙන් වෙන් වශයෙන් බලා ගැනීම සහ ඒ ඒ භෝග වර්ගයේ නිපයුම්වල වටිනාකම සමග සසඳා ආදායම් අතිරික්තය පහසුවෙන් බලා ගැනීමට පිළිවන් වීම මෙම ක්‍රමයේ විශේෂ අංගයකි.

මේ හැරෙන්නට චෙක් පොත්, චෙක් පොත් ලේඛනය ආදී ගිණුම් කටයුතුවලදී භාවිතා වන වෙනත් ලියකියවිලි ද මැනවින් පවත්වාගෙන යන බවට වග බලා ගැනීමේ කාර්යය ව්‍යාපාර භාර කළමනාකරුවෙක් වෙත පැවරෙන්නේය.